32 වන කාණ්ඩය
10 වන කලාපය

අඟහරුවාද
1984 දෙසැම්බර් 11

EVELYN RUTNAM INSTITUTE
REFERENCE LIBRARY
JAFFNA

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

RUTNAM LIBRARY
09269
JAFFNA

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

පිරිවැටුම් බදු පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ගම්පහ දිසා ඇමති ආරියරත්න ජයතිලක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

විසර්ජන පනත් කෙටුම්පත, 1985 [දහ හත් වන වෙන් කළ දිනය] :
[ශීර්ෂ 74 හා 75 (උසස් අධ්‍යාපන) ; ශීර්ෂ 175 හා 176 (ජේෂ කර්මාන්ත)] කාරක සභාවේදී සලකා බලන ලදී

පරිපූරක මුදල : පූගොඩ පෙහෙකම්හලට නිමහම් යන්ත්‍රාගාරයක්

අරක්කු බද්ද

මෙරට නිෂ්පාදිත විදේශීය ස්ප්‍රිතු බද්ද

ධාන්‍ය මත්පැන් බද්ද

ඉක්ෂුපාක හා තල් අරක්කු බද්ද

දුම්කොළ බද්ද

පිරිවැටුම් බදු පනත : නියෝගය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 32
இல. 10

செவ்வாய்க்கிழமை
11 டிசம்பர் 1984

# பாராளுமன்ற விவாதங்கள்

*(ஹன்சாட்)*

*அதிகார அறிக்கை*

*(பிழை திருத்தப்படாதது)*

*பிரதான உள்ளடக்கம்*

மொத்த விற்பனை வரி (திருத்தம்) சட்டமூலம்:
உயர் நீதிமன்றத் தீர்ப்பு

வினாக்களுக்கு வாய்மூல விடைகள்

கம்பஹ மாவட்ட அமைச்சர் திரு. ஆரியரத்ன ஜயத்திலக்கவினது சொந்த விளக்கம்

ஒதுக்கீட்டுச் சட்டமூலம், 1985 [ஒதுக்கப்பட்ட பதினேழாம் நாள்]:
குழுவில் ஆராயப்பட்டது [தலைப்புக்கள் 74, 75 (உயர் கல்வி); தலைப்புக்கள் 175, 176 (புடைவைத் தொழில்)]

குறை நிரப்புத் தொகை: பூகொடை நெசவாலைக்குப் பதனிடும் இயந்திரம்

தென்னஞ் சாராய வரி

உள்நாட்டில் தயாரிக்கப்பட்ட வெளிநாட்டு ஸ்பிரிற் வரி

மாவூறல் மதுவரி

பனம் பாகு, சாராய வரி

புகையிலை வரி

மொத்த விற்பனை வரிச்சட்டம்: கட்டளை

---

**Volume 32**
**No. 10**

**Tuesday**
**11th December 1984**

# PARLIAMENTARY DEBATES

**(HANSARD)**

## OFFICIAL REPORT

**(Uncorrected)**

## PRINCIPAL CONTENTS

TURNOVER TAX (AMENDMENT) BILL:
Decision of the Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

PERSONAL EXPLANATION BY MR. ARIYARATNE JAYATILLEKE, DISTRICT MINISTER, GAMPAHA

APPROPRIATION BILL, 1985 [Seventeenth Allotted Day]:
Considered in Committee [Heads 74& 75 (Higher Education): Heads 175 & 176 (Textile Industries)]

SUPPLEMENTARY SUPPLY: FINISHING PLANT FOR PUGODA TEXTILE MILLS

DUTY ON ARRACK

DUTY ON COUNTRY - MADE FOREIGN SPIRITS

DUTY ON MALT LIQUOR

DUTY ON MOLASSES AND PALMYRAH ARRACK

TOBACCO TAX

TURNOVER TAX ACT: ORDER

2 – A 080752 – 3,250 (84/12)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

1984 දෙසැම්බර් 11 වන අඟහරුවාදා

செவ்வாய்க்கிழமை, 11 டிசம்பர் 1984

*Tuesday, 11th December 1984*

*පූ.භා. 9 ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ඊ. එල්. සේනානායක මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு. ப. 9 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [திரு. ஈ. எல். சேனநாயக்க] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 9 a.m.* MR. SPEAKER (MR. E. L. SENANAYAKE) *in the Chair.*

## පිරිවැටුම් බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
## மொத்த விற்பனை வரவு வரி (திருத்தம்) சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு
## TURNOVER TAX (AMENDMENT) BILL : DECISION OF THE SUPREME COURT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I have an announcement to make regarding a Bill to amend the Turnover Tax Act, No. 69 of 1981.

This Bill was referred to the Supreme Court by His Excellency the President in terms of article 122 (1) (*b*) of the Constitution.

The Supreme Court has determined that the said Bill or any provision thereof is not inconsistent with any provision of the Constitution.

I order that the decision of the Supreme Court be printed in the Official Report of today's proceedings.

DECISION OF THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

In the matter of a reference under Article 122 (1) of the Constitution.

S. C. NO : 4/84
P/Parl.

PRESENT : S. Sharvananda, Chief Justice.
R. S. Wanasundera, Judge of the Supreme Court &
D. Wimalaratne, Judge of the Supreme Court.

COUNSEL : Sarath Silva, Deputy Solicitor-General.

COURT ASSEMBLED
FOR THE HEARING : At 10.30 a.m. on 4th December, 1984.

A Bill titled "AN ACT TO AMEND THE TURNOVER TAX ACT NO : 69 OF 1981" was referred to us by His Excellency the President in terms of Article 122 (1) (*b*) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka for determination whether the Bill or any provision thereof, is inconsistent with the Constitution. The Bill contains a certificate by which the Cabinet of Ministers has certified that the Bill is urgent in the national interest.

The Deputy Solicitor General appeared before us and assisted us in the consideration of the Bill.

We have examined the provisions of the Bill "AN ACT TO AMEND THE TURNOVER TAX ACT, NO : 69 OF 1981".

We are of opinion that the said Bill or any provision thereof is not inconsistent with any provision of the Constitution.

S. Sharvananda
CHIEF JUSTICE
R. S. Wanasundera
JUDGE OF THE SUPREME COURT
D. Wimalaratne
JUDGE OF THE SUPREME COURT

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Question No. 1.

එස්. එස්. අබේසුන්දර මහතා (නියෝජ්‍ය කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා)

(திரு. எஸ். எஸ். அபேசுந்தர — விவசாய அபிவிருத்தி, ஆராய்ச்சிப் பிரதி அமைச்சர்)

Mr. S. S. Abeysundera–Deputy Minister of Agricultural Development & Research)

I want one month's time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

### එච්. ජී. පුංචිහාමි මහත්මිය: අර්ථසාධක මුදල්
### திருமதி எச். ஜி. புஞ்சிஹாமி : ஊ சே நி
### MRS. H. G. PUNCHIHAMY : EPF

377/84

2. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)
(Dr. W. Dahanayake–Galle)

කම්කරු ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) අංකොක්කාවල පදිංචි හියාරේ ගමගේ පුංචිහාමි මහත්මියට අංක 4812/ජී/195 යටතේ සේවක අර්ථසාධක ප්‍රතිලාභ හිමිකම් ඇතත් පී. ඩබ්ලිව්. පේමවතී නමැති තැනැත්තියක්ද ඒ සඳහා හිමිකම් ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නවාද ?

(ආ) මේ පිළිබඳව සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා නීත්‍යානුකූලව හිමිකම් ඇති අයට එම ප්‍රතිලාභ ගෙවීමට එතුමා ක්‍රියා කරනවාද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද ?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 4812/G/159 ஆம் இலக்க ஊ. சே. நி. கொடுப்பனவு அங்கொக்காவெலே என்னுமிடத்தைச் சேர்ந்த திருமதி ஹியாரே கமகே புஞ்சிஹாமி என்பவருக்கு உரியதென்பதையும் ஆனால் அதே கொடுப்பனவை பி. டபிள்யூ. பேமாவதி எனும் பெயருடைய வேறொருவர் கோருவதையும் அவர் அறிவாரா?

(ஆ) இவ்விடயம் பற்றிப் பூரண விசாரணை நடாத்தி சட்டபூர்வமான உரிமையாளருக்குக் கொடுப்பனவைச் செலுத்த அவர் ஆவன செய்வாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Labour :

(*a*) Is he aware that E.P.F. on 4812/G/159, are due to Mrs.Hiyare Gamage Punchihamy of Ankokawela, but that another person by the name of P. W. Pemawathie also claimed the same dues ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා]

(*b*) Will he cause a full inquiry to be held into this matter, and make payment to the legal owner ?

(*c*) If not, why ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

**(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)**

(Mr. M. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I answer on behalf of the Minister of Labour.

(*a*) Mrs. H. G. Punchihamy had made an application for refund of EPF dues under membership No. 4812/G/159 which upon verification by the Central Bank was found to belong to a P. W. Premawathie.

(*b*) Instructions have already been given to hold a full inquiry with a view to refund the benefits due to H. G. Punchihamy.

(*c*) Does not arise in view of reply to (*b*) above.

**කථානායකතුමා**

**(சபாநாயகர் அவர்கள்)**

(Mr. Speaker)

Question No. 3.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

**(திரு. எம். வின்சன்ற் பெரேரா)**

(Mr. M. Vincent Perera)

On behalf of the Hon. Minister of Transport and Minister for Transport Boards and Minister for Private Omnibus Transport, I ask for three weeks' time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*

*வினவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

### පේෂ කර්මාන්ත අමාත්‍යාංශය: මිල දී ගත් මෝටර් කාර්

### புடைவைத்தொழில் அமைச்சு : கொள்வனவு செய்யப்பட்ட கார்கள்

### MINISTRY OF TEXTILE INDUSTRIES : CARS PURCHASED

392/84

4 **ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)—(රිචඩ් පතිරණ මහතා—අක්මීමන—වෙනුවට)**

**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திரு. றிச்சட் பத்திரன—அக்மீமன—சார்பாக)**

(Mr. Lakshman Jayakody – Attanagalla – on behalf of Mr. Richard Pathirana – Akmeemana)

**පේෂ කර්මාන්ත ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :**

(අ) 1977 ජූලි මාසයේ සිට 1984 අගෝස්තු මස අග දක්වා එතුමාගේ අමාත්‍යාංශයට මිළදී ගනු ලැබූ සියලුම මෝටර් කාර් සම්බන්ධයෙන් වර්ගය හා මෝස්තරයත්, සාදන ලද්දේ ඇණවුමකටද යන වග සහ ඩීසල්/පැට්‍රෝල් ගැලුමකින් දුවන සැතපුම් ගණනත් දක්වමින් ඒවායේ මුළු වටිනාකම එතුමා ප්‍රකාශ කරන්නේද ?

(ආ) එක් එක් මෝටර් රථය සඳහා ගෙවන ලද තීරු බදු ප්‍රමාණය සහ ඒ ඒ රථයේ මිල, රක්ෂණ හා ගැල් කුලිය සැදී ඇති අයුරු එතුමා දක්වන්නේද ?

(ඇ) රථය වෙන්කර ඇත්තේ කවරකුගේ ප්‍රයෝජනය සඳහාද යන්නත් වැය වෙන ඉන්ධන වියදම ලබාගන්නේ කවර වැය සම්මතය යටතේ ද යන්නත් එතුමා ප්‍රකාශ කරන්නේද ?

**புடைவைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:**

**(அ) 1977, ஜூலை முதல் 1984, ஆகஸ்ட் முடிவுவரை அவரது அமைச்சுக்கெனக் கொள்வனவு செய்யப்பட்ட சகல கார்களினதும் மொத்தப் பெறுமதியையும் ஒவ்வொரு காரினதும் இனம், மொடல், அவை கட்டளையின் பிரகாரம் செய்யப்பட்டனவா, இல்லையா, அவை டீசல்/பெற்ரோல் கலனொன்றுக்கு ஓடக்கூடிய மைல்கள் ஆகிய விபரங்களுடன் அவர் கூறுவாரா?**

**(ஆ) அவற்றின் கிரயம், காப்புறுதி, கேழ்வுப் பெறுமதியையும் (C. I. F. Value) ஒவ்வொரு காருக்கும் செலுத்தப்பட்ட தீர்வையையும் அவர் கூறுவாரா?**

**(இ) ஒவ்வொரு காரும் யாருடைய பாவனைக்கு ஒதுக்கப்பட்டுள்ள தென்பதையும் பயன்படுத்தப்படும் எரிபொருள் எந்த வாக்குப் பணத்திலிருந்து பெறப்படுகின்றதென்பதையும் கூறுவாரா?**

asked the Minister of Textile Industries :

(*a*) Will he state the total value paid for all cars purchased for his Ministry from July 1977 to end of August, 1984 with their make, model, whether made to order or not, and miles per gallon of diesel/petrol ?

(*b*) Will he give a break down of the C.I.F. value and the duty paid for each of the cars ?

(*c*) Will he state for whose use the car is allocated and from what Vote is the fuel consumed drawn ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා (නියෝජ්‍ය පේෂකර්ම ඇමතිතුමා)**

**(திரு. ஆர். எம். தர்மதாச பண்டா — புடைவைக் கைத்தொழில் பிரதி அமைச்சர்)**

(Mr. R. M. Dharmadasa Banda–Deputy Minister of Textile Industries)

As it is a long answer, I am tabling it.

**සභාමේසය මත තබන ලද පිළිතුර :*

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*

*Answer tabled:*

(*a*) Particulars of new cars purchased from July 1977 to August, 1984.

| *No. of Vehicle* | *Make* | *Model* | *Whether made to order or not* | *Miles per gallon diesel/petrol* | *Full Value* |
|---|---|---|---|---|---|
| 11 Sri 8812 | Datsun | 280 C | No | petrol 18 | Rs. 164,725.56 |
| 13 Sri 593 | Mitsubishi | Tredia | No | petrol 25 | Rs. 130,958.03 |
| 10 Sri 2671 | Audi | 100 DKW avent | No | petrol 20 | Rs. 180,925.50 |
| 13 Sri 1987 | Mercedes Bens | 380 SEC | No | petrol 15 | Rs. 784,698.43 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(*b*)

| *No. of Vehicle* | *Duty* | *Cost* | *Insurance* | *Freight* |
|---|---|---|---|---|
| 11 Sri 8812 | Nil | Rs. 130,207.00 | Rs. 1,513.00 | Rs. 19,758.00 |
| 13 Sri 593 | Nil | Rs. 97,295.07 | Rs. 1,721.84 | Rs. 17,992.80 |
| 10 Sri 2671 | Nil | Rs.145,987.98 | Rs. 4,089.44 | Rs. 21,712.58 |
| 13 Sri 1987 | Nil | Rs.737,022.21 | Rs. 14,006.22 | Rs. 33,670.00 |

(*c*)

| *No. of vehicle* | *For whom the vehicle is allocated* | *Votes relating to fuel* |
|---|---|---|
| 11 Sri 8812 | Hon Deputy Minister ) | 175-1-1-03 (2) |
| 13 Sri 593 | Secretary ) | 175-1-2-03 (2) |
| 10 Sri 2671 | Hon. Minister ) | 175-2-1-03 (2) |
| 13 Sri 1987 | Hon. Minister ) | |

The following second hand cars also have been purchased during this period :

(*a*)

| *No. of vehicle* | *Make* | *Miles per gallon diesel or petrol* | | *From whom purchased* | *Amount paid Rs.* |
|---|---|---|---|---|---|
| 6 Sri 1484 | Ford Cortina | petrol | 20 | Govt. Supplies Department | 2,973.00 |
| 6 Sri 7217 | Datsun | petrol | 25 | – do. – | 31,176.57 |
| 6 Sri 6979 | Austin Miniclubman | petrol | * | – do. – | 29,466.22 |
| 6 Sri 1684 | Datsun 280 B | petrol | * | – do. – | 11,178.61 |
| 7 Sri 4256 | Mitsubishi Gallant | petrol | 24 | Weaving Supplies Corporation | 63,229.20 |

(*b*) Does not arise

Since these vehicles were brought from Govt. Supplies Department and another institution

(*c*)

| *No. of vehicle* | *For whom the vehicle is allocated* | *Votes relating to fuel* |
|---|---|---|
| 6 Sri 1484 | Official use of the Ministry | 175-1-4-03 (07) |
| 6 Sri 7217 | –do.– | 175-1-2-03 (2) |
| 7 Sri 4256 | Private Secretary to Hon. Minister | |
| 6 Sri 6979 | Returned to Govt. Supplies Department on 6.3.1980 | 175-1-2-03 (2) |
| 6 Sri 1684 | *Returned to Govt. Supplies Department on 11.6.1981 | 175-2-1-03 |

## විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය : මිල දී ගත් මෝටර් කාර්

## வெளிநாட்டலுவலுகள் அமைச்சு : கொள்வனவு செய்யப்பட்ட கார்கள்

## MINISTRY OF FOREIGN AFFAIRS : CARS PURCHASED

393/84

5. **ලක්ෂ්මන් ජයකොඩි මහතා (රිචඩ් පතිරණ මහතා වෙනුවට)**

**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திரு. றிச்சட் பத்திரன—சார்பாக)**

(Mr. Lakshman Jayakody – on behalf of Mr. Richard Pathirana)

විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1977 ජූලි මාසයේ සිට 1984 අගෝස්තු මස අග දක්වා එතුමාගේ අමාත්‍යාංශයට මිලදී ගනු ලැබූ සියලුම මෝටර් කාර් සම්බන්ධයෙන් වර්ගය හා මෝස්තරයත්, සාදන ලද්දේ ඇණවුමකටද යන වග සහ ඩීසල්/පැට්‍රෝල් ගැලුමකින් දුවන සැතපුම් ගණනත් දක්වමින් ඒවායේ මුළු වටිනාකම එතුමා ප්‍රකාශ කරන්නේද ?

(ආ) එක් එක් මෝටර් රථය සඳහා ගෙවන ලද තීරු බදු ප්‍රමාණය සහ ඒ ඒ රථයේ මිල, රක්ෂණ හා ගැල් කුලිය සැදී ඇති අයුරු එතුමා දක්වන්නේද ?

(ඇ) රථය වෙන්කර ඇත්තේ කවරකුගේ ප්‍රයෝජනය සඳහාද යන්නත් වැය වෙන ඉන්ධන වියදම ලබාගන්නේ කවර වැය සම්මතය යටතේ ද යන්නත් එතුමා ප්‍රකාශ කරන්නේද ?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1977, ஜூலை முதல் 1984, ஆகஸ்ட் முடிவுவரை அவரது அமைச்சுக்கெனக் கொள்வனவு செய்யப்பட்ட சகல கார்களினதும் மொத்தப் பெறுமதியையும் ஒவ்வொரு காரினதும் இனம், மொடல், அவை கட்டளையின் பிரகாரம்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

செய்யப்பட்டனவா, இல்லையா, அவை டீசல்/பெற்ரேல் கலனென்றுக்கு ஓடக்கூடிய மைல்கள் ஆகிய விபரங்களுடன் அவர் கூறுவாரா?

(ஆ) அவற்றின் கிரயம், காப்புறுதி, கேழ்வுப் பெறுமதியையும் (C. I. F. Value) ஒவ்வொரு காருக்கும் செலுத்தப்பட்ட தீர்வையையும் அவர் கூறுவாரா?

(இ) ஒவ்வொரு காரும் யாருடைய பாவனைக்கு ஒதுக்கப்பட்டுள்ள தென்பதையும் பயன்படுத்தப்படும் எரிபொருள் எந்த வாக்குப் பணத்திலிருந்து பெறப்படுகின்றதென்பதையும் அவர் கூறுவாரா?

asked the Minister of Foreign Affairs :

(*a*) Will he state the total value paid for all cars purchased for his Ministry from July 1977 to end of August, 1984 with their make, model, whether made to order or not, and miles per gallon of diesel/petrol ?

(*b*) Will he give a break down of the C.I.F. value and the duty paid for each of the cars ?

(*c*) Will he state for whose use the car is allocated and from what Vote is the fuel consumed drawn ?

ඒ. සී. එස්. හමීඩ් මහතා (විදේශ කටයුතු ඇමතිතුමා)
(ஜனாப் ஏ. ஸி. எஸ். ஹமீத் — வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(Mr. A. C. S. Hameed–Minister of Foreign Affairs)

I am tabling the Answer.

*සභාමේසය මත තබන ලද පිළිතුර :
சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:
*Answer tabled:*

(*a*) Yes, as per particulars in Schedule (A).

(*b*) Yes, as per particulars in Schedule (B).

(*c*) Yes, as per particulars in Schedule (C).

Schedule "A"

| *Total Value paid for All Cars.* | *Make* | *Model* | *Whether made to order or not* | *Miles per Gallon* | *Whether Diesel or Petrol* |
|---|---|---|---|---|---|
| Rs. 1,739,602.15 | Datsun | 120 Y | Not made to order | 40 | Petrol |
| | Ford | Laser | do | 35 | do |
| | *Peugeot | 604 | do | 20 | do |
| | *Mercedes Benz | 230 | do | 25 | do |
| | Mercedes Benz | 250 | do | 22 | do |
| | Datsun | 140 J | do | 40 | do |
| | Toyota | Corona | do | 27 | do |
| | Daihatsu | Charade | do | 48 | do |
| | Datsun | 200 C | do | 20 | do |
| | Mercedes Benz | 380 | do | 18 | do |
| | Peugeot | 505 | do | 18 | do |
| | *Holden | Statesman | do | 18 | do |
| | *Holden | Statesman | do | 18 | do |
| | *Peugeot | 504 | do | 25 | do |
| | *Mercedes Benz | 230 | do | 25 | do |
| | *Holden | Statesman | do | 18 | do |
| | *Holden | Statesman | do | 18 | do |
| | *Peugeot | 504 | do | 25 | do |
| | Mazda | 323 | do | 35 | do |
| | †Ford | Cortina | do | 25 | do |
| | †Saehan | Bird | do | 40 | do |
| | †Saehan | Bird | do | 40 | do |
| | †Saehan | Bird | do | 40 | do |
| | †Saehan | Bird | do | 40 | do |
| | †Zastava | – | do | 30 | do |
| | †Saehan | Bird | do | 40 | do |

*Transfered from Government Supplies and Other Departments.

†Returned to Department of Government Supplies.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

SCHEDULE "B"

| *Make of Car* | *Model* | *CIF Value* | *Duty paid* |
|---|---|---|---|
| Datsun | 120 Y | 52,549.80 | Nil |
| Ford | Laser | 66,409.31 | Nil |
| Mercedes Benz | 250 | 103,683.54 | Nil |
| Datsun | 140 J | 47,465.82 | Nil |
| Toyota | Corona | 58,630.00 | Nil |
| Daihatsu | Charade | 36,233.75 | Nil |
| Datsun | 200 C | 87,996.25 | Nil |
| Mercedes Benz | 380 | 646,028.00 | Nil |
| Peugeot | 505 | 201,755.68 | 367,315.00 |
| Mazda | 323 | 71,535.00 | Nil |

Total CIF Value : Rs. 1,372,287.15
Duty : Rs. 367,315.00

(x) Value of the vehicles indicated by 'x' in schedule C has not been shown as they have been used cars transferred by the Department of Government Supplies.

SCHEDULE "C"

| (i) *Make of Car* | *Model* | *For whose use the car is allocated* |
|---|---|---|
| Mercedes Benz | 380 | Hon'ble Minister |
| Mercedes Benz | 230 | Hon'ble Deputy Minister |
| Peugeot | 505 | Secretary, Ministry of Foreign Affairs * |
| Datsun | 120 Y | Official use of the Ministry |
| Ford | Laser | -do- |
| Peugeot | 604 | -do- |
| Mercedes Benz | 250 | -do- |
| Datsun | 140 J | -do- |
| Toyota | Corona | -do- |
| Daihatsu | Charade | -do- |
| Datsun | 200 C | -do- |
| Holden | Statesman | -do- |
| Holden | Statesman | -do- |
| Peugeot | 504 GL | -do- |
| Mercedes Benz | 230 | -do- |
| Holden | Statesman | -do- |
| Holden | Statesman | -do- |
| Peugeot | 504 | -do- |
| Mazda | 323 | -do- |
| * Ford | Cortina | -do- |
| * Saehan | Bird | -do- |
| * Saehan | Bird | -do- |
| * Saehan | Bird | -do- |
| * Saehan | Bird | -do- |
| * Saehan | Bird | -do- |
| * Zastava | – | -do- |

* Returned to Department of Government Supplies.

(ii) The Fuel consumed is paid from Vote :

| | | |
|---|---|---|
| Head | 46 |
| Programme | 1 |
| Project | 1 |
| Object Code | 03 |
| Object Detail | 02 |

## ගම්පහ දිසා ඇමති ආරියරත්න ජයතිලක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

### கம்பஹா மாவட்ட அமைச்சர் கௌரவ ஆரியரத்ன ஜயதிலக்க வினது சொந்த விளக்கம்

## PERSONAL EXPLANATION BY HON. ARIYARATNA JAYATILLEKE, DISTRICT MINISTER, GAMPAHA.

පූ. භා. 7.03

**ආරියරත්න ජයතිලක මහතා (ගම්පහ දිසා ඇමතිතුමා)**
**(திரு. ஆரியரத்ன ஜயதிலக்க — கம்பஹா மாவட்ட அமைச்சர்)**
(Mr. Ariyaratne Jayatillake- District Minister, Gampaha)

ගරු කථානායකතුමනි, ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ රැකීරක්ෂා සම්බන්ධව කතා කළ මම තෙස්ලේ සමාගම රැකියා 150 ක් පමණ දීම ගැන කරුණු සඳහන් කළා. නමුත් ඒ සමාගම විසින් ඒ ගණන මෙන් දෙගුණයක් රැකියා දී තිබෙන බව පසුව වැඩිදුර කරුණු සෙවීමේදී මට පෙනීගොස් තිබෙනවා. ඒ ඇරත් එම කර්මාන්තශාලාව මෙහි එළදෙනුන්ගේ කිරි ප්‍රයෝජනයට ගෙන කිරිපිටි නිෂ්පාදනය කිරීම පටන්ගෙන තිබෙනවා. මම පසුගිය සතියේ වැරදීමකින් කරුණු කියා තිබෙනවා. ඒ නිසා එය නිවැරදි කොට සඳහන් කිරීමට උපදෙස් දෙන ලෙස මම තමුන්නාන්සේගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

## පාර්ලිමේන්තුවේ කටයුතු

### பாராளுமன்ற அலுவல்

## BUSINESS OF THE PARLIAMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
**(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)**
(Mr. M. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move,

"That the proceedings on Items 3, 4, 5, 6, 13 and 14 of Public Business appearing on the Paper be exempted at this day's sitting from the provisions of Standing Order No. 23"

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

I move,

"That the proceedings on Items 2 to 8 of Public Business appearing on the Paper be exempted at this day's sitting from the provisions of Standing Order No. 70 (3)."

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

## විසර්ජන පනත් කෙටුම්පත, 1985

### ஒதுக்கீட்டுச் சட்டமூலம், 1985

## APPROPRIATION BILL, 1985.

*කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී – [ප්‍රගතිය දෙසැම්බර් 10]*
*[කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.—[தேர்ச்சி : 10 டிசம்பர்]*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.* –
*[Progress : December 10]*
[MR. SPEAKER *in the Chair.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### 74 වන ශීර්ෂය.– උසස් අධ්‍යාපන අමාත්‍යවරයා

1 වන වැඩ සටහන.– සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා –පුනරාවර්තන වියදම, රු. 3,96,51,000

தலைப்பு 74.—உயர் கல்வி அமைச்சர்

நிகழ்ச்சித் திட்டம் 1.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—மீண்டுவரும் செலவு, ரூபா 3,96,51,000

### HEAD 74. – MINISTER OF HIGHER EDUCATION

Programme 1 – General Administeration and Staff Services – Recurrent Expenditure, Rs. 39,651,000

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Ministry of Higher Education Heads 74 and 75. The voting will be at 2.30 p.m.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)**
(Mr. Lakshman Jayakody–Attanagalla)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය රුපියල් දහයකින් කැපිය යුතුයයි යෝජනා කරමින් මේ වැය ශීර්ෂය ගැන අදහස් ටිකක් ඉදිරිපත් කරන්න කැමතියි. මෙය ගරු ජනාධිපතිතුමා යටතේ තිබෙන අමාත්‍යාංශයක් බව අපි කවුරුත් දන්නවා. ඒ එක්කම මේ අමාත්‍යාංශයේ තිබෙන වැදගත් භාවයත් අපි කවුරුත් දන්නවා. මේ රටේ ජීවනය වන සිසු පරපුර මේ රටේ අනාගතය බාර ගන්නට සිටිනවා නම් ඒ ඇත්තන් සැකසුම් කරන ආයතනයක් හැටියට අපි උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සලකනවා. එවැනි වැදගත්කමක් තිබෙන මේ ආයතනය අනිවාර්යයෙන්ම මේ ගරු සභාවේ සිටින කෙනෙකුට බාර වී තිබෙන්නට ඕනෑ බව මම අවංකවම කියන්න ඕනෑ.

ගරු ජනාධිපතිතුමා රාජකාරී බොහෝම තිබෙන කෙනෙක් බව අපි දන්නවා. මම එය කියන්නේ හොඳ අදහසින්, අවංක අදහසින්. කිසිම අන්දමකින් එතුමා සැහැල්ලු කර කතා කිරීමට නොවෙයි. එතුමාට හුඟක් රාජකාරි තිබෙන බව අපට වැටහී තිබෙනවා. පැවරී තිබෙන රාජකාරි කටයුතු දෙස බලන විට ඒ හැම විෂයයක් ගැනම එතුමාට කටයුතු කරන්න පුළුවන්ද යන ප්‍රශ්නය මතු වෙනවා. එතුමා දක්ෂ කෙනෙක්. එය හැම විටම අපි හිතේ තියාගන්න ඕනෑ. මම නම් එය හොඳින් හිතේ තියාගෙනයි ඉන්නේ. නමුත් රටේ තිබෙන රාජකාරි දෙස බලන විට එතුමාට කටයුතු රාශියක් පැවරී තිබෙනවා. ජාතීන් භේද-භින්න වීමෙන් ඇති වී තිබෙන්නේ ඉතාම උග්‍ර ප්‍රශ්නයක්. ඒ සමගම එතුමාට ජේ්ඩ්බ් එකේ ප්‍රශ්නත් පැවරී තිබෙනවා. ඒවාගේම පෙළක් වෙලාවට එතුමාට වතිනා කටයුතු සම්බන්ධ ප්‍රශ්නයත් පෙළක් අවස්ථාවලදී පෝර ටික බෙදීම වැනි දේ පිළිබඳ ප්‍රශ්නත් මේ පුද්ගලයාගේ අතේ තිබෙනවා.

ඒ කෙසේ වුණත්, එතුමා මේ ගරු සභාවේ සිටියා නම් මේ අමාත්‍යාංශය එතුමාටම අයිති වෙන්න ඕනෑ. නමුත් මගේ විශ්වාසය නම් මේවාගේ භාරදූර අමාත්‍යාංශයක් මේ ගරු සභාවේම සිටින කෙනෙකු යටතේ තිබිය යුතු බවයි. මෙහිදී නැගෙන්නාවූ ප්‍රශ්නවලට උත්තර දීමට මේ ගරු සභාවේ සිටින කෙනෙක්ම විය යුතුයි. අන්න ඒ නිසා මේ පණිවුඩය ගරු නියෝජ්‍ය ඇමතිතුමා විසින් ගරු ජනාධිපතිතුමට දෙවිය කියා මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා එම තනතුරට පත්වුණාට මගේ විරුද්ධත්වයක් නැති බවත් මම කියන්න ඕනෑ. මොකද, එතුමා විශ්ව විද්‍යාලයේ සිටි කෙනෙක්. නමුත් මම නම් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ කෙනෙක් නොවෙයි. මට දැන් එතුමාගෙන් අහන්න ප්‍රශ්න ටිකක් තිබෙනවා. එම ප්‍රශ්නවල වැදගත්කම කොතෙක්ද කිව්වොත් මම දැන් කිව්ව වචන ටික ඇත්ත බව පිළිගන්නට ගරු නියෝජ්‍ය ඇමතිතුමාට සිදුවේවිය කියා මා සිතනවා.

දැන් විශ්ව විද්‍යාලවල තිබෙන්නාවූ ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් රජය තීරණයක් අරගෙන තිබෙනවාද ? මේ ශිෂ්‍ය සංගම් කියන ඒවා ලෝකයේ හැම විශ්ව විද්‍යාලයකම තිබෙන දෙයක්. මා ඉදිරිපිට සිටින ගම්පහ දිසා ඇමතිතුමාත් විශ්ව විද්‍යාලයේ ඉන්න කාලයේදී ශිෂ්‍ය සංගම්වල සේවය කර තිබෙනවා. එතුමා ශිෂ්‍ය සංගම්වල සේවය කළ කාලය මට මතකයි. අපි පුංචි කාලයේදී – අවුරුදු හත, අට, නවය කාලයේදී – එකට සෙල්ලකම් කරමින් සිටි හැටිත් මතකයි. අපි සමහර දවස්වලට දේශපාලනය ගැන කථා කළේ පොල්මැස්ස උඩ ඉඳගෙනයි. පොල් මැස්සේ ඉඳගෙන කොප්පරා කමින් එතුමාත් මමත් මේ කටයුත්ත කළා. එතුමා එද හිටියේ අපේ පැත්තෙයි. නමුත් 1970 දී අනික් පැත්තට ගියා. එතුමාත් දන්නවා ඇති, මේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගම් ගැන. එතුමා ඉතාමත් දක්ෂ කෙනෙක්. එතුමාගේ උගත් කමේ හැටියට මම නම් විශ්වාස කළේ ඔය දැන් තිබෙන තනතුරට වඩා උසස් තනතුරක් එතුමාට ලැබේවි කියලයි. කෙසේ වෙතත් එතුමාත් මේ තත්ත්වය ගැන දන්නවා ඇති. මම අහන්නෙ මේ ශිෂ්‍ය සංගම් අහෝසි කිරීමට තීරණය කර තිබෙනවාද කියන එකයි. එය විශාල ශිෂ්‍ය අයිතිවාසිකමක් උදුරා ගැනීමක් හැටියටයි, අපි නම් සලකන්නෙ. මම හිතන හැටියට ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ කාලෙයදී සමවාදී ශිෂ්‍ය සංගමයේ හිටියා. බොහොම සටන්කාමී ශිෂ්‍යයෙක් හැටියටයි එතුමා එද කටයුතු කළේ. ඒ සටන්කාමීත්වය මොට කිරීම සුදුසුයි කියා එතුමා පිළිගන්නවාද ? සාමාන්‍යයෙන් ටිකක් වයසට යන විට එහෙම හැඟීමක් ඇති වෙන්නත් පුළුවන්. එද තිබුණු සටන්කාමීත්වය ඊළඟ පරම්පරාවෙන් ටිකක් අඩු කරන්න ඕනෑ කියල හිතනවා ඇති. වයසට යන උදවියට ඒ ලෙඩේ බෝවෙනවා. ඒ රෝගය ලංකාවේ තිබෙනවා. මේ කටයුතු තරුණයින්ට භාර නොදී ඉන්න ඕනෑ කියලත් ලංකාවේ ඉන්න සමහර වයසක උදවිය කල්පනා කරනවා. එහෙම කල්පනාවකුත් සමහර උදවියට ඇති වීම ස්වාභාවික දෙයක්. ඒ කෙසේ වෙතත් ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම කරන්න එපාය කියන ඉල්ලීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන්න කැමතියි.

ඊළඟට ශිෂ්‍ය ආධාර ගැන මතක් කරන්න ඕනෑ. මහපොළ ශිෂ්‍ය ආධාර ක්‍රමය ගැන අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ ආධාර ක්‍රමය නිසා ටිකක් බේරෙන්න පුළුවන් වුණා. උසස් අධ්‍යාපන ආයතනයට හෝ එහි නිලධාරී මහත්වරුන්ට එහි වාසිය ගන්න පුළුවන්කමක් නැහැ. මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය ඇති කළේ එක්තරා කාරණයක් උඩයි. මම එය පෞද්ගලික වශයෙනුත් දන්නවා. කෙසේ වෙතත් එය හොඳ අදහසක්. හොඳට ක්‍රියාත්මක කරන්න පුළුවන් විධියට එය සකස් කර තිබෙනවා. එතැනින් දෙන මුදල් ප්‍රමාණයත් නමුත්නාන්සේලා දෙන මුදල් ප්‍රමාණයත් සන්සන්දනය කර බලන්න. මහපොළ වගේ ව්‍යාපාරයක් මෙතුවක් කාලයකට විශ්ව විද්‍යාලවලට ආරම්භ කරන්න නුපුළුවන් වුණේ ඇයිද කියන කාරණය ගැන අපි ටිකක් කල්පනා කරන්න ඕනෑ. අද විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකුට ලැබෙන්නේ රු. 225 ක මුදලකුයි. එම මුදල කවද සිට ලැබෙන මුදලක්ද කියල මම දන්නෙ නැහැ.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා (නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා)**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க — உயர் கல்விப் பிரதி அமைச்சர்)**
(Mr. A. M. R. B. Attanayake–Deputy Minister of Higher Education)

පොඩි පැහැදිලි කිරීමක් කරන්න මම අවසර ඉල්ලනවා. මහපොළ ශිෂ්‍යත්ව ක්‍රම දෙකක් තිබෙනවා. අති දක්ෂ ශිෂ්‍යයින් සියයට 30 කට, රු. 400 බැගින් මාස්පතා ලැබෙනවා. සාමාන්‍ය ශිෂ්‍යත්ව ලබන්නවුන්ට රු. 350 බැගින් ලැබෙනවා. එසේ නොලැබෙන ළමයින්ට බැංකු ණයක් දීගෙන ආවා. නමුත් දැන් ඒ බැංකු ණය නතර කර අතිගරු ජනාධිපතිතුමා විසින් පාරිතෝෂික මුදලක් දෙන්නට නියම කර තිබෙනවා. මහපොළ ශිෂ්‍යත්ව නොලැබෙන සෑම ශිෂ්‍යයෙකුටම ඔවුන්ගේ තත්ත්වය අනුව, ණයෙන් තොරව තෑගී මුදලක් වශයෙන් මාසයකට රු. 350 මුදලක් දෙන්න නියම කර තිබෙනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

කවද ඉඳලද ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)

එන අවුරුද්දේ සිට. 1985 අවුරුද්දේ සිට. ඒ නිසා දැන් බැංකු ණය ක්‍රමය නවත්වා තිබෙනවා. නමුත් බැංකු ණය ලබමින් සිටි දැනට ඉගෙණුම ලබන ශිෂ්‍යයින්ට බැංකු ණය ඒ විධියටම දී ගෙන යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ඒ කියන්නේ රුපියල් 96 ක් වැඩිපුර දෙනවා, නැඟි වශයෙන්.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
නැහැ. තමුන්නාන්සේ වරද්ද ගත්තා. රුපියල් 350 දෙන්නේ බර්සරි එකක් වශයෙන්. එය නැවත අය කරන්න නොවෙයි, දෙන්නේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
නැවත අය නොකරන්න රුපියල් 96 ක් අද තිබෙන ගණනට වැඩිපුර දෙනවා.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
මෙතෙක් රුපියල් 225 දුන්නේ ණයට. දැන් රුපියල් 350 දෙන්නේ නිකම්.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
රුපියල් 296 ණයට දුන්නා. ලබන අවුරුද්දේ සිට රුපියල් 350 ක් බර්සරි එකක් වශයෙන් දෙනවා. නමුත් මම අහන ප්‍රශ්නය මේකයි. රුපියල් 96 ක මුදලක් වැඩිපුර දෙන්න කටයුතු කරලයි තිබෙන්නේ. ඒවා නිකම් දෙන්නේ. ගෙවන්න නොවෙයි දෙන්නේ. කවදද, ණය ගෙවන්න සිදුවෙන්නේ? ණය ගෙවන්න වෙන්නේ රක්ෂාවක් ලැබුණාට පසුවයි. එය වෙනත් දෙයක් එය නොවෙයි, මම කියන්නේ. රු. 96 ක් වැඩිපුර ගෙවනවා.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
රුපියල් 96 ක් නොවෙයි, රුපියල් 350 ක්. රුපියල් 350 ක් කියන්නේ රුපියල් 96 ක් නොවෙයි. තමුන්නාන්සේ මුලින්ම කිව්වා, තමුන්නාන්සේ විශ්ව විද්‍යාලයේ ඔයේ නැහැ කියල. ඒ ගැන මම කණගාටු වෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
විශ්ව විද්‍යාලයේ ඔය උදවිය මෙහෙම කථා කිරීම ගැන මම කනගාටු වෙනවා. කලින් ලැබුණු රුපියල් 250 ලැබුණේ ණයට. රුපියල් 254 ක් දැන් ලැබෙනවා. රුපියල් 350 ක් සම්පූර්ණයෙන්ම දෙනකොට ලබන අවුරුද්දේ සිට රුපියල් 96 ක් වැඩිපුර අතට එනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙතනයි. සම්පූර්ණ මුදල රුපියල් 350 යි. නමුත් අතට එන්නේ —

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
ගරු සභාපතිතුමනි, මෙහි පොඩි ප්‍රශ්නයක් පැනනැඟී තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
නැහැ, නැහැ. ප්‍රශ්නයක් නැහැ. මට හොඳට තේරෙනවා.

සභාපතිතුමා
(தவிசாளர்)
(The Chairman)
Order, please! Will the hon. Deputy Minister note down what the hon. Member is saying and reply to it in his speech. I cannot allow this argument to go on like this. Please make a note of it and reply. Do not interrupt the hon. Member who is speaking. It is not fair. We have only a limited number of hours. [*Interruption*]

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
Though the hon. Deputy Minister treats this as rubbish, this is not rubbish. Let us see who speaks rubbish.

Sir, what I say is true. Rs. 350 is going to be a bursary. It is not going to be repaid. It is going to be available to him a hundered per cent. Previously it was a loan. We all know that. But what I say is, the difference is going to be only Rs. 96. Of course, it will not be repaid. Is the Rs. 96 going to be repaid? My question is, is that going to be enough?

වැඩිපුර ලැබී තිබෙන රු. 96 ප්‍රමාණවත්ද?

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
රුපියල් 96 ක් නොවෙයි, රුපියල් 350 ක් නිකම් දෙනවා, ළමයින්ට. එය දෙන්නේ ණයෙන් නොරව. ඇයි, එය ගරු මන්ත්‍රීතුමාට එය පිළිගන්න බැරි?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ගරු සභාපතිතුමනි, මම කථා කලාට පසුව උත්තර දෙන්න කියන්න.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)
තමුන්නාන්සේ බොරු කථා කරනවිට මට නිශ්ශබ්ද වෙලා ඉන්න බැහැනේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ගරු සභාපතිතුමනි, මෙයාට මේක තේරෙනවාද කියන්න මම දන්නේ නැහැ. මටත් තේරෙන්නේ නැහැ.

මා ඉදිරිපත් කරන ඊලඟ කාරණාව මෙයයි. කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාව කොළඹ සහ විද්‍යෝදය විශ්ව විද්‍යාලවල පෞද්ගලිකව ආරම්භ කිරීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් කොළඹ විශ්ව විද්‍යාලය විරෝධය පළ කර තිබෙනවා. මේ පිළිබඳව කල්පනා නොකර පෞද්ගලික වශයෙන් කළමනාකරණ අධ්‍යාපන පාඨමාලාව — Management education — ආරම්භ කිරීමට තීරණය කිරීම සාධාරණද කියා මා ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි. එය යුක්ති සහගතද නැද්ද කියන එක ගැන මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආරක්ෂක අංශය පෞද්ගලික අංශයට භාර දී තිබෙනවා. මාදන ගැනීමට කැමතියි, ඒ පෞද්ගලික අංශ කවුද කියල. කවුද එහි ඉන්නේ? කවුද එය අධ්‍යක්ෂණය කරන්නේ? කවුද එහි කොටස් කරුවන්? කලින් පොලිසිය ඉන්න විට තම කවුද එහි ඉන්නේ කියලවත් දැන ගැනීමට පුළුවන්කම ලැබුණා. එහි ඇතුලේ පොලිසිය ඉන්නවාට අපි විරුද්ධයි. එය වෙනත් දෙයක්. නමුත් එහි පොලිසිය තිබෙද්දී ඒ ඉන්න පොලිස් නිලධාරියාගේ නම හෝ නොම්මරයක් හෝ තිබෙනවා. නමුත් දැන් මේ විශ්ව විද්‍යාලයේ ආරක්ෂක අංශයේ ඉන්න පුද්ගලයන් කවුද, ඒ අයගේ පසුබිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

මොකක්ද, ඒ අයට මාසිකව ගෙවන මුදල කොපමණද, ඒ කොම්පැණියට අපි විසින් ගෙවන මුදල කොමපමණද, ඒ කොම්පැණියේ අධ්‍යක්ෂවරු කව්ද ? යන කරුණු අපි දැන ගන්නට කැමතියි. මොකද, යම් දවසක මොකක් හරි ගැටුමක් හරි කලබයක් හරි ඇති වුණොත් එදාට බෙල්ලෙන් අල්ලා ගන්න මිනිස්සු ටිකක් ඉන්නවා. ඒ මිනිස්සු කවුද කියා අපට දැනගන්න පුළුවනි. එහෙම නැතිව රහසිගතව මේ කටයුත්ත කලොත් චෝදනාවක් එල්ල වූ අවස්ථාවකදී එය එහෙමම යටපත් වෙන්නට පුළුවනි. වැරදි වුණත් ඉස්සර නම් හිටියේ පොලීසිය. ඒක වැරදිය කියා මා කියනවා කෙළින්ම. විශ්ව විද්‍යාල භූමියක් තුළ ස්ථිර වශයෙන් පොලීසියක් පිහිටුවීම හොද නැහැ. වකවානුව අනුව තීරණයක් ගන්නවා නම් ඒක වෙනම එකක්. ඒකෙන් පාඩමක් ඉගෙනගත්තා. ලෝකයේ පළමුවන වතාවට විශ්ව විද්‍යාලයක් තුළ පොලීසියක් පිහිටෙව්වේ මේ ආණ්ඩුවයි. මීට පෙර කවදාවත් විශ්ව විද්‍යාල භූමියක් තුළ පොලිස් ස්ථානයක් පිහිටුවා නැහැ. මම ගිහින් තිබෙනවා ස්විඩන් රටේ උප්සලා සහ ලුන්ඩ් කියන විශ්ව විද්‍යාලවලට. මධ්‍ය විශ්ව විද්‍යාල වගයක් තිබුණු නිසා ඒවා තුළවත් පොලීසියක් තිබෙනවාද කියා මා සොයා බැලුවා. තිබුණේ නැහැ. මේ රටේ පමණයි ඒක කලේ. එම නිසා වූ සිද්ධිය තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. රෝහණ රත්නායක සහ පද්මසිරි අබේසේකර යන ශිෂ්‍යයන් දෙදෙනාගේ මරණය ගැන ගත් පියවර මොකක්ද ? වීරසූරිය ශිෂ්‍යයාගේ මරණය ගැන අපි යම් දෙයක් පිළිගන්නවා. වීරසූරිය ශිෂ්‍යයාගේ මරණය ගැන මෙතෙක් කල් මම නොකියපු දෙයක් වුවමනා නම් අද කියන්නම්. මම මෙතෙක් කල් එය කිව්වේ නැහැ. මම එය අද කියන්නට බලාපොරොත්තු වෙනවා. මොකද, අපි වගකීම බාර ගන්න නිසා. එද තිබුණේ වගකීම භාර ගත්තා ආණ්ඩුවක්. වීරසූරිය ශිෂ්‍යයාගේ මරණය සම්බන්ධයෙන් වූ සිද්ධිය මා හොඳින් දන්නවා. කැබිනට් මණ්ඩලයේ තීරණයට පටහැනිව යම් පුද්ගලයෙක් එද ඒක කළා. පොලීසිය එළියට ගතයුතුය කියා එද උදේ – බදාද උදේ – කැබිනට් මණ්ඩලය තීරණය කළා. දවල් වන විට විශ්ව විද්‍යාලයේ පීඨාධිපති සහ උප කුලපතිතුමාගේ ඉල්ලීම පරිදි පොලිස් නිලධාරීන් එතැනට ඇතුළු වුණා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේ එද කැබිනට් මණ්ඩලයේ හිටියද ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඔව්. පොලීසිය වහාම විශ්ව විද්‍යාලයෙන් එළියට ගන්නය කියා මමයි ඒ නියෝගය දුන්නේ. ඒ අවස්ථාවේදී අගමැතිණිය රටේ හිටියේ නැහැ. තමුත් පොලීසිය ඇතුලට ගියා. ගිහින් එළියට ආවා. පසුවද වන විට ඒ සිද්ධිය වී අවසානයි. මොනවා වුණත් ඒ වගකීම අපි භාර ගන්නවා. කොයි තරම් දුරට භාර ගත්තා ද කියනවා නම් මා ඒ අවස්ථාවේදී මැතිණියට කිව්වා මට ඉල්ලා අස් වෙන්නට වුවමනාය කියල.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)

ඇයි අස් නොවුණේ ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මට ඒකට ඉඩ දුන්නේ නැහැ. අපි ඒ තරම් දුරට ගිහින් තිබුණා. ඉල්ලා අස් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මන්ත්‍රීවරයෙක් තමයි මුදියන්සේ තෙන්නකෝන් මහත්මයා. ඒ වාගේ අපේ පක්ෂයේ ඉල්ලා අස් වන උදවිය ඉන්නවා. හැමදාම මේක බදාගෙන ඉන්නෙ නැති මිනිස්සු ටිකක් අපට ඉන්නවා. ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්මයා ඒ විධියේ තවත් එක්කෙනෙක්. ඉල්ලා අස් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මන්ත්‍රීවරයෙක්. අද වාගේ තත්ත්වයක් එද තිබුණා නම් කී දෙනෙකු ඉල්ලා අස් වේදැයි කියන එක අපට කල්පනා කරන්නට පුළුවනි. අර ශිෂ්‍යයන් දෙදෙනාගේ මරණ ගැනයි, මා සඳහන් කලේ. කෙසේ වුවත් යට ගිය දේ යට ගියාවේ. ඒ ශිෂ්‍යයන් දෙදෙනාගේ මරණ ගැන අද තත්ත්වය කුමක්ද කියන එක ගැන පැහැදිලි කිරීමක් අපි නියෝජ්‍ය ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. අපිත් ස්මාරක හදන්නද ? අපටත් ස්මාරක හදන්න ඉඩ දෙනවාද ?

**ආර්. පී. විජේසිරි මහතා**
**(திரு. ஆர். பீ. விஜேசிறி)**
(Mr. R. P. Wijesiri)

ඇයි හැදුවෙ කොල්ලුපිටියේ ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඒ ස්මාරකය හදපු දවස්වල තමුන්නාන්සෙත් ඔය පැත්තෙ හිටියෙ. ස්මාරකය විවෘත කරපු දවස්වල තමුන්නාන්සේ හිටියෙ මේ පැත්තෙ. අද ප්‍රශ්න කරනකොට තමුන්නාන්සේ ඔය පැත්තෙ ඉන්නවා.

**ආර්. පී. විජේසිරි මහතා**
**(திரு. ஆர். பீ. விஜேசிறி)**
(Mr. R. P. Wijesiri)

ස්මාරක විවෘත කරනකොටත් මම මේ පැත්තෙ. 1977 න් පස්සේ ඔය පැත්තට ආවෙ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඔව්. මට මතකයි. 1977 න් පස්සේ තමුන්නාන්සේ මේ පැත්තට ආවේ. සමා වෙන්න. මම ඒක ඉල්ලා අස්කර ගන්නවා. ඒ මරණය සිද්ධ වූ දිනවල ස්මාරකය සෑදූ කාලයේ තමුන්නාන්සේ සිටියේ අපේ පැත්තේ නොවෙයි. තමුන්නාන්සේ ඒ සෑම අවස්ථාවකදීම අනික් පැත්තේ හිටියාය කියන එක මා පිළිගන්නවා.

මා සඳහන් කළ මරණ දෙක ගැන තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ ? ඒ ගැන පැහැදිලි කිරීමක් ඕනැ. මේවා වාර්තාගත කරනවාට වැඩිය හොදයි මින් මත්තට අනාගතයේ දී එවැනි දේවල් නොවෙන්නට පියවරවල් කීපයක් ගන්නවා නම්. එහෙම නැතිව වෙන කිසි හේතුවක් නිසා නොවෙයි අපි මේ ප්‍රශ්න අහන්නේ. අපේ අතිනුත් වැරදි සිද්ධ වෙන්නට ඉඩ තිබෙනවා. නැත්තෙ නැහැ. තමුත් මේ ප්‍රශ්නය ගැන අද වන තෙක් අරගෙන තිබෙන පියවර මොකක්ද ? මේ වාගේ දෙයක් මින් මත්තට ඇති නොවේවායි අපි ප්‍රාර්ථනා කරනවා. තමුත් එවැනි දෙයක් අනාගතයේ දී ඇති නොවෙන්නට ගෙන තිබෙන පියවරවල් මොනවාද ? අන්න ඒවා ගැන ගරු ඇමතිතුමා ටිකක් සඳහන් කළොත් අපි ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, 1984 දෙසැම්බර් 9 වැනි දින "දිවයින" ඉරිද සංග්‍රහයෙහි පළ වී තිබුණු ලියවිල්ලක් මම දැක්කා. එහි මාර්තෘකාව මෙයයි :

"දුම්බර සිසුන් තේරූ හැටි පීඨාධිපතිටත් රහසක්"

මෙය ටිකක් පුදුම දෙයක්. ඉස්සර නම් මම කල්පනා කළේ ඇතුළත් කිරීමට ශිෂ්‍යයින් තෝරා ගත්තේ පීඨාධිපතීන් වැනි විශ්ව විද්‍යාලවල සිටින අයයි කියලයි. තමුත් මේ ගයිරික පේරුසිංහ මහතාගේ ලියවිල්ල අනුව බලන විට තත්ත්වය ඒක නොවෙයි. මෙය බොරු නම් මේ ගැන ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කරන්න.

ඒ ලිපියේ මෙන්න මේ විධියට සඳහන් වෙනවා :

"පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයට ඇතුළත් කර ගත්තා සිංහල සිසුන්ගේ සංඛ්‍යාව පහළ දැමීම ගැන එම සරසවියේ "කලා පීඨාධිපති" මහාචාර්ය ඒ ඇස්. කුලසූරිය මහතා විරෝධය දක්වා සිටී."

තනිකම් එක්කෙනෙක් නොවෙයි.

"මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කරුණු දක්වමින් මහාචාර්ය කුලසූරිය මහතා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ සභාපති මහාචාර්ය ස්ටැන්ලි කල්පගේ මහතා වෙත ලිපියක් එවා තිබේ."

කරුණාකර මේ ලිපිය සභාගත කරනවාද ?

"පේරාදෙණිය සරසවියට ඇතුලත් කර ගත්තා සිංහල ශිෂ්‍ය සංඛ්‍යාව අඩු කිරීම තමාගේ අති මහත් පුදුමයට හේතුවක් වූ බව දක්වන මහාචාර්යවරයා මෙයින් මතුවිය හැකි බරපතල ප්‍රතිවිපාක ගැන එය කළවුනට අවබෝධයක් නැති වුවද එය බලවත් අර්බුදයකට හේතුවී ඇති බව එම ලිපිය මගින් පෙන්වා දී තිබේ."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විශ්ව විද්‍යාලයේ අර්බුදකාරී තත්ත්වයක් පැනනැගීගෙන එන්නේ මේ ජාතිවාදී ප්‍රශ්නය මතයි.

"එම ලිපියේ මෙසේද සඳහන් වෙයි

පසුගිය වසරේ මෙම පීඨයට ඇතුලත් කර ගන්නා ලද මුලු සිසුන් ගණන 494 ක් වූ අතර, ඉන් 286 දෙනෙකු සිංහල මාධ්‍යයෙන් ද 195 දෙනෙකු දෙමළ හා 13 දෙනෙකු ඉංග්‍රීසි මාධ්‍යවලින්ද තෝරාගෙන තිබිණි. එහෙත් මේ වසරේ 407 ක් වූ මුලු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 243 දෙනකු දෙමළද, 152 දෙනකු සිංහල හා 12 දෙනකු ඉංග්‍රීසි භාෂා මාධ්‍යය සඳහා වේ.

දෙමළ මාධ්‍යයෙන් උපදෙස් දීමට හා අධ්‍යයන සටහන් සිසුන්ට ලබා දීමට තරම් හැකියාවක් දැනට පවතින ආචාර්ය මණ්ඩල මගින් ඉටු කිරීමට හැකියාවක් නොමැත."

ඔන්න එක හේතුවක් දීලා තිබෙනවා. වැඩිපුර දෙමළ ශිෂ්‍යයින් මෙයට ඇතුලත් නොකරන්න හේතුව වෙන මොකවත් නොවෙයි ; ගුරුවරුන් නැහැ. ඒ එක හේතුවක්.

"ඊට හේතුව අවශ්‍යය ප්‍රමාණයටත් වඩා අධ්‍යයන මණ්ඩල පහසුකම් යාපනය හා මඩකලපුව විශ්ව විද්‍යාලවලට ලබාදී තිබීමය.

පේරාදෙණිය කලා පීඨය විශාලත්වයෙන් මෙන්ම අධ්‍යයන මණ්ඩල හා අනෙක් පහසුකම්වලින් ප්‍රමුඛ තැන ගනී. පශ්චාත් උපාධි සුදුසුකම් සහිත ආචාර්යවරුන්ගේ සංඛ්‍යාව 100 කට අධිකය. ඔවුන් සියල්ලෝම සිංහල මාධ්‍යයෙන් කටයුතු කිරීම සඳහා සුදුනම් අයයි. මේ අනුව සිංහල සිසුන්ගේ සංඛ්‍යාව අඩු වීමත් සමග මෙම ආචාර්ය මණ්ඩලයේ සැහෙන පිරිසක් කලා පීඨයට අතිරික්තයක් වනු ඇත.

දෙමළ මාධ්‍යය සිසුන්ගේ වැඩිවීම "ආවේග" වලට හා "බෙදීම්" වලට හේතුවිය හැකි අතර"

හොඳින් මේවා සටහන් කර ගන්න.

"ඒ නිසාම සිසු අසහනයක්ද ඇති වීමට ඉඩ තිබේ. ඒ අතර අද පවතින වාතාවරණය යටතේ තවත් අර්බුදයකට එය හේතුවක් වනු ඇත. සත්‍යයමය හෝ මවා ගත් හෝ දුක් ගැනවිලි හේතුකොට ගෙන මෑත කාලයේ ඇති වූ ජාතිවාදී ආවේග හා ගැටුම් යලි සිහි කිරීම වටනේය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයය යනු "මානව ශාස්ත්‍ර" හා "සමාජ විද්‍යා" අධ්‍යයන පිළිබඳව "බුද්ධිමය මධ්‍යස්ථානයක්" හා ජාතික ආයතනයක් ලෙස ලෝකයා පිළිගෙන තිබෙන බවද තර්කයක් ලෙස පිළිගත යුතුව ඇත.

"අරාබි" හා "ඉස්ලාම්" වැනි විෂයයනට උසස්පෙළ විභාගයේදී දී ඇති ලකුණු ප්‍රමාණයක් නිසා විශේෂ උපාධි සඳහා සිසුන් තෝරා ගන්නා සමූහය (pool) සංඛ්‍යාව අතින්ද ගුණාත්මක අතින් හා විෂය ධාරා අතින්ද සීමා කරන්නට සිදුවී තිබීමද සැලකිල්ලට ගත යුතුය.

ඇතුලත් කර ගන්නා සිංහල මාධ්‍ය සිසුන් ගේ සංඛ්‍යාව අඩු කිරීම, විශ්ව විද්‍යාලය තුළ මෙන්ම ඒ අවට සිටින සිංහලයින්ගේද සිත් තැවුලකට හා කලකිරීමකට තුඩු දෙන හේතුවක් විය හැක. පේරාදෙණියේ විශ්ව විද්‍යාලය දිවයිනේ ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනයක් වන අතර, එයින් සාධාරණ කොටසක් රටේ හා ජාතියට ලැබේ යැයි සිතීම යුක්ති සහගතය.

සිංහල හා දෙමළ මාධ්‍ය සිසුන්ගේ සමබරතාවය රැක ගැනීම සඳහා නොපමාව කටයුතු කරන ලෙසද පීඨාධිපතිවරයා එම ලිපිය මගින් ඉල්ලීමක් කර තිබේ.

පේරාදෙණිය කලා පීඨයේ දෙමළ මාධ්‍ය සිසුන්ගේ ප්‍රශ්නය පිළිබඳ ප්‍රවෘත්තිය 'දිවයින' ඉරිද සංග්‍රහයේ පළ වූයේ 25.11.84 දය. එහෙත් මහාචාර්ය කුලසූරිය මහතා විසින් මෙම ලිපිය ප්‍රතිපාදන කොමිසම වෙත යවා තිබෙන්නේ 19.11.84 දිනයද සහිතවය.

මම අහන ප්‍රශ්නය මේකයි: ඒ ප්‍රවෘත්තිය ඇත්තක්ද ? එහෙම නම් කවුද, මේක වෙනස් කලේ ? කවුද, ඒ වගකීම භාර ගන්නේ ? අන්තිමේදී මේ ප්‍රශ්නයත් යයි, දැනටමත් ප්‍රශ්න නිසා ඔළුව කැක්කුම හැදී තිබෙන ජනාධිපතිතුමාටම. එතුමාටම කියයි, මේ ප්‍රශ්නයත් විසඳන්නය කියා. මට පෙනෙන හැටියට මේ හැම ප්‍රශ්නයක්ම දමන්නේ එතැනටයි. ඒ මොකද කීවොත් පල්ලෙහා මට්ටමේ ඉන්න අයට ස්ථිර තීරණයක් ගන්න බැරිකම නිසයි. ඒක දුර්වලකමක් හැටියට සලකන්න ඕනෑ. එතුමාට පල්ලෙහායින් ඉන්න නිලධාරීන්ට පුළුවන්කම තිබෙන්න ඕනෑ, මේ ගැන තීරණයක් ගන්න. නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමාට භාර වී තිබෙනවා නම් මේ ගරු සභාවට ඇවිත් මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න. මේ වගකීමත් එතුමා භාර ගන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ වගකීම භාර ගන්න පුළුවන් කෙනෙක් මේක භාර ගන්න ඕනෑ. මෙතැන පොලිසි — ප්‍රතිපත්ති — ප්‍රශ්නයක් නැහැ. මෙතැන තිබෙන්නේ තේරීමක් පමණයි. සිංහල ශිෂ්‍යයන් කී දෙනෙක් ගන්නවාද, දෙමළ ශිෂ්‍යයන් කී දෙනෙක් ගන්නවාද, මුස්ලිම් ශිෂ්‍යයන් කී දෙනෙක් ගන්නවාද කියන ප්‍රතිපත්තිමය තීරණයක් නොවෙයි, මෙතැනදී ගන්න තිබෙන්නේ. දැනටමත් ඒ ප්‍රතිපත්තිය — පොලිසි එක — තීරණය කරල ඉවරයි. ජන අනුපාතය අනුව තෝරා ගන්නවාද-නැද්ද කියන එක පිළිබඳව දැනටමත් තීරණයක් ගෙන අවසානයි. පේරාදෙණිය විශ්ව විද්‍යාලය සම්බන්ධයෙනුත් ඒ තීරණය ගෙන අවසානයි. යාපනය ගැනත් අවසානයි, මඩකලපුව ගැනත් අවසානයි, රුහුණ ගැනත් අවසානයි, දුම්බර ගැනත් අවසානයි, කොළඹ ගැනත් අවසානයි. සමහර විට හැම විශ්ව විද්‍යාලයක් ගැනම අවසාන තීරණයක් ගෙන තිබෙනවා වෙන්න පුළුවනි. එහෙම නැත්නම් ඒ තීරණය අවුරුද්දෙන් අවුරුද්ද වෙනස් වෙනවාද ? ඒකත් දැනගන්න අපි කැමැතියි. ශිෂ්‍යයන් ඇතුලත් කිරීමේ ප්‍රශ්නය ගැන ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තාම ඒ තීරණය දිගටම ක්‍රියාත්මක කරගෙන යන්න ඕනෑ. එහෙම නැතිව එය අවුරුද්දෙන් අවුරුද්ද වෙනස් කරනවා නම් ඒ බව අපට කියන්න ඕනෑ. 'මේ අවුරුද්දේ ඒ ප්‍රතිපත්තිය වෙනස් වුණා, ඒ නිසයි, මේ ශිෂ්‍ය සංඛ්‍යාව පහළ වැටුණේ' කියා අපට කියන්න ඕනෑ. එහෙම නම් ඒ ප්‍රතිපත්ති තීරණය — වෙනස් කිරීමේ තීරණය — ගත්තේ ජනාධිපති උතුමාණන්ට කියලද ? හැම කුණු කන්දලයක්ම බේරුවල් බොක්කට දමනවා වාගේ මේකත් ජනාධිපතිතුමාගේ උකුලට දමල බේරෙන්න ! ස්තුතියි.

අ.භා. 9.30

**රොහාන් අබේගුණසේකර මහතා (හඟුරන්කෙත)**
**(திரு. ரோஹான் அபேகுணசேகர — ஹங்குரன்கெத்த)**
**(Mr. Rohan Abeygunasekera–Hanguranketa)**

සභාපතිතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මේ අවස්ථාවේදී මාත් වචන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනවා. මා මුලින්ම, උසස් අධ්‍යාපන ඇමති අතිගරු ජනාධිපතිතුමාටත්, නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. සමස්තයක් වශයෙන් ගත් විට උසස් අධ්‍යාපන ආයතන වෙනුවෙන්, පසුගිය වර්ෂ කීපය තුළම අයවැය ලේඛනයෙන් වැඩිපුර මුදලක් වෙන් කරවා ගැනීමට සමත්වීම ගැන. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට වඩා වේගයකින් අපේ රජය උසස් අධ්‍යාපනය සඳහා සම්පත් ලබා දී තිබෙනවායයි මට හිතෙනවා.

සති දෙකකට පමණ කලින් මට ආරංචියක් ලැබුණා, විදේශ ආධාර ඇතිව කාර්මික විද්‍යාල පිළිබඳවත් අවුරුදු ගණනාවක් සඳහා සංවර්ධන සැලසුම් සූදානම් කර තිබෙනවාය කියා.

1970–77 කාලයේදී උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් එක්තරා විධියක පසුබෑමක් ලැබුවායයි මට හිතෙනවා. ඊට මූලික හේතුව උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් තරමින් සම්පත් වෙන් කරන්න ඒ රජයට බැරිවීමයි. 1970 — 1977 කාලයේදී ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වුණත්, මා දන්නා හැටියට 1960 ගණන්වලදී සැලසුම් කළ විධියටයි, එහි අධ්‍යාපනය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණේ. එම නිසා ඒ වකවානුවේදී විශ්ව විද්‍යාලවලට ඇතුලත් වුණු ශිෂ්‍ය පරම්පරාව එක්තරා විධියකින් අවාසනාවන්තය කියා මම හිතනවා. කෙසේ වුණත් — අයවැය සකස් කිරීමේ නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ පාන්න සිදු වුණත් — 1977 න් පසුව විශ්ව විද්‍යාලවලට ඇතුලත් වූ ශිෂ්‍යයන්ගේ අභිවෘද්ධිය සඳහා විශාල මුදල් ස්කන්ධයක් වෙන් කර දෙන්නට අපේ රජයට පුළුවන්කම ලැබී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අද අප ඉගෙන ගත් එක්තරා කාරණයක් ගැනත් අපේ ගරු ජනාධිපතිතුමන්ට මම විශේෂයෙන් ස්තුති වන්න වෙනවා, අපේ අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඒ ගැන ස්තුතිවන්ත නොවුණත්. ඒ තමයි, 1985 සිට ක්‍රියාත්මක කරන්නට සූදානම් කර ඇති අලුත් ප්‍රදාන ක්‍රමය නැතිනම් සහන ක්‍රමය. 1960 ගණන්වලදීද මෙය ක්‍රියාත්මක වුණත්, අප විශ්ව විද්‍යාලවලට යන අවස්ථාවලදී නම් අපට වියදම්. පිරිමසා ගන්නට සිදු වුණේ ඉතාම අමාරුවෙන්. ඒ කාලයේදී අපේ අත්තනගල්ලේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ කවුරුවත් සිතුවේවත් නැහැ, මෙවැනි මහපොළ ශිෂ්‍යත්වයක් ගැන. දැන් මෙම මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් පමණක් නොවෙයි, සෑම ශිෂ්‍යයකුටම තමන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යද්දී බාහිර ප්‍රශ්නවලට තමන්ගේ අවධානය යොමු නොකර තමන්ගේ අධ්‍යාපන කටයුතු නොකඩවා කර ගෙන යන්නට හැකි වන පරිදි, ශිෂ්‍යයන්ට කෙළින්ම මුදලක් ප්‍රදානය කිරීමට ගරු ජනාධිපතිතුමා මුදල් වෙන් කර තිබීම අපේ රටේ මුළු මහත් ශිෂ්‍ය පරම්පරාවටම කරන ලද විශාල උපහාරයක් හැටියට සලකන්නට ඕනෑ. ඒ ගැන අප හැම දෙනාම ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රොහාන් අබේගුණසේකර මහතා]

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ රටේ කලා උපාධිධාරීන් ඉදිරිපත් කරන කාරණයක් ගැන සඳහන් කළ යුතුව තිබෙනවා. උපාධිය ලබා ගත්තාට පසුව කලා උපාධිධාරීන්ට රැකියාවක් ලැබෙන්නෙත් නැහැ. අවුරුදු ගණනාවකට පසුව රැකියාවක් ලබා ගන්නට පුළුවන්කමක් ලැබුණත් රැකියාව ලැබුණු වහාම ලබාගත් බැංකු ණය ආපසු ගෙවන්නට සිදු වන අතර එයත් සිදු වෙන්නේ ලබා ගත් මුදල සහ ඊට පොලියත් සමගයි. පොලියත් සමග ආපසු ණය ගෙවන විට ඔවුන්ගේ පඩියෙන් එදිනෙද වියදමට ඉතිරි වන්නේ ඉතාමත් සුළු ප්‍රමාණයක් පමණයි. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මේ කාරණය ගැන හොඳින එසේ කථා කිරීම ගැන මම කණගාටු වෙනවා. අතිගරු ජනාධිපතිතුමා මේ අළුත් ක්‍රමය යටතේ කෙලින්ම දෙන ප්‍රදානයක් එය. මීට කලින් තිබුණු ණය ක්‍රමයත් මේ ප්‍රදානයත් අතර තිබෙන වෙනස වටහා ගන්නට බැරි වෙලා තිබෙන්නේ ඒ කාරණය නිසයි. එම නිසා, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදීත් ඒ ගැන වැඩිදුර විස්තර අපිට ලබා ගැනීමට හැකිවේවි. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ ණය ක්‍රමය සම්බන්ධව කෙටුම්පතකුත් මීට මාස ගණනකට උඩදී මේ ගරු සභාවට ඉදිරිපත් වුණා මට මතකයි. ඒ ක්‍රමයට බාහිරවයි දැන් මේ අළුත් ක්‍රමය ක්‍රියාත්මක කරන්නට යන්නේ. එවැනි ක්‍රමයක් මේ රටේ ක්‍රියාත්මක වෙනවා නම් ඒ විධියට හැම විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකුටම, ශිෂ්‍යාවකටම ප්‍රදානයක් ලබා දීමේ ක්‍රමයක් වෙන කිසිම රටක ඇති වෙලා නැහැ. අපේ රටෙ මෙන් දහස් ගුණයක් ධනය ඇති රටවල් බටහිර ලෝකයේ තිබෙනවා. ඒ රටවල පවා මේ විධියේ ප්‍රදාන ක්‍රමයක් සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම බලපාන විධියට ක්‍රියාත්මක වී නැහැ.

ගරු කථානායකතුමනි, විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් විටින්විට මතු කරන ප්‍රශ්නයක් ගැන වචන කීපයක් කියන්නට ඕනෑ. විශ්ව විද්‍යාලවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ ක්‍රම පිළිබඳව කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ වාර්තාව පිට වෙලා තිබෙනවා. රජය එම කමිටුවේ නිර්දේශ සම්පූර්ණයෙන්ම පිළිගෙන තිබෙනවාදැයි මම දන්නේ නැහැ. ඒවා සංශෝධනය කරනවාද එසේ නැත්නම් ඒවා කවද ක්‍රියාත්මක කරනවාද කියන එක ගැනත් සම්පූර්ණ විස්තර මම දන්නේ නැහැ. විශ්ව විද්‍යාල ප්‍රවේශය පිළිබඳව පත් කළ කමිටුව කාලයක් තිස්සේ විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කළ ගැටළුවලට පිළිතුරු වශයෙන් තමයි මේ නිර්දේශ ඉදිරිපත් කර තිබෙන්නේ. විශ්ව විද්‍යාලවල ආචාර්යවරු කීප දෙනෙක්ම, අපේ සංස්ථා, බැංකු ආදියේ ප්‍රධානීන් කීපදෙනෙක්ම අපේ උපාධිධාරීන් පිළිබඳව විශේෂයෙන් උපාධි තත්ත්වය ගැන නොයෙකුත් අදහස් ප්‍රකාශ කර තිබුණා මට මතකයි. මේ උපාධි වඩාත් දියුණු තත්ත්වයකට ගෙන ඒම මේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ එක් අරමුණක් වන්නට ඇති. මම ඒ ගැන සඳහන් කරන්න යන්නේ නැහැ. විශ්ව විද්‍යාල දෘෂ්ටි කෝණයෙන් බලනවා නම් මේ නිර්දේශ කවුරුත් ඉතාමත් සන්තෝෂයෙන් පිළිගනීවිය කියා මම හිතනවා. නමුත් විශේෂයෙන්, පිටිසර පළාත්වල මන්ත්‍රීවරුන් වශයෙන් මේ නිර්දේශ දෙස බලන විට සමහර විට අපට සැකයක් පහළ වෙනවා. මේ නිර්දේශ නිසා, විශ්ව විද්‍යාල අධ්‍යාපනයේත් රජයේ පරමාර්ථවලත් තිබෙන මූල්‍ය පරමාර්ථයක් වන සමාජයේ සමානාත්මතාව හා යුක්ති ධර්මයට යම්කිසි හානියක් මෙයින් සිද්ධ වේදෝ යන සැකයක් පහළ වෙනවා. මම එසේ ප්‍රකාශ කරන්නේ කාරණා දෙකක් නිසයි. එකක් නම්, දැනට විශ්ව විද්‍යාල ප්‍රවේශයට බලපාන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵලවලට අමතරව තවත් විභාගයකුත් පැවැත්වීමට නිර්දේශ කර තිබෙනවා. ඒ අදහස ඉතාමත් හොඳ එකක්. ඒක අපි පිළිගන්නවා. නමුත් ඒ සමඟම එක කාරණයක් ගැන මතක් කළ යුතුයි. නොයෙක් විධියේ ප්‍රවීණතා පරීක්ෂණ තිබෙන අවස්ථාවලදී එම පරීක්ෂණවලට ශිෂ්‍යයන්ගේ සූදානම් වීමක් තිබෙනවා. ඒ සඳහා ඉගෙන ගන්නවා. සමහර විට ඒ සඳහා පැවැත්වෙන ටියුෂන් පන්තිවලටත් ඒ අය යනවා. තමුන්නාන්සේලා දන්නවා, දැනටත් සී.ඒ.එස්., සී.ඕ.එස් වගේ විභාගවලදීත් නොයෙකුත් දෙනා පන්ති පවත්වා ඒ විභාගවලට අපේක්ෂකයන් පුහුණු කරවනවා. ඇමෙරිකාවේ විශ්ව විද්‍යාලවලට ඇතුළුවන්නට නම් සී.ආර්.ඊ., ටෝෆුල් වැනි විභාගවලට පෙනී සිටින්නට සිද්ධ වෙනවා. ඒ සඳහා සූදානම් වන උදවිය නොයෙකුත් විධියේ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියා සූදානමක් වෙනවා. මේ විධියට බලන විට අපිට හිතන්නට පුළුවන්, විශ්ව විද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා විශේෂ විභාගයකුත් පැවැත්වෙනවා නම් ඒ විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයට ඒ විධියේ අමතර පුහුණුවක් ලබා ගන්නට අවස්ථාවකුත් සමහර ශිෂ්‍යයන්ට ලැබෙනු ඇත කියා. සමහර ශිෂ්‍යයන්ට එසේ පුහුණුවීමේ අවස්ථාව නොලැබීත් යාවි. මේක විශේෂයෙන් බලපාන්නේ පිටිසර ගම්බද පළාත්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් කෙරෙහියි. ගම්බද පළාත්වල ඉන්න ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පවා නගරබදට එන්නට පුළුවන්කමක් තිබෙනවා නම් නගරයේ තිබෙන ටියුෂන් පන්ති ආදියට ඇදී එනවා. මගේ මැතිවරණ කොට්ඨාශයේ දුර බැහැර ප්‍රදේශවල ඉන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙක් හැතැප්ම 25 ක් 30 ක් ගමන් කර සති අන්තයේ දවල් කෑමවේලත් ඔතාගෙන නැත්නම් කෑම ගන්න වුවමනා සල්ලිත් අරගෙන මහනුවරට එනවා ටියුෂන් පන්තිවලට ගිහින් ඉගෙන ගන්න. ඒකත් කරන්නට පුළුවන් වන්නේ ඒ සඳහා හැකියාවක් තිබෙන අයට පමණයි. ඒ අයට සමහර විට මේ විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයටත් පෙනී සිටීමට පුහුණුවක් ලබා ගන්නට පුළුවන් වෙයි. ඒ සඳහා හැකියාවක් නැති අයට ඒක කරන්නටත් බැරි වෙයි.

ගරු සභාපතිතුමනි, එම්.සී.කියු කියන වර්ගයේ ප්‍රශ්න පත්‍රවල නොයෙකුත් අඩුපාඩුකම් තිබෙන බවට නොයෙක් දෙනා චෝදනා කරනවා. විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වෙනම විභාගයක් පැවැත්වීමේ හොඳ පැත්තක් තිබෙනවා වගේම එහි දුර්වලකම් කීපයකුත් තිබෙන නිසා විශ්ව විද්‍යාලවල ප්‍රවේශයට නැවත විභාගයක් පවත්වනවා නම් එය කොයි කාටත් සාධාරණ වන අන්දමින් පවත්වන ලෙස මම ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම් මම අර මුලින් කිව්වා වගේ රජයේ එක පරමාර්ථයක් වන සමාජ යුක්තිය කියන මූලධර්මය අපට අත්පත් කර ගන්නට බැරිව යනවා.

ඒ වාගේම ජාතික මට්ටමේ ප්‍රවීණතා, දක්ෂකම් දක්වා තිබෙන ශිෂ්‍යයන්ට වෙනමම විශ්ව විද්‍යාලයට ඇතුළත්වීමේ වරප්‍රසාදයක් ලබා දිය යුතුයි කියන නිර්දේශයත් එම නිර්දේශ අතර තිබෙනවා මම දැක්කා. එයත් ඉතාමත්ම හොඳ අදහසක්. එක් දහස් නවසිය පණස් ගණන්වල ඇති කළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඇත්ත වශයෙන්ම කවුරුවත් ප්‍රයෝජනයට ගන්නේ නැති ක්‍රීඩා පහසුකම් වැනි නොයෙකුත් පහසුකම් තිබෙන බව අපි දන්නවා. පාසල්වලදී ක්‍රීඩා කර තිබෙන අයට, නොයෙකුත් කලාවන්ට සහභාගී වී තිබෙන අයට මේ විශ්ව විද්‍යාලයට ගියාම ඇත්තම කියනවා නම් ඒ සම්පත්වලින් පුදුම විධියේ ප්‍රයෝජනයක් ගන්නට පුළුවන් තත්ත්වයක්, වාතාවරණයක් තිබෙනවා. නමුත් ඒ කාරණයේදීත් අපි විකක් ප්‍රවේශම් වන්න ඕනෑ. අපට සම්පූර්ණයෙන්ම මේ යෝජනාව පිළිගන්න පුළුවන්. මම මේ යෝජනාව පිළිගන්නවාට අකැමැති නැහැ. නමුත් මම හිතනවා එය කෙලින්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පිළිතුරු සපයන්නට පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි කියා. ඇත්ත වශයෙන්ම එය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ප්‍රශ්නයක්. අපි මේ වාගේ ක්‍රමයක් සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කරන්නට අදහස් කරනවා නම් උසස් පෙළ පන්ති තිබෙන අපේ ගම්බද පාසල්වලට නැති පහසුකම් අපි හැකි ඉක්මනින් ලබා දෙන්න ඕනෑ.

මම එක උදාහරණයක් ගන්නම්. අද අපේ රටේ ජාත්‍යන්තර මට්ටමින් ප්‍රසිද්ධියට පත් වී තිබෙන ක්‍රීඩාවක් තමයි ක්‍රිකට් ක්‍රීඩාව. එහෙම නැත්නම් පසුගිය දවස්වල නගරබද පාසල් සෑම එකකම වාගේ ව්‍යාප්ත වී ගිය බටහිර ක්‍රීඩා තිබුණා. පාපන්දු, රගර්, හොකී ආදී වශයෙන් අද නගරබද පාසල්වලට පොදුවේ සහභාගී වන්නට පුළුවන් ක්‍රීඩා රාශියක් තිබෙනවා. මගේ ආසනය ගත්තොත් එය වර්ග සැතපුම් එකසිය ගණනක විශාලත්වයක් තිබෙනවා. නමුත් අද අපට මේ ජාත්‍යන්තර මට්ටමේ හෝ ජාතික මට්ටමේ ක්‍රීඩාවක් කරන්නට තත්ත්වයක් නැහැ. සංගීතය හා වෙනත් කලාවක් ගැන කථා කළත් අද එවැනි තත්ත්වයකුයි තිබෙන්නේ. අපේ ශිෂ්‍යයින්ට හැකියාව තිබුණත් ඒ අංශවලින් සහභාගී වීමට තිබෙන අවස්ථාවන් ඇත්ත වශයෙන් ඉතාමත් දුර්ලභයි. ගරු සභාපතිතුමනි, එම නිසා මේ යෝජනාව ඉතාමත්ම හොඳ වුණත් වැඩි දෙනෙකුට එයින් සෙතක් සැලසෙන්නට නම් අපේ පාසල් සියල්ලකටම පොදුවේ බුක්තිවිඳින්නට පුළුවන් ඒ අවස්ථාවන් මුලින්ම ලබා දෙන්නට ඕනෑ.

ක්‍රීඩාවත් කරන්නට නම් ක්‍රීඩාගාර නැත්නම් පිට්ටනි මුලින්ම සකස් කර ගන්නට ඕනෑ. සංගීතය උගන්වනවා නම් එය ඉහළම මට්ටමේ ගුරුවරුන් මාර්ගයෙන් උගන්වන්නට ඕනෑ. අද අපේ ආසනවල තිබෙන පාසල්වල සංගීත ගුරුවරුන් ඉතාමත්ම ස්වල්ප දෙනයි ඉන්නේ. එය ගරු අධ්‍යාපන ඇමතිතුමාට කරන චෝදනාවක් වශයෙන් නොවෙයි මම ඉදිරිපත් කරන්නේ. එතුමා සංගීත ගුරුවරුන් බඳවා ගන්නට අදහස් කළ බව මම දන්නවා. නමුත් සංගීත ගුරුවරුන් වශයෙන් බඳවා ගන්නට සුදුසුකම් ලැබුවන් ඇති තරම් සිටියේ නැහැ. මූලික වශයෙන් කරන්නට තිබෙන මෙවැනි සමහර කරුණු ඉටු කරන්නේ නැතිව ඇත්ත වශයෙන්ම අපට මේ යෝජනා සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන්නට බැරි වෙයි කියා මම හිතනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, මම තවත් කාරණයක් මතක් කරන්නට ඕනෑ. විශ්ව විද්‍යාලවල දැනටත් තිබෙන, කාලයක් තිස්සේ පැවතීගෙන එන ප්‍රශ්නයක් තමයි මේ විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලවල තිබෙන අඩුපාඩුකම්. මම හිතනවා විශ්ව විද්‍යාලවල සිටින ගුරුවරුන්ගේ ආදායම් තත්ත්වය වැඩිකිරීමේ ක්‍රමයක් ගැන මම නැවත වතාවක් මේ අවස්ථාවේදී ඉල්ලීමෙන් එතරම් ප්‍රතිඵලයක් නොලැබෙය කියා. නමුත් අපි සැම වේලේම මතක තබාගතයුතු දෙයක් තමයි ලෝකයේ සැම තැනකම වාගේ විශ්ව විද්‍යාල ගුරුවරුන්ට ලැබෙන ආදායම පඩිය. ඉතාමත්ම අඩු බව. මේ අඩු පඩිය සමහර විට යුක්ති සහගතය කියා අපට කියන්න පුළුවන් මේ අය ඉගැන්වීමේ යෙදී සිටින නිසාත්, ඔවුන් ව්‍යාපාරික කටයුතුවල යෙදෙන්නේ නැති නිසාත්. නමුත් විශ්ව විද්‍යාලවලටත් සමහර අයට ව්‍යාපාරික කටයුතුවල යෙදෙන්න පුළුවන්. සමහර අයට බැහැ. සමහර අයට පුළුවන් විශ්ව විද්‍යාලයෙන් අස්වෙලා වෙනත් අංශවලට යන්න, වෙනත් ව්‍යාපාරවලට බැදෙන්න, එහෙම නැත්නම් පිටරටවලට යන්න.

ගරු සභාපතිතුමනි, කෙසේ වෙතත් මේ ප්‍රශ්නය දිගින් දිගටම අපේ විශ්ව විද්‍යාලවලට බලපානවා. මේ ආචාර්යවරුන්ගේ පඩිනඩි ප්‍රශ්නය. විශේෂයෙන්ම අපි දන්නා කාරණයක් තමයි වෛද්‍ය අංශයටත්, ඉංජිනේරු අංශයටත් එය බලපෑ බව. නමුත් අද ඒ අංශවලට පමණක් නොවෙයි විශ්ව විද්‍යාලයේ සැම අංශයකටම එය බලපා තිබෙනවා. හොඳ පළපුරුද්දක් තිබෙන, පශ්චාත් උපාධි ලබා අන්තර් ජාතික වශයෙන් පිළිගැනීමක් තිබෙන ගුරුවරුන් අපේ විශ්ව විද්‍යාලවල වැඩි කල් නතරවී ඉන්නෙ නැහැ. ඒ හැමෝම බලන්නේ විශ්ව විද්‍යාලයෙන් අස්වී වැඩි ආදායමක් ලබන තැනකට යන්නයි. මේ තත්ත්වය අපේ විශ්ව විද්‍යාල උපාධිවලටත් තදින් බලපානවා. මේ ප්‍රශ්නයේදී අපේ සිත සාමාන්‍යයෙන් යොමුවන්නේ වෛද්‍ය පීඨවලටත්. ඉංජිනේරු පීඨවලටත් පමණයි. මම හිතනවා පටන්ගැන්මක් වශයෙන්වත් අපේ වෛද්‍ය පීඨවලටත්, ඉංජිනේරු පීඨවලටත් ආචාර්යවරුන් බඳවාගැනීමේ දී ඒ අචාර්යවරුන් බලාපොරොත්තුවෙන පඩිනඩි ගෙවන්න බැරි නම්, එක්තරා සීමිත කාලයකටවත් කොන්ත්‍රාත් ක්‍රමයක් යටතේ හෝ නැත්නම් ගිවිසුමක් යටතේ හෝ ඔවුන් බඳවාගන්නට කටයුතු කරන්නට ඕනෑ කියා. අපි දන්නවා පිටරට විශ්ව විද්‍යාල අපේ විශ්වවිද්‍යාල හා සම්බන්ධකම් පවත්වමින් විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හුවමාරු කරගන්නා බව. ඒ යටතේ හෝ යම් ගිවිසුමක් මාර්ගයෙන්වත් දැනට අපේ ආචාර්ය මණ්ඩලවල තිබෙන අඩුපාඩුකම පුළුවන් තරම් දුරට පිරිමසා ගැනීමට ක්‍රමයක් අපි ඇති කරන්නට ඕනෑ. එහෙම නැත්නම් අපේ විශ්ව විද්‍යාලවල තිබෙන ඒ උපාධිවල තත්ත්වය එන්ට එන්ටම දුර්වල තත්ත්වයකට වැටෙනවා.

මම මේ අවස්ථාවේදී තවත් කාරණයක් මතක් කළ යුතුයි. ඒ තමයි, පසුගිය අවුරුදු දෙක තුළදී විටින් විටම මතුවී අවුත් මේ ගරු සභාවේදීත් තර්කවලට, විවාදවලට හේතුවුණු කාරණයක් වන ශිෂ්‍යයින්ගේ අසහනය. මේ කාරණය ගැන කථා කරන විට අපි එක විධියකින් කණගාටුවෙන්නට ඕනෑ. ඒ මන්ද, ගිය වතාවේ විශ්ව විද්‍යාල වරම ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 30,000 ක් වුවත් ඒ ගණනින් විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගනු ලැබුවේ පන්දහස් ගණනක් පමණයි, ඒ ඇතුළත් වූ සංඛ්‍යාව ඉතාමත්ම වාසනාවන්ත පිරිසක්. ඒ වාගේම අතික් අතින් බැලුවාම අපි කියන්නට ඕනෑ ඒ අය විශේෂ වරප්‍රසාදයක් ලැබූ පිරිසක්ය කියා. එහෙම වාසනාවක් හා වරප්‍රසාදයක් ලබා සිටින පිරිස විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබද්දී නොයෙකුත් අවස්ථා වලදී යම් යම් හේතුන් නිසා එය කඩාකප්පල් වෙනවා නම් මම හිතනවා ඒක ඉතාමත්ම කණගාටුදායක සිද්ධියක්ය කියා. මේ තත්ත්වයට නොයෙක් දෙනා නොයෙක් හේතු ඉදිරිපත් කරන්නට පුළුවන්. නමුත් මම හිතනවා ඔය දෙන හේතු ගැන. ඔය කරන විග්‍රහයන් ගැන, අප සියලු දෙනා අතර එකඟතාවයක් නැති බව. නමුත් එක කාරණයක් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සතුටුයි. ඒ තමයි විශ්ව විද්‍යාල ශිෂ්‍යයනුත්, ආචාර්ය මණ්ඩලත් අතර තිබෙන සම්බන්ධය. ඒ සම්බන්ධය දැනට වඩා සමීප එකක් කරන්නට අපි යම්කිසි වැඩපිළිවෙළක් යොදන්නට ඕනෑ. මම හිතනවා, දැනට වුවත් ශිෂ්‍ය උපදේශකයන් වශයෙන් කටයුතු කරන පිරිසක් සිටිනවා කියා. මම හිතනවා ඒ අයට යම් විශේෂ ගෙවීමකුත් කරනවා කියා.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය නිර්මාණය කරන අවස්ථාවේදී විශ්ව විද්‍යාල ගුරුවරුන්ට විශ්ව විද්‍යාලය තුළම නේවාසික පහසුකම් ලබා දුන්නා. මම හිතනවා එහෙම ලබා දුන්නේ එවිට ශිෂ්‍යයනුත් ආචාර්ය මණ්ඩලයත් ඉතාමත් කිට්ටු සම්බන්ධයක් ඇති කර ගනීවි කියලයි. මම දන්න තරමට නම් එහෙම සම්බන්ධයක් දැනට නම් නැහැ. එහෙම සම්බන්ධයක් තිබුණා නම් අපට විශ්ව විද්‍යාලවල නොයෙක් ප්‍රශ්න ඇති නොවෙන්න තිබුණා.

සාමාන්‍යයෙන් පාසල්වල ශිෂ්‍යයන් දෙමව්පියන් සමග ගුරුවරුන් සමග සම්බන්ධකම් ඇති කරගෙන සම්බන්ධකම් පවත්වා තම පාසල් දිවිය ගෙවන අවස්ථාවේදී ඒ අය නොමග යනවා නම් හරි මාර්ගයේ යොමු කරවීමට ඒ දෙමව්පිය ගුරුවරුන්ට පුළුවන්කම තිබෙනවා. එහෙම වාතාවරණයක් තුළ සිටි ශිෂ්‍යයන් විශ්ව විද්‍යාලයට පැමිණි විගසම එතෙක් ඔවුනට නොතිබුණ නිදහසක් ඔවුන්ට ලැබෙනවා. එවැනි අවස්ථාවලදී ඔවුන් නොමගට යොමු වීම පුදුමයක් නොවෙයි. එහෙමනම් විශ්ව විද්‍යාලවල යම්කිසි උපදේශක ක්‍රමයක් තිබෙන්න ඕනෑ එවැනි ප්‍රශ්නවලදී ක්‍රියාත්මක වෙන්න. සමහර විට ශිෂ්‍යයන්ගේ පෞද්ගලික ප්‍රශ්න වෙන්න පුළුවන්. පෞද්ගලික ප්‍රශ්න පිළිබඳව වුණත් ගිහින් මුළු ආචාර්ය මණ්ඩලය සමගම හෝ කථා කර සහනයක් ලබාගන්න පුළුවන්කම තිබෙනවා. අවවාද ලබා ගන්න පුළුවන්කම තිබෙනවා.

අද තිබෙන උපදේශක ක්‍රමය මම හිතන්නේ ඒ අරමුණ ඇතිවයි ඇති කර තිබෙන්නෙ. නමුත් එය ක්‍රියාත්මක වීමේදී අප බලාපොරොත්තු වන කාර්‍ය්‍ය ඉටු වෙනවාද කියන එක සැක සහිතයි. එම නිසා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට අවවාද දෙන්න පුළුවන් විධියේ උපදේශක ක්‍රමයක් සැම විශ්ව විද්‍යාලයකටම ලබා දීමෙන් මම කල්පනා කරනවා අද මේ ශිෂ්‍යයන් අතර තිබෙන නොයෙකුත් ප්‍රශ්න බොහෝ දුරට අඩු කරගන්න පුළුවන් වේවි කියා. හදිසියේ යම් යම් ක්‍රියා පිළිවෙලවල් අනුගමනය කරන්නට පෙළඹෙන අවස්ථාවලදී පවා ඒ ආචාර්ය මණ්ඩලයට පුළුවන් වෙනවා ඒ ශිෂ්‍යයන් යම් ආකාරයකින් මෙහෙයවන්න.

මේ අවුරුද්දේත් පසුගිය 1983 අවුරුද්දේත් විශ්ව විද්‍යාලයේ ඇති වුණ යම් යම් කලබලකාරී තත්ත්වයන් දෙස බලන විට අපට සැහෙන්න බැහැ විශ්ව විද්‍යාලවල තිබෙන ආරක්ෂක විධිවිධාන ගැන. මේ අවස්ථාවේදී අපට මතක් වෙනවා පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ පීඨාධිපතිතුමන් පැහැරගෙන ගිය ආකාරය. අපට මතක් වෙනවා ඔහුට කළ තාඩන පීඩන. අපට මතක් වෙනවා ඔහුට කළ අපහාස උපහාස. නමුත් මම හිතනවා ඉදිරියට වුණත් එවැනි සිදුවීම් යළිත් විශ්ව විද්‍යාලවල ඇති වීම වළක්වන්නට අපි අරගෙන තිබෙන පියවර තවමත් මදි බව.

ශිෂ්‍යයන් අතර වුණත් අරගල ඇති වෙනවා. දේශපාලන වශයෙන් එහෙම නැත්නම් වෙනත් නොයෙක් ප්‍රශ්න මත යම් යම් ගැටුම් ශිෂ්‍යයන් අතර ඇති වෙන්න පුළුවන්. අපි දන්නවා විශ්ව විද්‍යාලවල තිබෙන මූලිකම ප්‍රශ්නයක් තමයි මෙවැනි අවස්ථාවලදී රටේ සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන විශ්ව විද්‍යාල තුළ ක්‍රියාත්මක කිරීමට ඉඩ නොතිබීම.

පසුගිය දවසක පුවත්පතක මම කියෙව්වා, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ—මම හිතන්නේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඒ ගැනයි, සඳහන් කළේ—අලුත් ආරක්ෂක ක්‍රමයක් යොදවා තිබුණාය ඒකත් කඩාකප්පල් වුණාය කියන ප්‍රවෘත්තිය. මොන හේතුවක් නිසාද කියා දන්නෙ නැහැ. ඒකෙන් අදහස් වන්නේ පැහැදිලි වන්නේ ආරක්ෂාව තද කිරීම සඳහා විශ්ව විද්‍යාල යම් පියවරක් දැනට අරගෙන තිබෙනවා නම එය සාර්ථක වශයෙන් ක්‍රියාත්මක වී නැහැ කියන එකයි. නීතිගරුක අවංක නිදහසේ කථා කරන නිදහසේ සිටින විශ්ව විද්‍යාල ගුරුවරුන්ටත් ශිෂ්‍යයන්ටත් අත්‍යවශ්‍ය දෙයක් තමයි., විශ්ව විද්‍යාල තුළ ඔවුන්ට ලැබෙන ආරක්ෂාව. මෙය අද විශ්ව විද්‍යාල බලධාරීන් ප්‍රමුඛත්වය දී කටයුතු කරන්න ඕනෑ කාරණයක්. මෙය ආචාර්යවරුන්ට ශිෂ්‍යයන්ට පමණක් නොව මම හිතනවා විශ්ව විද්‍යාලවල තිබෙන දේපලවලට පවා ඉතාම තදින් බලපාන කරුණක් කියා.

මම පසුගිය වතාවෙත් මතක් කළ කාරණයක් නැවතත් මතක් කරන්න කැමතියි. මෙය විශ්ව විද්‍යාලවල ආචාර්‍ය්‍යවරුන් නොයෙක් විට මතු කරන කාරණයක්. එනම් විශ්ව විද්‍යාලවල සිටින සේවක පිරිස්—ආචාර්‍ය්‍ය මණ්ඩලය ඇතුළුව—විශ්ව විද්‍යාල නීති රෙගුලාසි උල්ලංඝණය කළොත් ඔවුන්ට විරුද්ධව ක්‍රියාත්මක වෙන්නෙ මොන විධියේ නීතියක්ද යන්නයි. මේ අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම අපි වුණත් දන්නෙ නැහැ, සංස්ථාවක් වශයෙන් දැනට වර්ග කර තිබෙන විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් මොන විධියේ නීති ක්‍රමයක්ද මොන විධියේ විනය ක්‍රමයක්ද අනුගමනය කෙරෙන්නෙ කියා. විශ්ව විද්‍යාලයේ කලබලකාරී තත්ත්වයන් ඇති වන අවස්ථාවලදී ශිෂ්‍යයන් සමග සමහර ආචාර්යවරුන් සිටින බව සමහර ආචාර්යවරුන් කියනවා. ශිෂ්‍යයන්ගේ අරගලවල පිටුපසින් සමහර ආචාර්යවරුන් සිටිනවායයි කියනවා. ශිෂ්‍යයන් උපදෙස් ගන්න යන්නේත් ඒ ආචාර්යවරුන් ළඟටයයිද කියැවෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රෝහාන් අබේගුණසේකර මහතා]

අරගල කෙරෙන අවස්ථාවලදී ජීවිත හානි පමණක් නොව දේපල හානිත් සිදු වෙනවා. පසුගිය අවුරුද්දේ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ හා කොළඹ විශ්ව විද්‍යාලයේ මරුමුවට පත්වුණු ශිෂ්‍යයන් දෙදෙනෙක් ගැන අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කරුණු සඳහන් කළා. මීට ප්‍රථමත් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් මරණයට පත් වී තිබෙනවා. ශිෂ්‍යයනුත් පොලීසියත් අතර අරගල, ගැටුම් ඇති වී ශිෂ්‍යයනුත් ඒවාගේම පොලිස් නිලධාරීනුත් බරපතළ විධියට තුවාල ලබා තිබෙනවා.

මේවාගේ අවස්ථාවලදී අපි ඇසිය යුතු ප්‍රශ්නය මේකයි. මේ අරගලවලට මුල් වුණු මේවා මෙහෙයවූ මේවාට ශිෂ්‍යයන් උනන්දු කරවූ යම් පිරිසක් ඔවුන් පසුපස සිටියා නම් ඒ අය සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද ? අපි සාර්ථක විධියට මේ ප්‍රශ්නයට උත්තර සැපයුවේ නැත්නම් ඉදිරියටත් ඒ සමානම කලබල විශ්ව විද්‍යාලවල නවදුරටත් ඇති වෙන්න පුළුවන්. එසේ වූ විට එහි සාමකාමී වාතාවරණයක් ඇති වන්නේ නැහැ. ඇති වන අවස්ථා අනුව විටින් විට ඒ විධියේ ප්‍රශ්න උද්ගත වෙනවා. එහෙම නම්, විශ්ව විද්‍යාලයේ ගුරුවරුන්ටත් ශිෂ්‍යයන්ටත් සේවක පිරිසටත් රටේ සාමාන්‍ය නීතිය අනුව විනයානුකූල දඬුවම් දෙන්නේ කොහොමද යන ප්‍රශ්නය අපි අහන්න ඕනෑ.

පසුගිය සතියේදී මට එක්තරා කරුණක් දැනගන්නට ලැබුණා. එය කොතරම් දුරට ඇත්තද නැත්තද යන වග මම දන්නේ නැහැ. පේරාදෙනියේ විශ්ව විද්‍යාලයේ එක්තරා ජ්‍යෙෂ්ඨ ගුරුවරයකුගෙන් සී. අයි. ඩී. එක ප්‍රශ්න කර තිබෙන බවට මට තොරතුරක් ලැබුණා. මේකට හේතුව මොකක්දැයි අසා බැලූ විට මට දැනගන්නට ලැබුණේ ඒ ආචාර්යතුමා පේරාදෙනියේ විශ්ව විද්‍යාලයේ සිට මඩකලපුවේ විශ්ව විද්‍යාලය දක්වා යම් රසායනික ද්‍රව්‍ය වගයක් පරිවහනය කරන්නට උත්සාහ කර තිබෙන බවයි. මේවාගේ කාලයක යම් කෙනෙක් රසායනික ද්‍රව්‍ය මඩකලපුව ප්‍රදේශයට ගෙන යනවායයි කිව්වාම කවුරුත් ඇස් දෙක ඇරලා ටිකක් පුදුමයෙන් ඒ දෙස බලනවා. මේ ආචාර්යතුමාගේ අදහස මොකක්දැයි මම හරියට දන්නේ නැහැ. ඔහු කියා තිබෙන්නේ එහි අවශ්‍යතාව පිරිමසා ගන්න ඒවා ගෙනගිය බවයි. කෙසේ වෙතත් ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. මේවාගේ දේවල් කෙරෙන විට ඒවාට වගකිව යුත්තේ කවුද ? විශ්ව විද්‍යාලයේ රසායනික විද්‍යාව උගන්වන අංශයේ ප්‍රධානියෙක් සිටිනවා. මේ සඳහා ඔහුගේ අවසරය ලැබුණාද ? පීඨාධිපති කෙනෙක් සිටිනවා. ඔහුගේ අවසරය ලැබුණාද ? එසේ අවසර නොලැබුණා නම් ඒ ආචාර්යතුමා කළ දේ හරිද ? ඔහුට දඬුවම් ලැබෙනවාද ? අවවාද ලැබෙනවාද ? මෙය මට ගිය සතියේ දැනගන්නට ලැබුණු එක් සිද්ධියක් පමණයි. මේවාගේ අවස්ථා අපේ විශ්ව විද්‍යාලවල අනන්ත අප්‍රමාණ ඇති වෙනවා.

සංයුක්ත මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් ආයතනයක සේවකයෙක් මෙවැනි දෙයක් කළා නම් සමහරවිට ඔහු සේවයෙන් පහ කරන්නත් මේවාගේ අවස්ථාවක් මුල් වෙනවා. විශ්ව විද්‍යාලයටත් ඒවාගේ නීති පද්ධතියක් අදාළ වෙනවාද නැද්ද යන ප්‍රශ්නය අද වැඩි දෙනෙක් අහන ප්‍රශ්නයක්. ඒ නිසා අමාත්‍යාංශ මට්ටමෙන් මේ ගැන සාකච්ඡා කර යම් කිසි පියවරක් ගනිතොත් එය විශේෂයෙන්ම මේවාගේ කාලයකදී විශ්ව විද්‍යාලයේ ආරක්ෂාවටත් ඒවාගේම විශ්ව විද්‍යාලයේ නීතිගරුකභාවය රැක ගැනීමටත් බොහෝ දුරට ඉවහල් වෙයි.

විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර වශයෙන් බලපාන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම නව අවුරුදු පහකට පමණ සැලැස්මක් සකස් කර තිබෙන බව මම දැක්කා. ඒ සැලැස්ම ගැන මම සන්තෝෂ වෙනවා. එය බොහෝ කාලයක් තිස්සේ අවශ්‍ය වී තිබුණු සැලැස්මක් ; 'කෝපරේට් ප්ලෑන්' එකක්. ඒ සැලැස්ම අනුව සැහෙන විපර්යාසයක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සැලැස්මෙන් බලාපොරොත්තු වන සියල්ලම ඉෂ්ට කර ගන්න අපට බැරි වුණත්, ඒ සැලැස්ම අනුව කටයුතු කරන නිසා ඉන් බාගයක්වත් ප්‍රතිඵල අත්පත් කරගන්න අපට පුළුවන් වේයයි මම හිතනවා. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා.

ඒ සැලැස්ම යටතේ ලබන අවුරුදු පහ හය තුළදී විශ්ව විද්‍යාවලට කලා අංශයෙන් ප්‍රවේශ වන ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් අඩු කරන්නට යන බව අපට පෙනෙනවා. එම ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාව අඩු කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙන බව අපට පෙනෙනවා. අපි නැවත වතාවක් මතක් කරන්න ඕනෑ, මේ කාරණයේදීත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් සමග සම්බන්ධයක් ඇති කර ගන්න සිදුවෙන බව. අද කලා අංශයට බරව් ඉන්න ශිෂ්‍යයන් එම අංශයට බරව් සිටින්නේ ඔවුන්ගේ කැමැත්තෙන් නොවෙයි. වෙන කරන්න දෙයක් නැති නිසයි. විද්‍යාව උගන්වන උසස් පෙළ පංති නැති නිසයි. කලා අංශයෙන් නැත්නම් වාණිජ අංශයෙන් ඉගෙණ ගැනීමට ශිෂ්‍යයන් ඉදිරිපත් වෙන්නෙ. එහෙම නම්, කලා අංශයෙන් විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙන ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු කරනවා නම්, විද්‍යා අංශය වැඩියෙන් දියුණු කරන්නට අපට සිදු වෙනවා. මගේ ආසනයේ විද්‍යාව උගන්වන එක පාසලක් පමණයි තිබෙන්නේ. ඒ පාසලටත් නොයෙක් විට විද්‍යා ගුරුවරුන් එන්නෙ නැහැ. ඒ නිසා මේ සැලැස්ම අනුව කලා උපාධිධාරීන්ගේ සංඛ්‍යාව අඩු කරන්න යනවා නම්, උසස් පෙළ මට්ටමේදී අපි එයට යම්කිසි ප්‍රතිකර්මයක් දුන්නේ නැත්නම්, නැවත වතාවක් මා මුලින්ම සඳහන් කළ තත්ත්වයට මුහුණ දෙන්නටයි, අපිට සිදු වෙන්නෙ. ඒ අනුව පිටිසර පාසල්වලට නැවත වතාවක් ප්‍රශ්න ඇතිවේවි. ඒ අවස්ථාවේදී රජයේ මූලික ප්‍රතිපත්තියක් වන සමාජ යුක්තිය අපට නැවත වතාවක් අහිමි වෙනවා. ඒ නිසා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශයත් සමග සාකච්ඡා කර උසස් පෙළ පංතිවලට පමණක් ඉගැන්වීම සඳහාවත් උපාධිධාරීන් කීප දෙනෙක් පුහුණු කරන්නට වැඩ පිළිවෙලක් ඇති කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

මට මතකයි, පසුගිය දවස්වල කැලණිය විශ්ව විද්‍යාලයේ පාඨමාලාවක් පැවැත්වූවා. ඉංග්‍රීසි සමත් වුණ ශිෂ්‍යයන් සඳහා ඒ පාඨමාලාව පැවැත්වූවා. මට මතක හැටියට එම ශිෂ්‍යයින්ට භාෂා කීපයක්ම ඉගැන්වූවා. බලාපොරොත්තුව වුණේ ඒ ශිෂ්‍යයින් ලවා උසස් පෙළ පංතිවලට ඉගැන්වීමයි. අන්න ඒ වගේ ක්‍රමයක් හරි ක්‍රියාවේ යොදවා ලබන අවුරුදු කීපය තුළදී ඇති තරම් උසස් පෙළ පංති පැවැත්වූවේ නැත්නම් නැවත වතාවක් අපට සිදුවන්නේ අර ගම්බද පළාත්වල ළමයින්ට අවස්ථාවක් නොදී ඉන්නයි. දැනටත් අපේ දේශීය වෛද්‍ය ඇමතිතුමා විටින් විට මතු කරන ප්‍රශ්නයක් තමයි, නීති විද්‍යාලයට ඇතුළත් කර ගැනීමේදී ඉංග්‍රීසි භාෂාවෙන් සමත් වී සිටීම අනිවාර්ය කොට සැලකීම. ඔන්න ඔය වගේ ප්‍රශ්න මතුවෙන අවස්ථාවලදී අපට කථා කරන්න සිදුවෙනවා. ඇති තරම් පහසුකම් අපේ ගම්බද පාසල්වලටත් ලබා දෙන්න ඕනෑ. එහෙම කළොත් පමණයි, සාර්ථක විධියට මේ කටයුතු විශ්ව විද්‍යාල මට්ටමේදී ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නෙ.

ඊළඟට තවත් කාරණයක් ගැන මේ අවස්ථාවේදී මතක් කරන්න සිදුවෙනවා. කලා හා වාණිජ අංශවලින් උසස් අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයින්ට අද කිසිම දෙයක් නැතිව බලා සිටින්න සිදුවී තිබෙනවා. අද ඒ අයට කිසිම බලාපොරොත්තුවක් තබා ගන්න පුළුවන්කමක් නැහැ. මෙවැනි අවස්ථාවලදී මා හිතන හැටියට එක්තරා අමාරු, දුෂ්කර ප්‍රශ්නයක් මතු වෙනවා. මොකක්ද ? මේ අයට නැවත වතාවක් රැකියාවල් සොයා ගන්න පුළුවන් තත්ත්වයේ පුහුණුවක් ලබා දෙන්නේ කොහොමද යන්නයි. මෙම අවස්ථාවේදී කලා හා වාණිජ විෂයයන් හදාරා තිබෙන ශිෂ්‍යයින් රැකියාවකට නැඹුරු කරන්න පුළුවන් ක්‍රමයක් ඇති කරන්නෙ කොහොමද කියන ප්‍රශ්නය විශේෂයෙන් කල්පනා කර බැලිය යුතු කාරණයක්ය කියා මා සිතනවා.

අන්තිම වශයෙන් කාර්මික විද්‍යාල සිසුන් විසින් විටින් විට ඉදිරිපත් කරන ඉල්ලීමක් සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. කාර්මික විද්‍යාල සමවාදී ශිෂ්‍ය පෙරමුණ මගිනුත් මේ ඉල්ලීම කර තිබෙනවා. ඒ අයගේ පාඨමාලාවට අදාල වෘත්තීය පුහුණුවක් ලබා ගැනීමට අවස්ථාවක් සලසා දෙන්නට පුළුවන්ද කියා උත්සාහ කර බලන ලෙස අපෙන් ඉල්ලා තිබෙනවා. ඇත්ත තත්ත්වය අනුව මෙය ඉතාම බැරෑරුම් ප්‍රශ්නයක්. සංස්ථාවල පුහුණු කිරීමට තිබෙන ඉඩ ප්‍රස්ථා සීමා සහිතයි. ඒ වගේම දැනටමත් ජාතික ආධුනිකත්ව මණ්ඩලය වගේ ආයතන ඒ ශිෂ්‍යයින්ගෙන් ප්‍රයෝජන ගන්නවා. එහෙම නම් අපට තව තිබෙන්නේ එකම විකල්පයයි. එය තමයි, පෞද්ගලික අංශය සමග යම් සම්බන්ධකමක් ඇති කරගෙන මේ ශිෂ්‍යයින්ට යම් අවස්ථාවක් ලබා දීම. ඒ කාර්මික විද්‍යාල පාඨමාලාවල යම්කිසි සංශෝධනයක් කර ඒ වෘත්තීය පුහුණුව ලබා දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා. එසේ නොහැකිනම් වෙනත් ක්‍රමයකින් හෝ එය ලබා දෙන්න. අපේ කාර්මික විද්‍යාලවලට විශාල මුදල් සම්භාරයක් වියදම් කර තිබෙන මේ අවස්ථාවේදී ඒ අයගේ පාඨමාලා සම්පූර්ණ කර ගැනීම පිණිස වෘත්තීය පුහුණුවක් ලබා දීමේ වැඩපිළිවෙළක් සකස් කරන්නය කියා අවසාන වශයෙන් ඉල්ලා සිටිමින් මට මේ කාලය ලබා දීම ගැන ස්තුතිය පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.10

**දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)**
**(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)**
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු සභාපතිතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කරුණු ගණනාවක් කියැවුණා. ඒවාගේම මේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඉදිරි අවුරුදු පහක වැඩපිළිවෙළක් ඉදිරිපත් කර තිබෙන වග දන් පෙනුනා. මේ වැඩපිළිවෙළ පිළිබඳව විවිධ අදහස් තිබෙනවා. ඒ ගැන මම දීර්ඝ වශයෙන් කරුණු කීමට නොවෙයි, බලාපොරොත්තු වන්නේ.

උසස් අධ්‍යාපනය පිළිබඳ පනත් කෙටුම්පත් සම්මත වූ හැම අවස්ථාවකදීම අපේ මූලික අදහස වූයේ උසස් අධ්‍යාපන ආයතනවලට යම්කිසි දුරකට ස්වාධීනත්වය ලබා දීමයි. මේ ස්වාධීනත්වය ලොව පුරා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් පිළිගත් අධ්‍යාපනයට අත්‍යාවශ්‍ය දෙයක්. මහා විද්‍යාලයක් මෙන් නොව විශ්ව විද්‍යාලයක් අංග සම්පූර්ණ බවට පත් වෙන්නේ, පාරිසරික, ආයතනික හා අභ්‍යන්තරික වශයෙන් එහි අධ්‍යාපනික ක්ෂේත්‍රයේ විවිධ මත, විවිධ පර්යේෂණ හා විවිධ සොයා ගැනීම් ස්වාධීනව දියුණුකර ගැනීම සඳහා අවස්ථාවන් ඇති කිරීමෙන්ය කියන එකයි, අපි කාගේත් පිළිගැනීම. නමුත් දන් එය ක්‍රමානුකූලව නැතිවී යනවාය කියන කාරණය අපි නිතර නිතර ප්‍රකාශ කර තිබෙනවා. විශ්ව විද්‍යාලවලට එකී ස්වාධීනත්වය අහෝසි වීම විවිධ අවස්ථාවලදී ඇති වූ යම් යම් ක්‍රියාවන් නිසා සිදු වුණා වාගේම දන් ඒ තත්ත්වය ස්ථාපිත කිරීමට ආණ්ඩුව මහන්සි වෙනවා. එම නිසා අපි මේ අවස්ථාවේදී කියා සිටින්නේ විශ්ව විද්‍යාල මේ ආකාරයෙන් නිලධාරී පාලනයට යටත් කරන්න එපාය කියන එකයි. හදිසි නීතිය මුවාවෙන් යම් යම් පරිපාලන නීතිරීති ඒ අය තමන්ගේ අතට ගත්තා. අද වැනි භයංකාර තත්ත්වයන් තිබෙන අවස්ථාවන් ගැන නොවෙයි, මා මේ කියන්නේ. සාමාන්‍ය අවස්ථාවල පවා හදිසි නීති රෙගුලාසි පනවා ගෙන විශ්ව විද්‍යාල උපකුලපතිවරුන් අයින් කරන්නට කටයුතු කර, එද සිට අද දක්වා විශ්ව විද්‍යාල පාලනය කිරීම නිසා ඒවා පිළිගත නොහැකි තත්ත්වයකට පත්වී තිබෙනවා. විශ්ව විද්‍යාලවල කෙරෙන එදිනෙද පත්වීම් පවා මාසිකව හදිසි නීතිය දීර්ඝ කිරීමේ අවස්ථා මාර්ගයෙන් කරන අන්දමට ඉතාමත් කණගාටුදයක තත්ත්වයට පත් වී තිබෙනවා.

මේ විෂය භාර ගරු ඇමතිතුමා හැටියට ගරු ජනාධිපතිතුමාටත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් එකක් මතක් කරන්න ඕනෑ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ධූරය දරන්නෙත්, අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරන්නෙත් එකම තැනැත්තෙක්. මම මහාචාර්ය කල්පගේ මහත්මයා ගැන පුද්ගලයෙක් වශයෙන් කිසිම විවේචනයක් කරනවා නොවේ. නමුත් එසේ තනතුරු දැරීමෙන් මා හිතන්නේ නැහැ එය මෙහි ස්වාධීනත්වය රැකගැනීමට කිසි ලෙසකින් උදව් වෙයි කියා. නැතිවී යන ස්වාධීනත්වය තවදුරටත් නැති කර දැමීමට ගෙන තිබෙන බලතලයක්. මෙය කල්පගේ මහත්මයා, අමාත්‍යාංශයේ ලේකම් මහත්මයා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වශයෙන් සිටීමෙන් ඔහු දෙන තීරණවලට එරෙහි වෙන්නට හෝ ඒවා පිළිබඳව වෙනත් අදහස් පළ කරන්නට හෝ තිබෙන තත්ත්වයන් නැති වී යනවා. මේ ගැන දන්වත් කල්පනා කරන්න කාලය ඇවිත් තිබෙනවාය කියන එකයි, මා විශේෂයෙන් කියා සිටින්නේ. විශ්ව විද්‍යාලවල කාලයක් මහාචාර්ය ධූර දරූ කෙනෙක් හැටියට මහාචාර්ය කල්පගේ මැතිතුමාටත් මා මතක් කරනවා, ගෞරවාන්විතව ඒ තනතුරකට තමන්ගේ නිර්දේශය අනුව වෙනත් කෙනෙක්වත් පත් කරනවා නම් වඩා හොඳ බව. එසේ කිරීමත් මේ ආයතනයට අවශ්‍ය ස්වාධීනත්වය සැලසෙන අතර ඒ ආයතනය මඟින් ඉෂ්ට කරන කාර්යභාරයටද එය උදව්වක් වෙනවා. එකම නිලධාරියෙක් සැම ආයතනයකම ප්‍රධානියා වුණාම ඇතිවෙන තත්ත්වය අපිට මීන් හොඳාකාරව පෙනෙනවා.

ඊළඟට අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මතු කළා වාගේම පසුගිය කාලයේ ඇති වූ ශිෂ්‍ය අරගල ගැනත් මා වචනයක් කියන්නට ඕනෑ. වීරසූරිය ශිෂ්‍යයාගේ සිද්ධිය වාගේම විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේ මෑත කාලයේ වූ ඉතාම කණගාටුදයක සිද්ධිය ලෙස අර ශිෂ්‍යයන් දෙදෙනාගේ ඝාතනය වාර්තාගත වෙනවා. ඒ ඝාතන පිළිබඳව අධිකරණ තීන්දු කුමක් වුවත් ඒවා සිදු වුණේ කොහොමද කියන එක ගැන අපි යම්කිසි දුරකට සොයා බැලීම වටිනවා. පොලීසිය විශ්ව විද්‍යාලයට ගෙන ඒම පිළිබඳව මතු වූ අදහස් නොතැකීම, විශ්ව විද්‍යාල පාලනය කරන උදවිය ශිෂ්‍යයන් සහ ශිෂ්‍ය සංවිධාන පිළිබඳව දක් වූ අදහස් පිළිබඳව ඇති වූ ගැටළු යනාදිය ඒකට මූලික වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් පළවන "කල්පනා" සඟරාවේ නොවැම්බර් කලාපය ගැන මා මේ අවස්ථාවේදී සභාවේ අවධානය යොමු කරවනවා. රටට ගැළපෙන උසස් අධ්‍යාපන ක්‍රමයක් සකස් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව සකස් කරන ලද ලිපියක් මෙම සඟරාවේ පළ කර තිබෙනවා. මේ රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කම්ටු වාර්තා ගණනාවක කොටස්කරුවකු වූ නීතිඥ ඩී. ඩබ්ලිව්. කුලරත්න මහතාගේ අදහස් ගණනාවක් මේකේ පළ වී තිබෙනවා. මා මේක සම්පූර්ණයෙන්ම කියවන්නට උත්සාහ කරන්නේ නැහැ. අප කාගේත් අවධානයට යොමු කිරීම සඳහා එක කොටසක් පමණක් කියවන්නට මා අදහස් කරනවා: මේ සඟරාවේ 49 වන පිටුවෙනුයි මම කියවන්නේ:

"නොබෝදා රටේ ආන්දෝලනයක් ඇති කළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිසුන් දෙදෙනෙක් මරු මුවට ලක්වීමට පෙර දිගටම පැය 5 ක් පමණ කාලයක් තුළ ශිෂ්‍යයන් සහ පොලීසිය අතර කලහකාරී තත්ත්වයක් ඇති වූ බව කවුරුත් දන්නා කරුණකි. ඊට වරදකරු කවුරුදැයි සොයා බැලීම හෝ එහි පසුබිම සොයා බැලීම කාර්‍ය භාරයේ වෙනත් අංශවලට පැවරේ. එහෙත් විශ්ව විද්‍යාලයේ උප කුලපතිටත්, ශාලාධිපතිවරුන්ටත් නේවාසික මහාචාර්‍ය හා කථිකාචාර්‍යවරුන්ටත් කෙමෙන් මෝරමින් පැවති අර්බුදය සමථයකට පත් කිරීමට ඕනෑ තරම් කාල වේලාව තිබුණි. ඒ වගකීම ඔව්හු පැහැර හැර ඇත."

මම හිතන හැටියටත් මෙවැනි තත්ත්වයක් මතු වී තිබෙන්නේ. මේ වූ විනාශය ගැන ඒ ආයතනයේ ප්‍රධානීන් යම්කිසි වගකීමක් ගන්නට ඕනෑ. ඒ ශිෂ්‍යයන් දෙදෙනා මරු මුවට පත් වුණා පමණක් නොවෙයි, එම ශිෂ්‍ය අරගලයේදී බැට කෑ දරුණු ලෙස තුවාල ලබා රෝගාතුර වූ තවත් ශිෂ්‍යයෝ කිප දෙනෙක් ඉන්නවා. වැඩි වශයෙන්ම මෙම සිද්ධිය ඇති වුණේ ඒක සමථයකට පත් කර ගන්නට තිබුණු අවස්ථාව ගැන ප්‍රධානීන් දක් වූ නොසැලකිල්ල නිසාය කියා අපි විශ්වාස කරන්නට ඕනෑ. ඒ වාගේම එම සිද්ධියෙන් පසු ඇති වී තිබෙන්නේ කුමක්ද ? කිසිම පරීක්ෂණයකින් තොරව එතැන හිටපු කුලපතිතුමාට ඇමෙරිකාවේ විශ්ව විද්‍යාලයකට යන්න අවසර දී තිබෙනවා. මේ වාගේ සිද්ධියක් වුණාම අඩු වශයෙන් ඊට සම්බන්ධ කරුණු ගැන සොයා බලන්නටවත් ඕනෑ. වගඋත්තරකරුවන් හැටියට යම් යම් චෝදනා ලබා තිබෙන අය ඒවායින් නිර්දෝෂීවීමටවත් යම්කිසි පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරන්නට ආණ්ඩුව අපොහොසත් වුණා. ඒ ගැන අපි කණගාටු වෙනවා. එය ඉදිරි කාලයටත් බලපාන්නට පුළුවනි. කාගෙන්වත් අදහස් ගන්නේ නැතිව එවැනි අයට රටින් පිට වී යන්නට ඉඩ දීම ඉතාම කණගාටුදයකයි.

ඊළඟට මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි නීති උපාධියට ඉංග්‍රීසි භාෂා විෂයයෙන් සාමාර්ථය අනිවාර්ය කිරීමෙන් මතු වී තිබෙන ගැටළුව ගැන. මේ පිළිබඳව පුවත්පත්වලින් විවිධ අදහස් මතු වී තිබෙනවා. මේ ගැන මට ලැබී තිබෙන ලිපි ගණනාවකින් එකක් පමණක් ඉදිරිපත් කරන්නට කැමතියි. ඇයි අපි නීති පීඨයට ඇතුළුවීමට ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය විෂයයක්ය කියා නියම කළේ ? අපේ ශිෂ්‍යයන් වෙනත් රටවලට ගිහින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනත් අංශ හදරනවා. අපේ ශිෂ්‍යයන් ඒ රටවලට ගිහින් හය මාසයෙන් ජර්මන් භාෂාව ඉගෙනගන්නවා. හය මාසයෙන් රුසියන් භාෂාව ඉගෙනගන්නවා. හය මාසයෙන් ප්‍රංශ භාෂාව ඉගෙනගන්නවා. හය මාසයෙන් ජපන් භාෂාව ඉගෙනගන්නවා. ඒ රටවල භාෂාව නොදන්නවාය කියා ඒ රටවල් අපේ රටවලට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම නවත්වා නැහැ. නමුත් අපේ රටේ ශිෂ්‍යාට අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් පීඨයකට ඇතුළුවීම සඳහා හදිසියේම ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කර තිබෙනවා.

ඉංග්‍රීසි භාෂාව අනිවාර්යයෙන් උගත යුතු නම්, ඇතුළත් වුණාට පසුව කෙටිකාලීන පාඨමාලාවක් තුළින් ඉංග්‍රීසි භාෂාව උගන්වන්නට අපට බැරි ඇයි ? මෙය එක්තරා කාලයක් තිස්සේ මේ රටේ කඩා වැටුණු බමුණු කුලයක් නැවත වරක් ඇති කිරීමට දරන උත්සාහයක්ය කියන දෙය බොහොම කණගාටුදයක ලෙස හෝ අපි කියන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටත් බොහොම ලෙහෙසියෙන් මේ සුළු වෙනස කරන්නට පුළුවන්. ශිෂ්‍යයින් ගණනාවක් මට මේ ගැන ලියා එවා තිබෙනවා. එයින් එක ලිපියක් ලියා එවා තිබෙන්නේ සාමාන්‍ය පොලිස් කොස්තාපල් කෙනෙකුගේ දරුවෙක්. එය බොහොම කණගාටුදයක ලිපියක්. තමන්ගේ පියා විවිධ ස්ථානවලට මාරු කිරීම නිසා හරියාකාර ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබන්නට බැරි ගම් නියම්ගම්වල බොහෝ සෙයින් ජීවත් වන්නට සිදු වුණා යයි කියන අතර, ඉංග්‍රීසි අනිවාර්ය කිරීම නිසා ඔහුට නීති පීඨයට ඇතුළත් වන්නට නොහැකි වී තිබෙනවා යයි කියනවා. එමෙන්ම ඔහු අභියෝගයකුත් කරනවා, ඔහුට ඇතුළත් වන්නට ඉඩ දුන්නොත් මාස හයකින් ඉංග්‍රීසි ඉගෙන ගන්නට හැකියාවක් තිබෙනවාය කියා. තවත් සිය ගණනක් ඒ හැකියාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

තිබෙනවා යයි කියනවා. මෙය අපට පිළිගන්න පුළුවන් කරුණක්. මේ ගැන සලකා බලන්නට දැන් කාලය ඇවිත් තිබෙනවා. එසේ නැති වුණොත් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ඒ පහසුකම් යම්කිසි සුළු පිරිසකට පමණක් ලැබෙනවා.

ලංකාවේ සෑම පාසලකම ඉංග්‍රීසිය පිළිබඳව හොඳ අධ්‍යාපනයක් තිබෙනවා නම් මේ ඉල්ලීම් ගැන අපටත් යම්කිසි පිළිගැනීමක් කරන්නට බැහැ. නමුත් එවැනි තත්ත්වයක් අද ඇත්තේ නැහැ. විවිධත්වයකින් විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන්නට තිබෙන වරප්‍රසාදය යම් යම් පීඨවලට සීමා කිරීමක් තමයි, මෙයින් සිදු වන්නේ. ඒ නිසා නීති පීඨයට ඇතුළත් වීමේදී ඉංග්‍රීසි භාෂාව විෂයයක් හැටියට සමර්ථවීම අනිවාර්ය කර තිබෙන රීතිය එවැනි තත්ත්වයක් ලබා ගන්නට රට පුරාම සිටින ශිෂ්‍යයින්ට අවස්ථාවක් ලැබෙන තුරු මේ අවස්ථාවේ ඉවත් කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

එමෙන්ම විවෘත විශ්ව විද්‍යාලයේ නීති උපාධි පාඨමාලාවටත් යම් යම් අසාධාරණයත් සිදු වී තිබෙනවා. ඒ පිළිබඳව ලිපි ලේඛන ගණනාවක් ඒ ශිෂ්‍යයින් විසින් ඉදිරිපත් කර තිබෙනවා. මේ පාඨමාලාවට අයදුම්පත් කැඳවීමේදීට වඩා එයට තෝරා ගැනීමේදී වෙනත් කොන්දේසි ඇතුළත් කර තිබෙනවා යයි කියනවා. විශේෂයෙන් උපාධිලාභීන්ට විශේෂත්වයක් කර තිබෙනවා යයි කියනවා. විවෘත සරසවියකට ඇතුළත් වීමට මූලික සුදුසුකම් තිබෙනවා නම් විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන්නට නොහැකි වූ අයට ඒ පාඨමාලාවට ලියාපදිංචි වී ඒ විවෘත විශ්ව විද්‍යාලයෙන් ලබා ගත හැකි සහතයක් ලබා ගන්නට ඉඩ ප්‍රස්ථාව දෙන්නට අපට හැකියාව ඇති වන්නට ඕනැ. මෙන්න මේ ක්ෂේත්‍රය ගැන මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ මේ විවෘත විශ්ව විද්‍යාලයේ මූලික උපාධිය සඳහා අයදුම් කළ විට මූලික උපාධිය සඳහා ඉල්ලන කොන්දේසිවලට වඩා වෙනත් කොන්දේසි ඇතුළත් කරන්නට එපාය කියන එකයි. මා ළඟ තිබෙන මේ ලිපිය ගරු නියෝජ්‍ය ඇමතිතුමාට එවන්නම්. එවිට එතුමාට එය කියවා බලන්න පුළුවන්. මේ ඉල්ලීම විස්තරාත්මකව මෙහි සඳහන් වෙනවා. මෙවැනි අසාධාරණයන් නොයෙක් තැන්වල ඇතත් අපට ඒවා ලැබෙන්නේ නැහැ. ප්‍රශ්නයක් ඇති වූ විට තමයි, එවැනි ප්‍රශ්න අපට දැනුම් දෙන්නේ.

ඒ සමගම ආයුර්වේද පීඨය පිළිබඳවත් මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. පස් අවුරුදු විශ්ව විද්‍යාල සංවර්ධන සැලැස්මේ සඳහන් වී තිබෙන අන්දමට කුමන ආකාරයේ පදනමකින් මේ ආයුර්වේද පීඨය ඉදිරි කාලයේ දී වැඩ කරනවාද කියන එක නිශ්චිතව පැහැදිලි කර නැහැ. ආයතනයක් හැටියට—ඉන්ස්ටිටියුට් එකක් හැටියට—කුමන තත්ත්වයක උපාධි ලාභයක් ලැබෙනවාද කියන එකත් පැහැදිලි නැහැ.

මා හිතන විධියට අපේ රටේ මෙන්ම වෙනත් පෙරදිග රටවලත් ආයුර්වේද ක්ෂේත්‍රයේ දේශීය වෛද්‍ය ක්‍රම විශාල වශයෙන් ප්‍රයෝජනයට අරගෙන තිබෙනවා. නැවත වරක් මෙහිදී මතු වී තිබෙන ප්‍රශ්නය මෙයයි. මා විශ්වාස කරන අන්දමට මේ ක්ෂේත්‍රයේ වෛද්‍යවරුන් හැටියට පිට වන ප්‍රමාණය යම්කිසි දුරකට අඩු කර, සීමා කිරීමට උත්සාහයක් තිබෙනවා. ඒ උත්සාහයට අපි ඉඩ දිය යුතු නැහැ. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෛද්‍යවරයෙකු වන්න පුළුවන් තත්ත්වයේ අයට ඒ තත්ත්වයට ඒම සඳහා අපි ඉඩ ප්‍රස්ථාව ලබා දෙන්න ඕනැ. බටහිර වෛද්‍ය පීඨයේ විෂය මාලාවට බොහොම කිට්ටු ආකාරයකිනුයි, ආයුර්වේද වෛද්‍යවරයන් පිළිබඳ පාඨමාලාවත් සකස් කර තිබෙන්නේ.

ආයුර්වේද වෛද්‍යවරුන් වීමේ බලාපොරොත්තුවෙන් සිටින ශිෂ්‍යයන් ඇතුළු කර ගැනීමේදී අලුත් තත්ත්වයක් ඇති වී තිබෙනවා. 1984 – 85 අධ්‍යයන වර්ෂය සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට සිසුන් බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබෙනවා. ඒ සම්මුඛ පරීක්ෂණයට ආ ශිෂ්‍යයන් ඊට ඇතුළු වීම දුර්මුඛ කරන තත්ත්වයෙනුයි, ඒ සම්මුඛ පරීක්ෂණයේදී එය පැවැත්වූ නිලධාරීන් කටයුතු කර තිබෙන්නේ. " මේක බොහොම අමාරු දෙයක්. මේකෙන් පිට වුණාට පස්සේ වුණත් රක්ෂාවක් සහතික නැහැ " යනාදී ප්‍රකාශ මඟින් ඒ ශිෂ්‍යයන් මීට ඇතුළු වීම දුර්මුඛ කරන්න උත්සාහයක් ගෙන තිබෙනවා, ඒ සම්මුඛ පරීක්ෂණයේදී. ශිෂ්‍යයන් මේ බව ප්‍රතිපාදන කොමිෂන් සභාවටත් දන්වා තිබෙනවා. ඔවුන් මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා හමු වුණාද කියන්න මම දන්නේ නැහැ. ඒ අය ඒ සඳහා උත්සාහයක් ගත්තා. නමුත් තවම ඔවුන්ට ඒ සඳහා අවස්ථාවක් ලැබුණේ නැත කියායි, මම හිතන්නේ. ඒ නිසා ඒ සම්මුඛ පරීක්ෂණයේදී ඒ ආකාරයෙන් ශිෂ්‍යයන් දුර්මුඛ කිරීමට කටයුතු කළේ ඇයිදැයි සොයා බලන හැටියට නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

මම ඒ ඉල්ලීම කරන්නේ මේ නිසයි : කලින් සඳහන් කළ තත්ත්වය තුළින් අපට සැකයක් මතු වෙනවා, මේ අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමෙන් ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳව ඉදිරි කාලයේදී පිළිගත හැකි මට්ටමේ පාඨමාලාවක් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියා. නියෝජ්‍ය ඇමතිතුමා සිය පිළිතුරු කථාවේදී ඒ පිළිබඳව පැහැදිලි කරනවා නම් එය ඉතා වැදගත්. ඒ මොකද කීවොත් අප දන්නා තරමින් ඒ අංශය පවත්වාගෙන යෑම සඳහා ගොඩනැඟිලි හා වෙනත් අවශ්‍යතාවන්, ඒ කියන්නේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ඒ විශ්ව විද්‍යාලයේ වෙනම පීඨයක් වශයෙන් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය දේවල් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ නැති නිසයි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න අනිවාර්යයෙන්ම සිදු වෙනවා. මෙතෙක් ආයුර්වේද වෛද්‍ය අංශය සඳහා උපයෝගී කර ගත්, බොරැල්ලේ – වැලිකඩ කිට්ටුව – තිබෙන ගොඩනැඟිලිවල අනාගතය රැඳී තිබෙන්නේ නගර සංවර්ධන අධිකාරිය ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය මතයි. ඒ නිසා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අවධානය යොමු කරන හැටියට නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ සමගම නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා නිකුත් කර ඇති විගණන වාර්තා කෙරෙහි. මම ඒ සම්බන්ධයෙන් ඒ විශ්ව විද්‍යාලයේ වර්තමාන උප කුලපතිවරයාට චෝදනා කරන්නේ නැහැ. නමුත් කාලයක් තිස්සේ එකී විශ්ව විද්‍යාලයේ සිදු වී ඇති වැරදි ගණනාවක් විගණකාධිපතිවරයා සිය වාර්තාවෙන් හෙළි කර තිබෙනවා. එහි සේවකයන්ගේ අර්ථසාධක අරමුදල් පිළිබඳ කටයුතු නිසියාකාරව කෙරී නැහැ. ඒ අතර ඊට වඩා වංචා ගණනාවක් සිදු වී තිබෙනවා. විවිධාකාරයේ නාස්තිවලට, දූෂණවලට තුඩු දෙන තත්ත්වයක් තුළ ඒ කටයුතු සිදු වී තිබෙන නිසයි, ඒ පිළිබඳව සොයා බලන්නය කියන ටික මතක් කරන්නේ.

මහනුවර බහුතාක්ෂණික ආයතනයේ ශිෂ්‍යයන්ගේ ඉල්ලීම් ගණනාවක් තිබෙනවා. ඒ ආයතනයට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවත් දැන් වේගයෙන් අඩු කරගෙන යනවා. ඒ සඳහා ඒ ආයතනයට ලැබෙන මුදල් ප්‍රමාණය අඩු වීම නිසා ඒ විධියට කටයුතු කරන්න සිදු වී තිබෙන බවයි, එහි ආචාර්යවරුන් කියන්නේ. නමුත් අපි කවුරුත් දන්නවා, අය කරන ගාස්තු නම් වැඩි කර තිබෙන බව. කීප වරක්ම ඒ ගාස්තු වැඩි කළා. සමහර විට එසේ කරන්න ඇත්තේ ඒ ආයතනය පවත්වාගෙන යෑමේ වියදම් ඉහළ යෑම නිසා වෙන්න ඇති.

මේ සම්බන්ධයෙන් මම විශේෂයෙන් කියන්නේ මේ නිසයි : ගණකාධිකරණ පාඨමාලාව හැදෑරීමේ පහසුකමත් ඒ බහුතාක්ෂණික ආයතනයේ තිබෙනවා. එය විශේෂයෙන් වර්තමානයේ අපේ රටට ඉතා වැදගත් විෂයයක්. අනෙක් විශ්ව විද්‍යාල හැම එකකම ඒ පාඨමාලාව පැවැත්වෙන්නේ නැත. ඒ නිසා එකී පාඨමාලාව පැවැත්වෙන මේ බහුතාක්ෂික ආයතනයේ ශිෂ්‍යයන්ට එයින් ප්‍රයෝජන ලබා ගැනීමේ අවකාශය සලස්වා දෙන හැටියට ඉල්ලා සිටින්න කැමතියි.

ඉදිරි අවුරුදු පහේදී විශ්ව විද්‍යාලවල කලා පීඨයන්ට ශිෂ්‍යයන් බඳවා ගැනීම සීමා කිරීමක් පිළිබඳවත් අදාළ සැලැස්මේ සඳහන් වෙනවා. මට පෙර කථා කළ හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාත් (රොහාන් අබේගුණසේකර මහතා) ඒ ගැන කීවා. ඒ අදාළ සැලැස්ම තුළ, ඉදිරි කාලයේදී උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඒ ඒ පීඨයන්හි කුමන ආකාරයේ ඉලක්කයන් සපුරාලීමට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවාද කියාත් අපි දැන ගන්න කැමතියි. මේ සැලැස්ම අනුව, කලා පීඨයට දැනට බඳවා ගන්නා සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් බඳවා ගැනීමට බලාපොරොත්තු නොවන බව අපට දැන් පැහැදිලි වෙනවා. ඒ වාගේම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ මිනිස් බල තක්සේරු කිරීමේ අංශයෙන් දක්වෙන ඉලක්කයන් එකකටවත්—ඒ කියන්නේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් බලාපොරොත්තු වුණු ඉලක්කයන් එකකටවත්—පසුගිය අවුරුදු කීපය තුළ ළඟාවෙන්නට එසේ නැතිනම් උපාධිධාරීන්ට අවශ්‍ය පුහුණ කිරීම් කරන්නට බැරි වී තිබෙනවා. වෛද්‍ය පීඨය ගෙන බැලුවත්, ඉංජිනේරු පීඨය ගෙන බැලුවත් මේ තත්ත්වය එක හා සමානයි. ඒ කාලය තුළ සංඛ්‍යාලේඛන ගෙන බැලුවාම අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වී ඇති බව පැහැදිලියි.

ගරු සභාපතිතුමනි, මහාචාර්ය කල්පගේ මහතා පවා සහභාගී වුණු ලෝක සෞඛ්‍ය සංවිධානයේදී ඉදිරිපත් වුණු එක්තරා යෝජනාවක් තිබෙනවා. මා හිතන්නේ එම යෝජනාව මේ රජය පිළිගෙන තිබෙනවා. එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජනාවෙන් කෙරෙන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යාංශයේ අදහස කුමක්ද කියා අප දැනගන්නට කැමතියි. ඒ අනුව, වෛද්‍ය උපාධිය ලබා ගැනීම සඳහා ඉගෙනුම ලැබිය යුතු කාලය අඩු කිරීම සඳහා කිසියම් නිර්දේශයක්—වාර්තාවක්—ඉදිරිපත් කර තිබෙනවා. එයින් අදහස් කරන්නේ දැනට ඇති මෙම විෂයන්ට අදාළ පාඨමාලාව අඩු කිරීමට නොවෙයි. දැනට පුහුණුව සඳහා ගත කරන කාලය අඩු කරන්නට පුළුවන්ද කියා මෙමගින් සොයා බැලීමයි. එය කර තිබෙනවා. එසේ සොයා බැලීමේදී පෙනී ගොස් තිබෙනවා, දැනට වඩා අඩු කාලයක් තුළදී, තමන් ලබන අධ්‍යාපනයේ කිසිදු අඩුවක්—අඩුපාඩුවක්—නැතුව, දොස්තරවරුන් හැටියට සමත්කම් ලබන්නට පුළුවන් බව. මා දන්නා හැටියට මේ ගැන දැනට වාර්තාවක් සපයා තිබෙනවා. මහාචාර්ය කල්පගේ මහත්මයා ඒ පිළිබඳව යම් යම් අදහස් ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා මේ ගැන ආණ්ඩුව ගන්නට බලාපොරොත්තු වන පියවර කුමක්ද කියා අපි දැනගන්නට කැමතියි. මන්ද ? මේ ක්ෂේත්‍රය වාගේම එවැනි වැදගත් විද්‍යාත්මක ක්ෂේත්‍ර පිළිබඳව ඒ හා සමාන වැදගත් අදහස් ක්‍රියාත්මක කරන්නට කාලය දැන් ඇවිත් තිබෙන නිසයි. වෙනත් රටවල එවැනි දේ ක්‍රියාත්මක කර තිබෙනවා ; අධ්‍යයන කාල සීමාවන් අඩු කර තිබෙනවා.

දැනට පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් අපේ රටේ පිහිටුවා තිබෙනවා. එමගින් මුදල් ලත් පැලැන්තියේ අවශ්‍යතාවක් ඉටු කර ගන්නට ඉඩ ප්‍රස්ථාවක් සැලසී තිබෙනවා. කොහොම වුණත්, වෛද්‍ය විද්‍යාලය ඇරඹීමට පෙර වෛද්‍ය විද්‍යාලය ආරම්භ කිරීමට මුල් වූ අය ඉංගිරීසිය පිළිබඳ ප්‍රශ්නයත් ගෙන ගිය බව ගරු ඇමතිතුමා පුවත්පත් මගින් දකින්නට ඇති. මේ කාරණය ගැන ඇති පරණ ප්‍රවෘත්ති පත්‍ර මම දැන් කියවන්නට යන්නේ නැහැ. නමුත් මෙහි පැහැදිලිව කියා තිබෙනවා : " English is essential for Medical Education "— වෛද්‍ය අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි භාෂාව අත්‍යවශ්‍ය — කියා. මේ අයම තමයි, මෙබඳු පෞද්ගලික විශ්ව විද්‍යාලයක් ආරම්භ කරන්නට කරුණු ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇත්තේ. මා මුලින් කිව්වා වාගේ මා නැවතත් පෙන්වා දෙන්න ඕනෑ, අපේ භාෂාවෙන් හෝ වෙනත් භාෂාවකින් හෝ වෛද්‍ය විද්‍යාව හෝ වෙනත් විද්‍යාත්මක විෂයයන් ඉගෙනීමට හෝ එම භාෂා හදුරා ඊට අමතරව පශ්චාත් පර්යේෂණ කරන්නට නොහැකි තත්ත්වයක අපේ රට වැසියන් නැත. අපේ දරුවන්ට අවශ්‍ය පහසුකම් සලසා දෙනවා නම් ඕනෑම භාෂාවක් ඉගෙනීමට පුළුවන් තත්ත්වයක අපේ දරුවන් සිටිනවාය කියන විශ්වාසයක් අප තුළ තිබෙන්නට ඕනෑ. එම නිසා යම්කිසි වරප්‍රසාදයක් ලත් කොටසකට දොස්තරවරුන් වීමේ අවස්ථාව ලබා දීම පමණක් නොවෙයි. දැනට ඇති එම අවස්ථාව තව පුළුල් කරන්නට ඉඩ දෙන්නටත් එපාය කියා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. මොකද ?

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයක් ඇති කරන්නට සුදුසු පරිසරයක් තිබෙනවා. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල පිහිටා තිබෙන්නේත් අපේ මහරගම මැතිවරණ කොට්ඨාශයේයි. එම රෝහලේ වෛද්‍යවරුන් සඳහා පාඨමාලාවක් ඇති කළ හැකියි. ඇති කිරීමට කිසිම අඩුපාඩුවක්—බාධාවක්—නැහැ. මෙය ලංකාවේ ඇති හොඳම රෝහල බවට පත් වී තිබෙනවා. එහෙම නම් ඉදිරිපත් කර ඇති මෙම සැලැස්මට ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය අන්තර්ගත කර නැත්තේ මන්දැයි අපි දැනගන්නට කැමතියි. අවශ්‍ය පරිසරය, අවශ්‍ය තත්ත්වය නොඅඩුව තිබෙද්දී ඒක නොකරන්නේ ඇයි ? ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අයත් එම ඉල්ලීම කර තිබෙනවා. නමුත් අපි දන්නවා, පශ්චාත් වෛද්‍ය උපාධිය පිළිබඳව විශේෂ පුහුණුවක් දෙන්නට ජයවර්ධනපුර රෝහල පාවිච්චි කරන්නට යන බව. ඒ අන්දමට පශ්චාත් වෛද්‍ය උපාධිය එමගින් ලබා දීමේ තත්ත්වයකට පරිවර්තනය කර තිබෙන්නේ, පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ අයට පශ්චාත් වෛද්‍ය උපාධිය මේ තුළින් ලබා ගැනීමේ තත්ත්වයකට අවතීර්ණ වන්නට විය හැකියි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ජයවර්ධනපුර රෝහලින් ලබා ගන්නට පුළුවන් එම සහතදායක තත්ත්වය—එසේ නැතිනම් වෛද්‍යවරුන් බිහි කිරීමේ තත්ත්වය—වළක්වා තිබෙන්නේත් මෙම වැඩ පිළිවෙළට අන්තර්ගත කර නැත්තේත් ඒ නිසා වෙන්නට පුළුවනි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට වෛද්‍ය පීඨයක් ඇති කිරීමේ අවස්ථාව සලසා දෙන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ආයුර්වේද වෛද්‍ය පීඨයක් එහි ඇති කළ හැකි නම් ඇයි, බටහිර වෛද්‍ය විද්‍යාව සඳහාත් පීඨයක් ඒ විශ්ව විද්‍යාලයේ ඇති කරන්නට බැරි ? එම විශ්ව විද්‍යාලයට යාබදව රෝහල් ගණනාවක් තිබෙනවා. ඒ විෂය පිළිබඳව අදාළ වන පිළිකා රෝහල බොහොම යාබදව තිබෙනවා. කළුබෝවිල රෝහල—දකුණු කොළඹ මහ රෝහල—තිබෙනවා. ඒ වගේම පාර්ලිමේන්තුවට තුදුරින් තිබෙන ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල ශ්‍රී ලංකාවේ සහ ආසියාවේ තිබෙන විශාලතම රෝහල්වලින් එකක්. මේ තත්ත්වය මේ වැඩපිළිවෙල සකස් කරන නිලධාරීන්ට පෙනෙන්නේ නැද්ද, කියන එකයි අපිට තිබෙන සැකය. ඔවුන්ට මේවා පෙනෙනවා නම් මෙවැනි තත්ත්වයක් ඇති කරන්නේ නැහැ. රුහුණු විශ්ව විද්‍යාලයට වෛද්‍ය විද්‍යා පීඨයක් ඇති කරගෙන යනවා. ඒක අළුත් විශ්ව විද්‍යාලයක්. මේ විශ්ව විද්‍යාලයේ තත්ත්වය අනුව ඒ රෝහල පවා ප්‍රතිසංවිධානය කරන්න වෙනවා. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට එම අවශ්‍ය තත්ත්වය තිබෙද්දී එම වෛද්‍ය පීඨය ඇති නොකරන්නේ ඇයි කියන එක ගැන සොයා බලා ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මම තවත් එක කරුණක් ගරු ඇමතිතුමාට මතක් කරන්නට ඕනෑ. තමුන්නාන්සේ මගේ අදහස් සමඟ සමහර විට එකඟ නොවන්නට පුළුවන්. වෙනත් උපාධීන් ලබාදීම සඳහා පාඨමාලා පැවැත්වීමට පෞද්ගලික විද්‍යාලවලට—පෞද්ගලික ආයතනවලට—ඉඩ ප්‍රස්ථාව දෙන්නට ආණ්ඩුව බලාපොරොත්තු වෙනවාය කියන දෙය අපිට දැනගන්නට ලැබුණා. මේ රටේ වාණිජ විද්‍යා උපාධි—බී.බී.ඒ. සහ එම්.බී.ඒ. වැනි උපාධි—ප්‍රදානය කිරීම සඳහා පාඨමාලා පවත්වාගෙන යෑමට යම්කිසි පෞද්ගලික සමාගමකට අවසර දීම පෙරදැරි කරගෙන සාකච්ඡා ආරම්භ කර තිබෙන බවත් පසුගිය දවසක අපිට දැනගන්නට ලැබුණා. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දැනට එවැනි වාණිජ පාඨමාලා සඳහා වෙනම අධ්‍යාපන පීඨයක් තිබෙනවා. ඒ හා සම්බන්ධ අයගේත් විරුද්ධත්වය මේ සඳහා දැනටමත් පළවෙලා තිබෙනවා. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය මෙන් වෙනත් උපාධීන් ප්‍රදානය කිරීම සඳහා පාඨමාලා පැවැත්වීමේ අවස්ථාව පෞද්ගලික අංශයේ ආයතනවලටත් ඇති කරන්නට ඉඩ ප්‍රස්ථාව දෙන්නට රජය බලාපොරොත්තු වෙනවාද කියන එක ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අපි දැනගන්නට කැමතියි. එවැනි තත්ත්වයන් නම් ඇති කරන්නට එපා. මන්ද, උසස් අධ්‍යාපනය සහ සාමාන්‍ය පොදු අධ්‍යාපනය රජය මගින්ම කළ යුතුය කියාත්, නිදහස් අධ්‍යාපනයක් හැටියට එය පවත්වාගෙන යා යුතුය කියාත් 1945 වර්ෂයේදී වැනි වූ ඈත එපිට කාලවලදීත් අතිගරු ජනාධිපතිතුමා මේ රටට ප්‍රකාශ කර තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංවිධාන කමිටුවේ වාර්තාව රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත්වුණු වෙලාවේත් අද මේ රටේ රටේ උසස් අධ්‍යාපනය භාරව ඉන්න අමාත්‍යවරයා වන අතිගරු ජනාධිපතිතුමා එද කළ ප්‍රකාශය දෙස බැලුවොත් අද මේ කරන දෙය මොකක්ද කියන එකතමයි අපිට ප්‍රශ්න කරන්නට සිදු වෙන්නේ.

මේ අධ්‍යාපනය පෞද්ගලික අංශයට ගියාම සිදු විය හැක්කේ කුමක්ද ? මුදල් තිබෙන අයගේ දරුවන්ට පමණයි එතකොට මේ අධ්‍යාපනය සඳහා අවස්ථාව ලැබෙන්නේ. ඒ තුළින් සාමාන්‍ය ජනතාවගේ දරුවන්ට නිදහස් අධ්‍යාපනයෙන් ඉහළට එන්නට තිබුණු අවස්ථාවත්—සමාජයේ ඉහළට එන්නට තිබුණු අවස්ථාවත්—නැති කිරීමේ භයානක කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. අපි එය වැළැක්වීමට අවශ්‍ය පියවරගන්නට ඕනෑ. ඉදිරියට පවත්වාගෙන යන්නට බලාපොරොත්තු වන ජාතික පාසල් රටාව තුළිනුත් සමහර විට මෙය සිදුවන්නට පුළුවන්. මේ රටේ හොඳම පාසල් ගණනාවක් තෝරාගෙන ඒවා ලබන වර්ෂයේ සිට ජාතික පාසල් පදනමට පරිවර්තනය වෙලා යම්කිසි දුරකට ඒවායේ නඩත්තු වියදම් ආදියත් ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමව්පියන්ගෙන් කෙළින්ම නොවුණත් ආධාර වශයෙන් හෝ අය කර ගැනීමට තමුන්නාන්සේලා කල්පනා කරනවා නම්, සල්ලි තිබෙන උදවියගේ දරුවන්ට පමණයි, ඔය කියන ජාතික පාසල්වල අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වන්නේ. විශ්ව විද්‍යාලවලට ඉදිරි කාලයේදී තේරෙන්නේත් ඒ වගේ කොටසකගේ දරුවන් පමණයි. මෙන්න මේ කාරණය ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට ඕනෑ.

මේ රටේ නිදහස් අධ්‍යාපනය ලැබීමටත් ඒ මගින් උසස් අධ්‍යාපනය ලැබීමටත් සාමාන්‍ය දෙමව්පියන්ගේ දරුවන්ට පාසල්වලට හා විශ්ව විද්‍යාලවලට ඇතුළුවීමට තිබුණු අවස්ථාව නඩත්තු මුදල් ආදී ක්‍රම තුළින් දැන් බොහොම සියුම් ලෙස කප්පාදු කිරීමේ වැඩපිළිවෙලක් ඇති කරගෙන යනවා. එය වැළැක්වීම අපේ රටේ අනාගතය වෙනුවෙන් ඉෂ්ට කළ හැකි, කළ යුතු, ඉතා වැදගත් සේවාවක්. මේ රටේ ජනතාව යම්කිසි ජයග්‍රහණයක් යම් යම් අංශවලින් පසුගිය කාලෙේ ලබා තිබෙනවා. අපි ඒක පක්ෂයකට සීමා කරන්න ඕනෑ නැහැ. සමස්තයක් වශයෙන් බලන විට මේ රටට නිදහස ලැබීමෙන් පසු ඇති වුණු යම් යම් වෙනස්වීම් අපට ඉතිහාසය අනුව පෙනී යනවා. ඒ ඉතිහාසයේ උරුමය බුක්තිවින්ද උදවියගේ එම අයිතිය නැති කරන්නට කිසිම නිලධාරියෙකුට මොනම විධියකින්වත් අපි කවදාවත් ඉඩ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

දෙන්නට හොඳ නැහැ. මේ රටේ උසස් අධ්‍යාපනය තුළින් තමන්ගේත් මහා ධනවතුන්ගේත් අවශ්‍යතාවත් ඉෂ්ට කරන්නට උත්සාහ කරන නිලධාරීන් කවුරුන්දැයි තේරුම් අරගෙන මේ ආකාරයට මහජන අපරාධයක් සිද්ධ කරන්නට හවුල් වන්නට එපාය කියලා අපි අවධාරණයෙන්ම ඒ නිලධාරීන්ට කියන්නට ඕනෑ.

මේ මුළු රටේම — ශ්‍රී ලංකා ද්වීපයේම — සිටින ජනතාවගේ දරුවන් ගැන අපි බලන්න ඕනෑ. තමන්ගේත් සීමාසහිත තවත් කොටසකගේත් දරුවන් ගැන පමණක් බලන්න එපා. අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඕනෑම කෙනෙකුට පිටරට විශ්ව විද්‍යාලයකට ගොස් අධ්‍යාපනය ලබන්නට ඉඩ දීලා තිබෙනවා. ඒ අයට ඒට අවශ්‍ය සල්ලි තිබෙනවා නම් පිටරට විශ්ව විද්‍යාලවලට යන්න කියන්න. එනෙක් ඒ තරමට සල්ලි නැති අයගේ දරුවන්ට මේවා ඉතිරි කරන්නැයි කියන්න. අන්න ඒ විධියේ ප්‍රතිපත්තියක්වත් මේ නිලධාරීන් අනුගමනය කරන්නට ඕනෑ. සිදුවේගන යන දේවල් දිහා බලාගෙන ඉන්න විට ඒ අය එහි අනෙක් පැත්ත අනුගමනය කරන්නට බලාපොරොත්තු වන බවයි අපට නම් පෙනී යන්නේ. මේ ගැන අපි කණගාටු වෙනවා. මේක තමයි ඉදිරියට ඇතිවන්නට ඉඩ ප්‍රස්ථාව තිබෙන තත්ත්වය. මෙය වළක්වන්නට වැඩ කරන්නේ කියන ටික මම විශේෂයෙන් කියන්නට ඕනෑ.

දිස්ත්‍රික්ක පදනම යටතේ විශ්ව විද්‍යාලවලට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍යයින් සිටිනවා. ඒ පදනම යටතේම ඇතුළත් කර ගැනීමේ විශේෂත්වයක් ලැබූ ශිෂ්‍යයින් ද සිටිනවා. ඇත එපිට දිස්ත්‍රික්ක බොහොමයක සිසුන් රැසකට එහි ප්‍රයෝජනය ලබාගෙන විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට අවස්ථාව ලැබී තිබෙනවා. ඒ වාගේම වෙනසක් නැතිව ඒ ක්‍රමයට දැනටත් ඇතුළත් වෙමින් පවතිනවා. මෙය නැවත සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කළා. ඒ කමිටු වාර්තාවත් දැන් භාර දී තිබෙනවා. ඒ කමිටු වාර්තාවේ නිර්දේශ මොනවාදැයි පුවත්පත්වල පළවුණා. පුවත්පත්වල පළ කරන ලද්දේ වාර්තාවේ තිබුණු ආකාරයෙන්මද කියන්නට මම දන්නේ නැහැ. යම් යම් දිස්ත්‍රික්කයන් දැනට ලබා තිබෙන ඒ විශේෂත්වයන් ඉවත් කරන බව ඒ නිර්දේශවල තිබුණා. එවැනි තත්ත්වයකට පත් කරනු ලැබීමට ඒ පළාත්වල තිබෙන පාසල් සුදුසුකම් ලබා තිබෙනවාද කියන දෙයයි අපි බලන්නට ඕනෑ. අවශ්‍ය සුදුසුකම් නැතිව ඒ දිස්ත්‍රික්ක එම තත්ත්වයෙන් ඉවත් කළොත් ඒ දිස්ත්‍රික්කවල දරුවන්ට විශ්ව විද්‍යාලවලට යන්නට මෙතෙක් තිබුණු විශේෂත්වය නැතිව යනවා. මම දන්න විධියට ඒ ඉවත් කරන්නට නිර්දේශ කර තිබෙන දිස්ත්‍රික්කවලින් එකක් තමයි පොළොන්නරුව. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසල් මේ තත්ත්වයෙන් ඉවත් කිරීමට නිර්දේශ කළේ එහි ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් තිබෙන නිසාද කියන දේ ගැන අපි කල්පනා කරන්නට ඕනෑ. අලුතෙන් පැමිණි මින්නේරියේ ගරු මන්ත්‍රීතුමාත් (එච්. බී. විජේකෝන් මහතා) දැන් මෙහි සිටිනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සෑම පාසලක්ම එවැනි තත්ත්වයක නැහැයි කියන කාරණය ගැන එතුමා පවා එකඟ වෙයි. එම නිසා මේවා මොන ආකාරයෙන් ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවාද කියන කාරණය ගැන අපි පැහැදිලිව දැනගන්නට කැමතියි.

මේ රටේ සංවර්ධනයට අවශ්‍ය අධ්‍යයන පීඨයන් මෙන්ම නව විශ්ව විද්‍යාල කීපයක් හෝ ඇති කිරීමට වැඩ කටයුතු කරන ලෙස ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. මහවැලි සංවර්ධනය කියන්නේ ඉදිරි කාලයේදී අපේ රටේ ආර්ථික සංවර්ධනයේ ඉතාමත් විශාල ක්ෂේත්‍රයක්. වර්තමානයේදීත්, අනාගතයේදීත් එයට මහා පරිමාණ වශයෙන් අපේ රටේ ආර්ථික, භූගෝලීය සහ සමාජ පදනමේ විශාල වෙනසක් ඇති කරන්නට පුළුවන්කම තිබෙනවා. එම නිසා කෘෂිකර්ම ක්ෂේත්‍රය ගැන මීට වැඩි අවධානයක් යොමු වන පරිදි මහවැලිය හෝ රජරට කෘෂිකර්ම ක්ෂේත්‍රයටම වෙන් වුණු විශ්ව විද්‍යාලයක් ඇති කිරීම වැදගත්ය කියා අපි විශ්වාස කරනවා. අද මහ ඉලුප්පල්ලම කෘෂිකර්ම පර්යේෂණායතනය, එහෙම නැතිනම් එවැනි වෙනත් පර්යේෂණායතනයි කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් බොහෝ දේ කරන්නේ. ඒ සම්බන්ධයෙන්අපේ විශ්ව විද්‍යාලවලටත් මීට වඩා පුළුල් වැඩ කොටසක් කරන්නට පුළුවන්කම තිබෙනවා. මීට වඩා විද්‍යාත්මක තත්ත්වයන් පිළිබඳව අවබෝධය ලත් ඒ වාගේම මේ රටේ දේශීය තත්ත්වයන් පිළිබඳව, පළාතෙන් පළාතට තිබෙන තත්ත්වයෙන් පිළිබඳව අවබෝධය ලත් ශිෂ්‍යයන් විශ්ව විද්‍යාල තුළින් ඒ ක්ෂේත්‍රයන් සඳහා පිට කිරීම ඉදිරි කාලයේදී මීට වඩා අත්‍යවශ්‍ය වෙනවා. ඉංජිනේරු ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි. එමනිසා මහවැලියේ, රජරට සහ නැගෙනහිර පළාත්වල ඉදිරි කාලයේදී ඇති වෙන්න පුළුවන්කම තිබෙන කෘෂිකාර්මික වැඩ පිළිවෙළවල් පිළිබඳව විශ්ව විද්‍යාලයේ පර්යේෂණාත්මක අංශයට මීට වැඩිය බරක් දමන්න ඕනෑය කියා මම හිතනවා. ඒ වාගේම ඒ අංශය මීට වඩා පුළුල් කර අලුතෙන් විශ්ව විද්‍යාල කීපයක් ඒ පළාත්වල ඇති කිරීමේ හැකියාව ගැනත් අපි සලකා බලන්න ඕනෑ.

අම්පාරේ තිබෙන හාඩි කර්මික ආයතනය ලංකාවේ දැනට ඉංජිනේරු වෘත්තියේ යෙදී සිටින්නන් විශාල පිරිසක් බිහි කළ ආයතනයක්. ලංකාවේ පමණක් නොවෙයි, එතැනින් පිට වූ අය විශාල සංඛ්‍යාවක් දැන් අප්‍රිකානු සහ අරාබි රටවලට ගොස් ඒ රටවල වැඩ කටයුතු කරනවා. ඒ ආයතනය මුලදී ජේටීඕ සහතිකයයි දුන්නේ. අද එම ආයතනය බොහොම කඩාවැටුණු තත්ත්වයකයි පවතින්නේ. එයින් මීට වඩා ප්‍රයෝජනයක් ගන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවා. කාර්මික ක්ෂේත්‍රයෙන් පුහුණුව ලත් නිලධාරීන් සොයන අද වැනි අවස්ථාවක මෙම ආයතනය මීට වඩා උසස් පදනමකට ගන්නා ලෙස මම මේ වේලාවේ ඉල්ලා සිටිනවා.

ගරු මහවැලි සංවර්ධන ඇමතිතුමාත් වාරිමාර්ග පිළිබඳ විශේෂ ආයතනයක් ඇති කරන්නට බලාපොරොත්තු වන බව අපට කිව්වා. ඒ අතර, මේ හාඩි ආයතනයත් මීට වඩා දියුණු කරගන්නට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. මෙය විශාල පරිත්‍යාගයක්. මෙය අපේ රටේ සංවර්ධනයට විශාල රුකුලක්. එයින් ලබා දෙන පුහුණුව සහ සහතිකය ඉතා වැදගත් නිසා මෙහි ඉගෙන ගන්නා ශිෂ්‍යයින් ඒ සහතික ලබාගෙන පිටරටවලට ගොස් රැකියාවත් කළත් අපට කමක් නැහැ. එම නිසා මේ කටයුත්ත ගැන විශේෂ අවධානයක් යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

දීර්ඝ වශයෙන් කථා කරන්නට මම බලාපොරොත්තු වන්නේ නැහැ. තව එක් කාරණයක් ගැන පමණක් මතක් කරන්නට කැමතියි. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මතු කළ ඒ කාරණය නම් පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයට ඇතුළත් කරනු ලැබ සිටින ශිෂ්‍යයන් පිළිබඳව මතු වී තිබෙන ප්‍රශ්නයි. 1985 වසර සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයට බඳවා ගන්නා 407ක් ශිෂ්‍යයන්ගෙන් 152 ක් සිංහල මාධ්‍යයෙන් වන අතර 243 ක් ද්‍රවිඩ මාධ්‍යයෙන් වෙනවා. එසේම ඉංග්‍රීසි මාධ්‍යයෙන් 12 යි. මේ අනුව එම ආයතනය මෙතෙක් කල් අනුගමනය කළ ප්‍රතිපත්තියේ වෙනසක් සිද්ධ වී තිබෙනවාද, සිද්ධ වී තිබෙනවා නම් ඒක එහෙම වුණේ ඇයිද කියා අපි දැනගන්නට කැමතියි. මේ ගැන එතැන සිටින ආචාර්ය මණ්ඩලයත් අදහස් ප්‍රකාශ කර තිබෙනවා. මේක මේ විධියට ක්‍රියාත්මක කරන්න ගියොත්, ඇතිවන තත්ත්වය ඒ අය පෙන්වා දී තිබෙනවා. එසේ වුවහොත් ආචාර්ය මණ්ඩලයට පවා අළුතෙන් බඳවා ගැනීම් කරන්නට වෙනවා. දැනට සිටින අය අයින් කරන්නටත් සිද්ධ වෙනවා. ඒ වාගේම අවශ්‍ය වෙනත් පහසුකම් එතැන නැති බවත් පෙන්වා දී තිබෙනවා. ඒ නිසා මෙතෙක් අනුගමනය කළ ප්‍රතිපත්තියේ යම්කිසි වෙනසක් ඇති කරන්න බලාපොරොත්තු වෙනවාද, එහෙම නම් ඒ මොකක්ද යන ප්‍රශ්නවලට පැහැදිලි ප්‍රකාශයක් අපි බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන්.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම, යාපනයේ විශ්ව විද්‍යාලයත් මඩකලපුවේ විශ්ව විද්‍යාලයත් ජාතික මට්ටමේ විශ්ව විද්‍යාල ලෙස ක්‍රියාත්මක වෙනවාද යන්න ගැන ප්‍රශ්නයක් තිබෙනවා. අපි මේ ප්‍රශ්නය පසුගිය වතාවකත් මතු කළා. මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරන්නේ එවැනි තත්ත්වයකින් ඒවා ක්‍රියාත්මක වන්නේ නැත කියන එකයි. විශ්ව විද්‍යාලයක් මේ රටේ එක ජන කොට්ඨාශයකට පමණක් දී තිබෙනවා නම්, එක ජාතියකට පමණක් දී තිබෙනවා නම්, ඒක ජාතික විශ්ව විද්‍යාලයක් වෙන්නෙ නැහැ. නමුත් මඩකලපුවේත්, යාපනයේත් විශ්ව විද්‍යාල ඒ තත්ත්වයකටයි අද පත්වෙලා තිබෙන්නෙ. ඒ විශ්ව විද්‍යාල එක ජන කොටසක් පමණක්, එක ජන වර්ගයක් පමණක් අධ්‍යාපනය ලබන විශ්ව විද්‍යාල බවට පත්වී තිබෙනවා. මේ තත්ත්වය අපි කොහොම හරි වෙනස් කරන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, ආණ්ඩු පක්ෂයේම ගරු ඇමතිතුමෙක් ලියා තිබෙන පොතකට. මේක අච්චු ගහලා තිබෙනවා. මා දැන් එම පොතෙන් කියවන්නේ, පොඩි කොටසක් පමණයි. ඔක්කොම කියවන්නට ඕනෑ නැහැ. මෙය පළ කර තිබෙන්නේ කළුවාදෙවගේ සිරිල් මැතිව් ගරු ඇමතිතුමා. 1984 ජූනි 14 වැනි දින ප්‍රකාශකර දැන් මෙය තිබෙනවා, හැමතැනම. මම පෙරේදායි මේක දුටුවෙ. මම මේ ගරු උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානයට යොමුකරවන්නේ, ආණ්ඩු පක්ෂයේම ප්‍රධාන ඇමතිවරයකුගේ මතයක් නියයි. එහි 6 වැනි පිටුවේ 8 වැනි අංකය යටතේ මෙසේ තිබෙනවා :

කිසියම් විශ්ව විද්‍යාලයක් දැනට පවතින ස්ථානයේ ඇතිවිට එයට නියම වශයෙන් ජාතික ආයතනයක් ලෙස කටයුතු කිරීමට නොහැකි තත්ත්වයක් උදවී ඇත්නම් එය වහාම අපේක්ෂිත ජාතික සේවාව ඉටු කළහැකි ස්ථානයකට ගෙන යා යුතුය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරයෙක් මේක කියන්නේ. මම මේ කාරණය මතක් කලේ, ජාතික විශ්ව විද්‍යාල පිළිබඳ තත්ත්වය කුමක්ද කියන දේ ගැන අපි කාගේත් එකඟත්වයක් තිබෙන්නට ඕනෑ නිසයි. මෙම පොතේ පසුව තිබෙන කරුණු සියල්ලක්ම මම කියන්නට ඕනෑ නැහැ. යාපනේ විශ්ව විද්‍යාලයට වූ දේත්, මඩකලපුවේ විශ්ව විද්‍යාලයට වෙමින් පවතින දේත් මෙතැන කියනවා. ඒනිසා අපි වගකීමක් දරන්නට ඕනෑ. ඒ ආයතනවලට අනික් ජන කොටස්වලටත් ඇතුලත් වෙන්නට ඉඩ දෙන්නට. අපේ මේ ප්‍රදේශවල, ඒ ආකාරයේම විශ්ව විද්‍යාලවල, විවිධ කොටස් ඉන්නවා. ඒ අයටත් ඒ තත්ත්වය ඇතිකර දීමට අපි වැඩකටයුතු කරන්නට ඕනෑ. අපි දන්නේ නැහැ මේ තත්ත්වය, ඉදිරි කාලයේදී ඇති වෙන්නට යන්නාවූ යම්කිසි ගිවිසුමක මූල අදහස්ද කියා. එක පළාතක් එක ජන වර්ගයකට සදාකාලිකවම දෙන්නට බලාපොරොත්තු වෙනවා නම්, ඒක මේ විශ්ව විද්‍යාලවලින් ඒ ආකාරයට දෙන්නට බලාපොරොත්තුවීම පුදුමයක් නොවෙයි. එසේ නොවෙනවා නම් මේ තත්ත්වය වෙනස් කළ යුතුමයි. මන්ද, මේ රටේ සෑම තැනකම කුමන ජන කොටසකට වුවත් – ද්‍රවිඩ වේවා, සිංහල වේවා, මුස්ලිම් වේවා ඒ සෑම දෙනාටම – තමන්ගේ ජීවිකාව ගෙන යන්නට, ජීවන වෘත්තිය පවත්වාගෙන යන්නට, නිදහසේ ජීවත් වන්නට පුළුවන් පදනම තිබෙන්නට ඕනෑ, රටේ හැම බිම් අඟලකම. ඒක එක එක ජන කොට්ඨාශ වලට වෙන් කරන්නට සුදුසු නැහැ. ඒ තත්ත්වය අපි කවුරුත් පිළිගන්නට ඕනෑ. ඒනිසා මේ තත්ත්වය බේරා ගන්නට වැඩ කරනවාය කියා මම ඉල්ලා සිටිනවා.

පසුගිය කාලයේදී විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන්ට අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩල පිහිටුවා ගැනීමට තිබුණු ඉඩකඩ අහෝසි කිරීම ගැන කියන්නට ඕනෑ. අද ඒවා නීත්‍යානුකූලව පවත්වාගෙන යන්නට බැහැ. ඒක කාලයක් තිස්සේ පවත්වාගෙන ආ දෙයක්. නමුත් අද එය නැති භංග කර තිබෙනවා. ඊට පස්සේ දැන් විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන් සංවිධාන පවත්වාගෙන යාම ඉවත් කර ශිෂ්‍යයන්ගේ සුභ සාධක –

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)

අන්තර් විශ්ව විද්‍යාල බල මණ්ඩලයක් ගැන මම නම් කවදාවත් අහලා නැහැ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා නම් අන්තර් විශ්ව විද්‍යාලීය බල මණ්ඩලයක් ගැන අහලා නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා විශ්ව විද්‍යාලයේ ඉන්න කාලේදී තිබුණු තත්ත්වය මීට වඩා දරුණුය කියලයි, මගේ හැඟීම. බොහෝම අරගල තිබුණා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් බොහෝ අරගලවලට සම්බන්ධවෙලා සිටියා. මේ ලඟදීත් මම දැක්කා, පින්තූර, බෝඩ් උස්සාගෙන අල්ලාගෙන ඉන්න හැටි, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ. ඒ එක යුගයක්. හොඳයි අපි ඒ යුගය අමතක කරමු, එහෙම යුගයක් තිබුණේ නැහැ කියල. එහෙත් ශිෂ්‍යයන්ට සංවිධානය වීමේ අයිතිය ලෝකයේ හැම තැනම ලැබී තිබෙන දෙයක් ; ලෝකයේ හැම විශ්ව විද්‍යාලයකම තිබෙන දෙයක්. අපි ඒක මෙල්ල කිරීම සුදුසු නැහැ. අපි ඒක යටපත් කිරීමට, මර්දනය කිරීමට උත්සාහ දැරුවොත් ඒ ශිෂ්‍යයන් වෙන වෙනත් මාධ්‍ය පාවිච්චි කරයි. ඊට වඩා හොඳයි විවෘතව ශිෂ්‍යයන්ට ශිෂ්‍ය සංවිධාන පවත්වාගෙන යන්නට ඉඩ දී මීට වඩා හොඳ විධියකට පාලකයන් සමග ඒ ශිෂ්‍යයන්ට සාකච්ඡාවට පිවිසෙන මාර්ගයක් ඇති කර දීම. ඒක තමයි, මම හිතන විධියට උසස්ම ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණය වන්නේ. එහෙම නැතිව මීට වඩා දරුණු ලෙස ඒ තත්ත්වය පාලනය කරන්න ගියොත් ඒ ශිෂ්‍යයන්ගේ ප්‍රශ්න විසඳා ගැනීමට ඔවුන්ට නියෝජනය වන්නට තිබෙන අවස්ථාව නැති වෙන්න පුළුවන්. පසුගිය කාලෙ උප කුලපති කෙනෙක් වාගේ තමන්ට සියලු දේ විසඳන්න පුළුවන් කියා හිතාගෙන ශිෂ්‍යයන්ගේවත් ආචාර්යවරුන්ගේවත් වෙනත් ආයතනවලත් අදහස් ගණන් ගන්නේ නැතිව හිතුවක්කාර ලෙස හැසුරුණොත් විය හැකි විනාශය මීට වඩා වැඩි වෙන්න පුළුවන්. ඒ මොකද අද විශ්ව විද්‍යාලවල දහස් ගණන් ශිෂ්‍යයන් සිටිනවා. ඒ වාගේම අද ශිෂ්‍යයන්ට තමන්ගේ නේවාසික පහසුකම් පිළිබඳව එදාට වඩා ගැටළු මතු වෙමින් පවතිනවා.

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! Mr. Deputy Speaker will now take the Chair.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்தின] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER, *left the Chair and* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *took the Chair.*

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ගරු සභාපතිතුමනි, මම විස්තර කරමින් සිටියේ, අපේ විශ්ව විද්‍යාල ශිෂ්‍යන්ට නේවාසික පහසුකම් පිළිබඳව මතු වී පවතින ගැටළු ගැනයි. අපි කවුරුත් පිළිගන්න ඕනෑ අද රටේ ජීවත් වීම එන්න එන්නම මුදල්මය වශයෙන් අමාරු තත්ත්වයකට පරිවර්තනය වෙමින් පවතිනවාය කියා. ඒ අයගේ දෙමව්පියන්ට ඒ අය නඩත්තු කරන්න පුළුවන් ප්‍රමාණය සීමා වෙමින් පවතිනවා. යම්කිසි ආධාරයක් රජයෙන් නැත්නම් විශ්ව විද්‍යාලයෙන් දුන්නත් නේවාසික පහසුකම් සොයාගැනීම ලොකු ගැටළුවක්. මේ ප්‍රශ්නයට මම හිතන්නෙ විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. වෙනද තිබුණ පහසුකම් ගණනාවක් අද අඩු වෙමින් පවතිනවා. ඒ නිසා ඒ ගැන විශේෂ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලනවා.

මම අවසාන වශයෙන් නැවතත් මතක් කරන්න කැමතියි, මේ රටේ නිදහස් අධ්‍යාපනයේ පදනම විනාශ කරන්නට අපි වැඩ කළ යුතු නැති බව. වර්තමානයේ අපේ තරුණ පරම්පරාවට විවිධ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබා ලෝකයේ ඕනෑම තැනකට ගිහින් සේවය කිරීමේ හැකියාව, දක්ෂතාව අනුව වැඩ කරන්නට පුළුවන් හැකියාව ලැබී තිබෙන්නේ නිදහස් අධ්‍යාපනයේ පල ප්‍රයෝජන නිසයි. නමුත් මෙම රටාවෙන් ඉවත් වී පෞද්ගලික විශ්ව විද්‍යාල සහ උපාධි පිරි නැම්මේ මාධ්‍යයට ඉඩ දීම නිසා ඉදිරි අවුරුදු දෙක තුන ඇතුලතදී සීමා සහිත වරප්‍රසාද ලත් කොටසකට පමණක් මේ රටේ උසස් අධ්‍යාපනයේ හිමිකාරයන් වෙන්න පුළුවන්. ඒක අපි වැලැක්විය යුතුමයි. එය අපි මේ රටේ අනාගතය වෙනුවෙන් ඉටු කළ යුතු කටයුත්තක්.

ඒ වාගේම තවත් වැදගත් කාරණයක් මතක් වුණා. අපේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව මීට වඩා විශ්ව විද්‍යාල සමග කිට්ටුවෙන් ඉඳගෙන තමන්ගේ අවශ්‍ය පුහුණු නිලධාරීන් බඳවා ගැනීම සඳහා ඇති පාඨමාලාව වැඩි දියුණු කරනවා නම් එය ඉතාමත් වැදගත්. මොකද, ඒ විශ්ව විද්‍යාල පර්යේෂණවලට උදව් වෙනවා වාගේම ඒ ආයතනයේ පර්යේෂණවලටත් උදව් වෙනවා. ඒ වාගේම මීට වඩා පුහුණු කොටසක් ඒ ආයතනවලට ඇතුළු වන්නට අවකාශ ලැබෙන විට ඒ අයගේ පුහුණුව ඊට පස්සේ කරන්න පුළුවන්. මම හිතන්නෙ වතු පාලකයන්ට විවිධ පුහුණු කිරීම් තිබෙනවා. ඔවුන් ලබන අධ්‍යාපනයෙන් පස්සේ පුහුණු කිරීම් කලත් කමක් නැහැ. නමුත් මේ විශාල ආයතන දෙක විශ්ව විද්‍යාලයට සම්බන්ධ වෙනවා නම් විශ්ව විද්‍යාල තුලින් දැනට වඩා යම් කිසි ප්‍රමාණයක් කලා පීඨවලට ඇතුළු වීමට සිටින අයගෙන් පවා සෑහෙන ප්‍රමාණයක් ඒ අංශවලට යොමු කරන්නට අවකාශ තිබෙනවා. ඒ අංශයේත් වගකීම දරන්නේ ගරු ජනාධිපතිතුමාමයි. ඒ නිසා කිසිම අමාරුවක් නැතිව නියෝගයක් මගින් මේ කාර්යය සකසා ගන්නට පුළුවන්. ඒ ගැන ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ ක්ෂේත්‍රයට සම්බන්ධිත වෙනත් අංශ තිබෙනවා. පොල් කර්මාන්තය, පොල් වැවීම හා කිරි නිෂ්පාදනය ආදී අංශවලට සම්බන්ධ කටයුතු විශ්ව විද්‍යාලයට සම්බන්ධ කිරීම සඳහා මීට වඩා වැඩි උත්සාහයක් දැරිය යුතුව තිබෙනවා. මේ ක්ෂේත්‍ර පිළිබඳ උනන්දුව මීට වැඩියෙන් ඇති කරන ලෙස ඉල්ලා සිටින අතරම, මේ රටේ ජනතාවගේ දරුවන්ට හිමි වී තිබුණු උසස් අධ්‍යාපනයට පිවිසීමේ මාර්ග කප්පාදු කිරීමට දැනට සියුම් ලෙස ගෙන යන වැඩ පිළිවෙලට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය හසු කරන්න එපාය යන ඉල්ලීම කරමින් මම නවතිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10. 55

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා, (මහනුවර දිසා ඇමතිතුමා)**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)**
(Mr. W. P. B. Dissanayake–District Minister, Kandy)

ගරු සභාපතිතුමනි, මේ වැදගත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් ඉතාම කෙටියෙන් කරුණු ස්වල්පයක් ප්‍රකාශ කිරීමටයි මම අදහස් කරන්නේ. මේ අවස්ථාවේදී මහනුවර දිස්ත්‍රික්කය වෙනුවෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මම අදහස් කළේ ලංකාවේ තිබෙන හොඳම ලොකු විශ්ව විද්‍යාලය මහනුවර තිබෙන නිසාත් මේ අමාත්‍යාංශයට සම්බන්ධිත අරුප්පල බහුතාක්ෂණිකායතනය, හසලක කාර්මික විද්‍යාලය යනාදී ආයතන රාශියක් මහනුවර තිබෙන නිසාත් ඒ ප්‍රදේශවාසීන්ගේ අදහස් ස්වල්පයක් ඒ පිරිස වෙනුවෙන් මේ සභාවේදී ප්‍රකාශ කිරීම මගේ යුතුකමක් හැටියට මම සලකන නිසායි.

වර්තමාන නායකත්වය යටතේ අලුතෙන් විශ්ව විද්‍යාල පීඨ දෙකක් හා අලුතෙන්ම විශ්ව විද්‍යාලයක් මේ රටේ ඇති කරන්න උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පුළුවන් වීම ගැන අපි ආඩම්බර වෙනවා. රුහුණු විශ්ව විද්‍යාලය මේ රජය විසින්ම මේ රටේ ආරම්භ කරන ලද අලුත්ම විශ්ව විද්‍යාලයයි. එහි වෛද්‍ය අංශයක් ඇති කිරීම නිසා දැන් එය අංග සම්පූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පරිවර්තනය වේගෙන යනවා. දුම්බර පීඨය හා මඩකලපු පීඨය ඇති කිරීමෙන් මේ රටේ උසස් අධ්‍යාපනයට වැදගත් රුකුලක් ලැබුණු අතර මොරටුවේ ආතර් සී. ක්ලාක් ආයතනය ඇති කිරීම නිසා මේ රටේ අනාගත විද්‍යාඥයන් වීමේ බලාපොරොත්තුවෙන් උසස් අධ්‍යාපනය ලැබීමට සිටින අයටත් උගතුන් වීමට බලාපොරොත්තු වන තරුණ පරම්පරාවටත් විශාල සේවාවක් සිදු වන බව ආඩම්බරයෙන් මේ සභාවේදී මතක් කළ යුතුව තිබෙනවා.

නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල දැනුයි මේ රටේ සමහර කොටස්වලට ලැබිගෙන එන්නේ. නොමිලයේ පොත් ලබා දීම පටන්ගෙන දැන් අවුරුදු දෙකක් නැත්නම් තුනක් වෙනවා. ඒ ඉගෙන ගන්නා ළමයින් විශ්ව විද්‍යාලයට යන්නේ තවත් කාලයකදීයි. නිදහස් අධ්‍යාපනයට පින් සිදු වන්නට අපේ ගම්වලිනුත් එක්කෙනෙක් දෙන්නෙක් විශ්ව විද්‍යාලයට ගියා. සමහර දෙනාට බැරි වුණත්. අපේ උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා පවා විශ්ව විද්‍යාලයට ගියේ දියුණු ප්‍රදේශයකින් නොව උඩදුම්බර, හසලක වැනි ඉතාම නොදියුණු ප්‍රදේශයකින් බව මම මතක් කරන්නේ ආඩම්බරයෙන්. නමුත් දැන් අපේ අධ්‍යාපනයෙහි ඇතිවේගෙන යන පරිවර්තනය නිසා අපේ ගම්බද ජනතාවට ඒ වරප්‍රසාදය අහිමි වේදෝ යන සැහෙන විධියේ බියක් අද ගම්වල ඇති වී තිබෙනවා. අන්න ඒ බව ප්‍රකාශ කරන්නයි, විශේෂයෙන්ම මම කතා කරන්න බලාපොරොත්තු වුණේ.

පේරාදෙණිය මණ්ඩපයට සිසුන් ඇතුළත් කිරීම ගැන විවිධ අදහස් මතු වී තිබෙනවා. මේ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලයේ පීඨාධිපති කෙනෙක් ම ප්‍රකාශ කර තිබෙන දෙයක්, 1984 දෙසැම්බර් මස 5 වැනි දින 'දිවයින' ඉරිද සංග්‍රහයේ පළ වී තිබෙනවා මම දැක්කා. 'දුම්බර පීඨයට සිසුන් තේරූ හැටි පීඨාධිපතිටත් රහසක්' යනුවෙන් එහි සඳහන් වෙනවා. එහි කියන්නේ දුම්බර පීඨයට ළමයින් ඇතුළත් කිරීමේදී යම්කිසි දෙයක් සිදු වුණු බවයි. මෙහි සත්‍ය-අසත්‍යතාව මම දන්නේ නැහැ. නමුත් ද්‍රවිඩ මාධ්‍ය සිසුන් පනහක් දුම්බරින් යාපනයට යැව්වාය කියන පුවතක් තවත් 'දිවයින' ඉරිද සංග්‍රහයක පළවී තිබෙනවා මම දැක්කා. තත්ත්වය දැන් මගහැරී ඇතැයි මම හිතනවා. යම්කිසි අඩුපාඩුවක් පෙන්නා දුන් විට එය හරි ගස්සන්න පුළුවන් ආත්ම ශක්තියක් විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් කටයුතු කරන උසස් නිලධාරීන්ට තිබීම ගැන මම සන්තෝෂ වෙනවා. මම ඊට වඩා ඒ ගැන කියන්නේ නැහැ.

නමුත් මේ කලා අංශය නැති කරන්න යනවාය, එහි කප්පාදුවක් ඇති කරන්න යනවාය කියන එක ගැන නම් අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ගම්බද පළාත්වල පාසල් තවම විද්‍යා ගුරුවරුන් ගැන අතලවත් නැහැ. ගම්පොළ ආසනයෙත් සමහර පාසල්වල විද්‍යා ගුරුවරුන් ඉන්නවා. සමහර පාසල්වල නැහැ. ඒ ඉන්න විද්‍යා ගුරුවරුනුත් විද්‍යා ගුරුවරුන් හැටියට අපි පිළිගෙන තිබුණත් අපොස සාමාන්‍ය පෙළ සමත් කළ ළමයිනුයි ඒවායේ උගන්වන්නේ. ඒ දරුවන්ට අගෞරවයක් කරන්න නොවෙයි, මම එහෙම කියන්නේ. විද්‍යා උපාධිධාරීන් අපේ මහා විද්‍යාලවලට ලැබිල නැහැ. ඒ නිසා ඒ විද්‍යාලවලින් දැනුත් අනිවාර්යයෙන්ම බිහි විය යුත්තේ කලා අංශයේ ශිෂ්‍යයින් පමණයි. ඒ දරුවන් තමයි, විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉදිරිපත් වෙන්නෙ. ඒ දරුවන්ට ලැබෙන අවස්ථාව මේ ක්‍රියාදාමය තුළින් අඩුවේගෙන යනවා නම් මම ඒ ගැන කථා කළ යුතුයි. මොකද, මම නියෝජනය කරන්නෙ නොදියුණු ඡන්ද කොට්ඨාශයක්. මහනුවර දිස්ත්‍රික්කය දියුණු ප්‍රදේශයක් කියල කවුරු කිව්වත් එය දියුණු ප්‍රදේශයක් නොවෙයි. නොදියුණු ප්‍රදේශ රාශියක් එහි තිබෙනවා. ඒ නිසා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නෙ මෙම කාරණයටයි. කලා අංශයේ කප්පාදුවක් කරන්න අවශ්‍ය නම් අපේ ප්‍රදේශවල දරුවන්ට කලා අංශයට ඇතුළත් වීමට තිබෙන වරප්‍රසාදය භුක්ති විඳින්න තව කාලයක් ඉඩ දෙන්න.

ඒ වගේම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතු තව දෙයක් තිබෙනවා. කලා අංශයට ඇතුල් වෙන්නට සුදුසුකම් ලබන ළමයින් අපි යම්කිසි ස්ථානයකදී විශ්ව විද්‍යාලයේ දොර ළඟ දී—නවත්වනවා නම් ඔවුන්ගේ අනාගතය සම්බන්ධයෙන් අප විසින් වෙනත් වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනෑ. රක්ෂාවල් නොලැබුණාට කමක් නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම තමුන්නාන්සේට කියා සිටින්නේ මෙයයි. උපාධියක් ලබා ගන්නේ රක්ෂාවක් සඳහාම නොවෙයි. උපාධියක් තිබෙනවා නම් රක්ෂාවක් සොයා ගැනීම දෙවැනි ප්‍රශ්නයක්. නමුත් මේ දරුවන්ට විශ්ව විද්‍යාලයට ඇතුල් වෙන්නට තිබෙන ඉඩ කඩ සීමා කරන්න එපා කියන එකයි මම මතක් කරන්නෙ. කලා අංශය අපි එහෙම අඩු කරගෙන ගියොත් මොකද වෙන්නෙ ? පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ තත්ත්වය ගැන බලන්න. තිබෙන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා නියෝජනය කරන ප්‍රදේශයේයි. මුළු ආසියාවේම තිබෙන හොඳම පුස්තකාලය තිබෙන්නේ පේරාදෙණියේයි. එය ඉතාම ලස්සන, වාසනාවන්ත, සෞම්‍ය දර්ශනයක් තිබෙන පසුබිමක පිහිටා තිබෙන මණ්ඩපයක්. මේ මණ්ඩපයේ තිබෙන සම්පත අද විනාශ වීගෙන යනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය විශේෂයෙන් මේ කාරණා කෙරෙහි මම යොමු කරවනවා. පශ්චාත් උපාධිධාරී කථිකාචාර්යවරුන් 100 කට වැඩි පිරිසක් අද එහි ඉන්නවා. ඔවුන්ගෙන් සියයට 90 ක්ම සිංහලෙන් උගන්වන්න පුළුවන් උදවියයි. අපි කලා අංශය කප්පාදු කරන්නට ඉඩ අරිනවා නම්, ක්‍රම ක්‍රමයෙන් එය කප්පාදු කරගෙන යනවා නම්, ඒ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන්ගේ අතිරික්තයක් ඇති වෙනවා. තමුන්නාන්සේ කල්පනා කර බැලුවොත්, තව ශිෂ්‍යයින් 200 ක් වැඩිපුර පේරාදෙණිය මණ්ඩපයට ඇතුළත් කර ගන්න පුළුවන්. ඒ සඳහා එකම අතිරේක කථිකාචාර්යවරයෙක්වත් අවශ්‍ය නැහැ. ඩෙස් බංකු, පුටු එකක්වත් ගන්න අවශ්‍ය නැහැ. එකම අතිරේක විදුලි බුබුලක් පත්තු කරන්න අවශ්‍ය නැහැ. අන්න ඒ අවස්ථාව ගම්බද ප්‍රදේශවල ඉගෙණ ගන්න අහිංසක ගොවි පවුල්වලින් නැගිට ගන්න උත්සාහ කරන අහිංසක තරුණ තරුණියන්ට ලබා දෙන්නය කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් වේදනාවකින් යුතුව මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටිනවා.

අපි නියෝජනය කරන්නේ ධනපතියන් ඉන්න කොට්ඨාශ නොවෙයි. ඒවායේ වැඩි වශයෙන් ඉන්නේ දුප්පත් මිනිසුන්. ඒ මිනිසුන්ගේ දරුවන් විශ්ව විද්‍යාලවලට යන්නෙ කොහොමද ? උදේට දහසකුත් එකක් ගොවිතැන් කටයුතුවලට දෙමව්පියන්ට උදව් කර තමයි, ඉස්කෝලෙ යන්නෙ. ඉස්කෝලෙ ඇරිල ඇවිදිනුත් ඒ කටයුතුවලට තමයි සහභාගී වෙන්නෙ. අතිරේක ටියුෂන් පංතිවලට යන්න, ඒ ගම්බද ප්‍රදේශවල 'ටියුෂන්' පංති ඇත්තෙ නැහැ. රෑ නිස්සේ, බොහෝ විට ලාම්පුතෙල් කුප්පියක් ළඟ තබාගෙන, පාඩම් කර විභාග සමත් කරල තමයි, ඒ ළමයින් විශ්ව විද්‍යාලවලට යන්නෙ. අන්න ඒ දරුවන්ට පේරාදෙණිය මණ්ඩපයේ ඉඩ තියෙන්න ඕනෑ. ඒ ප්‍රදේශවල දරුවන්ට ඒ විශ්ව විද්‍යාලයේ දොර ඇරෙන්න ඕනෑ. අපේ පළාතේ ළමයින්ට, ඌව පළාතේ ළමයින්ට, කෑගල්ලේ ළමයින්ට, මාතලේ ළමයින්ට, නුවරඑළියේ ළමයින්ට [බාධාකිරීමක්] තමුන්නාන්සේලාට පුළුවන් යාපනයට යන්න. අනුරාධපුරයට කිට්ටුයි නේ. මම එහෙම කියන්නෙ නැහැ. එමනිසා ඒ අවට ඉන්න දරුවන්ට ඒ විශ්ව විද්‍යාලයට යන්න පුළුවන් ක්‍රමයක් සකස් කර දෙන්නය කියා මා අවධාරණයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා එහෙම කියන්නේ කරුණු දන්න නිසයි.

මගේ ඡන්ද කොට්ඨාශයේ ඉතාමත් අහිංසක හිතවත් සහෝදරයෙකුගේ දරුවෙක් ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ඇතුලු වුණා. ඒ දරුවා මා හමුවෙලා කිව්වා "මගේ පියාට මුදල් වියදම් කරන්න බහැ ; ඒ නිසා මට විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය කරන්නට බැහැ ; මට මොකක් හරි රක්ෂාවක් හොයල දෙන්න" කියල. මේ වාගේ දරුවන්ට පේරාදෙණිය මණ්ඩපයට ඇතුලුවෙන්න ඉඩ දෙන්න. ඒ ප්‍රදේශවාසීන්ගේ අයිතියක් හැටියටයි, මම තමුන්නාන්සේට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙය මතක් කරන්නේ. මම දන්නවා, ලකුණු මට්ටමක් ඇතිවයි එක එක මණ්ඩපයට ඇතුලු කරන්නේ. මේ ලකුණු මට්ටම ගැන පසුගිය දවස්වල කථාවක් තිබුණා. මම මේ කාටවත් දොස් කියනවා නොවෙයි. සිංහල මාධ්‍යයෙන් ඉගෙනුම ලබන සිංහල දරුවන්ගේ ලකුණු පිළිබඳව – සම්මාන හා විශිෂ්ට සාමාර්ථ පිළිබඳව – සීමාවක් ඒ කථිකාචාර්යවරු ඇති කළාය කියා කථාවක් තිබුණා. [බාධා කිරීමක්] එය වැරදි නම් තමුන්නාන්සේ නිවැරදි කරන්න. මට ලැබුණු මේ ආරංචිය වැරදි නම් මේ සභාවේදී ඒ ආරංචිය ප්‍රකාශ කිරීම ගැන මම කණගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, පිටරට ශිෂ්‍යත්ව පිළිබඳවත් මා මතක් කරන්න ඕනැ. පිටරට ශිෂ්‍යත්ව අපේ පළාත්වලට ලැබෙන්නේ කොහොමද ? තමුන්නාන්සේලා ඒ සම්මුඛ පරීක්ෂණයේදී ක්‍රිකට් පිළිබඳ සහතික ඉල්ලනවා නම්, පිහිණුම් පිළිබඳ සහතික ඉල්ලනවා නම් කොහොමද අපේ පළාත්වල ළමයින් පිටරට යන්නේ ? මා අහන්න කැමතියි, අනුරාධපුර ගරු දිසා ඇමතිතුමාගෙන්, තමුන්නාන්සේගේ කොට්ඨාශයේ, තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයේ, ළමයින් කී දෙනෙකුට ක්‍රිකට් සහතික ඉදිරිපත් කරන්න පුළුවන්ද කියා. ආනන්දයේ ළමයින්ට ඒ වාගේම තවත් කොළඹ දියුණු විද්‍යාලවල ළමයින්ට නම් ඒවා ඉදිරිපත් කරන්න පුළුවන්. වක්ගුඩු ගහල එන ගම්බද ළමයින්ට, තට්ටු පැනලා එන ගම්බද ළමයින්ට කොහෙන්ද ක්‍රිකට් සහතික ? තට්ටු පැන්නාය කියා කව්රුවත් සහතික දෙන්නේ නැහැ. ඒවා තරගවලට ඇතුළත් වෙලත් නැහැ. ඒ ළමයින්ගෙන් ඇහුවොත් වෙනත් දේවල් ගැන ඒවා ගැන ඒ ළමයින්ට සහතික තිබෙනවා. නමුත් ඒ ළමයින්ට ඔය කියන සහතික නැහැ. එම නිසා පිටරට ශිෂ්‍යත්ව දෙන සම්මුඛ පරීක්ෂණවලදී ක්‍රිකට් සහතික ඉල්ලන්න එපා. ඒවාට ලකුණු දෙන්න එපා. ඒ ළමයින් ලබල තිබෙන සම්මාන සාමාර්ථවලට, "විශිෂ්ට" හා "සම්මාන" සාමාර්ථවලට ලකුණු දෙන්න. [බාධා කිරීම්] මම ශිෂ්‍යත්ව ඉල්ලන්නේ නැහැ. මගේ කව්රුවත් ශිෂ්‍යත්ව ගන්නත් නැහැ. නමුත් මම අපේ පළාත්වල දරුවන් ගැන කථා කරන්න ඕනැ. තමුන්නාන්සේලා පිටරට ශිෂ්‍යත්ව දීමේදී ක්‍රීඩාවලට යම්කිසි ලකුණු ක්‍රමයක් ඇති කරගෙන තිබෙනවා නම් එයින් ඒ ළමයින්ට අසාධාරණයක් වෙනවා.

ඒ වාගේම පිටරට ශිෂ්‍යත්ව සඳහා ඉංග්‍රීසි භාෂාව අනිවාර්යයි කියා තිබෙනවා. අපේ පළාතේ ඉංග්‍රීසි ගුරුවරුන් නැතිව කොහොමද අපේ දරුවන් ඉංග්‍රීසි ඉගෙන ගන්නේ ? ඒ ළමයින්ට කවදාවත් යන්න බැරිද පිටරට ? ඒ ළමයින් සදාකාලිකවම ඇන එපිට ගම්වල හරක් බලන්න පමණක් සීමා කරනවද ? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය ඉතාමත් ඕනැකමින් යොමු කරවනවා.

පසුගිය කාලයේදී අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, ඌව, මොනරාගල, හම්බන්තොට, මඩකලපුව වැනි දුෂ්කර ප්‍රදේශවලට අසාධාරණයක් සිදු වුණා. දිස්ත්‍රික් පදනමක් යටතේ අඩු ලකුණු මට්ටමකින් විශ්ව විද්‍යාලයට ළමයින් ගන්නය කියා තමුන්නාන්සේ අපට සාධාරණයක් කිරීමේ අදහසින් වරප්‍රසාදයක් දුන්නා. මොකක්ද වුණේ ? අනුරාධපුර දිසා ඇමතිතුමා දැන් මෙතන ඉන්නවා. මා අහන්න කැමතියි අනුරාධපුර දිසා ඇමතිතුමාගෙන් ,ඇතැම් අය කොළඹ විද්‍යාලවල ඉගෙන ගන්න ළමයින් අස්කරගෙන උසස් පන්තිවල ඉගෙනීම සඳහා අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලවලට ඇතුළත් කළේ නැද්ද කියා. නුවරඑළියේදී කොළඹ පදිංචි උසස් මහත්මයෙක් මට හමු වුණා. මම ඒ තැනැත්තාගෙන් ඇහුවා, ගියේ කොහේද කියල. එවිට ඒ මහත්මයා කිව්වා " මගේ දරුවා බදුල්ලේ ඉස්කෝලයකට යනවා, විශ්ව විද්‍යාල ප්‍රවේශය ගන්න. එහේ අඩු ලකුණු මට්ටමකින් ළමයින් ඇතුළු කර ගන්නවා " කියල. ඒ අසාධාරණය වෙන්න ආයෙත් ඉඩ දෙන්න එපා. මට ආරංචියි, මහනුවර දිස්ත්‍රික්කය දුෂ්කර ප්‍රදේශයක් හැටියට ගනන් ගන්නේ නැත කියා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේගේ ආසනයේ මොනවාද තිබෙන පහසුකම් ? තවමත් කද ගහගෙන නොවෙයිද, ලෙඩ්ඩු අරගෙන යන්නේ, ඉස්පිරිතාලයට ? තමුන්නාන්සේගේ ආසනයේ මිනිසුන් තවමත් තවලමෙන් නොවෙයිද, පොළට බඩු ගෙන යන්නේ, පොළෙන් බඩු ගෙන යන්නෙ ? එහෙම නම් ඇයි අඩු වශයෙන් ඒ ආසනයවත් දුෂ්කර ප්‍රදේශයක් හැටියට නම් කර ගන්නේ නැත්තේ ? මේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහනවා, එතුමාගේ ආසනයේ අදත් තවලම් නැද්ද කියා ? අදත් ලෙඩුන් කර ගහගෙන යන්නේ නැද්ද කියා මම අහනවා. සැතපුම් දහඅටක් පමණ පයින් යා යුතු ගම්මාන අදත් එතුමාගේ කොට්ඨාශයේ නැද්ද කියා මම ප්‍රශ්න කරනවා. එහෙම නම් ඇයි තමුන්නාන්සේ මහනුවර දිස්ත්‍රික්කයේ සිටින අපේ දරුවන්ට ඒ වරප්‍රසාදය ලබා නොදෙන්නේ ? තමුන්නාන්සේ අවශ්‍ය නිලධාරීන්ට කරුණු ඉදිරිපත් කර මහනුවර දිස්ත්‍රික්කයටද ? ඒ වරප්‍රසාදය ලබා දෙන්නය කියා මා ඉතා ඕනැකමින් ඉල්ලනවා.

ඊළඟට මා නැවත වරක් කණගාටුවෙන් මතක් කරන්නේ, කලා අංශය කප්පාදු කළොත් එයින් ගම්බද ඉන්න අපට පහර වදින බවයි. විද්‍යා අංශය දියුණු කිරීමෙන් මේ රටට සේවයක් වෙනවා. දොස්තරවරු වැඩි වැඩියෙන් පුහුණු කිරීම ගැන, ඉංජිනේරුවරු වැඩි වැඩියෙන් පුහුණු කිරීම ගැන, කාර්මික නිලධාරීන් වැඩි වැඩියෙන් පුහුණු කිරීම ගැන, මා ස්තුතිවන්ත වෙනවා. ඒක බොහාම හොඳයි. ඒ උදවිය වැඩි වුණොත් අපට පිටරට පටවන්නත් පුළුවන් වෙයි. එමනිසා ඒ අය වැඩියෙන් පුහුණු කිරීම ගැන අපේ කිසිම විරුද්ධයක් නැහැ. නමුත් මා කියන්නේ කලා අංශයෙන් හරි අපේ දරුවන්ට විශ්ව විද්‍යාලයට ඇතුළු වෙන්නට තිබෙන අවස්ථාව නැති කරන්න එපාය කියලයි. ඒ අයටත් ඒ අවස්ථාව ලබා දෙන්න.

අපේ රටට අවශ්‍ය සංවර්ධනයට අවශ්‍ය පිරිස් සකසා දීමට විශ්ව විද්‍යාලවලින් විශාල වශයෙන් රුකුලක් දීගෙන යෑම ගැන මා මෙම අමාත්‍යාංශය භාර අති ගරු ජනාධිපතිතුමාටත් නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒවාගේම අද නිදහස් අධ්‍යාපනය අර්ථවත් වෙමින් යනවා. විශ්ව විද්‍යාලවලට ඇතුලු කර ගන්නා ළමයින්ගේ සංඛ්‍යාව වැඩි කර තිබෙනවා. ඒ අතරතුර පේරාදෙණිය විශ්ව විද්‍යාලයට දෙමළ ළමයින් ඇතුළු කළාය කියා ඇතැම් අය භේදයක් ඇති කරන්නට උත්සාහ කරනවා. ඒක අමූලික බොරුවක්. 1983–84 අවුරුද්දේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයට දෙමළ ළමයින් ඇතුළු කර තිබෙන්නේ 193 දෙනයි. [ බාධා කිරීමක් ] දනට ඉන්නේ දෙමළ ළමයි 30 දෙනයි. ඒ පිළිබඳව අනවශ්‍ය ප්‍රචාරයක් කර මහා ආන්දෝලනයක් ඇති කරන්නට උත්සාහ කරන්ට උත්සාහ කළා. විශ්ව විද්‍යාලය දේශපාලන අත කොලුවක් බවට පත් කර ගන්නට උත්සාහ කරන්නට එපාය කියා මා සෑම දෙනාගෙන්ම දයාවෙන්, කරුණාවෙන් හා ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. විශ්ව විද්‍යාලවල ඉන්නේ මේ රටේ අනාගතය භාර ගන්නට ඉන්න වැදගත්ම තරුණ පරම්පරාවයි බුද්ධිමත්ම තරුණ පරම්පරාවයි. ඒ තරුණ තරුණියන්ගේ මොළවලට අනවශ්‍ය වාද භේද ඇතු කර, අනවශ්‍ය විධියේ ප්‍රශ්න ඇතුළු කර ඔවුන්ගේ සිත් තුළට අනවශ්‍ය අරගල පිළිබඳ චින්තන ඇතුළු කර ඒ දරුවන් අනාථ කරන්ට එපා ; නොමඟ යවන්නට එපා. ඒ දරුවන්ගේ දියුණුව සකස් කර ගැනීමට ඉවහල් වන විධියේ මාර්ග පාද දීම වැඩිහිටි අප සියලු දෙනාගේම යුතුකම බව මා මතක් කරන්නට කැමතියි. අපේ ප්‍රදේශවලට මෙතෙක් කල් වූ සේවා ගැන මා මෙම අමාත්‍යාංශයට ස්තුති කරනවා. අවසාන වශයෙන්, පේරාදෙණිය අවට ප්‍රදේශවල ඉන්න දරුවන්ට පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළුවීමේ වරප්‍රසාදය ලබා දෙන මෙන් යළිත් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

පූ. භා. 11.14

අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda–Baddegama)

ගරු සභාපතිතුමනි, කථා කරන්නට සීමිත වේලාවක් ලැබී තිබෙන මේ අවස්ථාවේදී මා කරුණු ස්වල්පයක් ගැන නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට බලාපොරොත්තු වෙනවා. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යම් වැඩ සැලැස්මක් පිළිබඳව අදහසක් ඉදිරිපත් කර තිබෙනවා. මා මතක් කරන්නට කැමතියි, අධ්‍යාපනය කියන එක මේ රටේ ජනතාවගේ මූලික අයිතියක් බව. ඒ මූලික අයිතියට හානි වන විධියේ කිසිම දෙයක් කරන්නට එපා. අධ්‍යාපනය මේ රටේ අතළොස්සකට සීමා වී තිබුණු යුගය අවසන් කරමින් කන්නන්ගර මැතිතුමා 1945 දී නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කිරීම ව්‍යවස්ථාපිත අවස්ථාවක්. ඒ අවස්ථාවෙනුත්, මේ රටට නිදහස ලැබීමෙනුත්, පසුව සැහෙන දුරට පිබිදීමක් ඇති වුණා. ජාතික මට්ටමින් හැම කෙනෙක්ම මේ අධ්‍යාපනයට සහභාගී වන්නට පටන් ගත්තා. ඒ සහභාගීත්වය යම් කප්පාදු කිරීමකින් හෝ යම් සීමා කිරීමකින් හෝ වැට බැඳීමකින් හෝ නැවැත්වීමට කටයුතු කරනවා නම් එය අධ්‍යාපන අයිතිය නැවත උදුරා ගැනීමක් වෙනවා. විශේෂයෙන්ම අපේ රට දෙස මුළු ලෝකයේම රටවල් බලන්නේ මේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ නිසා බිහිවන අය අනුවයි. ලෝකයේ හැම තැනකටම යන්නේ මේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ අනුව බිහිවන අයයි. ඒ නිසා ඒ අය අපේ රටට ගෞරවයක් ඇති වන විධියේ පුද්ගලයින් විය යුතුයි. එසේ ගොඩනැඟෙන පිරිස්වලට හවුල් වන්නට ජනතාවගේ හැම දරුවෙකුටම අයිතිය තිබිය යුතුය කියන එක මම ප්‍රථමයෙන්ම මතක් කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

අපේ රටේ පාසල් යන අයගෙන් විශ්ව විද්‍යාලවලට යන්නේ සියයට 2 කට අඩු ගණනක්. සියයට 85 ක්ම අපොස සාමාන්‍ය පෙළ විභාගයට කලින් පාසල් හැර යනවා. සියයට 15 ක් වන අනික් කොටසයි, උසස් අධ්‍යාපනය සඳහා ඉතිරි වන්නේ. එයිනුත් සියයට 2 ක්—සමහරවිට සියයට 2 ටත් අඩු පිරිසක්—තමයි, උසස් අධ්‍යාපනය ලබන්නේ. මෙන්න මේ තත්ත්වය ජනතාවගේ දරුවන් අධ්‍යාපන අයිතිය භුක්ති විඳිනවාය කියන එකට එකඟ වන්නේ නැහැ. ඒ නිසා මේ අයිතිය පුළුල් වන විධියට කටයුතු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයට මම විශේෂයෙන් මතක් කරනවා. 40,000 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සමත් වූ විට 5,000 ක් විශ්ව විද්‍යාලවලට තෝරා ගනු ලබනවා. ඒ අනුව ඒ අයිතියට මොන යම් තැනකින් හෝ සීමාවක් සිදු වෙනවා. එසේ සීමා ඇති කිරීම අයිතිය තහවුරු කිරීමක් නොවෙයි, අයිතියට අවහිර කිරීමක් බව මම ප්‍රථමයෙන්ම සඳහන් කරනවා. ඒ නිසා පුළුවන් තරම් ඉදිරි සැලැස්ම තුළ අයිතිය ව්‍යාප්ත වන විධියටත්, හැම කෙනෙකුටම උසස් අධ්‍යාපනයේ අවශ්‍යතාවය එයාගේ ශක්ති ප්‍රමාණයෙන් ලබා ගන්නට ඉඩ සැලසෙන විධියටත් ඒ සැලැස්මේ පදනම සකස් විය යුතුය කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

තවත් කරුණක් ගැන විශේෂ අවධානය යොමු කරවන්න කැමතියි. උසස් අධ්‍යාපන අවස්ථාවට පිවිසීමේදී මේ රටේ ශිෂ්‍යයින්ගෙන් වසර 2 ක් අපරාධයේ අහක යනවා. ඒ තත්ත්වය නැති කරන්නට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පුළුවන්. අපොස සාමාන්‍ය පෙළ විභාගයට පසුව නැවත පාසලට එන්නට පුළුවන් වන්නේ මාස 8 කට පසුවයි. දෙසැම්බර් විභාගයෙන් පසුව ප්‍රතිඵල නිකුත් වී නැවත උසස් පෙළ පන්තිවලට එන්නට පුළුවන් වන්නේ මාස 8 කට පසුවයි. මාස 8 ක් නිකම්ම වැය වෙනවා. ඊළඟට උසස් පෙළ පළමු වසර පන්ති පටන් ගන්නේ දෙසැම්බර් විභාගයෙන් පසුව ඊළඟ අවුරුද්දේ සැප්තැම්බර් මාසයේදීයි. අගෝස්තු මාසයේ පවත්වන උසස් පෙළ විභාගයෙන් පසුව විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගන්නේ ඊළඟ අවුරුද්දේ ඔක්තෝබර් මාසයේදීයි. ඒ අනුව ඒ ශිෂ්‍යයා අධ්‍යාපනයට හවුල් නොවී විභාග ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් හෙ වෙනත් යම් කටයුතුවල නිරත වී හෝ මාස 14 ක් බලා ඉන්නවා. ශිෂ්‍ය ජීවිතයේ ඒ අවුරුදු දෙක ඉගෙන ගන්නට පුළුවන් කාලයක්. ඒ නිසා මේ වසර දෙකක විරාමයක් ලැබීම ඉවත් කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය කල්පනා කරනවා නම් එය හුඟක් ප්‍රයෝජනවත් වෙනවා.

තවත් කරුණක් අවධානයට යොමු කරවන්න කැමතියි. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) හා මහනුවර දිසා ඇමතිතුමාත් මේ කරුණ ඉදිරිපත් කළා. ඒ සිංහල ප්‍රශ්නය පිළිබඳවයි. ධවල පත්‍රිකාවේ 90 වන ඡේදය ක්‍රියාත්මක වන විට විශ්ව විද්‍යාල විෂයයන් අතර—එයට පිවිසීමේදී—ඉංග්‍රීසි අනිවාර්ය වීමේ සැලැස්මක් තිබෙනවා. ඇත්ත වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳව අපි විරුද්ධ වන්නට ඕනෑ නැහැ. නමුත් මහනුවර දිසා ඇමතිතුමා කියන විධියට ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා අද තිබෙන පහසුකම් ගැන සලකා බැලුවොත් ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත කරන්නට බැරිව මේ විධියේ සීමාවන් පැනවීම මේ රටේ දිස්ත්‍රික්ක විසි හතරේ තිබෙන පාසල් විශාල ප්‍රමාණයක අද ඉගෙන ගන්නා ළමයින්ගේ අයිතිය උදුරා ගැනීමක්. ඉංග්‍රීසි අනිවාර්ය කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය වහාම ඉවත් නොකර මොනම පීඨයකට ඇතුළත් වීමේදී වුවද ඒ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන ගියොත් අයිතිය උදුරා ගැනීම ඉබේම සිදු වෙනවා.

තවමත් මේ රටේ කොටසකට පමණයි, ඉංග්‍රීසි අධ්‍යාපනය ලබන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ සඳහා පහසුකම් ලැබී තිබෙන්නේ කොටසකට පමණයි. විශේෂයෙන් ගම්බද ප්‍රදේශ කරා ඒ පහසුකම් ව්‍යාප්ත වී නැහැ. ඒ ප්‍රදේශවල ඉංග්‍රීසි ගුරු හිඟයක් තිබෙනවා. ගම්බද දුෂ්කර ප්‍රදේශයක පාසලකට ඉංග්‍රීසි ගුරුවරයෙකු යැව්වත් ඔහු එහි වැඩි කාලයක් රැදෙන්නේ නැහැ. ඒ නිසා ඒ ඉංග්‍රීසි අනිවාර්ය සීමාව කෙරෙහි එකහෙලා විරුද්ධත්වය ප්‍රකාශ කරන්න අපට සිදු වී තිබෙනවා.

ඒ සම්බන්ධයෙන් තවදුරටත් විස්තර කිරීමේදී විශ්ව විද්‍යාලවල තත්ත්වය ගෙනහැර දක්වන්න පුළුවනි. මෙතෙක් යම්-යම් පීඨයන්හි සිංහල,, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වුණු සමාන්තර පන්ති එක් මාධ්‍යකින් පමණක් පවත්වනු ලබන පන්ති බවට පරිවර්තනය කිරීමට දැනටමත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම සූදානම් වී සිටිනවා. මොරටු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේත්, වෛද්‍ය විද්‍යාලයේත් පළමු වැනි වසරේ සිටම කටයුතු කෙරෙන්නේ ඉංග්‍රීසියෙනුයි. ඒ හැරෙන්න ශ්‍රී ජයවර්ධනපුර හා කැලණි විශ්ව විද්‍යාලවල විද්‍යා අංශයෙහි පමණක් පළමු වසරේ දේශණ ඉංග්‍රීසියෙන් හා ස්වභාෂාවෙන් පැවෙත්වෙනවා. අනික් සියලුම කටයුතු කෙරෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙනුයි. ඒවායේත් පළමු වසරේ පමණයි, ස්වභාෂාවෙන් කටයුතු කරන්නේ.

අපේ ඉතිහාසය දිහා බලන විටත් අපට පැහැදිලි වෙනවා, ජාතියක් හැටියට – සිංහල ජාතිය හැටියට – නැගී සිටීමට නම් සිංහල භාෂාව දියුණු කිරීම එහි මූලික අවශ්‍යතාවයක් වන බව. ඒ විධියට භාෂාව දියුණු වන්න නම් ඒ භාෂාවෙන් උසස් අධ්‍යාපනය දෙන්න ඕනෑ. උසස් අධ්‍යාපනය සඳහා යම් භාෂාවක් භාවිත නොවෙනවානම් එය පිළිගත් භාෂාවක මට්ටමට පත්කරන්න අමාරුයි. ජාතියක් වශයෙන් නැගී සිටීමේදී අපේ භාෂාව – සිංහල භාෂාව – විවිධ ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන කටයුතු සඳහා පාවිච්චි කිරීම ඉතා වැදගත් වෙනවා. ඒ නිසා ඒ අදහස කඩදසියට පමණක් සීමා කරන්නේ නැතිව, ඉංග්‍රීසි භාෂාව වෙනුවට සිංහල භාෂාව ඒ හැම ක්ෂේත්‍රයකම පාහේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා හැටියට නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කොළඹ විශ්ව විද්‍යාලයේ භෞතික රසායන විද්‍යා අංශයේ කථිකාචාර්යවරුන් අට දෙනෙක්ම පසුගිය වර්ෂය තුළ එයින් ඉවත් වී ගොස් තිබෙනවා. වෙළඳ රටාව පුළුල් වීමත් සමඟම පැහැදිලිව දකින්න ලැබෙන ලක්ෂණයක් තමයි, බුද්ධියට ලැබෙන තැන අඩුවීම. ඒ නිසා විශ්ව විද්‍යාලවල කථිකාචාර්යවරුන්ට වාණිජමය ආයතන වලින් කැඳවීම් ලැබෙන්න පටන් ගන්නවා. විශේෂයෙන් මේ රටේ ලීවර් බ්‍රදර්ස් වැනි බහු ජාතික සමාගමකට පුළුවන්කම තිබෙනවා, විශ්ව විද්‍යාලවල කෙරෙන ගෙවීම්වලට වඩා හුඟක් ඉහළ ගෙවීම් කරන්න. ඒ නිසා උසස් අධ්‍යාපන ආයතන හැර දමා වාණිජ ආයතන වලට යොමු වෙන්න පටන් ගන්නවා, ඒවායේ කථිකාචාර්ය, මහාචාර්ය පදවි දරන අය. එක අංශයකින් පමණක් කථිකාචාර්යවරුන් අට දෙනෙකු ඉවත් වී ගොස් තිබෙනවා නම් ඒ අංශයේ අධ්‍යාපන මට්ටම තව දුරටත් ඒ තත්ත්වයෙන් පවත්වාගෙන යන්න අමාරු වන බව අප තේරුම් ගන්න ඕනෑ. ඒ අය යෑමට මූලික හේතුව වැටුප් ප්‍රශ්නයයි. කාලයක් තිස්සේ යම් යම් විෂයයන් පිළිබඳව හදරා විශේෂඥ දැනුමක් ලබා තිබෙන විශ්ව විද්‍යාලවල කථිකාචාර්ය වරුන්ට සෑහෙන ජීවන මට්ටමක් පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් වැටුපක් නොලැබෙන විට – මෙතෙක් පවත්වාගෙන ආ සමාජ මට්ටම තවදුරටත් පවත්වාගෙන යන්න අපොහොසත් වන විට – ඒ අය වැඩි වැටුප් සොයා ඇදෙනවා. ඒ නිසා විශ්ව විද්‍යාලවල වැටුප් තත්ත්වයන් පිළිබඳවත් නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතුව තිබෙනවා. එහෙම නොවුණොත් බුද්ධිමතුන් තව තවත් විශ්ව විද්‍යාල හැර යන්න පුළුවනි.

අපේ විශ්ව විද්‍යාල ජාත්‍යන්තර මට්ටමකින් පවත්වාගෙන යෑම කෙරෙහිත් මේ අවස්ථාවේදී නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. එසේ නොවුණොත් එකී විශ්ව විද්‍යාලවල උපාධි ජාත්‍යන්තර මට්ටමින් පිළිගැනෙන්නේ නැහැ. අපේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය මුලින්ම ඇරඹුණේ සෑහෙන උසස් තත්ත්වයකිනුයි; ජාත්‍යන්තර මට්ටමකිනුයි. අපේ නිදහස් ලංකාවේ පළමු වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදූ, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පළමු වැනි උපකුලපති සර් අයිවර් ජෙනිංස් මහතා ඒ විශ්ව විද්‍යාල රටාව – ආකෘතිය – හැදුවේ එකී විශ්ව විද්‍යාලය ජාත්‍යන්තර මට්ටමකින් පවත්වාගෙන යන්න පුළුවන් වන ආකාරයටයි. වැඩියක් තබා පේරාදෙණි විශ්ව විද්‍යාලය පිහිටි බිම – ඒ ප්‍රදේශය – තෝරා ගත්තේත් එය ජාත්‍යාන්තර මට්ටමේ විශ්ව විද්‍යාලයක් වශයෙන් පවත්වාගෙන යෑමට හැකි වන ආකාරයෙනුයි. ඒ වාගේම ඒ විශ්ව විද්‍යාලයේ විනය කටයුතුත්, පරිපාලන කටයුතුත් පවත්වාගෙන ගියේ ජාත්‍යන්තර මට්ටමිනුයි.

නමුත් ඒ අතර අපේ දේශීය අවශ්‍යතා කෙරෙහිත් අවධානය යොමුවන්න ඕනෑ. අපේ පළමු විශ්ව විද්‍යාලය එක්දාස් නවසිය හතළිස් ගණන්වල පිහිටුවා දැනට අවුරුදු ගණනාවක් ගත වී ඇතත් අපේ විශ්ව විද්‍යාලවල තවමත් සමාජ විපර්යාසයට අනුකූල අන්දමින් – සමාජය වෙනස් වූ අකාරය අනුව – පහසුකම් සැලැස්වී නැහැ. ඒක අඩුපාඩුවක් හැටියට අපට පෙනෙනවා. මෙම විශ්ව විද්‍යාල ආයතනවල උපකරණ වාගේම පුස්තකාලත් ජාත්‍යන්තර මට්ටමට නවීකරණය නොකළොත් ඒ විශ්ව විද්‍යාලවල පැවැත්ම ඇණ හිටිනවා. සමහර වෙලාවට, සමහර රටවල නොදැනුමෙන් හෝ ඕනෑකමින් හෝ අපේ විශ්ව විද්‍යාලවල මට්ටම ගැන සලකන්නේ නැහැ. නමුත් ඒ මට්ටම පවත්වා ගෙන යෑමේ වගකීම අපේ රටේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සතුයි.

ගරු සභාපතිතුමනි, ද්‍රවිඩ සිසුන් පිළිබඳ ප්‍රශ්නය මෙයට කලින් මතු කළ නිසා නැවතත් ඒ ගැන කියන්නට ඕනෑ කරන්නේ නැහැ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා අධ්‍යාපන පුහුණුව ගැන නියෝජ්‍ය ඇමතිතුමා හොඳින්ම දන්නවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති. මෙම පුහුණුව සඳහා ගුරු මහත්වරුන් සහභාගී වුණේ පඩි සහිතවයි. නමුත් අද පඩි සහිත නිවාඩුව ඉවත් කිරීම නිසා, ඒ අයට අපහසුකමක් ඇති වී තිබෙනවා. මා හිතන්නේ මෙය අධ්‍යාපන අමාත්‍යාංශයත් සමග සාකච්ඡා කර විසඳා ගත යුතු ප්‍රශ්නයක්. විශේෂයෙන්ම වෘත්තීය අංශවලින් පිවිසෙන පිරිසට ඒ පහසුකම ලබා දීමට කටයුතු කිරීම වැදගත් බව මතක් කරනවා.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) මෙම විවාදයේදී ඉතා වැදගත් අදහසක් ඉස්මතු කළා. ඒ කියන්නේ, මා කලින් සඳහන් කළ 1945 අධ්‍යාපන පනතේ පදනම, නිදහස් අධ්‍යාපනය ලැබීමට ජනතාවගේ දරුවන්ට ඇති අයිතිය සීමා වන විධියට හෝ අතළොස්සකට පමණක් එය ලබාගත හැකි අන්දමට වගන්ති සකස් කිරීමෙන් වැළකීමයි, එහි පදනම. මේ රටේ උසස් අධ්‍යාපනය සීල් තැබීමක්, නැතිනම් අතළොස්සකට පමණක් එම අයිතිය ලැබෙන පරිදි සීමා කිරීමක් කළොත් අපේ රටේ ජනතාව එවැනි සැලසුම් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා ඇති.

මගේ කථාව අවසන් කරන්නට පෙර නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කිරීම පිණිස බොහොම කෙටියෙන් මෙන්න මේ කාරණා ටික ඉදිරිපත් කරන්න කැමතියි. උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය ගැන අමුතුවෙන් කියන්නට වුවමනාවක් නැහැ. ඊට ඇතුළු කරන අයගේ ලකුණු මට්ටම ගැන දන්නවා; ඇතුළු කර ගන්නා ආකාරය ගැන දන්නවා. මේ හේතුව නිසා වෛද්‍ය අංශයේ උසස් අධ්‍යාපනය අපේක්ෂාවෙන් සිටින ශිෂ්‍යයන් තුළ සැහෙන තරම් දුරට කළකිරීමක් ඇති වී තිබෙනවා. "වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත් අපට වෛද්‍ය විද්‍යාලයට යන්නට බැහැ. අපට වඩා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත් අයට සල්ලි බඳින්නට පුළුවන් නම් වෛද්‍ය විද්‍යාලයට යන්නට පුළුවන්" කියන අදහස ඒ අය තුළ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, වෛද්‍ය විද්‍යාලය ලංකාවේ පිහිටුවා තිබෙන්නේ 1890 දියි. කෙසේ වුණත් එය පිහිටුවන අවස්ථාවේදී තිබුණු තත්ත්වයන්ට නැවතත් පත් කළ යුතු නැහැ. එම වෘත්තීය සඳහා පුහුණු කරනු ලබන, උසස් අධ්‍යාපනයට යොමු කරන පිරිස වෙනුවෙන් අපේ ජාතික ධනයෙන් විශාල කොටසක් වැය කරනවා. එසේ වැය කරන කොටස වෙනුවෙන් ඒ අය ජාතියට සේවය කරන්නට ඕනෑ. ජාතික ධනයෙන් වැය වූ කොටස වෙනුවෙන් සේවය කිරීම සඳහා සුදුසුකම් ලබන සාමාන්‍ය මට්ටමේ අඩු ආදායම් ඇති පවුල්වල ළමයින් තුළ කිසියම් කළකිරීමක් හෝ ධෛර්යයේ අඩු වීමක් හෝ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් පවත්වා ගෙන යාම නිසා ඇති වෙනවා නම්, ඒක අධ්‍යාපන ප්‍රතිපත්තිමය වශයෙන් හොඳ දෙයක් නොවෙයි. මූලික මිනිස් අයිතිය පැත්තෙන් ගෙන බැලුවෙත් එය හොඳ දෙයක් නොවෙයි. කොටින්ම එය නිදහස් අධ්‍යාපනයට එල්ලවන තර්ජනයක් හැටියටයි, අපට පෙනෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඉංජිනේරු විද්‍යාව පිළිබඳවත් මේ හා සමාන, අනුරූප ආයතනයක් ඇති කරන්නට සූදානමක් තිබෙන බව අපට දැනගන්න ලැබී තිබෙනවා. මේ ආයතනයත් සීමා වෙන්නේ කලින් සඳහන් කළ පිරිසටයි. එසේ නම් පහළ ආදායම් ලබන පවුල්වල දරුවන් තුළ වාගේම ඉංජිනේරු විද්‍යාව හැදෑරීමට අපේක්ෂිත පිරිස් තුළත් කළ කිරීමක් හා පසුබෑමක් ඇති වෙන්නට පුළුවනි.

මා කලින් සඳහන් කළ අන්දමට මෙතැනදීද ඉංගිරිසි මගින් කරනු ලබන සීමාවන් ගැනත් සැලකිල්ල යොමු වෙන්න ඕනෑ. ගම්බද ළමයින්ට මේ නිසා විශාල හානියක් සිදු වෙනවා. ඒ හැම දෙයක්ම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය සීමා කිරීමක් හැටියටයි, මා සඳහන් කරන්නේ.

ගරු සභාපතිතුමනි, දිස්ත්‍රික් පදනම උඩ සිසුන් තෝරා ගැනීමේ කලින් භාවිත කළ ක්‍රමයක් ගැන මහනුවර දිස්ත්‍රික් ඇමතිතුමා සඳහන් කළා. විද්‍යුත් පන්තිවලට යන්නට නොහැකි, අතිරේක ගුරු උපදෙස් ලබා ගන්නට බැරි, ඒ සඳහා යන්නට වෙලාවක් හා පහසුවක් නැති, තමන්ගේ වෙලේ ඉඩමේ වැඩ කර අන්තිමට යම්තම් පොත කියවන දරුවන් ජීවත්වන අධ්‍යාපන පහසුකම් අඩු දිස්ත්‍රික්ක ගැන සලකා, ඒ දරුවන් සඳහ වෙනමම ලකුණු මට්ටමක් ඇති කිරීම—දිස්ත්‍රික්කයේ පවතින පහසුකම් අඩු තත්ත්වය ගැන සලකා එබඳු ලකුණු මට්ටමක් ඇති කිරීම—ඉතාම සාධාරණ ක්‍රමයක් හැටියට අපට සලකන්නට පුළුවනි. අනුරාධපුර ගරු දිසා ඇමතිතුමාත් ඒ මතයට එකඟ වෙනවා ඇති. මන්ද එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකළොත් ඒ දිස්ත්‍රික්කවල අද තිබෙන අධ්‍යාපන පහසුකම්වල ඌණතාවය නැත්නම් හිඟකම අනුව ඒ දිස්ත්‍රික්කවල ළමයින්ට අසාධාරණයක් වීමට ඉඩ තිබෙන නිසයි. ඒ අසාධාරණය ඉවත් කර ගැනීමට ඇති එකම ක්‍රමය විභාගවලින් ලබන ලකුණු අනුව තෝරා ගැනීමේදී, නැවත දිස්ත්‍රික්ක අනුව තෝරා ගැනීම් ක්‍රමයක් ඇති කිරීමයි. මගේ මේ අදහස්වලට පදනමක් හැටියට මම ඉදිරිපත් කරන්නේ මෙන්න මේ කාරණයයි. මෙය 1945 වර්ෂයේදී ගරු කන්නන්ගර ඇමතිතුමා ඉදිරිපත් කළ නිදහස් අධ්‍යාපන පනත හේතුකොටගෙන මෙ රටේ ජනතාවගේ දරුවන් භුක්ති විඳි මූලික අයිතියක්. ඉදිරියේදී උසස් අධ්‍යාපනය සැලසුම් කිරීමේදී යම් සීමාවක් ඇති වෙනවා නම්, එයින් අධ්‍යාපනය ලබන දරුවන්ට බාධාවක් ඇති වෙනවා නම් එය ජනතාවගේ මූලික අයිතියක් උදුරා ගැනීමක් වන නිසා මේ සැලසුම් පිළියෙල කිරීමේදී පුළුවන් තරම් ගමේ පතුලේ ජීවත් වන දෙමව්පියන්ගේ දරුවන්ට උසස් අධ්‍යාපනය ලැබීමේ හැකියාව තහවුරු කිරීම සඳහා මේ සැලසුමෙන් විධිවිධාන යොමු කිරීම් කළ යුතුය කියන කාරණය මම සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් කාරණයක් ගැන මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුයි. මට ලැබී තිබෙන ලිපියක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ ලිපිය ලැබී තිබෙන්නේ මහනුවර, බහු තාක්ෂණික ආයතනයේ, වාණිජ විද්‍යා උසස් ජාතික ඩිප්ලෝමා සංගමයෙන්. ඒ සංගමයෙන් දන්වා තිබෙනවා, මහනුවර බහු තාක්ෂණික ආයතනයේ වාණිජ විද්‍යා උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගන්නා සිසුන්ගේ ප්‍රමාණය – සංඛ්‍යාව – 1984–1985 වර්ෂයේ සිට 60 කට සීමා කොට ඇති බව. මෙම ප්‍රමාණය පසුගිය වසරේ බඳවා ගත් ප්‍රමාණයෙන් හරි අඩක්. එයින් පෙනෙන්නේ එතැනත් සීමාවක් ඇති කරලා තිබෙන බවයි. ඒ සීමාව ඇති කිරීමට හේතුව වශයෙන් දක්වා තිබෙන්නේ බාහිර කථිකාචාර්යවරුන්ට ගෙවීම් කිරීම අමාරු බවයි. නමුත් ඒ සංගමය ඉදිරිපත් කර තිබෙනවා, ඒ ආයතනය ලැබූ රු. 1,80,900 ක් වූ ආදායමෙන් පාඨමාලාවට අතිරේක ගෙවීම් සඳහා වැය වන්නේ රු. 84,600 ක් පමණක් බව. එසේ නම් ඒ ගෙවීම් අනුව බඳවා ගැනීම් සීමා කිරීම ගැන අමාත්‍යාංශයේ සැලකිල්ල යොමු කරන්නටය කියලා ඉල්ලීමක් කරනවා.

මම අවසාන වශයෙන් කියන්නට කැමතියි, ගරු මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) සඳහන් කළ කරුණක් ගැන. ඒ කරුණ නම් විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගම් පිළිබඳ ප්‍රශ්නයයි. අන්තර් විශ්ව විද්‍යාලයීය සංගම් වගේම විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගම්ද මේ රටේ විශ්ව විද්‍යාල පිළිබඳව අදහස් දැක්වූ බුද්ධිමතුන් ඒ ක්ෂෙත්‍රයේ හැම වේලේම අගය කළ දෙයක්. අපිට ඒක ප්‍රතික්ෂේප කරන්නට බැහැ. පූජ්‍ය සෝරත හිමියෝ ඉතාම උසස් මට්ටමේ විනය අපේක්ෂා කළ නායක ස්වාමීන් වහන්සේ නමක්. ඒ වගේම උන්වහන්සේ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ප්‍රථම උපකුලපතිවරයායි. සර් අයිවර් ජෙනිංස් මැතිතුමා ලංකාවේ විශ්ව විද්‍යාලයේ ප්‍රථම කුලපතිවරයායි. ඒ ස්වාමීන්වහන්සේලා, ඒ මහත්වරුන් පවා එද විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ තත්ත්වය විග්‍රහ කළ ආකාරය අද අමතක කරගෙන යනවා. විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ පර්යේෂණාත්මක අවස්ථාවක ඉන්නාවූ තරුණ ජීවිතයට පිවිසෙමින්, ශිෂ්‍ය අවස්ථාව ඉවත් කරමින් සිටින පිරිසක්. ඒ පිරිස පාසල් ශිෂ්‍යයින් හා සමානව සලකන්නට බැහැ. ඒ අයට ස්වාධීනත්වය සහ නිදහස තිබිය යුතුයි. ඒ අය විසිදෙනෙක්, තිස්දෙනෙක් නැත්නම් සැළකිය යුතු සංඛ්‍යාවක් එකතු වුණාම කලබලකාරී වුණත් ඒ කලබලකාරීත්වයත් ඒ අවධියේදී අවශ්‍ය දෙයක් හැටියට සලකනවා. පූජ්‍ය සෝරත හිමියෝත්, අයිවර් ජෙනිංස් මැතිතුමාත් මේ ශිෂ්‍යයෝ කොයි තරම් කලබලකාරී වුණත්, ඒ අයගේ ශිෂ්‍ය සංගම් කොයි තරම් තිබුණත්, ඒවා පාලනය කරගෙන හොඳ මට්ටමකින් ඒ විශ්ව විද්‍යාල පවත්වාගෙන යන්නට සමත් වුණා. ශිෂ්‍යයින්ගේ අයිතිවාසිකම් වන අධ්‍යාපන අයිතිය වගේම ලෝකයේ සියළුම විශ්ව විද්‍යාලවල අධ්‍යාපනයට හවුල් වන උසස් පීඨවලට සහභාගී වන ශිෂ්‍යයින් ස්වකීය අයිතිවාසිකම් ආරක්ෂා කරගෙන ඒ අයගේ සංගම් පවත්වනවා. ඒ සංගම් මගින් ඒ අය වෙනත් පුහුණුවක්ද ලබනවා. ඒ සංගම් පැවැත්වීමෙන් එකතුවක් ඇති වෙනවා. ඒ වගේම මේ විශ්ව විද්‍යාල වැඩපිළිවෙලට උදව්වක් දෙන්නටත් ඒ අයට පුළුවන්. විශ්ව විද්‍යාලවල සිදු වන අසාධාරණකම්, දූෂණ හෝ ඇතිවන වෙනත් අඩුපාඩුකම් පිළිබඳව විවේචනාත්මකව සහභාගී වන්නටත් පුළුවන්. මෙවැනි සංවිධාන පිළිබඳව තහංචි—තහනම්—පැනවීම අගය කරන්නට අපට බැහැ.

පූ. භා. 11.34

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා (අනුරාධපුරය දිසා ඇමතිතුමා)**
**(திரு. கே. டீ. எம். சீ. பண்டார — அனுராதபுர மாவட்ட அமைச்சர்)**
(Mr. K. D. M. C. Bandara–District Minister, Anuradhapura)

ගරු සභාපතිතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මෙය ඉතාමත්ම වැදගත් වැය ශීර්ෂයක්. අපේ රටේ අපි ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා]

ගැනීමට බලාපොරොත්තු වන සෑම දියුණුවක්ම ලබා ගැනීමට ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන බුද්ධිමතුන් ඇති කිරීමට බලාපොරොත්තු වන්නේ මේ අමාත්‍යාංශයේ වැඩකටයුතු තුළිනුයි. පසුගිය අවුරුදු කීපය තුළදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ කටයුතු හුඟක් දුරට පුළුල් කර, මේ රටේ උසස් අධ්‍යාපනය ලබා ගැනීමට බලාපොරොත්තු වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වැඩි වැඩියෙන් ඒ සඳහා අවකාශ ලබා දීමට කටයුතු සලස්වාගෙන යාම ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. නමුත් එහි යම් යම් අඩුපාඩුකම් රාශියක් තිබෙන බවත් අපි පිළිගන්නට ඕනෑ. උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට විශාල වශයෙන් මුදල් වැය වන නිසා මේ අඩුපාඩුකම් සියල්ලක්ම එක වර නැති කර ගැනීමට අපට පුළුවන්කමක් නැහැ. කෙසේ වෙතත්, හුඟක් කරදර මධ්‍යයේ විශ්ව විද්‍යාලවල දියුණුව ඇති කිරීමට කටයුතු කරගෙන යාම ගැන එම ක්ෂේත්‍රයේ කටයුතු කරන ශ්‍රීමත් ජනාධිපතිතුමාටත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු දෙනාටත් අපි කෘතඥ විය යුතුයි.

විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් බලන විට, සර් අයිවර් ජෙනිංස් අපේ විශ්ව විද්‍යාල ඇති කළේ ඉතාම උසස් මට්ටමින් ජාත්‍යන්තර තත්ත්වයකට එළඹීම පිණිසය කියා බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) කිව්වා. ඇත්ත වශයෙන් අපි එය පිළිගන්නවා. එදත්, අදත්, අනාගතයේදීත් අපේ බලාපොරොත්තුවත් එයයි. කොළඹ ආරම්භ වුණු විශ්ව විද්‍යාලය—යුනිවර්සිටි කොලේජ් එක—පටන් ගත්තේ බොහොම සුළුවෙනුයි. නමුත් එය ක්‍රමක්‍රමයෙන් දියුණු වී විශාල ආයතනයක් බවට පරිවර්තනය වුණා. මම හිතන විධියට අද අපේ රටේ විශ්ව විද්‍යාලවල හයදහසකට අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉන්නවා. එම නිසා ඒ ශිෂ්‍යයින්ගේ අවශ්‍යතාවන් පිරිමැසීම, ඒ ශිෂ්‍යයින් විශ්ව විද්‍යාල තුළ අධ්‍යාපනය ලබන කාල සීමාවේදී ඔවුන් බලා හද ගැනීම හා ඔවුන්ට අධ්‍යාපනය ලබා ගැනීමට සුදුසු වාතාවරණයක් විශ්ව විද්‍යාල තුළ ඇති කිරීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීමක්.

පසුගිය කාල සීමාවලදී අප රටේ විශ්ව විද්‍යාලවල නොයෙක් අන්දමේ නොසන්සුන්තාවයන් රාශියක් ඇති වී තිබෙනවා. ඒ තුළින් විනාශකාරී තත්ත්වයන් ඇති වී තිබෙනවා. මෙන්න මේවා අපි මගහරවා ගන්නට ඕනෑ. මේ තත්ත්වයන් ඇති වෙන්නේ කොහොමද කියන එක අපි හොයා බලන්නට ඕනෑ. මේ තත්ත්වයන් ඇති වෙන්නේ විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන්ට තිබෙන අමාරුකම් නිසාමය කියා මම නම් හිතන්නේ නැහැ. ඒ අමාරුකම් සමහර විට එක කාරණයක් වෙන්න පුළුවන්. නමුත් අපේ විශ්ව විද්‍යාලවල නොයෙක් අන්දමේ බලපෑම් ඇති වුණු නිසා—සමහර විට දේශපාලන වශයෙන් වෙන්න පුළුවන්, සමහර විට වෙනත් නොයෙක් අංශවලින් ඇති වුණු ඒවා වෙන්නත් පුළුවන්—ඒ සියල්ලටම අවසානයේදී ගොදුරු වුණේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයිනුයි. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් පාවිච්චි කරමින් නොයෙකුත් න්‍යායයන් දියුණු කර ගැනීමට, නොයෙකුත් දර්ශන දියුණු කර ගැනීමට, ඒ තුළින් යම් යම් දේශපාලන දර්ශන දියුණු කර ගැනීමට ඇතැම් අය උත්සාහ කරන විට මේ වාගේ බොහොම කණගාටුදායක තත්ත්වයන් ඇති වෙනවා. අපි මේවාට ඉඩ දෙන්න හොඳ නැහැ. ආණ්ඩු පක්ෂයේ සිටියත්, විරුද්ධ පක්ෂයේ සිටියත්, අපි වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුයි. මහජනතාව වෙනුවෙන් මේ ගරු සභාවේ පෙනී සිටින මන්ත්‍රීවරුන් හැටියට අපි මේ තත්ත්වය හෙළාදකින්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් තමයි, මේ රටේ වටිනාම වස්තුව. විශ්ව විද්‍යාලයේ සිටින කාල සීමාවේදී ඔවුන්ට අධ්‍යාපනය පමණක් නොවෙයි, අනිකුත් අවශ්‍ය වාතාවරණය නිසි පරිදි ලැබෙන්නට ඕනෑ. විශ්ව විද්‍යාලවලින් අධ්‍යාපනය ලබා උපාධිය ලබාගෙන සමාජයට එළඹෙන අවස්ථාවේදී අංග සම්පූර්ණ හොඳ බුද්ධිමත් පිරිසක් හැටියට මේ රටේ ජනතාවට සේවයක් කිරීමට ඔවුන්ට හැකියාව තිබෙන්නට ඕනෑ. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමන් ඒ විශ්ව විද්‍යාලයේ ඉගෙනීම ලබමින් සිටින අවස්ථාවල අන්න ඒ තත්ත්වයට හානියක් වෙනවා නම් අපේ මුළු රටටම ඒක ලොකු පාඩුවක්. ඒක ශිෂ්‍යයින්ට වෙන පුද්ගලික පාඩුවක් පමණක් නොවෙයි, පොදුවේ මුළු රටටම සිදුවන පාඩුවක්. මේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට ඒ අධ්‍යාපනය ලබා දෙන්නට මේ රටේ ජනතාව අති විශාල මුදලක් වැය කරනවා. ඒ නිසා ඔවුන්ගේ අධ්‍යාපනය උසස් අන්දමින් ලබා දී ඔවුන්ගේ රටට සේවයක් ලබා ගන්නේ කෙසේද යන්න ගැන අපි කල්පනා කර බලන්නට ඕනෑ. අන්න ඒ තත්ත්වය ඇති කර ගන්නට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට තනිවම බැහැ. එහෙම නැත්නම් විශ්ව විද්‍යාලය භාරව සිටින පීඨාධිපතිටවත්, ඒ ආචාර්ය මණ්ඩලයටවත් තනිව එය කරන්නට බැහැ. ඒ සඳහා විශාල වශයෙන් දෙමව්පියන්ගේ සහයෝගය, මුළු රටේම ජනතාවගේ සහයෝගය ලැබෙන්නට ඕනෑ. ඒ වාගේම මේ රටේ නොයෙකුත් මට්ටම්වල සිටින දේශපාලන පක්ෂ, වෙනත් නොයෙකුත් ආයතන මේ සඳහා සහයෝගය දෙන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් (අමරසිරි දොඩන්ගොඩ මහතා) මහරගම ගරු මන්ත්‍රීතුමාත් (දිනේෂ් ගුණවර්ධන මහතා) ප්‍රකාශ කළ අන්දමට මේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ඒ ආයතන තුළ තිබෙන සමිති සමාගම් ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය නිදහස දෙන්නට ඕනෑ. අපිත් ඒක පිළිගන්නවා. මම හිතන්නෙ කවුරුත් ඒක පිළිගන්නවා ඇති. විශ්ව විද්‍යාලයේ යම් යම් ආයතන ඇති කරගෙන තමන්ගේ සුබසිද්ධිය සඳහා කටයුතු කර ගැනීමට ඒ විශ්ව විද්‍යාල ශිෂ්‍යයනට නිදහස තිබෙන්නට ඕනෑ. නමුත් කණගාටුදායකයි, මම මුලින් කිව්වා වාගේ, මේ ශිෂ්‍යයින්ගේ ආයතන සමහරක් පුද්ගලයෝ තන්ගේ අතකොළු කරගන්නවා තමන්ගේ අවශ්‍යතාවයන් ඒ මගින් සපුරාගන්නට. අන්න ඒ තත්ත්වය ඇති වෙන්නට ඉඩ දෙන්න හොඳ නැහැ. එහෙම කළොත් එයින් වන්නේ විශ්ව විද්‍යාල සිසුන්ගේ සුබසිද්ධිය සැලසීමක් නොවෙයි. ඒ නිසා ඔවුන්ගේ සුබ සිද්ධිය ඇති කර ගැනීම සඳහා මේ හැම අංශයකින්ම නිදහස්ව කටයුතු කරන්නට අපි ඔවුන්ට අවස්ථාව ලබා දීම අවශ්‍යයි.

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! There are three other speakers and we have only 30 minutes. Please make your speech as short as possible.

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා**
**(திரு. கே. டீ. எம். சீ. பண்டார)**
(Mr. K. D. M. C. Bandara)

I will take only a few minutes.

ගරු සභාපතිතුමනි, ඒ සමගම මම මතක් කරන්නට ඕනෑ ඉංග්‍රීසි භාෂාව ගැන. ඒ ගැන ලොකු බියක් තිබෙනවා. ඇයි මේ භය ? අපේ සමහර උදවිය තුළ ඉංග්‍රීසි ගැන මහා භයක් තිබෙන්නේ ඇයි කියා මම නම් දන්නෙ නැහැ. අපි පිළිගන්නට ඕනෑ, සිංහල භාෂාව අපේ උරුම භාෂාව අපේ රාජ්‍ය භාෂාව බව. නමුත් ඒ සමගම අපි පිළිගන්නට ඕනෑ, ඉංග්‍රීසි භාෂාවත් ඉතාමත්ම අවශ්‍ය බව. විශ්ව විද්‍යාල වලින්, වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලින් අධ්‍යාපනයක් ලබන සෑම කෙනෙක්ම බලාපොරොත්තු වෙනවා නම් පුළුල් අධ්‍යාපනයක් ලබාගන්නට, ඒ අය ඉංග්‍රීසි භාෂාවක් දැනගත යුතුයි. මොකද ඉංග්‍රීසි භාෂාවෙන් තමයි අපට පුළුවන් වන්නෙ පොත් පත් කියවන්න. විශ්ව විද්‍යාලයට ගියාම එහෙම නැත්නම් වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකට ගියාම ඒ තමන් හදාරන විෂයයන් පිළිබඳ පූර්ණ අවබෝධයක් කථිකාචාර්යතුමන්ලාගෙන් ලැබෙන උපදෙස්වලින් සහ ඒ ලැබෙන පොත්පත්වලින් පමණක් ලබාගන්න අමාරුයි. ඒ ප්‍රමාණයෙන් පමණක් යම් හෙයකින් උපාධිය ලබාගත්තත් ඒ විශ්ව විද්‍යාල ශිෂ්‍යයාට පුළුල් දැනුමක් ඇති වෙන්නෙ නැහැ. එයින් පිටස්තරව ඒ තමන් හදාරණ දේවල් ගැන හොඳින් කරුණු කියවා ඔවුන්ට පුළුල් අවබෝධයක් ලබාගන්න බැරිනම් උපාධිය ලැබුණාට පුළුල් දැනීමක් ඇති වෙන්නෙ නැහැ. එය ලබාගන්න පුළුවන් එකම ක්‍රමය තමයි ඉංග්‍රීසි භාෂාව ගැන හොඳ දැනීමක් තිබීම.

අපි කණගාටු වෙනවා පසුගිය කාලයේ මේ රටේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම නතර කර තිබීම ගැන. අන්න ඒකයි අපේ රටට වූ ලොකුම හානිය. [බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ රජය තිබුණු කාලයේ පාසැල්වල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම අත් හිටෙව්වා. ඒවා නැහැ කියන්න බැහැ. ලොකු හානියක් කළා. විශේෂයෙන් එයින් පාඩු වින්දෙ අපේ ගම්බද ශිෂ්‍යයොයි. ඉංග්‍රීසි ඕනෑ නැහැ කිව්වා. මේවා නැහැ කියන්න එපා. ඒ නතර කරන කාලයේ ගම්බද වුණත් සෑහෙන සංඛ්‍යාවක් ඉංග්‍රීසි ඉගෙන ගනිමින් සිටියා. පැය 24න් වැඩ කරන්න ගිහින් ඒවා සියල්ලම අහෝසි වුණා. අදත් ඒ දුක අපේ ගම්බද මිනිසුන් විඳිනවා. උපාධියක් තිබුණත් ඉංග්‍රීසි නැති නිසා ඔවුන්ට හොඳ රැකියාවක් ලබාගන්න අමාරු වී තිබෙනවා. අන්න ඒ නිසා ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීම ඉතාමත් අවශ්‍යයි. ඒ නිසා මේ ඉංග්‍රීසි භාෂාව යයි කියන විට මේක මහ බිල්ලෙක් වාගේ මේ රටේ ජනතාවට හඳුන්වන්න හදන්න එපා. එය ජාතියට කරන ලොකු හානියක්. ඒ නිසා ඉංග්‍රීසි භාෂාව අපි හැම ගමකම හැම පාසලකම උගන්වන්න පියවර ගන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුවරුන්ගේ හිඟයක් ඇති වී තිබෙන්නෙත් ඒකයි. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම නතර කළ නිසයි. ඒ කාලෙ අපේ ගම්බද පාසල්වල ඉංග්‍රීසි භාෂාව උගන්වන්න පුළුවන් හොඳ ගුරුවරුන් හිටියා. මම කියන්නෙ නැහැ ඔක්කොම පාසල්වල සිටියාය කියා. හුඟාක් පාසල්වල හිටියා. අපි කවුරුත් මහන්සි ගන්න ඕනෑ ඉංග්‍රීසි භාෂාව උගන්වන්න පුළුවන් ගුරුවරුන් සෑම පාසලකටම යොදන්න.

ඊළඟට බහු තාක්ෂණික විද්‍යායතන ගැන වචනයක් කියන්න ඕනෑ. අනුරාධපුරෙත් එකක් තිබෙනවා. මේ බහු තාක්ෂණික විද්‍යායතන ගැන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානය මීට වඩා යොමු කරන්න ඕනෑ. බහු තාක්ෂණික විද්‍යායතනවලින් විශාල සේවයක් කෙරෙනවා. අපි සමහර විට කියන්න පුළුවන් උපාධියක් ලබාගන්නේ රක්ෂාව බලාපොරොත්තුවම නොවෙයි කියා. නමුත් උපාධි ලාභීන්ගෙන් සියයට 99 ක්ම වාගේ උපාධිය ලබාගන්නේ රැකියාව කිරීමේ බලාපොරොත්තුවෙන්මයි. ඒක පිළිගන්න ඕනෑ. සමහර විට අනාගතයේදී රට දියුණු වුණාට පස්සෙ යම් කාලයක් එන්න පුළුවන්, රක්ෂාවක් බලාපොරොත්තුවෙන්ම උපාධි ලබා නොගන්න. නමුත් අපේ රටේ සෑම දෙනෙක්ම අද අධ්‍යාපනය ලබාගන්නේ ඒ අධ්‍යාපනය තුළින් රැකියාවක් කර ජීවිකාව කර ගැනීමේ අපේක්ෂාවෙනුයි.

මේ බහු තාක්ෂණික විද්‍යායතනවලින් ලබන පුහුණුව ඉතාමත් ප්‍රයෝජනවත් වෙනවා නොයෙක් මාධ්‍යයේ රක්ෂා ලබාගැනීමට. ඒ නිසා අපේ බහු තාක්ෂණික විද්‍යායතන දියුණු කරගන්න, ඒවා පුළුල් කරන්න, ඒවාගේ වැඩ පිළිවෙල වැඩි දියුණු කරන්න අපි ගන්න මහන්සිය මදි. වියදම් කරන මුදල් ප්‍රමාණය මදි. උදාහරණයක් වශයෙන් අනුරාධපුර බහු තාක්ෂණික ආයතනය සම්බන්ධයෙන් බොහෝ කාලයක් තිස්සේ කරුණු රාශියක් ඉදිරිපත් කළාට පසුවයි, දැන් යන්තම් එය පුළුල් කිරීමේ වැඩ ආරම්භ කර තිබෙන්නෙ. මේවා මීට වඩා ක්‍රමානුකූලව සකස් වෙන්න ඕනෑ. විශේෂයෙන් අනුරාධපුරය වැනි නොදියුණු, එහෙම නැත්නම් දියුණු වෙගෙන එන ප්‍රදේශයකට මෙවැනි ආයතන ඉතාමත් අවශ්‍යයි. මෙවැනි ආයතන අපට තිබෙන්නේ ඉතාම ස්වල්පයයි. ඔය බහු තාක්ෂණික විද්‍යාලය පමණයි, අනුරාධපුරය, මන්නාරම, වව්නියාව, ත්‍රිකුණාමලය යන ප්‍රදේශ සියල්ලටම තිබෙන එකම ආයතනය. ඒ නිසා වහාම එය පුළුල් කොට දියුණු කළ යුතුය යන ඉල්ලීම මම ඉදිරිපත් කරනවා.

මම අනුරාධපුර දිස්ත්‍රික්කයට විශ්ව විද්‍යාලයක් ඉල්ලන්නේ නැහැ. නමුත් අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා කෘෂිකාර්මික විශ්ව විද්‍යා පීඨයක් පිහිටුවන ලෙස මම ඉල්ලා සිටිනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ තිබෙන මහඉළුප්පල්ලම මේ සඳහා උපයෝගී කර ගන්න පුළුවනි. දැන් එය විශාල වශයෙන් දියුණු වී තිබෙනවා. අපේ රටට කෘෂිකාර්මික විද්‍යා පීඨයක් ඉතාම අවශ්‍යයි. මොකද ? මේ රටේ ජනතාවගෙන් සියයට හැත්තෑවක් පමණ දෙනා ජීවත් වන්නේ කෘෂිකර්මයෙන්. අපි මෙය පිහිටුවීම ප්‍රමාද කළා වැඩියි. මෙය ලබා දීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වහාම පියවර ගන්න ඕනෑ. මෙය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවීම ඉතාම උචිතයි. ඒ ප්‍රදේශයේ සියයට අනූවක් අනූ පහක් පමණ දෙනා ජීවත් වන්නේ කෘෂිකර්මයෙන්. ඒ අවට තිබෙන්නේ වියළි කලාපය. මේ නිසා අපට අවශ්‍ය කෘෂිකර්ම විද්‍යා පීඨය පිහිටුවීමට බොහෝම ඉක්මනට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මට කතා කිරීමට කාලය ලබා දීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා ( නියෝජ්‍ය තැපැල් හා විදුලි සංදේශ ඇමතිතුමා)**

**(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத் — தபால், தந்திப் போக்குவரத்துப் பிரதி அமைச்சர்)**

Mr. M. A. Abdul Majeed–( Deputy Minister of Posts and Telecommunications)

Mr. Chairman, in the speeches made from the Opposition benches this morning, there was a subtle attempt to make out that this Government has dethroned Sinhala. This is the fraud that had been perpetrated on the student body of this country for very many years by the leaders. I thought the days of '*bashawa*' tunes were over, but even today these voices are being raised. Whom are we cheating ?

What happened after 1956 upto now ? The student body, especially the under-graduates know that there has been a fraud perpetrated on them. What did the monied class and the leadership of the '*bashawa*' thrust do ? They saw to it that their children were educated in English. They sent their children abroad. The poor gulped it at that time. But please remember that you cannot get them to gulp it now. They know that they have been cheated. I know of an incident where a Sinhala educated lecturer was sent for his higher studies to England. He committed suicide ! This is the state to which that you have brought down higher education in this country !

We now have in the International Civil Service and various other organizations our men who can be compared with the best in the world. What are we going to do in the future ? I am very happy and am personally indebted to His Excellency the President, who is the Minister in charge of Higher Education, for resurrecting and trying to bring back English, so that not only the children of the *Raddala* class–(*Interruption*). Will you listen to me ? I cannot be educating you. I am sorry I am not here to educate you. (Interruption) What happened ? What did you all do ? Please listen to what I am trying to say.

I am very grateful, the country is grateful and the under-graduates are very grateful to His Excellency for having had the courage to ensure that English is brought as a compulsory second language so that the children in the rural areas like those in my electorate could also be educated in English so that their ablest children will also be in the International Civil Service and thereby not only bring credit to our country but also help our country. By having International Civil Servants in the WHO and various other UN Agencies our country will stand to gain.

What were you trying to do ? You thought that English was for the leadership that clamoured for 'Sinhala only'. Did you not get you children educated in English ? You wanted to perpetrate a fraud and have this monopoly. Thank God at least now you cannot thrust this in the people. I am telling you very frankly. We are very grateful to His Excellency.

It is now a very uphill task to insist on English because we threw the bath water and the baby ! There are no English teachers now. The few English teachers we had have gone in search of greener pastures to the African States. We are finding it very difficult to find English teachers but we should make an endeavour to teach English so that future generations will not curse us. I am very happy and I insist that in the sphere of higher education more and more place should be given to the study of English. Our rural children are capable of studying English. Our children have gone to Rumania, Russia and various other countries on

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා]

scholarships and they have learnt foreign languages and studied highly technical subjects. They have studied engineering and medicine. Why on earth cannot we do it and ensure the study of English in our country ?

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please 1 You have only three more minutes.

එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා
(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)
(Mr. M. A. Abdul Majeed)

About the award of scholarships by various foreign Governments, I would urge upon the Ministry of Higher Education to limit these to the poorer classes. If you study the way the students have got these places before 1977 and after our period, I find that most of them who have got these scholarships are from the best of schools. As some Member stated, students who knew swimming, cricket and so on are given additional marks. It should not be so. After all, His Excellency the President of our Government is in charge of Higher Education. Sir, you say that I have only two more minutes but I would like to have a few more minutes.

I would like to speak on this Private Medical College and the reasons why we should have it here. Those who have money will get into a private medical college. In an open society there are many who have made money. Let them pay for the education of their children. Let the State owned institutions be kept only for the underprivileged for the people who do not have the money. What is wrong in it ? What is wrong in it, I ask you ?

Today, do you know that as a result our people working abroad as housemaids, doctors and engineers, we are earning nearly Rs. 7000 million as foreign exchange which is second to tea. Why should we not train more and more of our students ? Our people are very intelligent. The foreigners who come here tell us that Sri Lankans are the best. So why do we not create more doctors and engineers ? Let them go abroad, earn and bring the money. what is wrong in it ? Sir, I am sorry, my time is limited. I thought of speaking on various topics.

Regarding the admission to universities, Sir, I understand that the number from the under-privileged districts has been reduced from 13 to 5. Sir, the Eastern Provice is a very backward area. I understand that Trincomalee and Batticaloa have been taken out of these under-privileged areas. Except for Batticaloa town and may be in Trincomalee town where there are one or two schools, the rest of the area is backward. Mutur electorate is very backward. Some say that Batticaloa is also the same. Therefore, I appeal to the authorities to reconsider the matter and ensure that all three districts, Ampara, Batticaloa and Trincomalee in the Eastern Province, are included as under-privileged districts. Earlier the quota for the under-privileged districts was 15. I understand that that has been reduced to five per cent. I kindly appeal to you to reconsider this and at least have it for some more years. This should not be a permanent feature. I understand that one day we also must stand and compete with the others, but we do not have the necessary facilities.

Till such time at least phase ensure that at least this 15 per cent is kept. These vacancies in the under-privileged districts earlier were re-distributed within that under-privileged district. Now I understand that is also being taken off and these vacancies will be given right round all over the Island. I would like you to reconsider that also and cotinue with the earlier practice for some more time. If there are vacancies that have not been filled in the under-privileged class, please redistribute them within those under-privileged districts, so that the children of the rural areas will be benefited. We are only asking it as a temporary measure till such time we equip our schools and we can also stand on our own and our children also can compete with students from either the North or from the Colombo city.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! The Sitting is suspended till 1.30 p.m.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி. ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மன் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [EDMUND SAMARAWICKREMA] *in the Chair.*

එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා
(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)
(Mr. M. A. Abdul Majeed)

Mr. Deputy Chairman, I was on my feet when we adjourned for lunch. I will not take much time. I want to finish up. There are just one or two points that I have to make.

I want to say a word regarding the scientific community in our Island as this Ministry comes under His Excellency the President. Today, Sir, the scientists are a very poorly paid lot when compared to what an accountant gets in a private firm. I believe an accountant is paid almost Rs. 15,000 per month whereas a scientist get a comparatively poor salary. This must be rectified. Othersise we cannot hope to hold on to these people. We cannot expect them to do research work for us. So I would earnestly urge the Government to give due consideration to this.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I want to make one more point before I finish. I want to thank this Ministry and its officials for updating ayurvedic education in our country. This Government has taken very meaningful steps to update ayurvedic education. The degree that is going to be given to ayurvedic students is going to be almost equivalent to the MBBS degree. It is high time that we put our ayurvedic system on par with the western system. There are counries like China which have done a great deal towards updating their indigenous medicine and thereby helping to treat the rural masses. In our country the rural masses still have faith in the ayurvedic system of medicine, and I am happy to note that ayurvedic education has been updated and the students who are going to pass out are going to be given degrees equivalent to the MBBS degree.

අ. භා. 1.33

එස්. ඩී. බණ්ඩාරනායක මහතා (ගම්පහ)
(திரு. எஸ். டி. பண்டாரநாயக்க — கம்பஹா)
(Mr. S. D. Bandaranayake–Gampaha)

Mr. Deputy Chairman, Sir, we have to congratulate the Ministry of Education of this country specially for promoting science and technology in our schools in the countryside. I think this Ministry has officials of very high calibre. I am happy that a lot of work in the countryside is done to promote science and technology. In fact, I understand, Sir, that Sri Lanka ranks number one in computer and electronics in schools amongest the Third World countries. The youth and students are greatly interested in this line of education, and this has to be fully extended to cover all schools in the rural areas. This will enable technology and modernization to be worked at village level through students.

In fact last month we had a science exhibition organized in the Bandaranaike Maha Vidyalaya in the Gampaha Electorate. This is the first time that an exhibition of this nature was organized in the Gampaha District. A science society was formed in this college just one year ago. A new principal has come there. The director is also a man of high calibre. This exhibition was held on the 15th, 16th and 17th of November in this college, and thousands of studes from the Gampaha Electorate and Gampaha District visited it.

If you have this type of education extended all over the countryside, the students, the younger generation, will show how a new and modern Lanka can and should be evolved where modernization will be necessary in all fields of development. In fact, these courses can be further extended to rural areas through science societies, which will enable young farmers and the working class to obtain scientific knowledge in the fields in which they are interested.

Sir, in this respect I would suggest that agricultural universities be established all over the countryside, perhaps one in each district, like what we have in China. Last month I happened to be in China. They have a large number of agricultural colleges and universities there. We can in fact start an agricultural university in the Mahaweli. We can straightaway have about 25,000 students in that university. In the Mahaweli area you have thick jungle at the moment and settlements are being just started. So about 25,000 students can be straightway absorbed into that university where natural surroundings are available. The students there will be able to do a lot of research in development work starting almost from scratch with forest land. I fell that you can start such a university in the Mahaweli area with about 25,000 students. Thereafter you car extend it to places like Polonnaruwa, Anuradhapura, Moneragala, Amparai and so on.

In this connection I would also like to suggest universities for fisheries in the fishing areas. One or two such universities can be started for the children of fishermen because, as we all know, the fishing industry is a very important industry in our country. With the sea right round our country, research in the sea can be of great benefit to mankind. I do not think we are making the best use of our sea resources.

Those are the two or three matters that I was anxious to submit to the Hon. Minister and the Ministry. In conclusion, I wish to thank the Ministry for removing the police post from the Peradeniya University because police posts should not be placed in universities. The universities must be manned by the heads of the universities, the heads of the colleges and the principals of those colleges together with the assistance of the prefects. You can have a number of prefects in the colleges and universites, and they must look after discipline among the students along with the lecturers and the heads of those universities. No police should interfere with discipline in the universities. I am happy that the Hon. Minister and the department have removed the police post from the Peradeniya University.

අ. භා. 1.39

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා (ඇමතිතුමා)**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார — அமைச்சர்)**
(Mr. W. J. M. Lokubandara–Minister)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට ඉතාම ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාව දීම ගැන. අනාගතයට කෙලින්ම බලපාන හෙට යුගයේ පුරවැසියන් පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කිරීමේදී විශේෂ සැලකිල්ලට ගත යුතු අමාත්‍යාංශයක් වශයෙන් ගත් විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සිදුවන මෙහෙවර සුළුපටුයයි කියන්න බැහැ. මෙය බොහෝ විට විවේචනයට ලක් වන අමාත්‍යාංශයක්. ලක් විය යුතු අමාත්‍යාංශයක්. එහෙත් අපේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය බොහෝම සංකීර්ණ ප්‍රශ්න රාශියකට මුහුණ දී සිටින බව අපට අමතක කරන්නට බැහැ.

කෙනෙකුගේ ජීවිතයේ යෞවන කාලය, තරුණ කාලය, තම අනාගතය පිළිබඳ තීරණ ගන්නා කාලයයි. ජාතියක අනාගතය පිළිබඳ පූර්ණ වගකීමක් දරන අමාත්‍යාංශයක් වශයෙන් සලකන විට, තරුණයාගේ චිත්ත ස්වභාවය ගැන කල්පනා කළත් ලෝකයේ ඉතා ඉක්මණින් වෙනස්වන සුළු ගතිය ගැන කල්පනා කළත් අපරට වැනි රටක අද සිදු වී තිබෙන විශේෂයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. ජ. මු. ලොකුබණ්ඩාර]

දෛනිකව පැනනගින් ප්‍රශ්න ගැන කල්පනා කළත් හැමදටම හැම වෙලාවටම ගැලපෙන ඔරොත්තු දෙන විධියේ උසස් අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම ඉතාම අමාරු බව පැහැදිලි වෙනවා. එහෙත් පසුගිය කාලය තුළදී අපට තිබෙන සීමිත ධන ශක්තිය අනුව අපට සතුටු විය හැකි අන්දමේ කාර්ය භාරයක් මේ අමාත්‍යාංශය ඉෂ්ට කළ බව කියන්නට පුළුවනි.

මම මේ අවස්ථාවේදී කරුණක් දෙකක් ඉදිරිපත් කරනවා. ඒවා ඉදිරිපත් කරන්නේ නිලධාරී මහත්වරුන්ගේත් විශේෂයෙන්ම ප්‍රතිපත්ති සාදන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අයගේත් විශේෂ අවධානයට යොමුවීම සඳහායි. මේ වැය ශීර්ෂය ගැන කතා කළ බොහෝ අය ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳව දැඩි අවධාරණයක් කළා. කවුද ඒක නැහැයි කියන්නේ ? ඉංග්‍රීසි අධ්‍යාපනයේ තිබෙන වටිනාකම මේ සභාව තුළ හෝ ඉන් පිටස්තරව හෝ කවුරුවත් අමුතුවෙන් අවධාරණය කරන්න වුවමනා නැහැ. ඉංග්‍රීසි අධ්‍යාපනයේ වටිනාකම වැඩියෙන්ම දන්නේ ඉංග්‍රීසිය නොදන්න එකා. ඉංග්‍රීසි භාෂාවේ වටිනාකම, ඉංග්‍රීසි නොදන්න මනුස්සයා විතර කිසිම විටෙකවත් ඔය ඉංග්‍රීසි දන්න ඇත්තෝ දන්නේ නැහැ. ඉංග්‍රීසිය දන්නා ඇත්තෝ 'කඩුව' පාවිච්චි කරනවා. කවුරු කාට කොටුවත් කොයි විධියට ලේ ගැලුවත් කමක් නැහැ. ඔවුන් ඒකෙන් වැඩ ගන්නවා. එහෙත් ඉංග්‍රීසිය නොදන්න අහිංසකයා, ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා ගැනීමට වරප්‍රසාද නැති අහිංසකයා ඒ නිසා ලබන මානසික සන්තාපය තේරුම් ගන්න බැහැ. මට පෙනෙන හැටියට ප්‍රතිපත්ති හදන අයත්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අයත් තවමත් එය තේරුම් අරගෙන නැහැ. ඉංග්‍රීසි අධ්‍යාපනයේ තිබෙන වටිනාකම ගැන කිසිම විවාදයක් නැහැ. ආණ්ඩු පක්ෂයේ හෝ වේවා විරුද්ධ පක්ෂයේ හෝ වේවා, අනාගත ලෝකයේදී හෝ වේවා ඒ ගැන කිසිම විවාදයක් නැහැ. ඒ අදහස ගැන කිසිම කෙනෙකුගේ විරුද්ධත්වයක් නැහැ. ඉංග්‍රීසි අවශ්‍ය නැහැ කියන හඬක්වත් කවදාවත් නැගිල නැහැ. මූලික දේ එය නොවෙයි. මේ රටේ අහිංසක දුප්පත් දරුවන්ට, ඉංග්‍රීසි කථා නොකරන පංතියේ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා සැකසුන සැලැස්මක් මේ රටේ තිබෙනවාද ? දිස්ත්‍රික් මට්ටමින් හෝ වේවා වෙන කිසිම ආකාරයක ජාතික මට්ටමේ සැලැස්මක් මේ රටේ තිබෙනවාද ? නමුත් හදිසියේම දවසක අපට පුවත්පතක දකින්න ලැබෙනවා, තීන්දුවක් අරගෙන තිබෙනවා සමහර විට නීති පීඨයට ඇතුල් වෙන්නට ඉංග්‍රීසි භාෂාවට සම්මානයක් අනිවාර්යයි කියා. එහෙම නැත්නම් තවත් දවසක අපට දකින්න ලැබෙනවා, විශ්ව විද්‍යාල ප්‍රවේශයට හෝ වේවා වෙනත් උසස් තනතුරක් සඳහා හෝ වේවා, තැපැල් මහත්මයෙකු වෙන්න හෝ වේවා ඉංග්‍රීසි භාෂාවට සම්මානයක් අනිවාර්යයි කියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ පොල්ල දමූ පලියට මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවාද ? තමුන්නාන්සේ ඉතාම දියුණු නාගරික ආසනයක් නියෝජනය කරනවා. ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ගන්න තරම් පහසුකම් නැති පාසල් තමුන්නාන්සේගේ ආසනයේ නැද්ද ? ඉංග්‍රීසියට සම්මාන සාමාර්ථයක් අනිවාර්ය කිරීම කෝකටත් තෛලය වගේ සමහර අය හිතනවා. හරි ප්‍රතිපත්තිය එයයි කියල හිතනවා. අපේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහනවා, හලාවත පාසල්වල ඒ සියලුම පහසුකම් තිබෙනවාද කියා. තමුන්නාන්සේ ඉංග්‍රීසි අධ්‍යාපනයේ වටිනාකම ගැන බොහොම හොඳට දන්නා කෙනෙක්. ඒ වගේම හම්බන්තොට ආසනයේ ඒ පහසුකම් ඔක්කොම තිබෙනවාද ? ඒ වගේම අපේ අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහනවා, වියලුව ආසනයේ ඒ පහසුකම් තිබෙනවාද කියා. ඒ වගේම උඩදුම්බර ඒ පහසුකම් තිබෙනවාද ? නැහැ. මේ පහසුකම් සලසා දෙන්නෙ නැතිව හැමදේම වැහෙන්න කියන දෙයක් තමයි, කොහොමද ඉංග්‍රීසි දන්නෙ නැති එක්කෙනා වැඩ කරන්නෙ කියා. ඉංග්‍රීසි දන්නෙ නැති එක්කෙනා ජාති අන්ධයෙක් වගෙයිලු. ඉංග්‍රීසි නොදන්නා එකාට ජේන්නෙ මොකක්ද ? එහෙම කියල ඉංග්‍රීසි වර්ණනා කර කර ඉන්නවා මිසක් ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳව කිසිම ජාතික සැලැස්මක් මේ රටේ තවම සකස් කරල නැහැ. මේ ගැන අපට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට දොස් පවරන්න බැහැ. නමුත් ඒ වගකීමෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට බේරෙන්නත් බැහැ. බේරෙන්න බැරි මේ නිසයි. යම්කිසි විධියක අමු ද්‍රව්‍යයක් තමන්ට ලැබෙනවා නම්, ඒ ද්‍රව්‍යයේ හැටියට තමයි, නිර්මානය කළ යුත්තෙ. ලැබෙන අමු ද්‍රව්‍යයේ තත්ත්වය හරියට හරවත්ව සකස් කර ගැනීමේ මූලික වගකීමෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට බේරෙන්න බැහැ. දැනට ඔවුන් කරන්නෙ මොකක්ද ? ගම්බද ප්‍රදේශවල ඉන්න ඉතාම දක්ෂ බුද්ධිමත් තරුණ තරුණියන් විශ්ව විද්‍යාලයට ආවාම යම්තම් එහෙන් මෙහෙන් ඉංග්‍රීසි අකුරු ටික පමණක් තෝරලා දෙනවා. බොරුවට ඇඟ බේරා ගන්නයි එය කරන්නෙ. පංතියක් තිබ්බ කියල කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතික හැඟීමක් තිබෙනවා නම් ඒ විධියට කරන්න බැහැ. අපේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් කෝටි 120 ක පමණ මුදල් ප්‍රමාණයක් වැය කරනවා. මේ කෝටි ගණන සුළු පටු මුදලක් නොවෙයි. ජනතාවට දරන්න පුළුවන් බරක් නොවෙයි. මෙයින් නියම ප්‍රතිඵලයක් ලබා ගන්නට නම් කටයුතු කළ යුත්තෙ කොහොමද ? ලක්ෂ ගණන් වටිනා ඉංග්‍රීසි පොත්පත් විශ්ව විද්‍යාලයේ තිබෙනවා. විශ්ව විද්‍යාලයේ හෝ වේවා නීති විද්‍යාලයේ හෝ වේවා, වෙනත් විද්‍යාලයක හෝ වේවා නියම විධියට පුස්තකාලයක් පරිශීලනය කරන්නට බැරි නම් ඒ අය ලබන උසස් අධ්‍යාපනය ගැන අපට සතුටු වෙන්න බැහැ. මේ තත්ත්වය තේරුම් අරගෙන කවර පීඨයකට කොයි ආකාරයකට ශිෂ්‍යයන් ඇතුළත් වුණත් ඔවුන්ට අංග සම්පූර්ණ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා දීමේ වගකීම විශ්ව විද්‍යාලය භාර ගන්න ඕනෑ. තාක්ෂණික විද්‍යාලය ඒ වගකීම භාර ගන්න ඕනෑ. උසස් අධ්‍යාපනය අංග සම්පූර්ණව දෙන්නට අත්‍යවශ්‍ය දෙයක් තමයි, ඒ. එහෙම නැතිව හදිසියේම සම්මානයක් අනිවාර්යයි කියන පොල්ල දැමීමෙන් වෙන්නෙ එකම එක දෙයයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සිදුවෙන දේ මොකක්ද ? බිබිලෙ වගේ ආසනයක හෝ වේවා, හපුතලේ වගේ ආසනයක හෝ වේවා බුද්ධිමත්ම බුද්ධිමත් ශිෂ්‍යයාට, සමහර විට විෂයයන් හතරට සම්මාන සාමාර්ථ නැත්නම් විශිෂ්ඨ සාමාර්ථ ලබා ගෙන සිටියත් නීති විද්‍යාලයට ඇතුල් වෙන්නට ඔහුට ඉඩ නොදීමයි. ඔවුන්ට නීති විද්‍යාලයට ඇතුල් වෙන්න බැරි විධියට පොල්ල දමනවා. ඉංග්‍රීසි නැහැ, ඇතුල්වීම තහනම්. එය හරිද ? සාධාරණද ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ නීතියේම තියෙනවා, පූර්ව නිගමනයක්, නීතිය නොදැනීම නිදහසට කාරණයක් නොවේය කියා. එහෙම තිබෙන රටක, නීති ගරුක විය යුතුය කියන එක හැම තැනම තිබෙන රටක, නීතිගරුක වෙන්න නම් නීතිය දැනගන්න ඕනෑ. ඒ වගේම මා සඳහන් කරන්න කැමතියි, මේ ගරු සභාව තුළ සිටින හැම සාමාජිකයෙකුටම, නීතිය සම්පාදනය කිරීමේ ඉහළම ආයතනය වන මේ සභාවේ ඉන්න හැම සාමාජිකයෙකුටම, නීතිය ඉගෙන ගන්න වරය තිබෙන්න ඕනෑ. අර ඉංග්‍රීසියට සම්මානයක් නැහැ කියල හෝ, උපාධියක් නැහැ කියල හෝ, උසස් පෙළ සාමාර්ථයක් නැහැ කියල හෝ එය වැළැක්වීම සුදුසු නැහැ. නීතිය ඉගෙණ ගැනීම හැම පුරවැසියෙකුටම තිබෙන මූලික අයිතිවාසිකමක්. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඒ වරය තිබෙන ඕනෑ බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. එබඳු පොදු තත්ත්වයක් තිබෙන්න ඕනෑ.

එහෙත් උසස් අධ්‍යාපනය සීමා කිරීමෙන් වෙන්නෙ එක් දෙයයි. ඉංග්‍රීසි කථා කරන පංතියත්, ඉංග්‍රීසි කථා නොකරන පංතියත් කියල පංති දෙකක් තිබෙනවා. ඒ බුද්ධිමත් හා බුද්ධිමත් නොවන පංති දෙකක් නොවෙයි ; උගත් නූගත් කියන පංති දෙකක් නොවෙයි. සමාජයේ වටිනාම තැන්, උසස්ම තැන් ලබා ගන්නට වරප්‍රසාද තිබෙන්නේ ඉංග්‍රීසි කථා කිරීමේ හැකියාව තිබෙන පංතියටයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මේ කියන දේ ඉංග්‍රීසියෙන් කිව්වත්, දෙමළෙන් කිව්වත්, සිංහලෙන් කිව්වත් වටිනාකම තිබෙන්නේ අදහසේ මිස මා යොදන භාෂාවේ නොවෙයි. එහෙත් මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල වී දශක කිහිපයක් ගියාට පසුව වුණත් ඉංග්‍රීසියෙන් කිව්වා නම් එතැන වටිනාකම තිබෙනවා කියලයි හිතන්නේ. මේ තිබෙන දුෂ්ට බුද්ධිය නිසා තමයි මේ තිබෙන නිවට කුහක ප්‍රතිපත්තිය නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉංග්‍රීසියට අනවශ්‍ය වන්දනාවක් අනවශ්‍ය පූජාවක් මේ රටේ තිබෙන්නේ. මේ තත්ත්වය නැති කරන්නට නම් හැම දුගී දුප්පත් ශිෂ්‍යයකුටම, ශිෂ්‍යාවකටම හොඳ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා දිය යුතුව තිබෙනවා. ඉංග්‍රීසිය ජනසතු කළ යුතුව තිබෙනවා. එහෙත් එය වෙන්නේ නැහැ. මෙය දක්ෂතම උගත්ම, බුද්ධිමත්ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශ්ව විද්‍යාලයට යන වරප්‍රසාදය නැති කිරීමේ මාර්ගයක් කර තිබෙනවා.

නීති පීඨවලට මෙවර ඉංග්‍රීසි සම්මානයක් අනිවාර්ය කළා. කාටද කියන්න පුළුවන් ලබන වර වෛද්‍ය පීඨවලට ඇතුළත් වෙන්න ඉංග්‍රීසි සම්මානයක් අනිවාර්ය නොකරනවාය කියල. කාටද කියන්න පුළුවන් ඉංජිනේරු පීඨවලට ඇතුළත් වෙන්න ඉංග්‍රීසි සම්මානයක් අනිවාර්ය නොකරයි කියල. මේ තත්ත්වය ඉතාමත් අසාධාරණයි. විශේෂයෙන් ගම්බද ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් සලකා බැලුවාම මේ තත්ත්වය ඉතාමත් අසාධාරණයි. අපේ රටේ පාර්ලිමේන්තුවෙන් ඇහෙන හඬ, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන නිලධාරීන්ට විශේෂයෙන්ම තේරෙන්න ඕනෑ. එහෙම තේරෙන බවක් නම් පෙනෙන්නේ නැහැ. එම නිසා මේ අවස්ථාවේදී මා තදින්ම විරුද්ධත්වය ප්‍රකාශ කරනවා, යම් යම් අවස්ථාවලදී ඉංග්‍රීසි විෂයයට සම්මානයක් අනිවාර්ය කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිබඳව. ඉක්මන් කොටයි කියා කියමනක් තිබෙනවා. එම නිසා අහිංසක දුප්පත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බිලි වෙනවා. එහෙයින් ඉංග්‍රීසි ඉගැන්විය යුතුයි. පලමුවත්, දෙවනුවත්, තුන්වෙනුවත් ඉංග්‍රීසි ඉගැන්විය යුතුයි. කවුද එය නැහැයි කියන්නේ ? මගේ ආසනයේ මම ස්වේච්ඡා සංවිධාන මගින් ඉංග්‍රීසි උගන්වනවා. පලාතේ මන්ත්‍රීවරයා වශයෙන් සෑම සුමාතයකටම එක ඉංග්‍රීසි පංතියක උගැන්වීම කිරීම මගේ පුරුද්දක්. අපි ඉංග්‍රීසි ද්‍රෝහියෝ නොවෙයි. ඉංග්‍රීසි ද්‍රෝහිකම නොවෙයි මෙතැන තිබෙන්නේ. පියදසගේ අම්මට අප්පට ඉංග්‍රීසි කථා කරන්න බැරි වූ නිසා පියදසගේ බුද්ධියට දඬුවම් කරනවා. මේ තත්ත්වය නැති කල යුතුයි. මේ තත්ත්වය අපි තේරුම් ගත යුතුයි. මේ ගැන තවත් කියන්න ඕනැද කියා මට නම් තේරෙන්නේ නැහැ. මෙය බරපතල අසාධාරණයක්.

ජාතික මට්ටමෙන් යම් සැලැස්මක් අනුව ඉංග්‍රීසි භාෂාව මේ රටේ ව්‍යාප්ත කල යුතුයි. අපනයන භාණ්ඩ පිළිබඳව මේ තරම් උනන්දුවක් දක්වන මේ රටේ ඉංග්‍රීසි ඉගෙන ගත් මනුෂ්‍යයා තරම් වටිනා භාණ්ඩයක් තවත් ඇත්තේ නැහැ. ලෝකයේ කොයි රටකටද යවන්න බැරි අපේ භාණ්ඩ ? නිතරම ආයාත නිර්යාත ගැන කථා කරන මේ රටේ විදේශ විනිමය සපයා ගන්නා ශක්තිය ඇති අය බිහි කරන බලවේගයක් තිබෙනවා. එයින් අපි වැඩි වැඩියෙන් වැඩ ගත යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් කාරණයක් කියන්න තිබෙනවා. ඒ පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුලත් කර ගැනීම පිළිබඳවයි. මේ පිළිබඳව " දිවයින " පත්තරයේ ඉතාමත් පැහැදිලි විස්තරයක් දී තිබුණා. මේ විස්තරය සම්බන්ධයෙන් " කරුණු පැහැදිලි කිරීමක් " කියල උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ—කවුදෝ දන්නේ නැහැ—නිලධාරි මහත්මයෙක් යම් ප්‍රකාශයක් කර තිබුණා. මම දන්නවා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්තුමා ගැන. එතුමා සමග ඉතාමත් සමීපව මම ආයුර්වේද අධ්‍යාපනය සම්බන්ධයෙන් ඒ වාගේම මේ රටේ උසස් අධ්‍යාපනය පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. ඉතාමත් විනීතව ප්‍රශ්නයක් තේරුම් ගෙන කටයුතු කරන මේ රටේ සිටින දක්ෂ නිලධාරීන්ගෙන් එක්කෙනෙක් එතුමා. ඒ ලේකම්තුමා මා හිතන්නේ නැහැ කවදාවත් අර විධියේ පිළිතුරක් දෙයි කියා. නිලධාරීන් ජනතාවට අහිතකර යම් යම් තීරණ ගත්තාම ඒවායේ තිබෙන වැරදි පෙන්වා දෙන්නට පුවත්පත්වලට සම්පූර්ණ අයිතිය තිබෙනවා. ජනතාවට යම් ප්‍රශ්නයක් වුණාම ඒ ප්‍රශ්නය මතු කර පෙන්වන්නට පුවත්පත්වලට අයිතිය තිබෙනවා. " පත්තරකාරයා දන්නේ නැත්නම් නිකම් ඉන්න ඕනැ " කියන ආකල්පයකිනුයි, එයට පිළිතුර දී තිබෙන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

තවත් මන්ත්‍රීවරුන් කථා කරන්න ඉන්නවා. තව විනාඩි කීයක් ඕනැද ?

**ඩබ්. ජේ. මු. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
(Mr. W. J. M. Lokubandara)

තව විනාඩි දෙකක් තුනක් ඕනැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නයකට උත්තර දෙන්න නිලධාරීන් බැඳී ඉන්නවා. යමක් වැරදි නම් ඒ පිළිබඳ සත්‍ය තත්ත්වය දෙන්න ඒ නිලධාරීන් බැඳී ඉන්නවා. ඒ වගකීමෙන් බේරෙන්න උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ට වුණත් බැහැ. මම ලේකම්තුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, ඇමතිතුමාටත් විදුලි පුවත් යැව්වා. මා මේ අවස්ථාවේදී චෝදනාවක් කරනවා නියෝජ්‍ය ඇමතිතුමාටත්, සභාපතිතුමාටත්, ලේකම්තුමාටත්, ඇමතිතුමාටත්. ඒ විස්තරය අපට පහද දෙන්න. අද වන තෙක් අපට උත්තරයක් නැහැ. මේ ආකල්පය වැරදියි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය " උසස් " ය කියා විශේෂණ පදයක් තිබුණු පලියට සාමාන්‍ය ජනතාවගේ ප්‍රශ්නවලට උත්තර නොදීමට තරම් දඩබ්බර වෙන්නට එපා. " දිවයින " පුවත්පතට එබඳු ප්‍රකාශයක් කිරීම මා හෙලා දකිනවා. අපට සම්පූර්ණ තොරතුරු ඕනැ. ඌව ප්‍රදේශය වැනි අපේ ආසන පිළිබිඹු කෙරෙන දිස්ත්‍රික්කවලට, මොණරාගල බදුල්ල රත්නපුරය අම්පාර යනාදී මේ දිස්ත්‍රික්කවලට පොදු විශ්ව විද්‍යාලය තමයි පේරාදෙණිය විශ්ව විද්‍යාලය. පේරාදෙණිය විශ්ව විද්‍යාලය මේ රටේ ජාතික සටනේ එක්තරා අනුස්මරණීය අවස්ථාවක්. ඌවේ අපට විශ්ව විද්‍යාලයක් නැහැ. ඒ සියලුම කරුණු ගැන කල්පනා කරන විට පේරාදෙණිය විශ්ව විද්‍යාලය සිංහල නොවන ශිෂ්‍යයන්ගෙන් පිරවීමට යම් කුමන්ත්‍රණයක් තිබෙනවා නම් ඒක ඌවේ හෝ වේවා, රත්නපුර දිස්ත්‍රික්කයේ හෝ වේවා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් එවූ ඡන්ද දායකයන්ට කරන අසාධාරණයක්ය කියා මා මේ අවස්ථාවේදී කියනවා. සාධාරණය ඉෂ්ට විය යුතුයි කන්ද උඩරට ජනතාවට. ඒ ජනතාවට කල මේ අසාධාරණයට හපුතලේ මන්ත්‍රීවරයා වශයෙන් මා තදින්ම මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

මේ අවස්ථාවේදී තවත් එක කාරණයක් ගැන නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඒක බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය සම්බන්ධවයි. ඒ ගැන මීට වඩා කල්පනාකාරී වෙන්නට ඕනැ. ඒ පිළිබඳව කල්පනා කර සැලැස්මක් අනුව කටයුතු කල යුතුව තිබෙනවා. අපේ බුද්ධ පුත්‍රයන් වහන්සේලාට හෙට දවසට සුදුසු අධ්‍යාපනයක් දෙන්නට පුළුවන් වෙනත් කරුණු පිළිබඳව දැනුම දෙන්නට පුළුවන් අංග සම්පූර්ණ අධ්‍යාපනික ආයතනයක් හැටියට බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය සකස් කරන්නට බැරි නම් එය සංස්කෘතික අමාත්‍යාංශයට භාර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන් ආයුර්වේද ක්ෂේත්‍රයේ දියුණුවට විශේෂයෙන්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මට ලැබුණු සහයෝගයට ප්‍රශංසා කරමින් මා නිහඩ වෙනවා.

අ. භා. 1.55

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා (නියෝජ්‍ය රෙජකර්ම ඇමතිතුමා)**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா — புடைவைக் கைத்தொழில் பிரதி அமைச்சர்)**
(Mr. R. M. Dharmadasa Banda–Deputy Minister of Textile Industries)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී එක කාරණයක් ගැන මුලු අමාත්‍යාංශයේම අවධානය යොමු කරවන්නට මට සිද්ධ වී තිබෙනවා. පත්‍රයක පල වූ ප්‍රවෘත්තියක් මා කියෙව්වා. ඒක හරිද නැද්ද කියා මා දන්නේ නැහැ. විශ්ව විද්‍යාලවලට ලමයින් ඇතුළු කර ගැනීම සම්බන්ධයෙන් දැනට තිබෙන ක්‍රියාදාමය නැතහොත් ප්‍රතිපත්තිය නැවත වරක් සලකා බලා ඒකේ වෙනසක් කලයුතුද නැද්ද කියා නිර්දේශ කරන්නට කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුව සාමාජිකයන් අට දෙනෙකුගෙන් සමන්විතයි. එම කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන්නේ එම අමාත්‍යාංශයේම ලේකම්තුමා වන ආචාර්ය කල්පගේ මහත්මයායි. ඒ කමිටුවේ යම් යම් තීරණ පිළිබඳව වාර්තාවක් 1984 සැප්තැම්බර් 29 වන දින "ඩේලි නිව්ස්" පත්‍රයේ පල කර තිබෙනවා. "Review of Varsity Admissions" කියන ශීර්ෂ පාඨය යටතේ එම වාර්තාවට යම් යම් ආරංචි කීපයක් ඇතුළු කර තිබෙනවා. ඒ ආරංචි දෙස බලන විට මොනරාගල වැනි දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් තත්ත්වය කණගාටුදායකයි. මෙතෙක් කල් විශ්ව විද්‍යාලයට ලමයින් ඇතුලත් කර ගත්තේ—විශේෂයෙන්ම 1978 සිට—දක්ෂතාවය අනුව සියයට 30 ක්ද දිස්ත්‍රික්ක මට්ටමෙන් සියයට 55 ක්ද වැඩි පහසුකම් නැති අධ්‍යාපනයෙන් ටිකක් පහත් මට්ටමේ තිබෙන දිස්ත්‍රික්කවලින් සියයට 15 ක්ද යන අනුපාතයට අනුවයි. තවමත් ලමයින් ඇතුලත් කර ගන්නේ එම අනුපාතයට අනුවයි. එම අනුපාතය අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් යම් පහසුකම් නැති දිස්ත්‍රික්කවලට සියයට 15 ක ඉඩක් ලැබී තිබෙනවා. ඒ ගණයට නුවරඑළිය, හම්බන්තොට, මන්නාරම, වවුනියාව, මුලතිව්, මඩකලපුව, අම්පාරේ, ත්‍රිකුණාමලය, පුත්තලම, අනුරාධපුරය, පොලොන්නරුව සහ මොනරාගල යන දිස්ත්‍රික්ක ඇතුලත් වෙනවා. මට නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැනගතයුතු කාරණයක් තිබෙනවා. මා දන්නේ නැහැ මේක අවසාන තීරණයද කියල. පත්‍රයේ තිබුණු දෙයක් ගැන මා කියන්නේ. පිළිවෙළින් සියයට 30, සියයට 55 සහ සියයට 15 ක්වූ එම අනුපාතයෙහි යම් වෙනසක් කරන්නට අර කමිටුව නිර්දේශයක් කර තිබෙනවාය කියනවා. දක්ෂතාවය අනුව සියයට 30 කුත් ඊළඟ දිස්ත්‍රික්ක සියල්ලටම සියයට 65 කුත් දී අර අඩු පහසුකම් තිබෙන දිස්ත්‍රික්කවලින් සියයට 5 ක් පමණක් බඳවා ගන්නට නිර්දේශ කර තිබෙනවාය කියා මේ ආරංචියෙන් කියනවා. සියයට 65 ක් දිස්ත්‍රික්ක මට්ටමින් බෙදන්නේ—සියයට 55 ක්ව තිබුණු ප්‍රමාණය සියයට 65 දක්වා වැඩි කර තිබෙනවා—යම් යම් දිස්ත්‍රික්ක කීපයකට පමණක් ඒ වැඩි කරන සියයට 10 බෙදන්නලු. මේ වාර්තාව අනුව ඒ දිස්ත්‍රික්ක වශයෙන් සඳහන් වන්නේ ගම්පහ, කළුතර, මහනුවර, මාතලේ, ගාල්ල, මාතර, කුරුණෑගල, රත්නපුරය හා කෑගල්ල යන දිස්ත්‍රික්කයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා]

ඒ දිස්ත්‍රික්කවලින් වැඩි පිරිසක් ගන්නට මේ අන්දමට සියයට 10 ක් වැඩි කර තිබෙනවා යයි කියනවා. ඒ අන්දමට සියයට 10 ක් වැඩි කර ඒ දිස්ත්‍රික්කවලට බෙද ඊටත් වඩා අසාධාරණ විධියේ තවත් යෝජනාවකුත් කර තිබෙනවා. මෙය ඇත්තද නැත්තද කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමා අපට කියන්නට ඕනෑ. මෙහි මෙන්න මෙහෙම කියා තිබෙනවා :

"....They also thought some districts classified as underprivileged could very well be out of the category . . "

ඒ මෙන්න මේ දිස්ත්‍රික්කයි. දිස්ත්‍රික්ක කීපයක් අයින් කර තිබෙනවා.

"....So this special category has been restricted to five districts, Hambantota, Mannar, Mullaitivu, Ampara and Badulla . . . "

මේ යෝජනාව අනුව කලින් මා සඳහන් කල දිස්ත්‍රික්ක පහලොව දිස්ත්‍රික්ක 5 කට පමණක් සීමා කරන්නට යනවා. ඒ දිස්ත්‍රික්ක පහ තම් හම්බන්තොට, මන්නාරම, මුලතිවු, අම්පාර සහ බදුල්ලයි. මේ යෝජනාව අනුව අධ්‍යාපන පහසුකම් අඩු දිස්ත්‍රික්ක හැටියට කලින් සඳහන් කල දිස්ත්‍රික්ක 15 ත් මෙන්න මේ දිසත්‍රික්ක 5 ට පමණයි, ඒ සියයට 5 හෝ කලින් හැටියට නම් සියයට 15 හෝ දෙන්නට යන්නේ. මේ කමිටුව කොහොමද මම දන්නේ නැහැ. කියා තිබෙන්නේ නම් "All reputed educationalists" කියලයි. හැබැයි ගරු සභාපතිතුමනි, මේ දිස්ත්‍රික්ක පහ තෝරා ගැනීමේදී මොනරාගල වැනි දිස්ත්‍රික්ක අයින් කර තිබ්බ ගැන මම කණගාටු වෙනවා. මොනරාගලට වඩා අන්තලූ, බදුල්ල. මොනරාගලට වඩා අන්තලූ, අම්පාරෙ. මෙවා අයින් වන්නේ කොහොමදැයි මම දන්නේ නැහැ. ඒ නිසා මෙසේ දිස්ත්‍රික්ක 5 කට පමණක් මෙය සීමා කිරීම ගැන මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

බදුල්ලට මේ පහසුකම් දීම ගැන මම විරුද්ධ වන්නේ නැහැ. අම්පාරේ ඇතුළු මේ දිස්ත්‍රික්ක පහටම මේ පහසුකම දීම ගැන මම විරුද්ධ වන්නේ නැහැ. මම විරුද්ධ වන්නේ අඩු පහසුකම් තිබෙන දිස්ත්‍රික්ක තෝරා බෙරා ගැනීමේදී ඇතැම් දිස්ත්‍රික්කවලට අසාධාරණයත් කර තිබ්බ ගැනයි. මොනරාගලට අසාධාරණයක් කර තිබෙනවා. පොලොන්නරුව, පුත්තලම වැනි තවත් එවැනි දිස්ත්‍රික්ක තිබෙනවා. ඒවාටත් අසාධාරණයක් කර තිබෙනවා යයි මම හිතනවා. [බාධා කිරීමක්] නුවරඑළියත් කැපී ගිහින් 15 න් 10 ක්ම කපා දමා තව ඉතිරි කර තිබෙන්නේ 5 යි. කරුණාකර මෙය ක්‍රියාත්මක කරන්න එපා යයි මම කියනවා. මේ තීරණ ක්‍රියාත්මක කලොත් ලොකු අසාධාරණයත් වෙනවා. මේ තීරණ ක්‍රියාත්මක කරන්න ඕනෑ නම් කරුණාකර අධ්‍යාපන අමාත්‍යාංශනයට කියා අපේ විද්‍යාලවලට සම්පූර්ණ පහසුකම් ලබා දෙන්න. එවිට අපි මේවාට විරුද්ධ වන්නේ නැහැ. ඒක කරන්න බැරි නම් අධ්‍යාපන පහසුකම් අඩු ප්‍රදේශ ගණයට මොනරාගලත් ඇතුලත් කරන්න. මම හිතන විධියට අතික් දිස්ත්‍රික්ක කීපයත් එයට ඇතුලත් කල යුතුයි. එසේ නැත්නම් කමිටුවේ නිර්දේශ කිසිවක් ක්‍රියාත්මක නොකර පරණ පිළිවෙලට 30 : 55 : 15 යන අනුපාතයටම ශිෂ්‍යයින් බඳවා ගැනීම කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

තවත් කරුණක් පෙන්නුම් කර දෙන්නට ඕනෑ. විශ්ව විද්‍යාලවලට— විශේෂයෙන් පේරාදෙනියට—ශිෂ්‍යයින් ඇතුලත් කර ගැනීමේදී ලොකු අසාරණයක් සිදු වී තිබෙනවා යයි කලින් පෙන්නුම් කර දුන්නා. තවත් කරුණක් කියන්නට ඕනෑ. මඩකලපුව විශ්ව විද්‍යාලය ශිෂ්‍යයින් 75 කින් පටන් ගෙන දැන් එය ටිකක් වැඩි වී තිබෙනව. එය දැන් දෙගුණයක් විගෙන යනවා. එහෙත් අවාසනාවකට මඩකලපුව විශ්ව විද්‍යාලයට වැඩිපුර සිංහල ශිෂ්‍යයින් බඳවා ගන්නවා. ඒ සිංහල ශිෂ්‍යයින්ට එහාට යන්නට විධියක් නැහැ. මම කථා කරන්නේ දැනට තිබෙන තත්ත්වය අනුවයි. සිංහල ශිෂ්‍යයින් එහි යවන්නට එපා යයි මම කියන්නේ නැහැ. මම මේ ඉල්ලීම කරන්නේ අද පවතින තත්ත්වය අනුවයි. එයත් දැන් යාපනය වැනි තත්ත්වයකට පත් වෙමින් තිබෙනවා. සිංහල ශිෂ්‍යයින්ට එහාට යන්නට බැරි තත්ත්වයකට දැන් එය පත් වෙමින් තිබෙනවා. ඒ නිසා එම විශ්ව විද්‍යාලයට සිංහල ශිෂ්‍යයින් තෝරා ගත්තත් ඔවුන් එහාට යන්නේ නැහැ. එවිට ඔවුන්ගේ අධ්‍යාපනය අතරමග නතර වන තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා එක්කෝ සිංහල ශිෂ්‍යයින් මේ අවස්ථාවේ මඩකලපුව විශ්ව විද්‍යාලයට යවන්න එපා. එහෙම නැත්නම් මඩකලපුව විශ්ව විද්‍යාලය ඉතා කුඩා විශ්ව විද්‍යාලයක් නිසා— දැනටත් එහි 250 කට වැඩි පිරිසක් නැහැ—අද තිබෙන මේ වාතාවරණය යටතේ එය තාවකාලික හෝ වසා දමා ඒ ළමයින් වෙනත් විශ්ව විද්‍යාලයකට ගන්න. දැනටමත් වරක් දෙකක් එය කඩා තිබෙනවා. මීට පසුවත් එවැනි තත්ත්වයන් ඇති වෙන්නට පුළුවන්. සිංහල ළමයෙකුට යා නොහැකි තත්ත්වයක් එහි පවතින්නේ. ඒ නිසා කරුණාකර එය තාවකාලිකව වසා දමා ඒ ළමයින් වෙන තැනකට ගන්න. එහෙම නැත්නම් කරුණාකර සිංහල ළමයින් ටිකවත් වෙන තැනකට ගන්න. එහෙම නොවුණොත් ඒ සිංහල ළමයින්ට ගෙදර නවතින්න වෙනවා. ඒ අනුව ඒ අයගේ උසස් අධ්‍යාපනය එතනින් නතර වෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් පියවර ක් ගන්නය කියා මම ඉල්ලනවා. මෙවැනි වකවානුවක් නිසා එක්කො සම්පූර්ණයෙන්ම වසා දමා ඒ සිෂ්‍යයින් පේරාදෙනියට ගන්න නැත්නම් දේශීය වෛද්‍ය ඇමතිතුමා කී විධියට ඌවට ඉල්ලා තිබෙන විශ්ව විද්‍යාලය ආරම්භ කර ඒ පිරිස එහාට ගන්න. ඒ ඉල්ලීම කරමින් මම නතර වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කාලයෙන් මිනිත්තු 5 ක් කොත්මලේ ගරු මන්ත්‍රීතුමාට (ආනන්ද දසනායක මහතා) දෙන්නට පුළුවන් ද ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා (නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා)**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க — உயர் கல்விப் பிரதி அமைச்சர்)**
(Mr. A. M. R. B. Attanayake–Deputy Minister of Higher Education)

මිනිත්තුවක්වත් දෙන්නට බැහැ. මට තිබෙන්නේ මිනිත්තු 30 යි. පොඩ්ඩක් කලින් කියා තිබුණා නම් යමක් කරන්නට තිබුණා.

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
**(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலை)**
(Mr. Ananda Dassanayake–Kotmale)

එහෙනම් ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන විට අපි ප්‍රශ්න අහනවා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)

හොඳයි. නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ මෙන්ම විරුද්ධ පාර්ශවයේත් ගරු මන්ත්‍රීතුමන්ලාට මම මේ අවස්ථාවේදී බොහොම ප්‍රශංසා කරනවා. ඒ මොකද කීවොත් සැලකිය යුතු අන්දමින් අපේ අමාත්‍යාංශය පිළිබඳ විවාදයට සහභාගී වුණු නිසයි. එතුමන්ලා හොඳ යෝජනා ඉදිරිපත් කලා ; ඒ වාගේම සමහරු වේදනාත්මකවත් කථා කලා. ඒ යෝජනාවත් අපි පිළිගන්නවා. ඒ වේදනාව නැති කොට සහනය ලබා දෙන්නත් මට සිදු වී තිබෙනවා. ඒ විධියේ කරදර ගොඩකට මුහුණ පා තිබෙන මේ අවස්ථාවේ කථා කරන්න සූදානමින් සිටි කොත්මලේ ගරු මන්ත්‍රීතුමාට (ආනන්ද දසනායක මහතා) ඒ සඳහා ඉඩ දෙන්න බැරිවීම ගැන මම කනගාටු වෙනවා.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට මුදල් වෙන් කිරීම් කර තිබෙන්නේ කොහොමදැයි කවුරුවත් අසාවියයි මම හිතුවා. නමුත් කිසිම කෙනෙක් ඒ ගැන කථා කලේ නැහැ. ඒ නිසා අනෙක් ප්‍රශ්නවලට උත්තර දෙන්න ප්‍රථමයෙන්, අතිගරු ජනාධිපති උතුමාණන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ කොයි ආකාරයට එය දියුණු කරගෙන යනවාද කියා පෙන්වා දෙන්න කැමැතියි. අපේ රජයේ අනෙක් අමාත්‍යාංශ හා සසඳන විට, අවුරුද්දෙන් අවුරුද්ද මුදල් වෙන් කිරීම් හා වියදම් කිරීම් මෙන්ම ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම ආදියත් තුළින් බලන විට අපේ අමාත්‍යාංශයේ සීඝ්‍ර දියුණුවක් පෙනෙන්න තිබෙනවා. ඒ නිසා මම ඒ තත්ත්වය කලින්ම පෙන්වා දෙන්නම්.

අයවැය ලේඛනයෙන් වෙන් කෙරෙන මුදල් ප්‍රතිපාදන දිහා බලන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් 1979 වෙන් කර තිබුණේ රුපියල් දසලක්ෂ 31 ක් පමණයි. නමුත් 1984 වන විට එය රුපියල් දසලක්ෂ 262 දක්වා වැඩි වී තිබෙනවා. ඊලඟට, විශ්ව විද්‍යාල සඳහා දෙන දායක මුදල් ප්‍රමාණය 1979 වන විට තිබුණේ රුපියල් දසලක්ෂ 134 ක් නමුත් 1984 වන විට එය රුපියල් දසලක්ෂ 582 ක් දක්වා ඉහල නංවා තිබෙනවා. ඒ වාගේම, කාර්මික විද්‍යාල සඳහා දෙන ආධාර 1979 දී තිබූ රුපියල් දසලක්ෂ 30 සිට 1984 වන විට රුපියල් දසලක්ෂ 215 දක්වා වැඩි කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මීට අමතර වශයෙන්, මහනුවර දිසා ඇමතිතුමා සඳහන් කළා වාගේ අලුතින් විශ්ව විද්‍යාල පීඨ කීපයක් ඇති කර තිබෙනවා. රුහුණු විශ්ව විද්‍යාලය කලින් පීඨයක් වශයෙන් පටන්ගෙන දැන් එය සාම්ප්‍රදායික අංග සම්පූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පත් කර තිබෙනවා. ඒ අතර දුම්බර මණ්ඩපයත්, මඩකලපුව පීඨය වගේ පීඨත් ආරම්භ කර තිබෙනවා. අනුරාධපුරයේ දිසා ඇමතිතුමා ඉල්ලා සිටි කෘෂිකර්ම ඒකකය දැනටමත් පේරාදෙණි විශ්ව විද්‍යාලයට අනුබද්ධ කොට මහඉලුප්පල්ලමේ ආරම්භ කොට ඒ කටයුතු කරගෙන යනවා.

ඊළඟට, කාර්මික විද්‍යාල ක්ෂේත්‍රය ගැනත් මතක් කර දෙන්න කැමැතියි. 1977 න් පස්සේ ඒ ක්ෂේත්‍රයේ අලුතින් ඇති කළ ආයතන පහත සඳහන් පරිදි, විස්තර කරන්න පුළුවනි. වරකාපොළ බහුතාක්ෂණික ආයතනය 1978 දී. මට්ටක්කුළිය කණිෂ්ඨ කාර්මික ආයතනය 1978 දී. කුලියාපිටිය කණිෂ්ඨ කාර්මික ආයතනය 1978 දී. හෝමාගම කණිෂ්ඨ කාර්මික ආයතනය 1979 දී. නුවරඑළිය කණිෂ්ඨ කාර්මික ආයතනය 1979 දී. හසලක කණිෂ්ඨ කාර්මික ආයතනය 1981 දී. දඹුල්ල කණිෂ්ඨ කාර්මික ආයතනය 1982 දී. මීට අමතරව අනුබද්ධ කාර්මික ආයතන වශයෙන් පාතදුම්බර 1978 දීත්, බෙලිඅත්තේ 1980 දීත්, බලපිටියේ 1982 දීත්, මඩකලපුවේ 1983 දීත් ආයතන ආරම්භ කර තිබෙනවා. ඒ අතර වාරියපොළත් 1982 දී අනුබද්ධ කාර්මික ආයතනයක් ඇති කර තිබෙනවා. ඒ විධියට ඒ ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති කරගෙන ගිහින් තිබෙනවා. 1977 වන විට කාර්මික විද්‍යාල තිබුණේ 15 යි. නමුත් දැන් ඒ සංඛ්‍යාව 27 ඉක්මවා තිබෙනවා.

ඒවායේ ඉගෙන ගන්නා ළමයින් සංඛ්‍යාව බැලුවොත් 1977 දී හිටියේ 9,830 ක් පමණක් නමුත් දැන් වාර්ෂිකව ළමයින් 21,690 ක් ඒවාට ඇතුළු වෙනවා. මෙයින් පෙනී යනවා, මොන තරම් වේගවත් දියුණුවක් අප ඇති කර තිබෙනවාද යන බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හාඩි කාර්මික විද්‍යාලය ගැන කථා කළා. 1977 දී අපි ආණ්ඩුව භාර ගැනීමෙන් පසු අපේ අධ්‍යාපන ඇමතිතුමා, හාඩි කාර්මික විද්‍යාලයට නිලධාරීන් යැව්වාම, ඒ නිලධාරීන්ට එම ආයතනයේ ගේට්ටුවෙන් එම ආයතනය තුළට යන්නට සිද්ධ වුණේ පඹවැල් කපාගෙනයි. ඒ ස්ථානය ඒ තරමට වල්බිහි වී තිබුණා. අධ්‍යාපනය ලබන ළමයින් සිය ගණනකට වැඩිය එද එහි සිටියේ නැහැ. අද මෙම හාඩි කාර්මික විද්‍යාලයේත්, කටුබැද්ද විශ්ව විද්‍යාලයේත් ප්‍රථම වර්ෂයේ එන්. ඩී. ටී. පාඨමාලාව පවත්වනවා. විශ්ව විද්‍යාලයක පූර්ව පාඨමාලාවක් එහි පැවැත්වීමට පුළුවන් තත්ත්වයකට එම ආයතනය දැන් උසස් කර තිබෙනවා. එංගලන්තයෙන් පැමිණි ආචාර්යවරුන් හතර දෙනෙක් එහි ඉන්නවා. ජපානයෙන් ආචාර්යවරුන් දෙන්නෙකුත් ඇවිත් ඉන්නවා. අපේ ආචාර්යවරුන්ගේ හිඟය පිරිමසා ගැනීම සඳහා විදේශවලින් පවා ආචාර්යවරුන් ගෙන්වා ගනිමින්, එහි පැවැත්වෙන පාඨමාලා උසස් තත්ත්වයට ගොඩනගා තිබෙනවා. ඇත්ත වශයෙන්ම කාර්මික අධ්‍යාපනයත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ උසස් මට්ටමකට ගෙන එන්නට අපට පුළුවන් වුණේ එම කටයුතු භාර අධ්‍යක්ෂවරයා වන පොන්සේකා මහත්මයා නිසයි. අපේ ගරු ජනාධිපතිතුමා එතුමාගේ සේවය කොයි තරම් ඉහළින් පිළිගත්තාද කියනවා නම්, එතුමා අද අතිරේක ලේකම්වරයකු වශයෙන් පත් කර ඇති අතර කාර්මික අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය විධිවිධාන සලස්සන වෙනමම දෙපාර්තමේන්තුවක් හැටියට සකස් කර තිබෙනවා. ඒ අනුව වෙනමම දෙපාර්තමේන්තුවක් බවට පත් කිරීමට පවා සුදුසු මට්ටමකට උසස් අධ්‍යාපනය ගෙනැවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කලින් සාමාන්‍ය අධ්‍යාපනයේ කොටසක් වශයෙනුයි කාර්මික අංශය තිබුණේ. කොටින්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයක් පිහිටුවන විට, කාර්මික විද්‍යාලවල අධ්‍යාපනයෙහි නිරත ආචාර්යවරුන්ගේ වාර්ෂික දීමනා ආදිය අවුරුදු දහතුනක කාලයක් තිස්සේ ඒවා ලැබිය යුතු අයට ගෙවා තිබුණේ නැහැ. එසේ වුණත්, අපේ ආණ්ඩුව බලයට පත් වී මාස තුනක් ඇතුළතදී ඒ සියල්ලක්ම ගෙවා අවසන් කරමින්, කාර්මික විද්‍යා ක්ෂේත්‍රය අද එක්තරා තත්ත්වයකට ගෙන එන්නට අපට පුළුවන්කම ලැබුණා. එපමණක් නොවෙයි, මෙම ක්ෂේත්‍රය තවත් ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා කාර්මික විද්‍යාල අංශයේ වෙනමම පුහුණු ආයතනයක් රත්මලානේ පිහිටුවීමටත් කටයුතු කරගෙන යනවා. ඒ සඳහා රුපියල් දස ලක්ෂ 11.2 ක් වියදම් කරමින් ඉඩමක් ලබාගෙන දැන් ඒ කටයුතු ආරම්භ කර තිබෙනවා. මේ සමගම එක් එක් අංශ සඳහා පුහුණුවක් ලබා දීම පිණිස දැනටමත් ආචාර්යවරුන් හතළිස් දෙන්නෙක් පිටරට යවා තිබෙනවා.

ඒ සමගම කාර්මික විද්‍යා අංශයේ විෂය ධාරාවන් රටට ගැළපෙන පරිදි, සමාජයට ගැළපෙන පරිදි වෙනස් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කරගෙන කටයුතු කරගෙන යනවා. ඇත්තෙන්ම අලුත් ලොවකට ගැළපෙන පරිදි කාර්මික විද්‍යාලයීය විෂය මාලා සකස් කළ යුතුයි. අන්න ඒ අන්දමට කාර්මික විද්‍යාල අංශයත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දැන් ක්‍රියාත්මක වෙනවා.

විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් ගැටළු කීපයක්ම මතු කළා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) අද උදය වරුවේ කථා කරගෙන යන අතර මතු කළ ප්‍රශ්නවලට එවෙලේම උත්තර දෙන්නට මම කල්පනා කළා. ඒ අනුව ඒ මොහොතේම ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්නට විටක්-දෙකක් උත්සාහ කළ විට සභාපතිතුමා මට කිව්වා, බාධා කරන්නට එපා, පසුව උත්තර දෙන්නට පුළුවන්ය කියා. මම ඒ අවස්ථාවේදී කිව්වා, මම එතුමාට උත්තර දෙන විට එතුමා සභාවේ ඉන්න ඕනෑ බව. නමුත් දැන් එතුමා පෙනෙන තෙක් මානයකවත් නැහැ. මොනවා හරි බොරු ජාතියක් කියා එතුමා යන්ට ගිහින්. ඒවාට උත්තර දෙන වෙලාවේ එතුමා අහගෙන ඉන්න ඕනෑ, තමන් මතු කළ ප්‍රශ්න සම්බන්ධයෙන් මොන විධියේ පිළිතුරක් ලැබෙනවාද කියා දැනගැනීමට. එතුමාට ඕනෑ නම් මම කථා කරන විට, දැන් වුණත් මගෙන් ප්‍රශ්න කරන්නට පුළුවන්. ඕනෑ කෙනෙකුට මගෙන් ප්‍රශ්න කරන්නට මම ඉඩ දෙනවා. ඒක මට බාධාවක් නොවෙයි. මොකද ? මම ඇත්ත කියන නිසයි. බොරු කියන මිනිහාට බාධා කරන විට හරි අමාරුයි බොරුව ගොඩනගා ගන්නට. අන්න ඒකයි ප්‍රශ්නය.

ලංකාවේ විශ්ව විද්‍යාල ක්ෂේත්‍රය ගැන කථා කළ විරුද්ධ පාර්ශ්වයේ එක් මන්ත්‍රීවරයෙක් ලංකා විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේ අති ශ්‍රේෂ්ඨයා හැටියට සර් අයිවර් ජෙනිංග්ස් හඳුන්වා දුන්නා. ඒ මන්ත්‍රීවරයා සෝරත හාමුදුරුවන් ගැනත් සඳහන් කළා. උන්වහන්සේ ගැන මමත් දන්නවා. ආචාර්යවරයෙකු වශයෙන් උන්වහන්සේට මගේ ගෞරවය තිබෙනවා. ඒ වාගේම අයිවර් ජෙනිංග්ස් මහත්මයාටත් මම ගරු කරනවා. එතුමා ලංකා විශ්ව විද්‍යාල ඉතිහාසයේ හැටියට ලංකා විශ්ව විද්‍යාල ජීවිතයේ ආරම්භ කළ කෙනෙක්. නමුත් එතුමා පාලනය කළ විශ්ව විද්‍යාලයක තත්ත්වය නොවෙයි අද ලංකාවේ විශ්ව විද්‍යාලවල පවතින්නේ. අන්න ඒ කාරණය හොඳින් මතක තබා ගන්න. එතුමා පාලනය කළ විශ්ව විද්‍යාලය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් යටතේ තිබුණු විශ්ව විද්‍යාලයක්. සීමිත ළමයින් සංඛ්‍යාවක් මෙන්ම සීමිත පීඨ සංඛ්‍යාවකුයි එද තිබුණේ. කොටින්ම කියනවා නම්, වෛද්‍ය අංශයක් හෝ ඉංජිනේරු අංශයක් හෝ එද තිබුණේ නැහැ. දැන් අපේ උපකුලපතිවරුන් පාලනය කරන විශ්ව විද්‍යාල එද තිබුණු විශ්ව විද්‍යාලයට සමාන කරන්න බැහැ. වර්තමාන විශ්ව විද්‍යාලවල ළමයින් විශාල සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබනවා, පීඨ විශාල ගණනක් තිබෙනවා. එම නිසා අපේ ආචාර්ය, මහාචාර්යවරුන් ගැනත්, අපේ උපකුලපතිවරුන් ගැනත් ටිකක් කථා කළානම් ඊට වඩා සුදුසුය කියා මම කල්පනා කරනවා. උදාහරණයක් වශයෙන්, අපේ රුහුණු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා ගනිමු. කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධයක් වශයෙන් තිබුණු මෙම විශ්ව විද්‍යාලය කුඩා දරුවකු හදන්නා වාගේ ඉතා කෙටි කාලයක් තුළදී සකස් කර ගනිමින් දැන් එයින් ඉවත් කරගෙන අවුරුද්දක් තුළදී ස්වල්ප දියුණුවට ගෙනවිත් තිබෙනවාද, ස්වල්ප ළමයින් සංඛ්‍යාවක් ඇතුළත් කර ගෙන තිබෙනවාද ? එහෙම නම් සර් අයිවර් ජෙනිංග්ස් උපකුලපතිවරයාගේ යුගයේ තිබුණු විශ්ව විද්‍යාලය හා මෙම විශ්ව විද්‍යාලය සසඳා බැලුවොත් රුහුණු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා සර් අයිවර් ජෙනිංග්ස්ට වඩා ශ්‍රේෂ්ඨ බව මට කියන්නට පුළුවනි. ඇයි අපේ මිනිහාගේ වටිනාකම කියන්නට බැරි ? සර් අයිවර් ජෙනිංස් සුදු මහත්මයයෙක් නිසාද විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු ඒ මහත්මයාගේ වටිනාකම පමණක් කියන්නේ ? සර් අයිවර් ජෙනිංස් අවුරුදු ගණනක් පාලනය කළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයට වඩා දියුණු තත්ත්වයකට අද රුහුණු විශ්ව විද්‍යාලය එහි උපකුලපතිවරයා විසින් ගෙනැවිත් තිබෙන බව මම ආඩම්බරයෙන් මතක් කරනවා. රුහුණු විශ්ව විද්‍යාලය අපේ ළාබාලම විශ්ව විද්‍යාලයයි. පේරාදෙණිය විශ්ව විද්‍යාලය ගැන කියන්නට දෙයක් නැහැ. කොළඹ විශ්ව විද්‍යාලය ගැනත් කියන්නට දෙයක් නැහැ. කැලණිය විශ්ව විද්‍යාලය ගැනත් කියන්නට දෙයක් නැහැ; ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ගැනත් කියන්නට දෙයක් නැහැ.

විරුද්ධ පාර්ශ්වයෙන් ළමයින් දෙදෙනෙකුගේ මරණය ගැන සඳහන් කළා. ඒ ගැන මහ ලොකු කණගාටුවකට පත් වෙලා මට ඒ ගැන ප්‍රකාශයක් කරන්නට කියලා කිව්වා. මම උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිවරයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ආර්. ●. අත්තනායක මහතා]

වශයෙත් එහෙම මෝඩ ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ ළමයින්ගේ සිද්ධිය පිළිබඳව සොයා බැලීමට අධිකරණයකට භාර කර තිබෙනවා. අධිකරණයෙන් පිළිතුරක් ආවායින් පස්සේ අපි වාද කරමු. මගේ මේ පිළිතුර දැන් භාර ගන්න.

ගරු අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) විශ්ව විද්‍යාලයට ගියේ නැහැ කිව්වා. ඒ බව එතුමාගේ කථාවෙන් පේනවා. එතුමා ඒක නොකිව්වත් අපි දන්නවා ගියේ නැති බව. විශ්ව විද්‍යාලයට නොවෙයි ඉස්කෝලේ 8 වන පන්තියවත් පාස්කරලා නැති බවයි කථාවෙන් පේන්නේ. 1972 වර්ෂය දක්වා විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන්ට 'බර්සරි' එකක්—ශිෂ්‍යාධාර මුදලක්—දුන්නා. 1972 තිබුණු ආණ්ඩුව හිඟමනට පත්වෙලා ඒ රු. 62ක කපා දලා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව බැංකුවට උකස් කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කාලයේදී මුදල් ඇමතිවරයා වශයෙන් සිටි එන්. එම්. පෙරේරා උන්නැහේ ළමයින්ව බැංකුවට උකස් කළා. 1972 න් පස්සේ හැම උපාධිධාරියෙක්ම ණයකාරයෙක් වශයෙන් ජාතියට පහළ කෙරෙව්වා. මම උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වුණාට පස්සේ මහජන බැංකුවේ සභාපතිතුමා හමුවෙන්නට ගියා ; ලංකා බැංකුවේ සභාපතිතුමා හමුවෙන්නට ගියා. ගිහිල්ලා දීර්ඝ වශයෙන් පැය දෙකක් තුනක් සාකච්ඡා කළා. මහජන බැංකුවේ සභාපතිතුමා මෙහෙමයි කිව්වේ ; "තමුන්නාන්සේ වගේම මමත් ගොඩේ ගම්මැද්දෙන් ශිෂ්‍යත්වයකින් ආපු ශිෂ්‍යයෙක්. එහෙම ඇවිල්ලයි මේ තත්ත්වයට මමත් උසස් වුණේ. අධ්‍යාපනයේ තිබෙන වටිනාකම මමත් දන්නවා. අපි ළමයින්ට සලකන්නට ඕනැ. නමුත් මේවා මගේ සල්ලි නොවෙයි. ඒ නිසා නියෝජ්‍ය ඇමතිතුමා, මේවා නිකම් දෙන්නට බැහැ ; දීලා තිබෙන ඒවා සතයක්වත් තවම අයවෙලා නැහැ. අය වෙන වේගයත් බොහොම අඩුයි. උපදිසාපතිවරු වෙලා ඉන්න අයත් මේ මුදල ගෙවන්නේ නැහැ. එම නිසා මේ ණය මුදල් වැඩි කරන්නට බැහැ" ඔන්න ඔහොමයි කිව්වෙ. ලංකා බැංකුවත් එහෙමයි කිව්වෙ. මම ඊට පස්සේ අපේ ගරු ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා හමු වන්නට ගියා. එතුමා හමු වෙලා මේ දුක් ගැනවිල්ල එතුමාට කිව්වා. එතුමා පෞද්ගලිකව රු. 10,000 ක් ඉස්සෙල්ලා තැන්පත් කරලා මේ ශිෂ්‍යත්ව අරමුදල පටන්ගෙන ඊට පස්සේ මහපොළ ව්‍යාපාරය පටන් ගත්තා. අද මම මේ කථා කරන වේලාව වන විට මහපොළ ශිෂ්‍යත්ව අරමුදලින් ළමයින් 6,849 කට පූර්ණ ශිෂ්‍යත්ව පිරිනමා තිබෙනවා.

1981-82 වර්ෂයේදී විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් 5,004 න් 422 කටත්, 1982-83 වර්ෂයේදී ශිෂ්‍යයන් 5,328 න් 122 කටත්, 1983-84 වර්ෂයේදී ශිෂ්‍යයන් 5,465 න් 2,486 කටත් 1984-85 වර්ෂයේදී ශිෂ්‍යයන් 5,630 න් 2,919 කටත් රු. 400 සහ රු. 350 බැගින් වූ මහපොළ ශිෂ්‍යත්ව පිරිනමා තිබෙනවා. මේවා ගැන කල්පනා කර බලන්න ඕනැ.

ගරු අත්තනගල්ලේ මන්ත්‍රීතුමා ඉක්මනට ඇවිල්ලා වාඩි වුණොත් මෙක අහගන්න පුළුවන්. මේ ශිෂ්‍යත්ව දීලා ඉවර වුණාම, ඊළඟට ඉතුරු ශිෂ්‍යයන්ට මොකද කරන්නේ කියන ප්‍රශ්නය මතු වුණා. බැංකුවෙන් ණය ගන්නට ගියාම හරියට හදවතෙන් කෑල්ලක් කඩාගන්නට ඉල්ලනවා වගේ, කොහොමටවත් දෙන්නේ නැහැ. පසුව, උසස් අධ්‍යාපන ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයාත් මමත් අතිගරු ජනාධිපතිතුමාට මේ ගැන කරුණු දැක්වූවා. මේ ගැන මොකක් හෝ ප්‍රතිකර්මයක් යොදන්නට ඕනැය කියලා කරුණු දැක්වූවා. ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය පළමුවන වතාවට අංග සම්පූර්ණ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් බවට පත් කළ එකම රාජ්‍ය නායකයා අතිගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමායි. තිස් අට ලක්ෂයක් ශිෂ්‍යත්ව පාසල් පොත් ටික නිකම් අතට දුන්නා වගේම විශ්ව විද්‍යාලයට යන හැම ශිෂ්‍යයෙකුටම රු. 350 ක් ආපසු නොගන්නා සහනාධාර මුදලක් වශයෙන් ලබා ගැනීමේ ක්‍රමයක් ඇති කළා. එය ජාති ණයක් වශයෙන් නොවෙයි, සහනාධාර මුදලක් වශයෙන් දෙන්නේ. ඒගැන කථා කරන විට ගරු අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා කියනවා වැඩිපුර දෙන්නට යන්නේ රු. 96 යි කියලා. එතුමාට මම කියන්නේ, 8 වන පන්තියේවත් හිටියා නම්,—අඩු ගණනේ ගණිත පොතවත් බැලුවා නම්—මේක වැටහෙනවා. රු. 225 ක් ණයට ගන්න ශිෂ්‍යයෙකුට රු. 350 ක් නිකම් දෙන විට ඒක රු. 96 කට ගණන් හැදුවේ කොහොමද ? අනූ හයක් වැඩි වුණ හැටි පෙන්වා දෙන්නටය කියා මම අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට අභියෝග කරනවා. දෙසිය විසිපහට අනූහයක් එකතු කළාම තුන්සිය පණහක් වෙනවාද ? රුපියල් දෙසිය විසිපහට රුපියල් අනූ හයක් එකතු කළාම රුපියල් තුන්සිය පණහක් වෙනවාද ? එහෙමවත් අහලා බලන්න. අට වැනි පන්තියවත් පාස් වෙලා නැහැයි කියා ඒකයි මම කිව්වේ. තමුන්නාන්සේ විශ්ව විද්‍යාලයකට ගියේ නැහැයි කියන එක කියන්නට වුවමනාවක් නැතැයි කියා මම කිව්වේ ඒ නිසයි. තමුන්නාන්සේ විශ්ව විද්‍යාලයකට ගියේ නැහැයි කියා කිව්ව එකත් මහ නින්ද සහගත දෙයක්. ඇයි ? විශ්ව විද්‍යාලයකට නොගිය බව කථාවෙන් තේරෙනවා. කොයි රටේද, කොයි සමාජවාදී රටේද එහෙම දෙන්නේ ?

1985 වර්ෂය ලංකාවේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය ඉතිහාසයේ ස්වර්ණමය සමරු වර්ෂයක් වෙනවා. හැම ශිෂ්‍යයෙක්ම විශ්ව විද්‍යාල ජීවිතය අවසන් කරනතුරු රජය මඟින් මුදල් ලබා ගන්නවා. එක් කණ්ඩායමක් මහ පොළ ශිෂ්‍යත්ව මඟිනුත් අනික් කණ්ඩායම ජනාධිපතිතුමාගේ අරමුදලිනුත් ඒ මුදල් ලබා ගන්නවා. 1970 සිට 1977 දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙන් එක ශිෂ්‍යයෙකුට ශත පහක් දුන්නාද ? ශත පහක් නිකම් දුන්නාද කියා මම ප්‍රශ්න කරනවා. ශිෂ්‍යයෙකුට ශත පහක් නිකම් දුන් ආණ්ඩුවක මන්ත්‍රීවරයෙක් නම්, නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයෙක් නම් ඒ විධියට කථා කළාට කමක් නැහැ පුළුවන් නම් දුන්නාය කියා ඔප්පු කරන්න. විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ලෝකයේ පළමුවන වතාවට ජාති ණයකාරයන් බවට පත් කළ ජාතිභ්‍රෂ්ටයින් කොටසක් හැටියට 1970 සිට 1977 දක්වා තිබුණු තමුන්නාන්සේලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව පත් වෙනවා. ඒක නැහැයි කියන්නට තමුන්නාන්සේලාට පුළුවන්කමක් නැහැ. උඩ යට අවබෝධයක් ඇතිව කථා කරන්නට ඕනැ. සහනයක් දෙන විට එය ලඝු කරනවා. එය කුඩා කරනවා. ඒක පුංචි කරනවා. මහවැලි ව්‍යාපාරය ජාතිවාදී අරගල මැද්දේයි ගරු ජනාධිපතිතුමා ශිෂ්‍යයින්ට මේ විධියට සලකන්නේ. ඒක මතක තබා ගන්නට ඕනැ. ඒ ගැන මම මීට වඩා කථා කරන්නට යන්නේ නැහැ.

විරුද්ධ පාර්ශ්වයෙන්, විශේෂයෙන් මහරගම ගරු මන්ත්‍රීතුමාගෙන් (දිනේෂ් ගුණවර්ධන මහතා) ජාත්‍යන්තර මට්ටම පිළිබඳව හඬක් නැගුණා. ඊළඟට ජාත්‍යන්තර මට්ටමට අපේ උපාධිධාරීන් ගෙනෙන්නටය කියා තවත් මන්ත්‍රීවරයෙකුගෙන් අහන්නට ලැබුණා. මේවාට හිනහා වෙන්නේ කොහොමද මම දන්නේ නැහැ. ඒ අයට මේවාට උත්තර දෙන්නට පුළුවන්ද මම දන්නේ නැහැ. 1982 වනතුරු ලංකාවේ උපාධි ජාත්‍යන්තර මට්ටමට පිළිගත්තේ නැහැ. නමුත් අද රුසියාව, හංගේරියාව, බල්ගේරියාව, රුමේනියාව, බ්‍රිතාන්‍යය, ජපානය, චීනය ආදී මේ හැම රටක්ම ලංකාවේ ප්‍රථම උපාධිය පිළිගන්නවා. බ්‍රිතාන්‍ය පශ්චාත් උපාධි පිළිගන්නවා. අපි සමාජවාදී රටවල් සමඟ ඒ ගිවිසුම අත්සන් කළේ 1982 දීයි. අද රුසියානු උපාධිය උපාධියක් වශයෙන් මෙහි පිළිගන්නවා. ඒවාගේම ලංකාවේ උපාධිය රුසියාවේ පිළිගන්නවා. අපේ එක උපාධිධාරියෙක් එද එහෙම ජාත්‍යන්තර මට්ටමට පිළිගත්තාය කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙකුට කියන්නට පුළුවන්ද ? අද ලංකාවේ උපාධිය ජාත්‍යන්තර මට්ටමින් පිළිගන්නවා. ඒක මතක තබාගත යුතුයි. ඒ විතරක් නොවෙයි, එෆ්ආර්සීඑස් විභාගයේ ප්‍රථම වර්ෂයේ පරීක්ෂණය පවා අද ලංකාවේ පවත්වනවා. ඊළඟ වර්ෂයේයි අපි පිටරට යවන්නේ. ඒ තරම් උසස් මට්ටමකට අද ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ගෙනැවිත් තිබෙනවා. පුළුවන් නම් ඩීඑස්සී උපාධියක් ලංකාවේ දීමට කටයුතු කරන්නය කියා අපේ දක්ෂ කුලපතිවරුන්ට, මහාචාර්යතුමන්ලාට මම ආරාධනා කරනවා. අපට බැරිකමක් නැහැ. අපේ දක්ෂ ආචාර්යවරුන්ට, උපකුලපතිවරුන්ට ඒක කරන්නට බැරිකමක් ඇති නොවෙයි කියා මම කල්පනා කරනවා.

අපි ආයුර්වේද විශ්ව විද්‍යාලය ගැනත් පොඩ්ඩක් හොයා බලන්නට ඕනැ. ආයුර්වේද විශ්ව විද්‍යාලය පිළිබඳව් අපි ක්‍රමානුකූලව කටයුතු කර තිබෙනවා. මහාචාර්ය කෂප් මහතා ලංකාවට ගෙන්වා විශේෂ වාර්තාවක් සකස් කළා. ලංකාවේ ආයුර්වේද විශ්ව විද්‍යාලය උසස් කිරීම සම්බන්ධයෙන් ඔහු කරුණු දහයක් ඉදිරිපත් කර තිබෙනවා. උපාධි පාඨමාලා සකස් කිරීම ඉන් එකක්. දැන් අපි ඒ වාර්තාවට අනුකූලව එය සකස් කර තිබෙනවා. ඊළඟට උපාධි ප්‍රදානය තිබෙනවා. ඒකත් සකස් කරගෙන යනවා. ඊළඟටට උපාධි සඳහා පුහුණු කිරීමේ ආයතනයක්—ට්‍රේනිං ස්කූල් එකක්—තිබෙනවා. දේශීය වෛද්‍ය ඇමතිතුමාත් සමඟ අපි එය බොරැල්ලේ සකස් කරගෙන යනවා. ඊළඟට දේශීය වෛද්‍ය උද්‍යාන හා උපකරණ අවශ්‍යයි. ගරු ඇමතිතුමාත් සමග එකතු වී අපට එය කරන්න පුළුවන්. ඒ පිළබඳ ප්‍රශ්නයක් නැහැ. අද ඒ ආයතනයේ සිසුන්ට දේශීය වෛද්‍ය උපාධිය වහාම පිරිනැමීම සඳහා එහි අධිපතිතුමා වේගයෙන් ක්‍රියා කරගෙන යනවා. මේ අවුරුද්දේ ළමයි 119 ක් ඉල්ලුම් කර තිබෙනවා. එයින් සියයක් අපි නොවරදවාම ගන්නවා, අධ්‍යයන උසස් පෙළ විභාගයෙන් ලකුණු 180 ට වඩා ගත් ළමයින්ගෙන්. අනිකුත් විශ්ව විද්‍යාලවලට බඳවා ගන්නා විධියටමයි මෙතැනත් ගන්නෙ. කිසි අඩුපාඩුවක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ එක්කම අපි සෞන්දර්ය පීඨයටත් ගත්තා. මෙතුමන්ලාගේ ආණ්ඩුව සෞන්දර්ය පීඨයක් ඇති කර ඒ ළමයින් ලවා බෙර ගස්ව ගස්වා, ඒ අය තටව තටවා, ඒ මිනිස්සු පිංකමේ ගියා. ඒ ආණ්ඩු කාලයේ කළේ ඒකයි. ඒ ළමයින්ගේ අනාගතය ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්, එක ඇමතිවරයෙක් සැලකුවේ නැහැ. මේ ගරු සභාවට තීන්දු කෙරෙව්වා. ලංකාවේ දක්ෂ ශිෂ්‍යයින් අරගෙන ලංකාවේ දේශීය කලාව තමන්ගේ ආභරණයක් කරගැනීම පමණයි ඒ ඇමතිවරු කළේ. නමුත් අපි මොකද කළේ ? ගිය අවුරුද්දේ අපි මේ සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ට උපාධි ප්‍රදානය කළා. එපමණක් නොවෙයි, එහි අධ්‍යක්ෂවරයා, තිස්ස කාරියවසම් මහත්මයා ලබන පෙබරවාරි මාසයේදී දෙවැනි වතාවටත් උපාධි ප්‍රදානය කරනවා. එහි පුහුණුවුණු කිසි ළමයෙක් අද නිකම් නැහැ. අද ඒ ළමයින් ඔක්කොම රක්ෂාවල නියුක්තව ඉන්නවා. ඉතුරු ළමයින් කණ්ඩායමටත් ලබන මාසයේ 5 වැනිද වතවිට ගරු අධ්‍යාපන ඇමතිතුමා රක්ෂාව ලබා දෙනවා. ඒ හැම ළමයෙක්වම පිළිගෙන තිබෙනවා. නමුත් එදා තමුන්නාන්සේලා ඒ ළමයින් ලවා බෙර ගහ ගහ පිංකමේ ගියා. අපි ඒ මනුෂයන් උපාධි පෙරහැරේ අරගෙන ගියා අතික් කට්ටිය ලවා බෙර ගහ ගහ. [බාධා කිරීමක්] අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් බෙරයක් වාදනය කරන්න එන්න පෙබරවාරි මාසයේදී.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වෙලාව නැහැ. ඒ නිසා අන්තිම එක ප්‍රශ්නයකට පමණයි උත්තර දෙන්නට වෙලා තිබෙන්නේ. ඒ මේ විශ්ව විද්‍යාලවලට ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නයයි. අපේ " දිවයින " පත්‍රයේ වාර්තාකාර මහත්වරු ඒක අවුල්කර පළ කර තිබෙනවා. මට පෙනෙන හැටියට දුම්බර කොටසේ මහාචාර්ය වරයකුත් මේක අවුල් කරගෙන තිබෙනවා. ඒ දෙගොල්ලටම මම සමාව දෙනවා. හේතුව මේකයි : දෙමළ කතා කරන ළමයි කොයි මට්ටමේද කියා අපි අතගා බැලුවෙ නැහැනේ. ඒ නිසයි ප්‍රශ්නය මතු වුණේ. ඔන්න ඕකයි ගැටළුව. ඒ නිසා පත්‍රයටත්, ඒ ඔක්කෝටමත් මගේ සමාව ලැබෙනවා. මෙන්න මෙහෙමයි ඇතුළත් කරගෙන තිබෙන්නේ. තමුන්නාන්සේලා ඒක පැහැදිලි කර ගත්තාම කරදරයක් නැහැ. මම මේකට උත්තර දී තිබෙනවා. පැහැදිලි උත්තරයක් දී තිබෙනවා 1984 නොවැම්බර් 27 වැනිද සභාව කල් තබන වෙලාවේ. මම පැය බාගයක් පමණ කතා කර පැහැදිලි කර දුන්නා මේ සිද්ධිය. ඒ අවස්ථාවේ අපේ දේශීය වෛද්‍ය ඇමතිතුමා සභාවෙ සිටියෙ නැහැ. මම එදා දුන් උත්තරය පත්තර කාරයා කවදාවත් දැම්මෙ නැහැ. වෙන මොකක්දෝ වල්ගයක් අල්ලාගෙන පත්තරේ දැම්මා. පත්තරකාර මහත්වරු මීට වඩා ටිකක් කල්පනාවෙන් වැඩ කරන්නට ඕනෑ. ජාතික අර්බුදකාරී වේලාවක ජාතිය කලඹන්නේ නැතුව සත්‍යය වාර්තා කරන්න මහන්සි ගන්න ඕනෑ. අන්න ඒක නොකිරීමයි ඒ අයගෙන් වූ වරද. වෙන වරදක් නම් කර ඇති බවක් මට පෙනෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අදත් ආයෙත් කෙටියෙන් කියන්නට සිදු වී තිබෙනවා ඒ ප්‍රශ්නයට උත්තරේ. පේරාදෙනි විශ්ව විද්‍යාලයට ළමයි ඇතුළත් කරගත්තෙ මෙන්න මෙහෙමයි : පත්තරේ මහත්වරු මේක හොඳට අහගන්න. පත්තරේ මේක හොඳට වාර්තා කරන්න ඕනෑ.

| | | |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාව සඳහා | සිංහල ළමයින් | 92 යි. |
| | දෙමළ ළමයින් | 01 යි. |
| | මුස්ලිම් ළමයින් | 02 යි. |
| | අනිකුත් ළමයින් | නැහැ. |
| | එකතුව | 95 යි. |

මේ 1984/85 අවුරුද්ද සඳහා. ඒ කියන්නේ එන අවුරුද්ද සඳහා.

| | | |
|---|---|---|
| ඉංජිනේරු විද්‍යාව සඳහා | සිංහල ළමයින් | 129 යි. |
| | දෙමළ ළමයින් | 102 යි. |
| | මුස්ලිම් ළමයින් | 16 යි. |
| | අනිකුත් ළමයින් | නැහැ. |
| | එකතුව | 247 යි. |

| | | |
|---|---|---|
| පශු වෛද්‍ය විද්‍යාව සඳහා | සිංහල ළමයින් | 35 යි. |
| | දෙමළ ළමයින් | 10 යි. |
| | මුස්ලිම් ළමයින් | නැහ. |
| | අනිකුත් ළමයින් | නැහැ. |
| | එකතුව | 45 යි. |
| දන්ත ශල්‍ය විද්‍යාව සඳහා | සිංහල ළමයින් | 41 යි. |
| | දෙමළ ළමයින් | 24 යි. |
| | මුස්ලිම් ළමයින් | 01 යි. |
| | අනිකුත් ළමයින් | නැහැ. |
| | එකතුව | 66 යි. |
| කෘෂිකර්ම විද්‍යාව සඳහා | සිංහල ළමයින් | 107 යි. |
| | දෙමළ ළමයින් | 36 යි. |
| | මුස්ලිම් ළමයින් | 01 යි. |
| | අනිකුත් ළමයින් | 02 යි. |
| | එකතුව | 146 යි. |
| ජීව විද්‍යාව සඳහා | සිංහල ළමයින් | 47 යි. |
| | දෙමළ ළමයින් | 06 යි. |
| | මුස්ලිම් ළමයින් | 08 යි. |
| | අනිකුත් ළමයින් | නැහැ. |
| | එකතුව | 61 යි. |
| භෞතික විද්‍යාව සඳහා | සිංහල ළමයින් | 104 යි. |
| | දෙමළ ළමයින් | 15 යි. |
| | මුස්ලිම් ළමයින් | 23 යි. |
| | අනිකුත් ළමයින් | 02 යි. |
| | එකතුව | 144 යි. |

කලාව සඳහා — ඔන්න ඔතැන තමයි වරද තිබෙන්නේ

| | |
|---|---|
| සිංහල ළමයින් | 207 යි. |
| දෙමළ ළමයින් | 35 යි. |

හොඳට අහගන්න. " දිවයින " කර්තෘ මේක පළ කරන්න. " හෙඩ් ලයින්ස් "

| | |
|---|---|
| මුස්ලිම් ළමයින් | 161 යි. |

ඔන්න ඕකයි මම කිව්වේ ළමයින් අතගා බලන්නේ නැතුව මේක ප්‍රකාශ කළා කියා.

| | |
|---|---|
| අනිකුත් ළමයින් | 01 යි. |
| එකතුව | 404 යි. |

එතකොට ජාතීන් වශයෙන් ඒ ඒ පාඨමාලාවලට මුළු එකතුව මෙහෙමයි. සිංහල ශිෂ්‍යයන් 762 යි. දෙමළ ශිෂ්‍යයන් 229 යි. මුස්ලිම් ශිෂ්‍යයන් 212 යි. අනිකුත් ශිෂ්‍යයන් 5 යි. එකතුව 1,208 යි.

මොකක්ද වෙලා තිබෙන හානිය ? කාටවත් හානියක් වෙලා තිබෙනවාද ? පේරාදෙණිය විශ්ව විද්‍යාලය ජාතික විශ්ව විද්‍යාලයක් වශයෙන් අපි පිළිගන්නවා. රුහුණු විශ්ව විද්‍යාලය ප්‍රාදේශීය විශ්ව විද්‍යාලයක්. එහි දෙමළ මාධ්‍යය නැහැ. සිංහල මාධ්‍යය පමණයි තිබෙන්නෙ. ඒක මම තවත් පැහැදිලි කරන්නම්. මිනිස්සු කුලප්පු කරන්න, ඇවිස්සෙන මිනිස්සු තවත් අවුස්සන්න කටයුතු කරන්න එපා. විශේෂයෙන් මහජන ප්‍රසාදය දිනාගත් පුවත්පත්වලින් කරුණාවෙන් ඉල්ලා සිටිනවා ජාතිය කැලඹෙන වැරදි ප්‍රවෘත්ති දන්න එපාය කියා. එහෙම පළ කරන්න කලින් අපෙන් විමසන්න. අප අතින් වරදක් සිදු වී තිබෙනවානම් අපි ඒක පිළිගන්නවා. අපි ඒකට සමාව ඉල්ලනවා. අපට සමාව ඉල්ලන්න දෙයක් නැහැ මෙතන. මේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබෙන්නේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා]

අද තත්ත්වය මොකක්ද ? පස් අවුරුදු සැලැස්මක් ගැන කථා කළා. පස් අවුරුදු සැලැස්ම අනුව අපි කලා අංශයේ ශිෂ්‍යයන් අඩු කරනවා. විද්‍යා, ඉංජිනේරු, කෘෂිකර්ම, වාණිජ, පරිපාලන වාගේ විෂයයන් හදාරණ ශිෂ්‍ය ප්‍රමාණය වැඩි කරනවා. ඊකට හේතුව රටේ මිනිස් බල අවශ්‍යතාව සැලසුම් කිරීමේ අමාත්‍යාංශයත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ව උසස් අධ්‍යාපනයට ගැළපිය යුතු නිසයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)
දැන් දෙකහමාරට ඡන්දය විමසන්න තිබෙනවා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
මෙය අමාත්‍යාංශයක වැය ශීර්ෂය අවසාන වන වේලාව නිසා මට තව මිනිත්තු දෙක තුනක් දෙන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)
Does the House agree ?

**මන්ත්‍රීවරු**
**(அங்கத்தினர்)**
(Members)
Aye !

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
**(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)**
(Mr. A. M. R. B. Attanayake)
මේක බොහොම වැදගත්. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ 1984 සිට 1989 වන විට ඇතුළුවන ක්‍රමය මම පෙන්වා දෙන්නම්. කලාවට ශිෂ්‍ය සංඛ්‍යාව 400 සිට 250 දක්වා අඩු කරනවා. දැනට 160 ක් වූ විද්‍යා ශිෂ්‍ය සංඛ්‍යාව 195 ක් දක්වා වැඩි කරනවා. කෘෂි විද්‍යා අංශයේ 185 එහෙමමයි. ඉංජිනේරු අංශයේ 250 ශිෂ්‍ය සංඛ්‍යාව 300 දක්වා වැඩි කරනවා. වෛද්‍ය, ජෛව හා භෞතික අංශයේ 200 ශිෂ්‍ය සංඛ්‍යාව 280 දක්වා වැඩි කරනවා. එතකොට ඒ පස් අවුරුදු සැලැස්ම අනුව මෙසේ බලන්න ඕනෑ. අපි කලාව අඩු කරනවා නොවෙයි. අපි කලාව පේරාදෙණියේ 400, 250 කළාට කොළඹ 425 ක් වූ කලා ශිෂ්‍ය සංඛ්‍යාව 1989 වන විට 500 දක්වා වැඩි කරනවා. කැලණිය විශ්ව විද්‍යාලයේ 625, 1989 වන විටත් 625 මයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ 825 සංඛ්‍යාව 1989 වන විට 675 ට බහිනවා. ඒ මොකද ? එහි අතික් පරිපාලන පාඨමාලා වැඩි කරන නිසා. රුහුණු විශ්ව විද්‍යාලයේ 225 සංඛ්‍යාව 1989 වන විට 325 ක් වෙනවා. යාපනේ විශ්ව විද්‍යාලයේ 400 සංඛ්‍යාව 1989 වන විට 375 ට අඩු කරනවා. අන්න ඒකයි පස් අවුරුදු සැලැස්මේ හැටියට වැඩ පිළිවෙළ.

ඊළඟට විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ගැන වචනයක් නොකිව්වොත් වටින්නෙ නැහැ. මම මතක් කරන්න ඕනෑ ආචාර්යවරුන්ගේ වැටුප් ගැන. අපි කනගාටුවෙනවා ඒ ගැන. වාර දෙක තුනක් ගරු ජනාධිපතිතුමා වැටුප් වැඩි කළා. නමුත් තත් කාලීන වශයෙන් එය ප්‍රමාණවත් නැහැ. ගරු මුදල් ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් දැනට කොමිටියක් පත් කර තිබෙනවා. ඒ අයගේ වැටුප් ගැන ක්‍රියා කරන්න. මම හිතන්නෙ තව මාසෙකින් පමණ ඒ වාර්තාව ලැබුණු විගසම ඒ ඇත්තන්ගේ වැටුප් දීමනා වහාම වැඩි කරනවා ඇති. නැත්නම් අලුත් ලෝකයට ගැළපෙන්නෙ නැහැ.

එක් ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන් 6 දෙනෙක් වැඩි පඩි සොයාගෙන පිටරට ගියාය කියා. ඒක සාධාරණයි. ඒක නවත්වාගන්න නම් අපි ඒ අයට ගෙවන ගෙවීම වැඩි කරන්න ඕනෑ. ඒ ආචාර්යවරුන්ගේ ජීවන වෘත්තිය ඒකම පමණයි. වෙනත් ජීවන වෘත්තියක් ඔවුන්ට නැහැ. එම නිසා ඔවුන්ගේ වැටුප් වැඩි කිරීමක් කෙළේ නැත්නම් අද විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේ, කාර්මික විද්‍යාල ක්ෂේත්‍රයේ වැඩ කටයුතු පවත්වාගෙන යාම අඩපණ වෙන්න ඉඩ තිබෙනවා. අන්න ඒකයි ප්‍රධාන කාරණය.

අවසාන වශයෙන් අමාත්‍යාංශයේ මගේ ලේකම්තුමා ඇතුළු කාර්‍ය මණ්ඩලයටත්, ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් සභාපතිතුමා ඇතුළු සියළු කාර්‍ය මණ්ඩලයටත්, ගණකාධිකාරීතුමන්ලා ඇතුළු නිලධාරීන්ටත්, විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේ සියළුම මහාචාර්ය කථිකාචාර්ය කුලපතිවරුන් ඇතුළු කාර්‍ය මණ්ඩලයටත්, කාර්මික විද්‍යාල ක්ෂේත්‍රයේ අතිරේක ලේකම් අධ්‍යක්ෂවරයා ඇතුළු සියළු ආචාර්‍යවරුන්ටත් ශිෂ්‍ය සමූහයටත් මේ අවස්ථාවේදී මගේ අවංක ආදර ස්තුතිය පිරිනමනවා. ඒ මොකද, කිසිම කරදරයකින් තොරව, අවුලකින් තොරව මේ අමාත්‍යාංශය සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාමට පුළුවන් වූ නිසායි.

ආරක්ෂක කටයුතු පිළිබඳව ප්‍රශ්න මතු කළා. මෙය විශ්ව විද්‍යාල පාලක සභාවට පැවරී තිබෙන අභ්‍යන්තර ප්‍රශ්නයක්. ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් අහෝසි කිරීමක් අපි කරන්නෙ නැහැ. ඒක තරයේම මතක තියාගන්න. ශිෂ්‍යයන්ගේ නිදහස නැති කරන්නෙ නැහැ. මෙය හදිසි අවස්ථාවක්. සිංහල ජාතිය අවුරු දහස් ගණනකට පසුව යුද්ධයකට මුහුණ දී සිටිනවා.' මේ අවස්ථාවේදී විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනය හදිසි නීතිය යටතට ගන්න සිදු වී තිබෙනවා. ශිෂ්‍ය සංගම් අහෝසි කර තිබෙනවා. කුලපති පත්කිරීමේ ක්‍රමය තාවකාලිකව පොඩ්ඩක් වෙනස් කර තිබෙනවා. විශ්ව විද්‍යාල සංශෝධන පනත ලබන මාසයේ අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ අනුව ක්‍රියා කරන අතර, ශිෂ්‍ය සමිති මින්පස්සේ පිහිටුවන්නේ පීඨ වශයෙන්. ඒවායේ ලේකම්වරුන් හා සභාපතිවරුන් අරගෙන මහා ශිෂ්‍ය සමිතිය හෙවත් උපදේශක සභාව හදනවා. එතකොට කරදරයක් නැහැ. ශිෂ්‍යයන්ගේ නිදහස නැති කළායයි කවුරුවත් හුඹස් බිය ඇතිකර ගන්න වුවමනා නැහැ. ශිෂ්‍යයන්ගේ අධ්‍යයන නිදහස ආර්ථික නිදහස දේශීය නිදහස ආදි හැම නිදහසක්ම ගොඩනැගූ එකම උසස් අධ්‍යාපන ඇමතිවරයා අතිගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති උතුමාණන් බව ආඩම්බරයෙන් මතක් කරමින් ඒ ක්ෂේත්‍රයේ සියලුදෙනාටම ස්තුතිය ප්‍රණාමය කරමින් වැඩිපුර කාලය දීම ගැන ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත් ස්තුතිය ප්‍රණාමය කරමින් මම නිහඬ වෙනවා.

**"74 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,96,51,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**74 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**"தலைப்பு 74, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 3,96,51,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

**தலைப்பு 74, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.**

Question, "That the sum of Rs. 39,651,000, for Head 74, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 74, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

**1 වන වැඩ සටහන—සාමාන්‍ය පරිපාලනය සහ කාර්ය මණ්ඩල සේවා—මූලධන වියදම, රු. 26,50,000**

**நிகழ்ச்சித் திட்டம் 1.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 26,50,000**

Programme 1.– General Administration and Staff Services – Capital Expenditure, Rs. 2,650,000

**"74 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 26,50,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.**

**74 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**"தலைப்பு 74, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 26,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

**தலைப்பு 74, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.**

Question, "That the sum of Rs. 2,650,000 for Head 74, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 74, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

2 වන වැඩ සටහන–කාර්මික විද්‍යාල–පුනරාවර්තන වියදම, රු. 3,83,56,000

நிகழ்ச்சித் திட்டம் 2.—தொழில் நுட்பக் கல்லூரிகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 3,83,56,000

Programme 2.– Technical Colleges – Recurrent Expenditure, Rs. 38,356,000

"74 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,83,56,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

74 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 74, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 3,83,56,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 74, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 38,356,000, for Head 74, Programme 2, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 74, Programme 2, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

2 වන වැඩ සටහන–කාර්මික විද්‍යාල–මූලධන වියදම, රු. 29,13,00,000

நிகழ்ச்சித் திட்டம் 2.—தொழில் நுட்பக் கல்லூரிகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 29,13,00,000

Programme 2.– Technical Colleges – Capital Expenditure, Rs. 291,300,000

"74 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 29,13,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

74 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 74, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 29,13,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 74, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 291,300,000, for Head 74, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 74, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

## 75 වන ශීර්ෂය–විශ්ව විද්‍යාලවලට සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දයක මුදල්

1 වන වැඩ සටහන–උසස් අධ්‍යාපනයට දයක මුදල්–පුනරාවර්තන වියදම, රු. 24,90,00,000

## தலைப்பு 75.—பல்கலைக் கழகங்கள், பல்கலைக் கழகக் கொடைகள் ஆணைக்குழு

நிகழ்ச்சித் திட்டம் 1.—உயர் கல்விக்கு உதவி தொகைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 24,90,00,000

## HEAD 75.– CONTRIBUTIONS TO THE MINISTERIES AND UNIVERSITY GRANTS COMMISSION

Programme 1.– Constributions to Higher Education – Recurrent Expenditure, Rs. 249,000,000

"75 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 24,90,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

75 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 75, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 24,90,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 75, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 249,000,000, for Head 75, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 75, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන–උසස් අධ්‍යාපනයට දයක මුදල්–මූලධන වියදම, රු. 56,85,83,000

நிகழ்ச்சித் திட்டம் 1.—உயர் கல்விக்கு உதவு தொகைகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 56,85,83,000

Programme 1.– Constributions to Higher Education – Capital Expenditure, Rs. 568,583,000

"75 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 56,85,83,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

75 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 75, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 56,85,83,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 75, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 568,583,000, for Head 75, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 75, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

## 175 වන ශීර්ෂය–රෙදි කර්මාන්ත අමාත්‍යවරයා

1 වන වැඩ සටහන–රෙදි කර්මාන්ත තගා සිටුවීම හා සංවර්ධනය කිරීම–පුනරාවර්තන වියදම, රු. 49,18,000

## தலைப்பு 175.—புடைவைக் கைத்தொழில்கள் அமைச்சர்

நிகழ்ச்சித் திட்டம் 1.—புடைவைக் கைத்தொழில்களின் அபிவிருத்தியும் மேம்பாடும்—மீண்டுவருஞ் செலவு, ரூபா 49,18,000

## HEAD 175.– MINISTER OF TEXTILE INDUSTRIES

Programme 1.– Promotion and Development of Textile Industries – Recurrent Expenditure, Rs. 4,918,000

අ. භා. 2.35

**ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)**
(Mr. Lakshman Jayakody–Attanagalla)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෙදිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය රුපියල් දහයකින්ම කැපීමට යෝජනා කරන අතර මම ගරු ඇමතිතුමාට මුලින්ම එක් කරුණක් මතක් කරන්න කැමතියි. ඊයේ පෙරේදා වේයන්ගොඩ රෙදිකර්ම ආයතනය මගින් බාලක් පැවැත්තුවා. ගරු ඇමතිතුමාවත්, නිලධාරී මණ්ඩලයේ කිසිකෙනෙකුවත් මේ බාලට ගොස් සිටියේ නැහැ. මගේ ආරංචියේ හැටියට තම ඇමතිතුමාගේ බිරිඳත් නිලධාරී මහත්වරුන්ගේ බිරියනුත් මේ බාලට නොයන ලෙස එතුමන්ලාට කියා තිබෙනවා. ඒ කෙසේ වුණත් ඒකට නොගියු එක හොඳයි.

වේයන්ගොඩ රෙදිකර්ම ආයතනයේ මේ විධියට බාලක් පිළියෙළ කළේ මොන හේතුවකටද ? මොකටද ඒක පැවැත්තුවේ ? මගේ ආරංචිය අනුව තම ඇත්ත වශයෙන්ම රෙදිකර්ම සංස්ථාව අද සම්පූර්ණයෙන්ම වාගේ පරිපාලනය කරන්නේ සුදු අධිරාජ්‍යවාදී කොම්පැනියක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා, මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, குழுப் பிரதித் தலைவர் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

මේ කොම්පැනිය මහා පුදුම සහගත කොම්පැනියක්. වේයන්ගොඩ ජේෂකර්ම ආයතනය මේ කොම්පැනියට බාර දී 1981 සිට අද දක්වා රුපියල් කෝටි දහ අටක් පාඩු විඳිනවා. අපට දැනගන්නට ලැබී තිබෙන හැටියට මේ පාඩුවත් එක්කම තවත් රුපියල් කෝටි පනහක් භාණ්ඩාගාරයෙන් ඉල්ලන්න යනවා.

ඒ එක්කම මේ ඇත්තන්ට ගෙවන පඩිනඩි දෙස බලන විට ලංකාවේ කොහේවත්ම සිටින කිසිම උසස් නිලධාරියකුට එවැනි පඩි නොගෙවන බව පෙනී යනවා. රේනර් නමින් මහත්මයෙක් සිටිනවා. ඔහුට මාසයකට රුපියල් හැත්තෑ හය දහක් ගෙවනවා. බ්‍රැන්ක්ෂෝ නමින් තවත් මහත්මයෙක් ඉන්නවා. ඔහුට මාසයකට රුපියල් හතළිස් අටදහක් පඩි ගෙවනවා. ඩිපයිනර් කෙනෙක් සිටිනවා. ඔහුට රුපියල් හතළිස් හයදහක් විතර ගෙවනවා. රෙසිඩන්ට් මැනේජර්ට රුපියල් හතළිස් හයදහක් විතර ගෙවනවා. මේ එක්කම මේ අයට වේයන්ගොඩ ආයතනයේ වියදමෙන් ගෙවල් දී තිබෙනවා. ගෙවල්වල අවශ්‍ය බඩුබාහිරාදිය දෙන්නේ වේයන්ගොඩ ආයතනයේ වියදමෙන්. කාරෙකේ ඉන්ධන ගාස්තු වේයන්ගොඩ ආයතනයේ මුදලින් ගෙවන්න සිද්ධ වී තිබෙනවා.

එක් අතකින් කල්පනා කළාම කොළඹ මේ කටයුතු කිරීම මහා මෝඩ ක්‍රියාවක් බව පෙනෙනවා. වේයන්ගොඩ රෙදි හුඟාක්ම හදන්නේ පිටිසර ප්‍රදේශවල. ඒ නිසා පිටිසරට ගොස් මේ සම්බන්ධ ප්‍රචාරයක් කරනවා නම් එය මට තේරෙනවා. ඔය බාලට පැමිණි කට්ටියගෙන් කී දෙනෙක් වේයන්ගොඩ රෙදි අඳිනවාද ? මේවා තමයි නාස්ති කියන්නෙ. අන්න ඒ නිසා මම ප්‍රථමයෙන්ම තමුන්නාන්සේගෙන් එක් ඉල්ලීමක් කරන්න කැමතියි. තව අවුරුද්දකින් නැත්නම් දෙකකින් මේ වේයන්ගොඩ ගිවිසුම අවසන් වෙනවා. කරුණාකර නැවත වරක් ඒ උදවිය සමග ගිවිසුම් ඇති කරගන්නෙ නැතිව ජාතික ජේෂකර්ම සංස්ථාව මාර්ගයෙන්ම වේයන්ගොඩ නිෂ්පාදන කටයුතු කරගෙන යාමට කටයුතු කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අර කෝටි 18 ගෙවන්න එපා. ඇත්ත වශයෙන්ම ඒ කෝටි 18 ගෙවිය යුත්තේ එහි කළමනාකරණයට ආව උදවියයි. ආණ්ඩුව නොවෙයි. අයිතිකරුවන් නොවෙයි. අයිතිකරුවන් වන්නෙ ජේෂකර්ම සංස්ථාවයි. කෝටි 50ක් ඉල්ලුවත් ඒ කෝටි 50 ගන්න එපා. තමුන්නාන්සේ අතට භාරගත්තාට පසුව ඒ කෝටි 50 ඉල්ලන්න. මේ අවස්ථාවේදී මම තමුන්නාන්සේට එක දෙයක් කියන්න කැමතියි. වේයන්ගොඩින් පමණක් කවදාවත්ම, අපේ යුගයේදීවත් මේ ආණ්ඩු කාලයේදීවත් තමුන්නාන්සේ යටතේ තිබියදීවත් පාඩුවක් වුණේ නැහැ. මේ ආයතනය පාඩුවට දිව්ව ආයතනයක් නොවෙයි. කවදාවත් වේයන්ගොඩ පාඩුවට ගියේ නැහැ. එම නිසා මම ඉල්ලා සිටිනවා මේ කළමණාකරණ ගිවිසුම් අහෝසි කරන්නය කියා. විශේෂයෙන්ම වේයන්ගොඩ කළමනාකරණ ගිවිසුම අහෝසි කරන්න. එය අහෝසි කර දමා තමුන්නාන්සේ තනියම ඒ කටයුත්ත කරගෙන යාමට කටයුතු කරනවා ඇතැයි කියා මා බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම දැන් තුල්හිරියෙනුත් ලාභ ගෙන දෙන ලකුණු තිබෙනවා. පූගොඩිනුත් ලාභ ගෙනදෙන ලකුණු තිබෙනවා. නමුත් මේවායේ ගණන් හිලව් දකින තුරු මේ ලාභ ගැන කථා කරන්න මම කැමති නැහැ. මත්තෙගොඩ මම හිතන්නේ යම්තම් දස ලක්ෂයක පමණ ලාභයක් ගෙන දෙන ලකුණු දැන් තිබෙනවා. නමුත් මින්නේරියෙ මොනවා කරනවාද කියලා මම දන්නෙ නැහැ. පසුගිය කාලයේ නම් කල්පනා කළා මින්නේරිය පූගොඩට භාර දෙන්න ඕනෑය කියා. මොකද ? එහි ඔනන නූල්වල යම් අඩුපාඩුවක් තිබෙනවාය කිව්වා. ඇත්ත වශයෙන්ම එය පූගොඩට භාර දීම වරදක් නොවෙයි. අමාරුවේ වැටුණු යම් කර්මාන්ත ශාලාවක් තිබෙනවා නම් එය ගොඩගන්න ක්‍රමයක් තිබෙනවා නම් එය කළ යුතුයි. නමුත් මින්නේරියේ දැන් තවත් ප්‍රශ්නයක් මතුවී තිබෙනවාය කියා මට ආරංචියි. ඒයේ පෙරේද සිට අලුත් තත්ත්වයක් ඇතිවී තිබෙනවා. සමහර විට මෙය යුද හමුදාවට භාර දෙන්නත් ඉඩ තිබෙනවා. ඒ අයගේ ප්‍රයෝජනයට එය දෙන්න ඉඩ තිබෙනවා. එය වෙනම දෙයක්. ඒ කෙසේ වී නමුත් එහි සිටින සේවක පිරිස සම්පූර්ණයෙන්ම අද රක්ෂා නැති තත්ත්වයකට පත්ව සිටින බව කියන්න ඕනෑ. ඒ අය ගෙවල්වලට ඇවිත් ඉන්නවා. සමහර අය තැන් තැන්වල සුළු සුළු රක්ෂාවල් කරමින් සිටියා. දැන් ඒ අයට කිසිම පඩියක් ගෙවන්නෙත් නැහැ. ඒ නිසා ඒ අය සම්බන්ධයෙන් මොකක් හරි වැඩපිළිවෙලක් යොදන්ය කියා මතක් කරන්න කැමතියි. මින්නේරියේ ගරු මන්ත්‍රීතුමාත් ඒ තත්ත්වය දන්නවා ඇති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දැන් බලාපොරොත්තු වෙන්නෙ වේයන්ගොඩ ගැන පමණක් කථා කරන්නටයි. මන්ද ? මම මුලින්ම කිව්වා වේයන්ගොඩ කර්මාන්ත ශාලාව කොහොම හරි තමුන්නාන්සේගේ අතටම ගන්න කියා. මම දැන් පූගොඩ ගැනත් සඳහන් කළා. පූගොඩ ගැන පසුව කථා කරන්න පුළුවන්. මොකද ? පූගොඩ කොන්ත්‍රාත් ගිවිසුම දැන් කාටත් ලැබිලා තිබෙනවා. වේයන්ගොඩට සිදුවී තිබෙන ඇබැද්දිය නැති කිරීමට එතුමාට ආධාර කළා. ටික කාලයකට කලින් අලුත් රෝටරි ස්ක්‍රීන් ප්‍රින්ටින් එකක් ගෙනැවිත් දුන්නා. තමුන්නාන්සේට මතක ඇති එයට මුදල් දුන්නෙ වෙන කවුරුවත් නොවෙයි, එන්.ඩී.බී. එකෙනුයි. එන්.ඩී. බී. එකෙන් සල්ලි අරගෙන මම හිතන විධියට හොලන්ඩ් එකේ තව පත්තයේ හොඳම රෝටරි ස්ක්‍රීන් ප්‍රින්ටින් මැෂින් එකක් ගෙනැවිත් හයි කළා. එය හයි කරලා දැන් එය පාවිච්චි කරනවා. එහි සම්පූර්ණ මිල මම හිතන හැටියට දස ලක්ෂ 15 ක් පමණ වුණා. නමුත් එන්.ඩී.බී. එකෙන් ලබාගත් මුදල් අද වන තෙක් ගෙවලා නැහැ. මුල් මුදලවත්, පොලියවත් මේ කළමනාකරණ උදවිය විසින් ගෙවා නැහැ. එහෙම නම් කළමනාකරණ උදවියගේ බාල්තැටුම සාධාරණයි කියා තමුන්නාන්සේට කියන්න පුළුවන්කම තිබෙනවාද ? ඒ නිසා තමයි, මම කිව්වේ වහාම මෙය වෙනස් කරන්නය කියා. මේ උදවියට තිබෙන්නේ වෙනම අදහසක්. සම්පූර්ණයෙන්ම වේයන්ගොඩ ශාලාව සූරාගෙන කෑමේ අදහසක් මේ අයගේ සිත් තුළ තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ කළමනාකරණයේ ඉන්න උසස්ම ගණයේ උදවියටවත් මේ මුදල ගෙවන්න බැරි වී තිබෙන්නේ ඇයිද කියන එක ගැන මට තේරුම් ගන්න බැහැ. ඒ නිසා වේයන්ගොඩ ගිවිසුම අත්සන් කරන්න යන විට වහාම ඒ ගිවිසුම නැවත සංශෝධනය කරන්නට කටයුතු කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම දැන් මේ ස්ථානය නවීකරණය කරන්න ඕනෑ. මේ කර්මාන්ත ශාලාව ආරම්භ කළේ අවුරුදු 25 කට පමණ කලිනුයි. මෙය නවීකරණය කරනවාට අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ නිසා මේ වේයන්ගොඩ ආයතනය බේරා ගන්නට ඕනෑ නම් කරුණාකර මේ උදවියගෙන් ඈත් වී තමුන්නාන්සේගේ අතට මේ කටයුත්ත භාර ගන්න. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ දක්ෂ උදවිය ඉන්නවා. හැකියාවක් තිබෙන නිලධාරී මහත්වරුත් ඉන්නවා. කරුණාකරලා ඒ උදවිය මාර්ගයෙන් තමුන්නාන්සේ යටතේ එය නැවත වරක් ක්‍රියාත්මක කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

දැන් ඇඟලුම් නිෂ්පාදනය දියුණුවෙලා තිබෙනවාය කියනවා. අපි එය නැතැයි කියන්නේ නැහැ. ජීසීඒසී එක සහ එෆ්ජ්අයිඡ්සී එක යටතේ ඇඟලුම් නිෂ්පාදනය කරන කර්මාන්තශාලා තිබෙනවා. එෆ්ජ්අයිඡ්සී එක යටතේ තිබෙන බොහෝ කර්මාන්තශාලා ලාංකික කර්මාන්තශාලා බව අපට කියන්නට පුළුවන්. නමුත් ජීසීඒසී එක යටතේ තිබෙන කර්මාන්තශාලා ලාංකික කර්මාන්තශාලා කියා අපට කියන්න පුළුවන්කමක් නැහැ. දැන් සිදුවෙන ප්‍රශ්නය මෙයයි. එක අතකින් බැලුවාම කෝටා ක්‍රමය ලොකු ජාත්‍යන්තර ප්‍රශ්නවලට මුහුණ දී තිබෙන දෙයක්. ලංකාවට කෝටා එකක් තිබෙනවා. මේ කෝටා එක අධික මිලකට ලැබෙනවා. ලංකාවට ලැබෙන කෝටා එකෙන් හරි අඩක් ජීසීඒසී එකට දෙනවා. මා හිතන්නේ ඒ යටතේ කර්මාන්තශාලා විස්සක් තිහක් පමණ තිබෙනවා. බොහෝ අඩු ප්‍රමාණයක් ඒ යටතේ තිබෙන්නේ. එෆ්ජ්අයිඡ්සී එක යටතේ ඒ වාගේ හතර පස් ගුණයක කර්මාන්තශාලා ප්‍රමාණයක් තිබෙනවා. නමුත් ඒ අයට දෙන්නේ කෝටා එකෙන් අඩයි. අනික් කොටස ජීසීඒසී එකට දෙනවා. ජීසීඒසී එක මොකක්ද කරන්නේ ? අද වෙළඳපොලේ තිබෙන සෑම රෙද්දක්ම වාගේ නියමාකාරයෙන් ආනයනය කරන ලද ඒවා නොවෙයි. හොර ජාවාරම්වලින් මේ රටට ගලා එන රෙදියි, වෙළඳපොලේ වැඩිපුර තිබෙන්නේ. අද පත්තරවල රෙදි විකුණන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවාය කියා නිර්භයව දන්වීම් පළකර තිබෙනවා. ඒවා ජීසීප්සී එක මාර්ගයෙන් වෙළඳ පොළට පැමිණ තිබෙන ඒවා බව පරීක්ෂණයක් කළොත් තමුන්නාන්සේලාට පෙනෙයි. එම නිසා ඒ ගැන වග බලාගන්න ඕනෑ. මෙහි තවත් අඩුපාඩුවක් තිබෙනවා. එයත් නොකියාම බැහැ. අමාත්‍යාංශයෙන් ආනයන බලපත්‍ර දෙන අවස්ථාවේදී ඒ බලපත්‍ර දවසින් දෙකෙන් දෙන්නට කටයුතු කරන්න ඕනෑ. එෆ්ජ්අයිප්සී එකේ සුමානයක් පමණ ගත වෙනවා, මොකක් හරි බලපත්‍රයක් ගැනීමට. නමුත් ජීසීප්සී එකේ එහෙම ප්‍රමාදයක් වෙන්නේ නැහැ. ඒ ඇයි ? ඒ අය හිතු මතයට වැඩ කරන්නේ. එම නිසා රෙදි ආනයනය කිරීමේ බලපත්‍ර පුළුවන් තරම් ඉක්මණින් ඒ කර්මාන්තශාලාවලට දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා, විශාල මුදලක් පොලී ගෙවන්නට තියෙන නිසා.

ඊළඟ කරුණ බැංකුවලින් ණය මුදල් ගැනීමේ ප්‍රමාදයයි. බැංකුවලින් ණය මුදල් ගැනීම තරම් අමාරු දෙයක් වෙන ඇත්තේ නැහැ. විශේෂයෙන්ම ලාංකික කර්මාන්ත ශාලාවට බැංකුවලින් ණය මුදල් දීම ප්‍රමාද කරනවා. මේ ප්‍රශ්න දෙක, එනම් — ආනයන බලපත්‍ර දීම සහ බැංකුවලින් ණය මුදල් දීම පිළිබඳ ප්‍රශ්න දෙක හැකි තරම් ඉක්මණින් නිරාකරණය කළොත් සෑහෙන දුරට තමුන්නාන්සේගෙන් සේවයක් සිදු වෙනවාය කියන්න පුළුවන්. ඒ වාගේම මේ ආනයනය කිරීමේ කටයුත්ත සම්පූර්ණයෙන්ම ලාංකික ජනතාව විසින් කරනු ලබන ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්න. එය කරන්න බැරිවෙන එකක් නැහැ. අනික් රටවල් හැම එකක්ම කරනවා. ලෝකයේ කුමන රටක් හෝ වේවා " Protectionism " ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවා නම් තමන්ගේ ජාතිය ආරක්ෂා වන විධියටයි, ඒ කටයුත්ත කර තිබෙන්නේ. 1952 දී රබර් කර්මාන්තශාලා සම්පූර්ණයෙන්ම ලාංකික කළා. ඉන්පසුව වීනය සමග තිබුණු ගිවිසුම සාර්ථක වෙලා තිබුණා. ඒ මොකද, ලාංකික ජනතාව ආයතයනය කරන්නට පරිවර්තනය කළ නිසා. එම නිසා මා යෝජනා කරනවා තමුන්නාන්සේට මේ කර්මාන්ත හැකි තරම් දුරට ලාංකික කරන්නය කියල. අර " බොන්ඩඩ් වෙයාර් හවුසස් " ඇති කර තමුන්නාන්සේ හොඳ වැඩක් කර තිබෙනවා. ඒක බොහොම හොඳ වැඩ පිළිවෙළක්. නමුත් ටිකක් ප්‍රවේශම් වෙන්නට ඕනෑ. මෙම නිදහස දිය යුත්තේ කාටද කියන එක ගැන ටිකක් කල්පනාකාරී වෙන්නට ඕනෑ. එම නිදහස අවංකව කර්මාන්ත කරුවන්ට දෙන්න. වංකකමක් ගැන යන්තම් හෝඩුවාවක් තිබෙනවා නම් එවැනි කර්මාන්ත කරුවන් ගැන ටිකක් ප්‍රවේසමින් කටයුතු කරන්නට ඕනෑ.

අනික් කාරණය මෙයයි. " කෝටා " දෙන කොට සාධාරණ බෙදා හැරීමක් කෙරෙන්නට ඕනෑ.

You have to streamline the distribution of fabrics and garments. Please streamline your distribution of fabrics and garments. That is one way in which you will be able to compete with some of the factories that are being put up in places like Bangladesh, Katmandu and the Maldive Islands.

I would like to bring to the notice of the Hon. Minister that very soon there will be a massive threat from those countries. The threat will come because they have no quota, the threat will come because their labour is cheap and the threat will come also because we have an FTZ here which does not calculate under the CMC system but calculates under what they call a CMP system. In other words, they do not trim but only pack in the FTZ. Please watch out. You may not agree with me, Sir. This is where the Hon. Minister does not agree. But I say now that within the FTZ there are certain factories that are working on the CMC system and not on the CMP system.

Sir, I would like to bring to the notice of the Hon. Minister another matter which may be useful to him. With regard to the importation of yarn, I find that the quality of the yarn that is being imported is rather weak. (*Interruption*) Now, this is where he does not agree with me, Sir. It is either smuggled or imported. You say that you do not import. Are you quite sure that you are not importing ? Are you quite sure that imports are not coming in ? The yarn that we are producing in this country is of a better quality. All our factories are good. All our factories are new. Therefore I would request the Hon. Minister to check on this matter. I have come across certain quantities of yarn that are being sold in Pettah which are not of our grades.

මන්ත්‍රිවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Cotton or synthetic ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Both cotton and synthetic. He may not agree with me, Sir, but if he only cares to go to the Pettah–(*Interruption*). This is what you think. Every import does not carry your licence. There is an Import Control Department which does not come under you. Just check to find out whether there is any imported yarn. You may say "no". I know you are not going to agree with me, but please check on that.

The drying and processing sector in our country is good. It is modern. But I must say that we are finding it rather difficult to find the technical know-how yet. The technical know-how of the drying and processing sector has to to be developed so that it can be imparted to those who are in the trade.

Therefore, I would like to bring to the notice of the Hon. Minister that there are certain matters on which he can take steps in order to improve the quality of textiles.

Sir, now we must not only go for the garment manufacture. We must also go in a big way for textile manufacture, not only in the mill sector but also in the handloom and powerloom sectors. Very useful fabrics from handloom can be porduced here. Once we produce this fabric we should aim to be the feeder to the FTZ organization. If our fabric is good and better than what we get from outside, then we can be a hundred percent sure that we have taken the next inevitable step of making the fabrics here to make our garments. There are fabrics of a very high quality made in Sri Lanka with handlooms. But this handloom industry must be given all the impetus that is necessary. The time has come to produce our own fabrics and our own yarn. We have to produce fabrics from powerlooms and handlooms as well as other fabrics which can be made.

ගරු සභාපතිතුමනි, අත්තනගල්ලේ පේෂකර්ම ව්‍යාපාර සම්බන්ධවත් යමක් කියන්නට මම කැමතියි. දිවුලපිටිය හා කටාන වගේම අත්තනගල්ලෙත් පේෂකර්මාන්තය ආරම්භ කළේ 1933 වර්ෂයේදීයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

ආරම්භ වුණේ කොටටල කියන ගමේයි. ලංකාවේ ප්‍රථම වරකය පිහිටෙව්වෙත් අත්තනගල්ලෙයි. එමෙන්ම ප්‍රථමයෙන්ම එය ආරම්භ කරන ලද්දේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා විසිනුයි. එයින් පසු මේ කර්මාන්තය ව්‍යාප්ත වී ගියා. මේ කර්මාන්තය කොයි තරම් දුරට ව්‍යප්ත වුණාද කියනවා නම් දන් සිටින ගරු ඇමතිතුමාට කියන්න පුළුවන්කමක් තිබෙනවා දන් අපි ඒ අතින් ස්වයම්පෝෂිතයි කියා.

මෙයට ටික දවසකට කලින් ගරු ඇමතිතුමා අපට කිව්වා තමන්ගේ ඡන්ද කොට්ඨාශයේ අත් යන්ත්‍ර පේෂකර්මාන්තය දියුණු කරන්නට ස්ථාන තුනක් නම් කරන්නය කියා. ඒ අනුව අපි ස්ථාන තුනක් නම් කළා. එසේ නම් කිරීමේදී ඒ කර්මාන්තයේ යෙදෙන්නට පුළුවන් අය සිටින ස්ථාන නම් කිරීමට අපි හුඟක් දුරට වගබලා ගත්තා. ඒ නිසා අත්තනගල්ලේ බොහොම ඈත තිබෙන ගම් තුනක් අපි තෝරා ගත්තා. හැබැයි, ඒ ගම්වල අයට පේෂකර්මාන්තය ගැන දනුමක් තිබෙනවා. මීවල , උදම්විට හා පරණගම කියන ගම්වල පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන පුනරුත්ථාපනය කරන්නට යයි අපි කිව්වා. නමුත් මේ වන තුරුම කිසිම පියවරක් අරගෙන නැහැ.

තවත් කරුණක් ගැන කියන්න කැමතියි. මේ ගැන අපි ගරු ඇමතිතුමාට ලිපියකුත් ලිව්වා. වේයන්ගොඩ ඉතා භයානක සිද්ධියක් ඇති වුණා. එහි සිටි ආරක්ෂක නිලධාරියෙක් මරුමුවට පත් වුණා. එය සිදු වුණේ මේ අවුරුද්දේ 5 වැනි මාසයේදීයි. බී. පී. එස්. කරුණාරත්න කියන මහතාට වෙඩි තබා මරා දැම්මා. නමුත් අද වන තුරු ඒ මහතා වෙනුවෙන් කළමනාකාරිත්වයෙන් කිසිම මුදලක් ගෙවා නැහැ. සමහරවිට ඒ අය කියාවි " මෙය රක්ෂණය කර මදි. මේ කටයුත්ත කරන්න කියා අපි භාර දී තිබෙන්නේ වෙනම කොම්පැණියකටයි " කියා. නමුත් එක ප්‍රශ්නයක් තිබෙනවා. කළමනාකාරිත්වයට එහෙම ඇඟ බේරා ගන්නට බැහැ. අයිතිකාරයින් හැටියට තමුන්නාන්සේලා හිටියා නම් ඇඟ බේරා නොගන්නා බව මම දන්නවා. ඒ අයට මොකක් හෝ වන්දියක් ගෙවන්නට තිබුණා. නමුත් මේ මොහොත වන තුරුම නම් කිසිම වන්දියක් ගෙවා නැහැ.

තවත් කරුණක් තිබෙනවා, වැඩ වර්ජනයට සහභාගී වුණාය කියා. මම එකක් කියන්න කැමතියි. මෙය ඔළුවෙන් අයින් කරන්න. වැඩවර්ජනයට සහභාගී වුණාය කියන එක හැමදම ඔළුවේ තබා ගෙන ඉන්නට පුළුවන් එකක් නොවෙයි. මේ අය දේශපාලනය කළ අය නොවෙයි. දේශපාලනයක් ඇතිව තමන්ගේ වෘත්තිය කරන එකත් දේශපාලනයක් නැතිව තමන්ගේ වෘත්තිය කරන එකත් අතර ලොකු වෙනසක් තිබෙනවා. වඩු වැඩ කරන කෙනෙක් ගැන හිතමු. ඔහුගේ රැකියාව ලී කැල්ලක් තබාගෙන එය යතුගෑමයි. උදේ සිට රෑ වන තුරු යතුගානවා. ඔහුගේ දේශපාලන අදහසක් ඇති. නමුත් යතුගෑමට දේශපාලනය සම්බන්ධ වන්නේ කොහොමද ? එමෙන්ම මේ කර්මාන්ත ශාලාවේ වැඩ කරන අයගෙනුත් සමහරෙක් කරන්නේ නූල් ටික බඳින රැකියාවයි. තවත් සමහරෙක් විවින් රැකියාව කරනවා. ඒ රැකියාව කරන වේලාවේදී කිසිම දේශපාලනයක් නැහැ. ඒ අයට දේශපාලන නිදහස් දුන්නේ අන්න ඒ නිසයි. නමුත් වෘත්තිය අයිතිවාසිකමවත් ලැබෙන්නේ නැතිව දේශපාලන මට්ටමින් මේ ගැන කල්පනා කිරීම ඉතාමත් අසාධාරණයි කියා අපි කල්පනා කරනවා.

දන් බලන්න. මම පිළිගන්නවා එකක්. ගමේ ග්‍රාම සේවක නිලධාරියාට දේශපාලන අයිතිවාසිකම් නොදිය යුතුයි. ඇයි ? ඔහු තීරණ ගන්නා පුද්ගලයෙක් නිසයි. ඩී. ආර්. ඕ. මහත්මයාට දේශපාලන නිදහස නොදිය යුතුයි. ඔහු තීරණ ගන්නා පුද්ගලයෙක්. ඒ වාගේම රජයේ විවිධ ආයතනවල ඉන්නවා තීරණ ගන්නා ඇතැම් පුද්ගලයෝ. ඒ අයට දේශපාලන අයිතිවාසිකම් දෙන්නට වුවමනාවක් නැහැ. ඒ අයට ඡන්ද බලය තිබෙනවා. ඒ අය මැතිවරණවලට ඉදිරිපත් වෙන්නේ නැහැ. නමුත් දේශපාලනය නොකරන උදවිය අයින් කිරීම ගැන නැවත කල්පනා කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] පෞද්ගලිකව මා නම් කැමතියි හැම එක්කෙනාටම දේශපාලන අයිතිවාසිකම් පමණක් නොවෙයි වෘත්තීය සමිති අයිතිවාසිකම්ද දෙන්නට.

ඒ සමගම මා අහන්නට කැමතියි වේයන්ගොඩ කම්හලේ සේවය කළ උදවිය ගැන ප්‍රශ්නයක්. ඒ අය රක්ෂාව දෙන්නය කියා හෝ යම් මුදලක් ගෙවන්නය කියා හෝ ඉහළ මට්ටමින් තිබෙන කම්කරු විනිශ්චය සභාවකින් තීන්දුවක් දුන්නත් දනට තිබෙන කළමනාකරිත්වය ඒක කරන්නේ නැහැ. මට නිදර්ශනයක් වශයෙන් පී. බී. ජයසිංහ මහත්මයා පෙන්නුම් කරන්නට පුළුවනි. තමුන්නාන්සේත් කියා තිබෙනවා මුදලක් ගෙවන්නය කියල. නමුත් දනට සිටින පාලකයන් ඒක කරන්නේ නැහැ. එම නිසා මොකක්ද කළේ ? ඒක ඇවරකරුට යවන්නය කිව්වා. වේයන්ගොඩ ජාතික පේෂකර්ම සංස්ථාවේ කම්හල ඇවරකරුවෙකුට භාර දී තිබෙනවාද කියා අහන්න කැමතියි. ඒක අහෝසි කරන්නට ඇවරකරුවෙකුට භාර දී තිබෙනවාද ? ඒ වාගේම තමුන්නාන්සේගේ යටතේ තිබෙන්නා වූ ජාතික පේෂකර්ම සංස්ථාවත් ඇවරකරුවෙකුට භාර දී තිබෙනවාද ? ඇවරකරුවෙකුට භාර දෙන්නේ සම්පූර්ණයෙන්ම ඒක අහෝසි කර දමන්නට. මේ කරන වැඩෙන් සමහර අයගේ අයිතිවාසිකම් නැති වී යනවා. ඒ ගැන ඇමතිතුමා සැහෙන වගබලාගැනීමක් කරයි කියා මම විශ්වාස කරනවා. ජාතික පේෂකර්ම සංස්ථාව රජයට පවරා ගත්තාට පසු ඊට කලින් එහි වසර පහකට වඩා සේවය කළ සේවකයන්ට පාරිතෝෂික මුදලක් ගෙවන්නය කියා නියම කළා. නමුත් ඒක හම්බු වුණෙත් නැහැ. ඒ මුදල වහාම ලබා දෙන්නට කටයුතු කරන්න. කොයි ආයතනයකට ගියත්, කම්කරු විනිශ්චය සභාවකට ගියත් ගෙවන්නය කියා නියම කරන මුදලක් ඒක. ඒක ගෙවන්න.

තවත් කාරණයක් තිබෙනවා. රජයට පවරා ගත් පේෂකර්ම සංස්ථාවේ කම්හල්වල වැඩ කළ සේවකයන්ට වැටුප් වැඩිවීමක් නැහැ. ඇයි, ඒ සේවකයන්ගේ පඩි වැඩි කරන්නේ නැත්තේ ? මේක දන් සාමාන්‍ය සිරිතක් බවට පත් වී තිබෙනවා. ඊයේ–පෙරේද ගරු මුදල් ඇමතිතුමා සිය අයවැය යෝජනා මගින් රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මාසික වැටුප රු. 100 කින් වැඩි කළා. නමුත් මේ අයට ඒ වැඩි කළ රු. 100 ලැබෙන්නේ නැහැ. ඒ වුණාට ඒවායේ ඉන්න උසස් නිලධාරීන් නම් තමන්ගේ වැටුප් වැඩි කර ගන්නවා. කම්කරු ශ්‍රේණියේ හා නිමැවුම් අංශවල ඉන්න සේවකයන්ගේ වැටුප් වැඩි කෙරෙන්නේ නැහැ. ඒ නිසා ඒ පහළ ශ්‍රේණිවල සේවකයන්ගේ වැටුප් වහාම වැඩි කිරීම සඳහා පියවර ගන්නා හැටියට මේ අවස්ථාවේදී ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

වේයන්ගොඩ කර්මාන්තශාලාවේ සේවකයෙක්–වැලිකඩමුල්ලෙ කෙනෙක්–සේවය කරමින් සිටියදී විදුලි සැර වැදී මරු මුවට පත් වුණා. ඒ සම්බන්ධයෙන් මොකක් හෝ වන්දි ගෙවීමක් කරන්නය කියා අපි කළමනාකරිත්වයෙන් ඉල්ලා සිටියා. ඒ සේවකයා සේවය කරන අවස්ථාවේදීයි, ඒ අනතුරට මුහුණ පෑවේ. නමුත් කිසිම මුදලක් දුන්නේ නැහැ. ඒ වාගේම, විධිමත් පරීක්ෂණයක් පවත්වා මේ අනතුරුදායක ස්ථානය ගැන සොයා බලන්නය කීවා. නමුත් අද වන තුරුවත් ඒ ගැන ක්‍රියා කර නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, වේයන්ගොඩ කර්මාන්තශාලාව ගැන ටිකක් පරීක්ෂා කර බලන්න, එහි කළමනාකාරිත්වය නිසි පරිදි සිදු වෙනවාද කියා.

ගරු ඇමතිතුමාගෙන් ඇසිය යුතු තවත් වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. සමහර අමාත්‍යාංශ වෙන–වෙනම වෙනස් තීරණ ගෙන තිබෙනවා, මේ කාරණ සම්බන්ධයෙන්. 1980 වැඩ වර්ජනයට සම්බන්ධ වුණු අය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද ? එක–එක ඇමතිතුමා වෙන–වෙන ආකාරයටයි, මේ ප්‍රස්තය විග්‍රහ කරන්නේ. ඒ නිසා එක–එක ඇමතිතුමාගෙන් වෙන–වෙනම මේ ගැන අහන්න අපට සිදු වී තිබෙනවා.

ගරු ඇමතිතුමා යටතේ වැඩ කරන වයි. ආර්. ද සිල්වා මහත්මයා බොහොම දක්ෂ අධ්‍යක්ෂ මහත්මයෙක්. ඒ වාගේම බොහොම හොඳ මහත්මයෙක්. යම්කිසි සේවකයකුගේ අමාරුකමක් ගැන අපට දනගන්න ලැබුණම ඒ සම්බන්ධයෙන් ඇමතිතුමාට කරදර නොකර අපි කෙළින්ම ඔහු යවනවා, වයි. ආර්. ද සිල්වා මහතා ළඟට. එතුමා අධ්‍යක්ෂ මට්ටමේ ඉන්න පරණ සිවිල් නිලධාරියෙක්. එතුමා කෙරෙහි අපේ සම්පූර්ණ විශ්වාසය තිබෙනවා. නමුත් එතුමා සාධාරණ තීරණයක් අරගෙන ඒ පිළිබඳව ඔය විවිධ කම්හල්වල කළමනාකාරිත්වය දන්නුවත්, එතුමාගේ නියෝග පිළිගැනීමට වුණත් ඒ අය කැමති නැහැ. මේවා ගැන යම්–යම් පරීක්ෂණ පවත්වනවාට වඩා මේවා ඇතිවීම සම්පූර්ණයෙන්ම නවත්වා දමන්න පුළුවන්, වේයන්ගොඩ කර්මාන්තශාලාව කෙළින්ම ඇමතිතුමා යටතට ගන්නවා නම්.

වේයන්ගොඩ කර්මාන්තශාලාවේ හුඟක් යන්ත්‍ර කොටස් හොර කඩයට යනවාය කියනවා. අපි බලයේ සිටි කාලයේ ඒ කම්හල සඳහා අමතර කොටස් ගෙන්වා ගත්තේ බොහොම අඩු මිලටයි. ' ස්විස් ' වර්ගයේ අමතර කොටස් නමයි, අපට ගෙන්වන්න සිදු වුණේ. ඒ කර්මාන්තශාලාවේ තිබුණේ ' ස්විස් ' වර්ගයේ යන්ත්‍රසූත්‍රයි. නමුත් දන් ඒ යන්ත්‍ර කොටස්, අමතර කොටස් වංචනික ලෙස එහා–මෙහා කෙරෙන බවට අපට පෙන්සම් ලැබී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එවැනි එක පෙත්සමක් ඇමතිතුමාට ඉදිරිපත් කරන්න කැමතියි. ඒ පෙත්සමේ සඳහන් වෙනවා, එය එවූ තැනැත්තාගේ නමත්. හැබැයි, මේ පෙත්සම ඉදිරිපත් කළාය කියා ඒ මනුෂ්‍යයා එතැනින් අස් කරන්න එහෙම එපා. ඒ කොන්දේසිය පිටයි, මම මේ පෙත්සම ගරු ඇමතිතුමාට දෙන්නේ. එහෙම නැත්නම් හෙට වැඩට ගියාම මේ මනුෂ්‍යයා අස් කර දමන්න බැරි නැහැ. යම්කිසි සේවකයෙක් ගරු ඇමතිතුමාට ලිපියක් එවුවත් කළමනාකාරිත්වය විසින් ඒ සේවකයා ගෙදර යවනවා. ඒ නිසා මේ වංචාවන් ගැනත්, සේවකයන්ට සිදු වන අසාධාරණය ගැනත් ඇමතිතුමා ඒ ඒ කම්හල්වල කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කොට තීරණයකට බහින්න ඕනෑ.

අවසාන වශයෙන් සඳහන් කරන්න කැමතියි, අපට ලැබී තිබෙන ආරංචියක් ගැන. මේ කම්හල් සම්බන්ධයෙන් ඇති කර ගත් ගිවිසුම් නැවත සොයා බැලීමකට භාජන කරනවායයි අපට ආරංචියි. ඒක බොහොම හොඳ වැඩක්. පූගොඩ ගිවිසුම ගැන නම් මේ අවස්ථාවේදී කථා කරන්න මම කැමති නැහැ. ඒ ගැන ඇමතිතුමා සමඟ කථා කරන්න වෙනම දිනයක් ලබා ගන්න ඕනෑ. ඒ පූගොඩ ගිවිසුමේ තිබෙන අඩුපාඩුකම් හා වෙනත් නොයෙක් කරුණු දිහා බැලුවාම අපට පෙනෙනවා, ඒවා නැති කර ගන්නවා නම් ඒ කර්මාන්තශාලාවෙන් ලාභයක් ලැබෙන විධියට, භාණ්ඩාගාරයට මුදල් ලැබෙන විධියට, එහෙමත් නැත්නම් 'ඉන්කම් ටැක්ස්' ලැබෙන විධියට එය පරිවර්තනය කරන්න පුළුවන් බව. ඒ සඳහා යොදවන්න දක්ෂ කෙනෙක් ඇමතිතුමාට ලැබී තිබෙනවා. එතුමාගේ ලේකම්තුමා දක්ෂ පුද්ගලයෙක්. එතුමා දැන් මේ ගැන කටයුතු කරගෙන යන බව ආරංචියි. මේ ගිවිසුම්වල තිබෙන කොන්දේසි, ඒවායින් බලාපොරොත්තු වුණු පරමාර්ථයන් ඉෂ්ට වෙනවාදැයි කරුණාකර සොයා බලන හැටියට ඉල්ලා සිටින්න කැමතියි.

You will have to find out whether the purposes for which the joint ventures were inaugurated or started have been achieved by the foreign collaborator. This is very important because we noticed that in most of these agreements that have been reached, the foreign collaborator has quietly slipped out. I do not blame them. The main reason is that we do not have a very strong agreement with them. When an agreement is negotiated, you must see to it that we have the controlling power as much as possible. I know it is a very difficult task for you to have your own way with some of these foreign collaborators. But what I cannot understand is that when they come here and enter into a collaboration agreement they do not stick to what has been decided upon. Did you decide to pay Rs. 76,000 per month to these people ; Rs. 46,000 to another and Rs. 40,000 to a third ? I am made to understand that there are three people who are resident in Veyangoda who have been paid over Rs. 25,000 a month. Therefore, Sir, I think these agreements must be subject to a very careful scrutiny, and not only a scrutiny but every foreign collaboration must get the covering sanction of the Parliament. It must go through the Foreign Ministry. It must go through the other Ministers who are involved. It must go through the Finance Ministry. Do not do it alone. The last time when they entered into the Air Lanka/SIA Agreement, we saw what happened. Similar situations can arise here. Therefore, Sir, in future I hope the Hon. Minister will take care, specially when it comes to the case of a foreign agreement, to see that it is not loaded to one side.

අ. භා. 3. 07

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ගරු සභාපතිතුමනි, පේෂකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ, අපේ මේ ඇමතිතුමාට ආධාරයක් වශයෙන්, අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධයෙන් සුළු විවේචනයක් පමණයි කරන්නට මම බලාපොරොත්තු වෙන්නේ. මේ ඇමතිතුමාගේ මූලික පරමාර්ථය වී තිබෙන්නේ මොන විධියකින් හෝ අපේ රට රෙදිපිළි අතින් ස්වයංපෝෂිත කිරීම බව එතුමා කිව්වා. රටේ ජනතාවට වුවමනා කරන රෙදිපිළි මෙහිම නිපදවා එයින් ස්වයම්පෝෂිත තත්ත්වයකට ගෙන එන්නට උත්සාහ කරන බවයි එතුමාගේ අදහස. නමුත් මෙහිදී මතු වන ප්‍රශ්නයක් තිබෙනවා. පේෂකර්ම අමාත්‍යාංශ, පේෂකර්ම දෙපාර්තමේන්තුවක් පිහිටුවා ඇත්තේ කුමන පරමාර්ථයක් ඉටු කර ගන්නටද ? මුලින්ම අපේ අවධානය යොමු කරන්න ඕනෑ ඒ ප්‍රශ්නයටයි. අපේ රටේ පේෂකර්මාන්තය දියුණු කිරීමට ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා. හොඳයි, සමහර විට, රෙදිපිළි නිෂ්පාදනය විදේශීය කොම්පැණිවලට භාර දී, අපේය කියන දේවල් කිසිම අන්දමකින් දියුණු වෙන්නට ඉඩ නොදී රෙදිපිළිවලින් රට ස්වයම්පෝෂිත කිරීම එතුමාගේ මතය වෙන්නට පුළුවනි. විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවකදී මතු වන කලබැගෑනියෙන් තාවකාලිකව බේරෙන්නට එසේත් කළ හැකියි. නමුත් එයින් අපේ පේෂකර්මාන්තයට ස්ථිර පදනමක් කවදාවත් වැටෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මම ඊයේත් කී පරිදි, අපට මේ සම්බන්ධයෙන් ඉන්දියාවෙන් උගත හැකි පාඩම මොකක්ද කියා සිතා බලන්නට ඕනෑ. ඉන්දියාව බ්‍රිතාන්‍ය පාලනය යටතේ තිබුණු අවදියේ, බ්‍රිතාන්‍ය සහ ජර්මනිය ආදී විදේශීය රටවල සමාගම් මඟිනුයි ඉන්දියාවේ රෙදිපිළි නිපදවීමේ කර්මාන්තය පවත්වාගෙන ආවේ. මෙය නතර කර දැමීමේ උපක්‍රමයක් වශයෙන් තමයි, ඉන්දියාවේ කදර් ව්‍යාපාරය ආරම්භ කළේ. කදර් වස්ත්‍ර ව්‍යාපාරයෙන් ආරම්භ කළ සටනින් තමයි, අධිරාජ්‍යවාදී පාලනය බිඳ දමන්නට ඉන්දියාවට හැකි වුණේ. කදර් වස්ත්‍ර ව්‍යාපාරය දේශපාලන බලවේගයක් බවට පරිවර්තනය වුණා. ජාතික බලවේගය දේශපාලන බලවේගයක් වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් බ්‍රිතාන්‍ය පාලනය ඉන්දියාවෙන් අතුගා දමන්නට හැකි වුණා. එම ව්‍යාපාරය ශ්‍රී ලංකාවටත් සෑහෙන තරම් දුරට බලපෑ බව අපි දන්නවා.

පේෂකර්මාන්තය ශ්‍රී ලංකාවේ නගා සිටුවීමේ කාර්යය පැවරී තිබෙන්නේ අපේ මේ ඇමතිතුමාටයි. මෙය ඉතාමත් වැදගත් අමාත්‍යාංශයක්. මනුෂ්‍යයාට ආහාර ළඟට අවශ්‍ය වෙන්නේ ඇඳුම්. මුලින්ම ආහාර අවශ්‍යයි. ඊළඟට ශිෂ්ටාචාරවත් මනුෂ්‍යයාට ඇඳුම් අවශ්‍යයි. ඒ අනුව ඇඳුම් දෙවන ස්ථානයට ගැනෙනවා. එහෙම නම් ආහාර තරමටම අවශ්‍ය ඇඳුම්, අපේම ශ්‍රමයෙන්—අපේම ශක්තියෙන්—මේ රටේම ස්ථිර වශයෙන් අපේම අය ලවා නිපදවා ගන්නට අපි උත්සාහ ගන්නට ඕනෑ. ඒ සඳහා තාවකාලික පිළියම් යොදන්නට එපා යයි මම කියන්නේ නැහැ. ඒවාත් කරන්නට ඕනෑ. නැතිනම් අපේ මේ ඇමතිතුමාට රටෙන් බැණුම් අහන්නටත් සිදු විය හැකියි. කොහොම වුණත් ඒක ස්ථිර පියවරක් නොවෙයි. අන්න ඒ නිසයි එතුමාගේ වැඩ පිළිවෙළ විවේචනයට ලක් වී තිබෙන්නේ. සමහර විට යම් යම් අංශවලින් දුර්වලකම් තිබුණත් අපේ කිසියම් පරමාර්ථයක්, ඉලක්කයක් තිබෙන්නට ඕනෑ, ස්වයං රැකියාවක් වශයෙන් හෝ ස්වදේශීය කර්මාන්තයක් වශයෙන් හෝ අපේම අය පුහුණු කර, අපේම අය ලවා—යම් යම් දුර්වලකම්, අඩුපාඩුකම් ඇත්නම් ඒවා නැති කරගෙන—මෙම කර්මාන්තය කරගෙන යන්නට, එය කිසියම් ස්ථානයකට ගෙන එන්නට. අන්න ඒක තමයි, අපේ දර්ශනය විය යුත්තේ. මෙන්න මේ කාරණය ගැනත් අපේ මේ ඇමතිතුමා නැවතත් සිතා බලන්නට ඕනෑ.

පසුගිය කාලයේදී පේෂකර්මාන්තයෙන් සෑහෙන පාඩුවක් විඳින්නට සිදු වූ බව මෙම වාර්තාවලින් පෙනෙනවා. ඒ අන්දමට පාඩු සිදු වුණත් සෑහෙන සේවයකුත් ඉටු වී තිබෙනවා. විශේෂයෙන්ම නූල් නිපදවා ඇති ප්‍රමාණය පිළිබඳව ගණන් හිලවු සැලකිල්ලට ගත්තාම ඒ අංශයේ සෑහෙන දියුණුවක් ලබා ඇති බව පෙනෙන්නට තිබෙනවා. ඒ අතර දැන් සේවක පිරිවැය, සේවකයන්ගේ දළ ඉපයීම, සාමාන්‍ය වශයෙන්—ඇවරේජ්—අවුරුද්දකට රු. 9,100 ක් වී තිබෙනවා. වෙයන්ගොඩ කම්හල, තුල්හිරිය කම්හල, පූගොඩ කම්හල, මත්තේගම කම්හල, මින්නේරිය කම්හල, කපුනූල් අංශය—ප්‍රධාන කාර්යාලය සහ තුල්ටෙක්ස් ප්‍රදර්ශනාගාරය යන මේ සියල්ලේම සේවකයන් 11,301 ක් ජීවත් කරලා තිබෙනවා. රු. 9,100 ක සාමාන්‍ය ආදායමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

වශයෙන් ඒ හැම සේවකයාටම ලැබිලා තිබෙනවා. ඒ කාලය තුළ මෙහි යම්කිසි වැරදි සිදු වී තිබුණත් 1978 වර්ෂය අවසානයේදී ගණන් බලන විට මෙයින් යම්කිසි සේවයක් සිදු වී තිබෙන බව පෙනී යනවා. එපමණක් නොවෙයි, මේවායින් නිෂ්පාදනය කරන නූල් ආදියේ ප්‍රමාණය බැලුවාම විශාල වශයෙන් අපිට සන්තෝෂ වන්නට පුළුවන්. අපේ දේශීය කර්මාන්ත සංස්ථාවක් වශයෙන් කර තිබෙන සේවය ඇත්ත වශයෙන්ම අපි අගය කරන්නට ඕනෑ. යම් යම් වැරදි සිදු වූ කොටස් තිබෙනවා. පාඩු සිදු වූ කොටස් සහ පාඩු වෙලා තිබෙන්නේ කවර හේතු නිසාද යන්නත් විගණනයේ පෙන්වනවා. ජාතික පේෂකර්ම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 1978.1.1 සිට 1978.12.31 දක්වා වූ වාර්තාවේ 2, 5 සහ 15 යන විගණන සාක්ෂි යටතේ, "ගිණුම්මිල පහත දක්වෙන ප්‍රධාන විෂයයන් ඒවාට කෙලින් දක්වෙන සාක්ෂි නොමැතිවීම නිසා සතුටුදායක ලෙස විගණනයේදී සහතික කළ නොහැකි විය" යනුවෙන් සඳහන් වෙනවා.

මෙන්න මෙතැනයි වරද තිබෙන්නේ. එක අංශයක පමණයි මේ දුර්වලකම ඇති වෙලා තිබෙන්නේ. දක්ෂතා එහි තිබෙනවා. නිෂ්පාදනය කරලත් තිබෙනව. දක්ෂ සේවකයන් හිටියාය කියන එකත් පේනවා. නමුත් විගණනයේ තැබීම හා මුදල්වල අරපරිස්සම තමයි සම්පූර්ණයෙන්ම ඇලියාවට ගිහිල්ලා තිබෙන්නේ."කාර්ය මණ්ඩල ණය ගැතියෝ දස ලක්ෂ 20.620 යි". ඒවායේ උපලේඛන නැහැල්ලු. ඒවායේ ලිපිගොනු කිසිවක් නැහැ. "වේයන්ගොඩ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ දසලක්ෂ 8.049 යි. ප්‍රමාණවත් බිල්පත් ආදිය ඉදිරිපත් කර නැත". තොග මිත්තේරිය දස ලක්ෂ 12.569 යි. ඇගයුම් පත්‍රිකා නැත. වියදම්න් තුල්හිරිය—මාස දෙකක්—දස ලක්ෂ 2.100 යි. උපකුච්තාන්සි නැත. වියදම්—පූගොඩ මාස 2 ක දස ලක්ෂ .950 යි. උපකුච්තාන්සි නැත. ණය ගැතියන් ප්‍රධාන කර්යාලය දස ලක්ෂ .225 යි. අදාල ලිපිගොනු නැත. ප්‍රධාන කාර්යාලය වියදම් විභාජනය සඳහා දස ලක්ෂ 37.125. සැකසීම් ලිපිගොනු නැත. තැන්පතු ප්‍රධාන කාර්යාලය දස ලක්ෂ .098 යි. අදල ලිපිගොනු නැත. ණය හිමියෝ ප්‍රධාන කාර්යාලය දස ලක්ෂ .309 යි. අදල ලිපිගොනු නැත."

මෙයින් මොකක්ද පෙනී යන්නේ ? පලමුවෙන්ම අපිට හිතාගන්නට පුළුවන් මේ සංස්ථාවේ පාඩුව ඇති වෙලා තිබෙන්නේ "මැනේජ්මන්ට් එකේ—පාලනයේ තිබෙන දුර්වලකම නිසයි කියලා. [බාධා කිරීම්]—ඔව් 1978 වර්ෂයේ—[බාධා කිරීම්] ඒක හරි මම කියන්නේ මෙයයි. තමුන්නාන්සේගේ තර්කය වුණේ පාඩුවට දුවනවා ; ඒ නිසා පාඩුව පිරිමසා ගන්නට බැහැ ; හැමදම මේ විදියට කරන්නට බැහැ කියන එකයි මම කියන්නේ මෙයයි. මේක අනෙක් සංස්ථාවලටත් අදාළ වෙනවා. මේ සංස්ථාවල පරිපාලනය—මැනේජ්මන්ට් එක—හරියට යොද වන්නේ නැතිව හැම ආණ්ඩුවක්ම කරන්නේ දේශපාලන වාසියක් දමා ගෙන කොහේ හරි ඉන්න පුද්ගලයෙක් දම්මයි, ඒ ස්ථානයට. ඔහුගේ ඉල්ලීම පිට හෝ ඔහුගේ කන්කෙඳිරිය පිට හෝ ඒ ස්ථානයට ඔහු දම්මාම ඒ පුද්ගලයා තමන්ට ඕනෑ විධියට නොයෙක් විදියේ හොරකම් දූෂණ කළ බව මෙතැනින් පේනවා. මේ ගැන බැලුවාම භයානක විදියට මේ සංස්ථා පිරිහෙනවාය කියන එක අහන්නට දෙයක් නැහැ. තමුන්නාන්සේ මේවා ගැන බැලුවේ නැහැ. මේවායින් මට වැඩක් නැහැ, මේවා ගැන මම මොනවටද පොර බදන්නේ, මේවා හදන්නට ගියොත් මාවත් ඉවර වෙයි, ඒ නිසා මේවා හදන්නේ නැතිව සම්පූර්ණයෙන්ම පැත්තකට තල්ලු කර දමා, මම මේක වෙන කාටවත් භාර දෙනවාය යයි හිතාගෙන තමුන්නාන්සේ කටයුතු කලා. තමුන්නාන්සේගේ පැත්තෙන් බැලුවාම ඒක බොහොම ප්‍රශස්ත වැඩක් හැටියට පෙනෙනවා. තමුන්නාන්සේ එහෙම කළේ තමුන්නාන්සේගේ බේරීමටයි. නමුත් රටේ ප්‍රගතිය සම්බන්ධයෙන් බලනවිට මේවාගේ දෙයකින් එතරම් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ.

මේ සංස්ථාවල වැඩ කළ සේවකයන් අතුරින් විදේශීය ශිෂ්‍යත්ව ලබා අධි පුහුණුව ලබා, අධි ශිෂ්‍යත්ව ලබා රෙදි විවීම සම්බන්ධයෙන් අවුරුදු හත, අට, දහය නොයෙක් විධියේ පුහුණුව ලත් දක්ෂ පුද්ගලයන් අපි බිහි කලා. ඒ විධියේ පිරිසක් බිහි කර සිටිනවා. නමුත් ඒ අයට වැඩ නැහැ. ඒ අය වැඩට ගන්නේ නැහැ. දැන් ඒ කර්මාන්තශාලා පාලනය කරන උදවිය කරන්නේ ඒ උදවියට ඕනෑ අය තෝරා ගැනීමයි. සමහර විට ඉන්දියාවෙන් එහෙම නැත්නම් ඒ උදවියගේ රටවලින් ඒ අය ගෙන්වා ගන්නවා. ඒ කොම්පැණිවල යම්කිසි විශේෂඥයින් කියා පිරිසක් ඉන්නවා. ඇත්තම කියනවා නම් ඒ අය සමහර විට විශේෂඥයින් නොවෙයි. " ටෙක්නිකල් ට්‍රේනිං " එකක් පමණක් ලැබූ උදවියයි. ඒ විධියේ එක්කෙනෙක් මේ රටට ගෙනැවිත් රුපියල් හතලිස් දහසක්, නැත්නම් පණස් දහසක් පඩි ගෙවනවා. අවුරුදු හත අට පුහුණුව ලැබූ අපේ රටේ උදවිය නොයෙක් තැන්වල සිටිනවා. එක් එක් විෂයයන් සම්බන්ධව වෙන වෙනම පුහුණුව ලැබූ අය සිටිනවා. එයින් සමහර උදවිය අදත් ගෙවල්වල සිටිනවා. අපට අද තැනක් නැහැයි කියා ඒ උදවිය අප සමඟ කියනවා. එයින් පෙනියන්නේ මොකක්ද ? මේ නිසා අපේ රටේ විශේෂඥයින් පහළ වෙන්නෙත් නැහැ. රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් දක්ෂතාවය ඇති අපේ රටේ පුද්ගලයෙකුට තැනක් ලැබෙන්නෙත් නැහැ. විදේශීයයන් ඒවාට ඇවිදින් කටයුතු කිරීම නිසා අපේ අයගේ තිබෙන වැඩීම සම්පූර්ණයෙන්ම ඇනහිටිනවා. මෙය කල්පනා කළ යුතු ප්‍රශ්නයක්. පමාවී වුවත් අද පටන් හෝ හැම දෙයකදීම අපේය කියන හැඟීම මුල් කොට ගන්න ඕනෑ. අපේය කියන හැඟීම උඩ, අපේ අමු ද්‍රව්‍ය යොද, අපේ මිනිසුන් ලවා, අපේ කර්මාන්ත අපට මූලික වශයෙන් දියුණු කරන්නට පුළුවන් නම් එය තමයි, ලොකුම දේ. අපේ මිනිසුන්ගේ තිබෙන දක්ෂතාවයන් වැඩිදියුණු කරනවා වෙනුවට ඒ අයගේ දක්ෂතාවයන් බිඳ දැම්මට කටයුතු සිදු කරනවා නම් එය අපේ තිබෙන ලොකු අදක්ෂතාවක්. අපේ තිබෙන නොසැලකිලිමත්කමක්. එහෙම කලොත් අපි කළ වැඩය වැරදියි කියා කවද හරි අපට ආවර්ජනය කරන්නට සිදු වෙනවා.

එම නිසා මේ අපේ තිබෙන දේවල් කොම්පැණි ක්‍රමයට දීම ගැන නැවතත් කල්පනා කර බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙනුත් නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා. අපේය කියන දේ ගම් මට්ටමෙහි සිට ඇති වෙන්නට ඕනෑ. අද ගම්බදව තිබෙන " විවින් " එක ගැන කාගේවත් සැලකිල්ලක් නැහැ. පේෂකර්ම දෙපාර්තමේන්තුවේත් සැලකිල්ලක් නැහැ. පේෂකර්ම අමාත්‍යාංශයේත් සැලකිල්ලක් නැහැ. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේත් සැලකිල්ලක් නැහැ. ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේත් සැලකිල්ලක් නැහැ. ගමකට අමාත්‍යාංශ ගණනාවක බලපෑම තිබෙනවා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා (නියෝජ්‍ය කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)**

**(திரு. என். டென்சில் பெர்னாண்டோ — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் பிரதி அமைச்சர்)**

**(Mr. N. Denzil Fernando–Deputy Minister of Industries & Scientific Affairs)**

අපේ කර්මාන්ත බොහොමයක් දැන් සිංහල විශේෂඥයින් පාලනය කරනවා. ඒවාගේ තමයි, ඔය අමාත්‍යාංශයටත් වෙන්නේ. අපි ඒක බොහොම ඉක්මනට ගන්නවා. භය වෙන්න එපා.

වසන්ත උදයරත්න මහතා (අරනායක)

(திரு. வசந்த உதயரத்ன — அ,ர,நாயக்க)

(Mr. Wasantha Udayaratna–Aranayaka)

Then you will repent.

**ආනන්ද දසනායක මහතා**

**(திரு. ஆனந்த தஸநாயக்க)**

(Mr. Ananda Dassanayake)

නියෝජ්‍ය කර්මාන්ත ඇමතිතුමාට මම කවදත් ගරු කරනවා. ඇත්ත වශයෙන්ම එතුමා නැත්නම් කර්මාන්ත අමාත්‍යාංශය ඉවරයි. එතුමාට පින්සිදු වන්නට තමයි, යන්තම් හරි ඒක ගෙන යන්නේ.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**

**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**

**(Mr. N. Denzil Fernando)**

කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තිබෙන්නේ සිකුරාදටයි. කරුණාකරලා එදට ඇවිදින් ඒ ගැන කථා කරන්න. අද තිබෙන්නේ පේෂකර්ම අමාත්‍යාංශයයි. ඒ නිසා කරුණාකරලා සිකුරාදට එන්න. අපි එදට ඉන්නවා. අපි එදට උත්තර දෙන්නම්. එදට අපි කරපු ඒවා කියනවා. භය වෙන්න එපා. අපේ ජනාධිපති උතුමාණන්ගේ ආණ්ඩුව ගැන කියන්නට අපි එදට ලෑස්ති වෙලයි එන්නේ. එන්න ! අපි භය නැහැ.

**ආනන්ද දසනායක මහතා**

**(திரு. ஆனந்த தஸநாயக்க)**

**(Mr. Ananda Dassanayake)**

උතුමාණන් ගැන කොච්චර වර්ණනා කළත් ඔය තත්ත්වයෙන් ඉහළට නම් යන්නට ලැබෙන්නේ නැහැ. ඔය මට්ටමත් වැඩියි කියලයි උන්වහන්සේ හිතිල තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

මන්ත්‍රීතුමා ! " තට්ටය " කියන එක පුද්ගලික දෙයක්. ඕවා මේ ගරු සභාවේ කියන වචන නොවෙයි. ඒවා ඕනෑ නැහැ. මෙතැන තිබෙන්නේ මහජනතාව වෙනුවෙන් කථා කරන්නටයි. මගේ ඔළුවේ හිසකෙස් නැහැයි කියන එක කිව්වාට තමුන්නාන්සේට මේ රට දියුණු කරන්නට බැහැ. ජාතික මට්ටමින් මේ රට වෙනුවෙන් කථා කරන්න. ඒකයි ඕනෑ කරන්නේ. මගේ ඔළුවේ හිසකෙස් තිබුණත් නැතත් ඒක තමුන්නාන්සේට ඕනෑ දෙයක් නොවෙයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඒක නොවෙයි මම තමුන්නාන්සේට කිව්වෙ. තමුන්නාන්සේට ඔය තිබෙන තැනට වඩා උසස්වීමක් අවශ්‍ය නම් ඔයිට වඩා වෙනස් ක්‍රමයකට යන්න කියලයි මම කිව්වෙ.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

ඒ උසස්වීම තමුන්නාන්සේට දෙන්න බැහැ. ඒක කරන්න පුළුවන් ජනාධිපති උතුමාණන්ට පමණයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඒක ලැබෙන්නෙ නැහැ කියන එකයි, මගේ ගැහීම.

ගරු සභාපතිතුමනි, එතුමා මගේ මිත්‍රයෙක්. මම තරහවෙන්නෙ නැහැ. එතුමා තරහවෙන්නෙත් නැහැ.

මම ගම ගැනයි කියාගෙන ආවෙ. ගමේ තිබෙන පේෂකර්ම ආයතන නැත්නම් විවිං මධ්‍යස්ථාන සම්බන්ධවයි මම කියාගෙන ආවෙ. ඒ මධ්‍යස්ථානවලට දුන් සම්පූර්ණ ආධාරයම, කෙළින්ම අමාත්‍යාංශයෙන් නැත්නම් දෙපාර්තමේන්තුවෙන් දීමේ ක්‍රමයක් තිබුණා. ඒවා බලාගැනීම, පරිපාලනය කිරීම, ඒවාට ක්‍රමානුකූලව නූල් සැපයීම ආදිය කෙළින්ම කෙරුණා. නමුත් ඒ හැම දෙයක්ම දැන් අඩපණවී තිබෙනවා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ තමුන්නාන්සේ අර " කලකට පස්සේ වෙලකට බැස්සේ " කිව්වා වාගේ මටත් එව්වා විවිං මධ්‍යස්ථාන තුනක් නම්කර එවන්න කියා. අපි ඒවා නම්කර එව්වා, බොහොම සන්තෝෂයෙන්. මොකද, අර " නිකම් ඉන්න මට අහලා ගියත් ඇති " කිව්වා වාගේ කිසිම පිළිසරණක් නැතුව සිටින, ඒවායේ සේවය කළ අය වෙනුවෙන් ස්ථාන තුනක් බැගින් අවුරුද්දකට දියුණු කරන්නට පුළුවන් වුණාම අවුරුදු කිහිපයකදී සැලැස්මක් ඇතුව මුළු ආසනයේම තිබෙන විවිං මධ්‍යස්ථාන දියුණු කරන්නට ලැබෙයි කියා හිතාගෙන අපි ලියා එව්වා. නමුත් ඒවා සම්බන්ධයෙන් තවම කිසිවක් වෙලා නැහැ. මම ඇමතිතුමාට කියන්නේ මේ ගැන සොයා බලන්නය කියලයි. අපි යම්කිසි ක්‍රියා පටිපාටියක් යෙදුවා නම් ඒක ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. අපි විශ්වාසය තබන්නේ ගරු ඇමතිතුමා ගැනයි. ඒ නිසා මම ඇමතිතුමාට කියනවා මේ මධ්‍යස්ථාන තුන පමණක් නොවෙයි කලින් තිබුණු සියලුම විවිං මධස්ථාන ඒ තිබුණාට වඩා දියුණු කර ඒ ස්වදේශීය රෙදිපිළි නිෂ්පාදනයේ දුර්වලකම් තිබෙනවා නම් ඒවා ටිකෙන් ටික, අඩියෙන් අඩිය, පඩියෙන් පඩිය ක්‍රමානුකූලව දියුණු කරන්න කියා.

ගම දිහා බලන්න ඕනෑ. දැන් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් ගම අතහැර දමා තිබෙනවා. ගමට සහායක් නැතිවී තිබෙනවා. ඒක වැරදියි. හැම ගමකටම හැම අමාත්‍යාංශයකම සහාය ලැබෙන්නට ඕනෑ. එවිටයි මුළු රටම දියුණු වෙන්නෙ. එක එක කොටස් වෙන් කරන්නට බැහැ. එනිසා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ආධාරයත් ගමට ඕනෑ. " ඉන්ටර් ග්‍රේටඩ් රූරල් ඩිවෙලොප්මන්ට් ප්‍රෝගෑම් " එක තිබෙනවා. ඒ මඟින් දැන් දිස්ත්‍රික්ක තුන හතරක් එකතු කර සැකිල්ලක් සාදගෙන යනවා. මේ අමාත්‍යාංශයත් ඒකට එකතු වුණොත් ස්වදේශීය කර්මාන්ත දියුණු කරන්න පුළුවන්.

ගරු සභාපතිතුම්, රුසියාවේ හැම ගමකම ග්‍රාමීය කර්මාන්තයි දියුණු කරන්නේ. ගම්බද කර්මාන්ත දියුණු කරන්නෙ. මම ගියා ඒවා බලන්න. ඒවායේ නිෂ්පාදනය කරන දේ විකිණීමේ මධ්‍යස්ථාන මඟින් එහි යන හැම සංචාරකයකුටම ඒවා " සුවනියර්ස් " හැටියට විකුණනවා. ඒවා විශේෂ අඩු මිලකට විකුණනවා. ඒ අයට මුදල් ආදිය නැතුව නොවෙයි. විශාල කර්මාන්ත නැතුවා නොවෙයි. ඒවා දියුණු රටවල්. ඒ දියුණු රටවල් හැම එකක්ම බලන්නේ ස්වදේශීය කර්මාන්ත කෙරෙහි යම් දක්ෂතාවයක් තිබෙනවා නම් ඒවා ක්‍රියාත්මක කර ඒ ජනතාවගේ ජීවන රටාව ගෙන යාමට උදව් දීමයි. ඊට වඩා සංවර්ධනයක් රටකට නැහැ.

ගරු ඇමතිතුමනි. අනික් හැම අංශයක්ම ගමේ තිබෙන අයිතිවාසිකම් වැඩි කිරීමට කටයුතු කරගෙන යද්දී තමුන්නාන්සේගේ අමාත්‍යාංශය ගමෙන් ඈත්වෙනවා. මම ඒ ගැන කණගාටු වෙනවා. මම මේ ගැන එදත් කිව්වා. තමුන්නාන්සේ පමණක් ගම අත්හැර විශාල කොම්පැණි ක්‍රමයට ඒවා භාර දී රෙදි මීටර මෙපමණ ගණනක් නිෂ්පාදනය කළා කියන හැඟීම දීම ප්‍රමාණවත් නැහැ. ඒ මොකද ? මේ අමාත්‍යාංශය මිනිසාට වුවමනා දෙවැනි වැදගත්ම දේවල් රෙදිපිළි නිෂ්පාදනයට සම්බන්ධ නිසයි. කෑම ළඟට අවශ්‍ය වන දේ රෙදිපිළි . ඒ නිසා මේ අමාත්‍යාංශයේ කටයුතු දියුණු කරන්න ඕනෑ. මුළු රටේම ගෞරවය ලැබෙන පරිදි දියුණු කරන්න ඕනෑ. ඉන්දියාවට දේශපාලන නිදහස ලැබුණේ මහත්මා ගාන්ධිගේ චරක ව්‍යාපාරය නොහොත් කදර් වස්ත්‍ර ව්‍යාපාරය නිසානම් [බාධා කිරීම්] එක්කෙනෙක් කථා කරනවානම් උත්තර දෙන්න පුළුවන් [බාධා කිරීම්] ඔව්, රෙදි තිබෙනවා. සමහර රෙදි නැති වන අවස්ථාත් තිබෙනවා. [බාධා කිරීම්] why are you hiding you your face ? ටිකක් නැගිටලා කථා කරන්නකෝ ? නිකම් මූණ හංගාගෙන කථා කළාම කොහොමද උත්තර දෙන්නෙ ?

මම කියාගෙන ආවේ අපේ රටේ ජීවය තියම විධියට සකස් කරන්නනම් අපේ ග්‍රාමීය කර්මාන්ත ටික අපි දියුණු කරන්න ඕනෑ බවයි. අපි හැමදමත් කියනවා ගමත් නගරයත් එකක් කරන්න ඕනෑය කියා. ගිරවුන්ගේ කීමක් වාගේ හැම කෙනෙක්ම කියනවා ගම නගරයට වඩා ඉහළ තත්ත්වයට ගන්න ඕනෑය කියා. නමුත් ගමට බෙදන හැන්ද කුඩා වෙලා. හැම අමාත්‍යාංශයක්ම ප්‍රචාරය කරනවා, වේදිකාවෙ කෑ ගහනවා. නමුත් ගම දෙස ඇහැ ඇරලා බලන්නෙ නැහැ. ඉතින් මන්ත්‍රීවරුන් වන අපිටයි මේ බර එන්නෙ. ඉතින් ගමේ මිනිස්සු ඇවිත් කෑ ගහන කොට අපි හැම එක්කෙනාටම බොරු ගහනවා. "ලබන සුමානෙ දෙන්නම්, ඊළඟ මාසෙ දෙන්නම් " ආදි වශයෙන්. එහෙම නොකියා අපට කටයුතු කරන්න බැහැ. මේ අනුව ඇත්ත වශයෙන්ම අපි දෙගොල්ලම යෙදෙන්නේ වංචනික, බොරු ව්‍යාපාරයක බවයි ප්‍රකාශ කරන්න සිදුවී තිබෙන්නෙ.

මම එකක් කියන්නම්. ඉස්සෙල්ලා ආණ්ඩුව කළ එක වැරදි නම් ඒක වැරැද්දයි. ඒ ආණ්ඩුව වැරදි කලා නම් ඒක වැරදිමයි. මේ ආණ්ඩුව වැරදි කරනවානම් ඒකත් වැරදිමයි. කවුරු කළත් වැරැද්ද වැරැද්දමයි කියා අපි පිළිගන්න ඕනෑ.

මේ කටයුතු ටිකක් නියෝජ්‍ය ඇමතිතුමාට භාර දෙන්න. ආණ්ඩුවටවත් කැබිනට් මණ්ඩලයටවත් නොවෙයි මම කියන්නෙ. මම ඒවාට අත ගහන්නෙ නැහැ. මම ඇමතිතුමාටයි කියන්නෙ, එතුමාට වැඩ වැඩිනම් එයින් අර මම කිව්ව කොටස නියෝජ්‍ය ඇමතිතුමාට භාර දෙන්නය කියායි. එතුමාට හොඳ පලපුරුද්දකම් තිබෙනවා. මේ ග්‍රාමීය කර්මාන්ත අංශයට සම්බන්ධ විමේ කටයුතු ටික සකස් කරන්න නියෝජ්‍ය ඇමතිතුමාට භාර දෙන්න. තමුන්නාන්සේලාට තව අවුරුදු පහක් කරන්න තිබෙනවානම් ඒ අවුරුදු පහ ඇතුළත ඒ ටික හරි ගස්සා දෙන්න කියා නියෝජ්‍ය ඇමතිතුමාට භාර දෙන්න.

**එන්. ඒ. සෙනෙවිරත්න මහතා (කෑගල්ල දිසා ඇමතිතුමා)**
**(திரு. என். ஏ. செனெவிரத்ன — கேகாலை மாவட்ட அமைச்சர்)**
(Mr. N. A. Seneviratne–District Minister, Kegalle)

දැන් තුන තුන හදගෙන යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

"තුන තුන හදගෙන යනව" කිව්වට ඒකත් තවම හදලා නැහැ. මම තුනක් තම් කර එව්වා තමුත් මට ඒවා ලැබුණෙ නැහැ කියා මම ලියා එව්වා. අපට එකක් හරි කමක් නැහැ ලැබෙනවානම්. අපි ඉන්නෙ කෙසේ හෝ ජනතාවගේ ප්‍රශ්න විසදන්නයි. තමුන්නාන්සේ දන්නවා මේ විවිමේ සේවිකාවන් එද මුදලින් ගත්තේ රු. 125 ක 130 ක තරම දීමනාවක්. ඒක ඒ අයගේ මුළු පවුලම නඩත්තු කරන්නත එද ප්‍රමාණවත් වුණා. ලෙඩින් හිටිය අම්මට උප සත්කාර කරන්න, ලෙඩින් හිටිය පියාට උප සත්කාර කරන්න, නංගිල මල්ලිලාට ඉගෙන ගැනීමට විය පැහැදම් කරන්න, ඒ අයගේ වෙනත් ඕනෑ එපාකම් බලන්න, සමහර විට ගේ අලුත්වැඩියා කර ගන්න පවා එද හැටියට ඒ ගොල්ලන්ට පුළුවන් වුණා.

**එන්. ඒ. සෙනෙවිරත්න මහතා**
**(திரு. என். ஏ. செனெவிரத்ன)**
(Mr. N. A. Seneviratne)

හාල් සේරුව රුපියල් දහය කාලෙද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේට ඒ ගැන මම කියන්න යන්නෙ නැහැ. අද හාල් සේරුව රු. 14 යි, රු. 10 නොවෙයි. තමුන්නාන්සේ වලිගෙ පාගාගන්නෙ නැතිව තිකම් හිටියොත් හොඳයි. අද රුපියල් දහතරට නැගලා තිබෙන්නේ. ගරු ඇමතිතුමා මේ විවිම මධ්‍යස්ථාන නගාසිටුවන්න ඕනෑ. මට විශේෂයෙන් වුවමනා කරන්නේ ඒකයි. මේ අවුරුද්දේ මේ සම්බන්ධයෙන් තමුන්නාසේ තිසි පියවර තබන්න. තව අවුරුදු පහක් තිබෙනවා. අවුරුදු පහක සැලැස්මක් දීමා මේ මධ්‍යස්ථාන නගා තැබීමට කටයුතු යොදන්න.

1978 දී තමුන්නාන්සේලා ඒවා අඩපණ කලා. [බාධා කිරීම්] නැ. නැ. ඒ ගැන වාර්තා තිබෙනවා. තමුන්නාන්සේ කියන දේ මම පිළිගන්නේ නැහැ. මම කියන දේ තමුන්නාන්සේ පිළිගන්නත් එපා.

**විජයපාල මෙන්ඩිස් මහතා (පේෂකර්ම ඇමතිතුමා)**
**(திரு. விஜயபால மெண்டிஸ் — புடைவைத் தொழில் அமைச்சர்)**
(Mr. Wijayapala Mendis–Minister of Textile Industry)

අපි නොවෙයි, අඩපණ කළේ. තමුන්නාන්සේලා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඒ ගැන වාර්තා තිබෙනවා. ඒවා බැලුවාම හරි. ඒ වාර්තා ඉදිරිපත් කර තිබෙන්නේ පරීක්ෂණ කරලයි. අපි දෙන්නාටම මේ ගැන කරුණු කියන්න පුළුවන්. තමුන්නාන්සේට 'නැහැ' කියන්න පුළුවන්. මට 'ඔව්' කියන්න පුළුවන්. අපි මොනවා කිව්වත් ඒවායින් කවුරුවත් රවටන්න පුළුවන් වන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම පසුගිය කාලයේදී ඒවා අඩපණ වුණා. තමුන්නාන්සේ හිතාමතාම හෝ නොසලකා හැරීමෙන් හෝ එසේ වුණා. එක් අංශයක් ගැන බැලුවා. අනෙක් අංශය ගැන බැලුවේ නැහැ.

දැන් මම ඉල්ලා සිටින්නේ ග්‍රාමීය කර්මාන්තයක් වශයෙන් විවිම මධ්‍යස්ථාන ටික දියුණු කර උච්ඡස්ථානයකට ගෙනැවිත් අපේ මිනිසුන් තුළ රෙදි කර්මාන්තය පිළිබඳ දක්ෂතාවක් ඇති කරන්න ඕනෑ බවයි. විදේශිකයන්ගේ දක්ෂතා තිබෙනවාය කියා අපි ඔවුන් මෙහි ගෙන්නාගෙන උන්ගේ දක්ලතා පෙන්නුම් කරනවා. තමුත් ඒ කොම්පැණිකාරයන් සමහර විට අපටත් ටිකක් දීලා උන් වැඩිපුර අරගෙන යනවා. ඒක නොවෙයි අපට වුවමනා කරන්නේ. අපේ අයගේ හැකිම් ඇතිකරලා අපේ අය ධෛර්යමත් කරලා අපේ අයට මේ පිළිබඳ ශිෂ්‍යත්ව ආදී නොයෙක් දේ දීලා ඔවුන් නගා සිටුවීමයි, අපේ පරමාර්ථය විය යුත්තේ.

මට ලැබුණු ලිපියක් අනුව කරුණක් කියන්න කැමතියි. මම මීට ඉස්සරත් මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කලා. බලවේග පේෂකර්ම මධ්‍යස්ථාන ගැන මම කීපවතාවක්ම ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්න ඇහුවා. එතුමා මට උත්තර දුන්නා. ඉතා ඉක්මනින් ඒවායේ තත්ත්වය සතුටුදායක වන අන්දමට කටයුතු සකස් කරන බව එතුමා කිව්වා. එය කොපමණ දුරට ඉෂ්ට වී තිබෙනවාදැයි මම දන්නේ නැහැ. නැවතත් අපට ලියුමක් ලැබී තිබෙනවා. එය කියවන්න කැමතියි :

"සුහසාධක සංගමය,
බලවේග පේෂකර්මාන්ත වැඩපල,
තලාතුඔය, 84.11.26

හේවාහැට ශ්‍රී. ල. නි. ප. සංවිධායක මහතා මගින්,
විරුද්ධ පක්ෂ නායක ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා,
ශ්‍රී. ල. නි. ප. ප්‍රධාන කාර්යාලය,
ඩාර්ලි පාර,
කොළඹ.

මැතිතුමනි,

**පේෂකර්ම දෙපාර්තමේන්තුව මගින් පුද්ගලික අංශයට පවරාදුන් බලවේග පේෂකර්ම ආයතන සම්බන්ධයෙනි**

පේෂකර්ම දෙපාර්තමේන්තුව මගින් පාලනයවූ ලේවැල්ල බලවේග පේෂකර්ම ව්‍යාපාරයට අයත් තලාතුඔය, ගලගෙදර, හඟුරන්කෙත, උඩුනුවර, යටිනුවර සහ තෙල්දෙනිය යන ආයතන හය (6) 1982 පෙබරවාරි මස 01 වෙනි දින සිට සීමාසහිත ලක්ව්ව් සමාගම නමැති පුද්ගලික සමාගමට පවරණ ලදි. එම පැවරීමේදී පේෂකර්ම දෙපාර්තමේන්තුව මගින් සියළුම සේවකයින්ට ලිඛිතව කොන්දේසි මාලාවක් ලබාදී ඇත."

සේවක අයිතිවාසිකම් සම්බන්ධයෙන් කොන්දේසි තිබෙනවා.

"කොන්දේසි නම් පුද්ගලික අංශයට සේවකයින් පවරා ඇතත් දෙපාර්තමේන්තුව විසින් එම විඳිනාලද සියළුම වරප්‍රසාදයන් තවදුරටත් පුද්ගලික සේවා යෝජකයා යටතේද බුක්ති විඳීමට අයිතිවාසිකම් ඇති බවයි."

මේක ගරු ඇමතිතුමා කිව්වා.

"පේෂකර්ම අධ්‍යක්ෂතුමා ලිඛිතව එසේ සේවකයින්ට පොරොන්දු දී ඇතත් අද පුද්ගලික සේවා යෝජකයා යටතේ ඒ කිසිවක් ලැබී නැත. එබැවින් කරුණාකර අප සේවක සේවිකා දහස ගණනකගේ අනාගත යහපත තකා පහත සදහන් කරුණු ගැන මැති සබයේදී අයවැය කාරක සභා අවස්ථාවේ හෝ වෙනත් දිනක මේ කරුණු ඉදිරිපත් කර මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන අපහට ලැබිය යුතු දීමනාවන් ලබා දෙන්නේ නම් මැනවි.

1. වැඩිවන ජීවනාධාර දීමනා කිසිවක් ලැබී නැත. එහෙත් ඒ වැඩිවන සෑම ජීවනාධාර දීමනාවක්ම ගෙවනු ලබන බැව් කොන්දේසි පත්‍රයෙහි 3 ඡේදයේ II කොටසේ සටහන්ව ඇත. දැනට ලැබෙනුයේ ර. 140/- ක් පමනි."

දැන් ලැබෙනවාය කියන්නේ රුපියල් එකසිය හතළිහක් පමණයි.

"ඊටපසු තුන් වතාවක්ම ජීවනාධාර දීමනා වැඩිකර ඇතත් අපහට ඒ කිසිවක් ලැබී නැත."

ඒ සේවකයන්ට ලැබෙන්නේ රුපියල් 140 ක් පමණයි.

"වැටුප් වර්ධන ගෙවනු නොලබයි. ඒවාද ගෙවනු ලබන බවට තුන්වෙනි (3) ඡේදයේ I කොටසේ සටහන්ව ඇත."

"නිවාඩු දුම්රිය බලපත්‍ර අනුග්‍රහය අහිමි කර ඇත. එහෙත් 4 වැනි ඡේදයේ II වැනි කොටසේ එම අනුග්‍රහය දිය යුතු බැව් සදහන්ව ඇත."

අමාත්‍යාංශයෙන් මේවා නියම කර තිබෙනවා. තමුත් පෞද්ගලික අංශය මේවා පැහැර හරිනවා.

"1982 පෙබරවාරි සිට මේ වන තුරු අර්ථසාධක අරමුදල් වැටුපෙන් අයකර ඇතත් මේ වන තුරු එකම රිසිට් පතක්වත් ලැබී නැත."

මෙය හුඟක් තැන්වල කරන වැඩක්. මෙය දැනගත්තා විට හුඟක් කොම්පැනිකාරයින් ඒ ආයතන වසා දමා ගිහින් අවසානයි.

". . . ඒවාද වංචනික ලෙස තබා ගත්තා බැව් දැන ගැනීමට ලැබී ඇත."

මේ අනුව බලන විට සේවකයන්ගේ මූලික අයිතිවාසිකම් රාශියක් උල්ලංඝනය කර තිබෙනවා. මම මේ සදහන් කළේ "ලක්ව්ව්" සමාගම ගැනයි. අන්න ඒ වගේ වන් සමාගමක් මගේ ආසනයේත් කටයුතු කර තිබෙනවා. මගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආසනයේ සංගිලිපාලම බලවේග පේෂකර්ම මධ්‍යස්ථානයත් වසා දැම්මා. ඒ වගේම නුවරඑළිය දිස්ත්‍රික්කයේ මේ වගේ බලවේග පේෂකර්ම මධ්‍යස්ථාන පහක් භාර දී තිබුණා. "ජ—ලංකා ටෙක්ස්ටයිල් මිල්ස්" සමාගමට භාර දුන්න ඒ පෙහෙකම් හල්වලට මොකද වුණේ ? ඒ ජර්මන් කාරයා පැදුරටත් නොකියා යන්න ගියා. ඒ වගේ ආයතන භාර ගත්ත පුද්ගලයෙක් අවුරුද්දක් යන්න කලින් යන්න ගියා. ඔහුට ඕනෑ කරන මුදල සොයා ගෙන පැනල ගියා. සේවකයන් දන්නෙත් නැහැ, වෙන කවුරුත් දන්නෙත් නැහැ. සේවකයන්ට මාස තුන හතරක පඩි ගෙවලත් නැහැ. දැන් ඒ මිනිසුන්ට රක්ෂාවත් නැහැ. මේ බලවේග පේෂකර්ම මධ්‍යස්ථානවල සේවකයන් 1,300 ක් පමණ සිටියා. අද 1,300 ක් පමණ පිරිසක් රැකියා නැතිව සිටිනවා. අපි කෙනෙකුට රක්ෂාවක් සොයා දෙන්න කොයි තරම් උත්සාහ කරනවාද ? තිබුණ රක්ෂාවලුත් නැතිව යන විට රටටත් එයින් ලොකු පාඩුවක් සිදුවෙනවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා ( පේෂකර්ම නියෝජ්‍ය ඇමතිතුමා)**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா — புடைவைத்தொழில் பிரதி அமைச்சர்)**
(Mr. R. M. Dharmadasa Banda–Deputy Minister of Textile Industry

සේවකයන් 1,300 ක් ඉන්නවාද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඔව්. නුවරඑළියේ මධ්‍යස්ථාන පහක් වසා දැම්මා. ඒ වගේම සංගිලි පාලම මධ්‍යස්ථානය වසා දැම්මා. එතැනත් සේවකයන් 400 ක් පමණ සිටියා. මට මේ සංඛ්‍යා ලේඛන පෙන්වන්න පුළුවන්. පසුගිය අවුරුද්දේදී මේ සංඛ්‍යා ලේඛන සියල්ලම මම දුන්නා. එතකොට ඒ විදේශීය කොම්පැනිකාරයා කළ වරදට විශාල පිරිසකට රැකියා නැතිව ගියා. ඒ කොම්පැනිකාරයා මෙහාට ඇවිත් ලංකාවේ උදවියත් සමග කොම්පැනියක් අටවා ගත්තා. ටික දුරක් ගියා. ඔහුට ඕනෑ කරන මුදල සොයා ගත්තා. ඔහු හෙමිහිට යන්න ගියා. මේ කොම්පැනිවලින් කරන හානිය ගැන විශේෂයෙන් අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමා වගකීමක් ඇතිව ඒ කොම්පැනිවලට මේවා භාර දෙනවා. අපටත් කිව්වා, භය වෙන්න වුවමනාවක් නැත කියා. නමුත් අර සේවකයන්ට වැඩ කළ කාලයට පඩිනඩි ගෙවලත් නැහැ. ලැබිය යුතු කිසිම වරප්‍රසාදයක් ලබා දී නැහැ. අන්තිමට ඔවුන්ට රක්ෂාවත් නැතිව ගියා. ඒ නිසා බලවේග පේෂකර්ම මධ්‍යස්ථාන පහේ වැඩ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමාට හෝ භාර දී නැවත එහි වැඩ කටයුතු ආරම්භ කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සේවකයන් කැඳවා නැවත ඒවායේ වැඩ ආරම්භ කරනවා නම් එයින් ලොකු සේවයක් වෙනවා. එහෙම නොකරනවා නම් එය අර සේවකයන්ට කරන ලද අසාධාරණයක් හැටියටයි අපි සලකන්නෙ. ඒ සේවකයන්ගේ සේවය නැතිවීම රටටත් ලොකු පාඩුවක්. ඒ නිසා ගරු ඇමතිතුමා ජාතික වශයෙන් කල්පනා කර දේශානුරාගයෙන් යුතුව, පොඩි වුණත්, දුර්වල වුණත් අපේ මිනිසාට තැනක් දිය යුතුය කියා කල්පනා කර, අපේ මිනිසුන්ට මෙය කවද හරි නඟා සිටුවන්න පුළුවන්ය කියන අදහස ඇතිව මේ කටයුත්ත පටන් ගන්න. ඉන්දියාවේ මධ්‍යස්ථානවල වුණත් සේවය කරන්නට පුළුවන්. ඒ අයට උගන්වන්නට පුළුවන් තරම් ශක්තියක් ඇති අය අපේ රටින් බිහි කරන්න පුළුවන් වේවිය කියන හැඟීමෙන් මේ කටයුත්ත පටන් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 3. 42

අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda–Baddegama)

පේෂකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ කාරක සභා අවස්ථාවේදී අදහස් කීපයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්න කැමතියි. විශේෂයෙන්ම මගේ කථාව පදනම් වෙන්නේ, තමුන්නාන්සේලා විදෙශ කළමනාකරණය ඇති කළාට පසුව සේවක කොටස්වලට මතු වූ ප්‍රශ්න පිළිබඳවයි. කොළඹ - ආසියා පදනම් ආයතනයේ කාර්යාලයේදී සේවකයින් 15,000 ක් පමණ නියෝජනය කරන වෘත්තීය සමිති නියෝජිතයින් රැස් කර ගරු ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළා, සංස්ථාවල කළමනාකරණය විදේශීය ආයතනවලට භාර දෙනවාය කියා. ඒ අවස්ථාවේදී ඒ වෘත්තීය සමිති නියෝජිතයින් එයට විරෝධය පළ කළා. ඇත්තවශයෙන්ම මේ විදේශීය කළමනාකරණයත් සමගම මේ සංස්ථාවල පරමාර්ථයක් හැටියට බලාපොරොත්තු වූ වැදගත් දෙයක් අහෝසි වුණා. ඒ වැදගත් දේ තමයි දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාත් ප්‍රකාශ කළ දෙයක් වන සංස්ථාවක් පිහිටුවීමෙන් සංස්ථාවෙන් නිෂ්පාදනයක් බිහිවීම බලාපොරොත්තු වෙනවා වාගේම ඒ සංස්ථාවේ සේවකයින්ගේ තත්ත්වය ගැනත් සැලකිලිමත් වෙන්න ඕනෑය කියන එක. සමහර වේලාවට යම් සංස්ථාවකින් පාඩු වෙන්න පුළුවන්. නමුත් එද වන විට සේවකයින් 15,000 ක් සංස්ථා පහක සේවයේ නිරතව සිටියා. ඒ 15,000 ජීවත්වීම ලක්ෂ ගණනක් ජීවත්වීමක් හැටියටයි, අපි සැලකිය යුත්තේ. පේෂකර්ම සංස්ථාවට අදාල කම්හල් පහේ පාඩු තිබුණත් සේවකයින් ලැබූ වැටුපෙන් ඒ අයගේ පවුල් ජීවත්වීමම ලාබයක් හැටියට අපට සලකන්න පුළුවන්. මොකද, රජය ලාබ උපදවන්නෙත්, සංස්ථා ලාබ උපද්දවන්නෙත් ජනතාව ජීවත් කරවන්නටයි.

විදේශීය කළමනාකරණය ඇතිවීමත් සමඟම මෙම සේවකයින් විශාල පිරිසක් සේවයෙන් ඉවත් කරනු ලැබුවා. මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නම් එක උදහරණයක්. තුල්හිරිය කම්හලේ සේවකයින් එම කළමනාකරණය විසින් ඉවත් කරනු ලැබීමෙන් පසුව ඒ අය කම්කරු උසාවියට ගියා. කම්කරු උසාවියේ අධිකරණමය රැකවරණය අපේක්ෂාවෙන් ඒ අය කටයුතු කළා. නමුත් කම්කරු උසාවියේ සහන පැතු ඒ සේවකයින්ට එම සහන ලබා ගැනීමට පුළුවන් වුණේ නැහැ. මේ විදේශීය කළමනාකරණය නිසා සේවය අහිමි වූ විශාල පිරිසක් අදත් රැකියා විරහිතව සිටිනවා. මේ අයට අධිකරණමය රැකවරණ නොලැබීමට හේතුවූ කරුණු මොනවාද කියන එක ගරු ඇමතිතුමා සොයා බැලුවොත් හොඳයි. ඕනෑම ආයතනයක කම්කරුවෙකුට තමන්ගේ සේවය අහෝසි වීමෙන් පසුව එසේ අහෝසි කිරීම අසාධාරණ නම් අධිකරණමය රැකවරණය ලබා ගත හැකිව තිබුණා. තුල්හිරිය කම්හලේ සේවක කොටස් වෙනුවෙන් පෙනී සිටීමට මටත් අවස්ථාව ලැබුණා. ඒ අයට උසාවියේ රැකවරණය පැතීමට අපහසු වුණේ ඇයිද කියන එක ගැන සලකා බලා, ඒ සේවය අහෝසි වූ පිරිස ගැන සානුකම්පිකව සලකා බලන්නය කියා ඉල්ලා සිටිනවා. එද ආසියා පදනම් ආයතන කාර්යකාලයේ පැවති රැස්වීමේදී ජනාධිපතිතුමාගේ ප්‍රකාශනයෙන් ඒ සේවක පිරිස් තුළ විශ්වාසයක් ඇති කළා, මේ කළමනාකරණය යටතේ සේවකයින්ට ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැත කියා. නමුත් ඒ කළමනාකරණය පාලනය භාර ගත්තාට පසුව සේවකයින් සැහෙන පිරිසකට සේවය අහෝසි වුණා. සංස්ථා පරමාර්ථයක් වශයෙන් ඒ සේවකයින්ගේ සුභසාධනයත් ඒ සේවකයින් ලබන වැටුපත් රටට ලාභයක් හැටියට අපි සැලකිය යුත්තේ. එම නිසා කළමනාකරණය භාර ගත්තාට පසුව ඒ අලුත් කළමනාකරණය යටතේ ඒ සේවකයින්ට ලැබුණු දීමනා පිළිබඳවත් ඔවුන්ගේ සේවා ස්ථිරත්වය පිළිබඳවත් අපි සැලකිලිමත් වුණොත් හොඳයි. මොකද, විදේශීය ආයෝජන සමාගම්වලට, නිදහස් වෙළඳ කලාපය තුළ තිබෙන සමාගම්වලට, විවිධ රැකවරණයන් මගින් පහසුකම් සැලසුවත් මෙම කම්හල් තවමත් ජාතික පේෂකර්ම සංස්ථාව නම්නුයි, ක්‍රියාත්මක වෙන්නේ. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළ විධියට ජාතික පේෂකර්ම සංස්ථාවේ සේවය කරන පිරිස්වලට හිමිවිය යුතු බෝනස්—පාරිතෝෂික දීමනා—වැටුප් වැඩිවීම් යනාදිය මෙම කළමනාකාරිත්වය යටතේත් ඒ සේවකයන්ට ලැබෙනවාද කියා විමර්ශනයක් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතුමනි, සංස්ථාවෙන් යම් පාඩුවක් සිද්ධ වුණා නම් එය සිද්ධ වුණේ කළමනාකාරිත්වයේ වරදින්ද නැත්නම් වෙන යම් වරදක් නිසාද කියන එක පිළිබඳව අපි සැලකිලිමත් වෙන්නට ඕනෑ. විශේෂයෙන්ම ජාතියටම අවශ්‍ය වන රෙදිපිළි නිෂ්පාදනයෙහි පාඩුදායක තත්ත්වයක් ඇති වුණා නම් ඊට හේතු වුණේ එම සේවක කොටස්වල සේවා තත්ත්වය පහත් මට්ටමකට වැටීම නොවෙයි. එහෙම වුණේ වෙළඳ පොල පිළිබඳ ප්‍රශ්නයක් නිසා නොවෙයි. ආනයනය කරන රෙදි සමඟ සසඳන විට අපේ රෙදිපිළිවෙල තත්ත්වය වර්ගීකරණය අඩු තත්ත්වයක තිබීමෙන් සමහර විට ඒවා අපේ වෙළඳ පොලේ අලෙවි නොවුවා වෙන්නට පුළුවනි. එහෙම නැතිව අර කොත්මලේ ගරු මන්ත්‍රීතුමාත් කියා සිටි විධියට පාඩු වුණේ සංස්ථාවේ සේවය කරන සේවක පිරිස්වලට රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳව විශේෂඥතාවයක් නොතිබුණු නිසා නොවෙයි. මෙම ක්ෂේත්‍රය පිළිබඳව විදේශීය තාක්ෂණික පුහුණුව ලැබූ ලාංකික සේවකයන් සැහෙන පිරිසක් ඒ සංස්ථාව යටතේ සේවය කළා. එවැනි සේවක පිරිසක් මේ රටේ ඉන්න අවස්ථාවක මෙසේ විදේශීය කළමනාකාරිත්වයක් ගෙන්වීම ලාභදායකද කියන එක ගැන මා ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

1977 දී ස්ථිර සේවකයින් 5,500 ක් සිටි තුල් හිරිය කම්හල කාර්යක්ෂම පාලනයක් සඳහා විදේශීය සමාගමකට භාරදී තිබෙනවා. එදා පන්දහස් පන්සියයක් ස්ථිර සේවකයන් හිටපු තැන අද ඉන්නේ ස්ථිරතාවයක් නැති—අනියම් තත්ත්වයේ—සේවා අයිතිවාසිකම් හරි හැටි නැති සේවකයෝ වික දෙනෙක්. ඒ සේවකයන් අද විදේශීය කළමනාකරණය යටතේ වැඩ කරනවා. අවශ්‍ය අවස්ථාවක නොයෙක් ක්‍රමවලට වුවමනා නම් ඒ සේවකයන් සේවයෙන් නෙරපන්නට පුළුවනි. එම නිසා ඒ විදේශීය කළමනාකරණයට ලාභයක් තිබෙන්න පුළුවනි. නමුත් මගේ විශ්වාසය නම් පන්දහස් පන්සියයක සේවකයන් හරිහැටි ජීවත් වුණා නම් නම්, ඒ තුළින් පවුල් පන්දහස් පන්සියයක් ජීවත්වීමේ ලාභය කියන එක මෙතැනින් ඉවත් වුණාය කියලයි. එම නිසා මා නැවත වතාවක් මතක් කරනවා විදේශීය විශේෂඥ පාලනය යටතේ ඇති වූ කාර්යක්ෂමතාවය සේවාවේ නියුක්ත වූවන්ට අපහසුතාවයක් සහිතව බිහි වූවක් නම් ඒ ලාභය ගැන නැවත සලකා බැලිය යුතු බව.

අනික් කාරණය මෙයයි: ඒක පසුගිය කාලයේ මින්නේරියේ ජනතාවන් ප්‍රකාශ කළ දෙයක්. අද මින්නේරිය රෙදි කම්හල වැටී තිබෙන තත්ත්වය බලන්න. සැහෙන සේවක සංඛ්‍යාවක් අඩ වැටුප් ලබමින්—සම්පූර්ණ සේවා කාලය නොලැබ අඩ වැටුප් ලබමින්—අද ඒ කම්හල පවත්වාගෙන යනවා. මින්නේරිය රෙදි කම්හල ඇත්ත වශයෙන්ම රජරටට තිබුණු ප්‍රධානතම රෙදි කම්හලයි. ඒ රෙදි කම්හල වැසී ගියොත් ඒ සේවක සේවිකාවන්ගේ ඉරණම කවර තත්ත්වයකට පත්වේදැයි ඒ අය දැනුත් කණස්සල්ලකින් පසු වෙනවා. මින්නේරිය රෙදි කම්හල යන්ත්‍රෝපකරණ සහිතව හොඳ පුහුණු ශ්‍රමිකයින් සැහෙන පිරිසක් ඇතිව හොඳට වැඩ කරගෙන ආ කම්හලක්. එය වසා දමන තත්ත්වයකට පත්ව තිබෙන්නේ මන්ද කියන කාරණය ගැන සොයා බැලිය යුතුයි. ඒ කම්හල නැවතත් යථා තත්ත්වයට පත් කරන්නට කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

මින්නේරිය කම්හලේ දැනට තිබෙන තත්ත්වය සමහර විට අද ලාභදායකය කියන වේයන්ගොඩ කම්හලේත් ඇති වෙන්නට පුළුවනි. මක්නිසාද ? කැටීමේ අංශය දැනට අකර්මන්‍යයි. ඒ වාගේම අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පිටරටින් රෙදි ගෙන්වන්නට දී තිබෙන ඉඩ නිසා සමහර විට තවත් අංශ ඇන හිටින්නට පුළුවනි. එවැනි තත්ත්වයක් ඇති වුණොත් මොකක්ද වෙන්නෙ ? මේ රටේ අමු රෙදි නිෂ්පාදනය කරන්නට බැරිකමක් තිබෙනවා නම් පිටරටින් ගෙන්වූවාට කමක් නැහැ. නමුත් පුළුවන්කමක් තිබියදී පිටරටින් අමු රෙදි ගෙන්වීම නිසා ඒ කම්හල වැසී ගියොත් වේයන්ගොඩ කම්හලේ තිබෙන ලාභදායී තත්ත්වයත් නැති වෙන්නට පුළුවනි. එමෙන්ම අපට ලැබී තිබෙන්නේ විදේශීය කළමනාකරණය පමණක් බව මම කියන්න කැමතියි. දැනුත් මේ කම්හල් පවත්වා ගෙන යනු ලබන්නේ අපේ බැංකුවලින් ලබා ගත් ණය මුදල්වලිනුයි. මට දැනගන්නට ලැබී තිබෙන අන්දමට රුපියල් 12 කෝටි 70 ලක්ෂයක් බැංකුවලට ණය තිබෙනවා. ඒ ණය මේ රටේ බැංකුවල මුදල්. ඒ ණයගැතිභාවය තිබෙන තුරු—ඒවා මේ රටේ මුදල්—මේ ආයතනවල ලාභදායී තත්ත්වය පිළිබඳව අපට ඒ තරම් සතුටු වන්නට පුළුවන්කමක් නැහැ.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) පෙන්වා දුන් කරුණක් මමත් මතක් කරන්නට කැමතියි. ඒ, සේවක කොටස්වල වැටුප් පිළිබඳ ප්‍රශ්නයයි. පසුගිය කාලයේ වේයන්ගොඩ කම්හලේ කවුරුවත් නොදන්නා ආකාරයට ඇතැම් කොටසකගේ වැටුප් වැඩිවීමක් සිදු වුණා. ජ්‍යෙෂ්ඨත්වය හෝ සුදුසුකම් ගැන සලකන්නේ නැතිව මේ වැටුප් වැඩි වුණේ කොහොමද කියන එක ගැන අවධානය යොමු කළොත් හොඳයි. ඒ වැටුප් වැඩි කිරීමේ ක්‍රමය පිළිබඳව සැහෙන සේවක පිරිසකගේ නොකැමැත්තක් හා අප්‍රසාදයක් තිබෙනවා.

තවත් කරුණක් තිබෙනවා. මේ කම්හල්වලින් සැම්පල් ගෙනයෑම යටතේ—පෙන්වන්නට රෙදි ගෙන යන විට—රෙදි කච්චි පිටින් ගෙන යන බවක් අපට දැනගන්නට ලැබී තිබෙනවා. එය වහාම නැවැත්විය යුතුව තිබෙනවා. රෙදිවල සැම්පලයක් සඳහා රෙදි කච්චියක් ගෙන යන්න ඕනෑ නැහැ. අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා කී පිළිවෙළට මේ කම්හල්වල සිදු වන ලාභ අඩු වීමට හේතු සොයා බලන්න. විශේෂයෙන්ම පේෂකර්ම සංස්ථාව ජාතික සංස්ථාවක් වශයෙන් පවතින නිසා ඒ සඳහා ජාතික වැඩ පිළිවෙළක් යෙදුවොත් ඉතා හොඳයි කියන එකයි, මගේ විස්වාසය.

අත්-යන්ත්‍ර පේෂ කර්මාන්තය ගැනත් වචන කීපයක් කියන්නට ඕනෑ. එක් දහස් නවසිය තිස් ගණන්වලදී බණ්ඩාරනායක අගමැතිතුමා රචනයක් කළා. "වරකය සහ ගොයම් කෙත" කියා එය ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත් ආසියාකරයේ බුද්ධිමතුන්ගේ සංවිධානය මේ රට තුළට ඇවිත්, රටේ වැඩ පිළිවෙළ රටේ අය විසින්ම හැසිරවීම ගැන අදහස් ප්‍රකාශිත ප්‍රථම ග්‍රන්ථයි. ඉන්දියාවේ ගාන්ධිතුමා ඇතුළු දේශප්‍රේමී කොටස් ඒ රටේ රෙදි ව්‍යාපාරය නැත්නම් රෙදි නිෂ්පාදනය පිළිබඳව ඒ අයගේ යොමු කිරීමත් ඒ කාලයේ කළා. ආසියාකරයේ වෙනත් ආසියාකරයේ රටවල ඒ ජාතික වැඩ පිළිවෙළ අවශ්‍ය අයත් ඒවා දියත් කළා. "වරකය සහ ගොයම් කෙත" කියන දෙක එකට සඳහන් කර ලිව්වේ ආහාර වගාව මෙන් හෙවත් ගොයම් කෙත වගේම රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳ වැඩ පිළිවෙළක් හුවා දක්වන්නටයි. මේ යටතේ ඉන්දියාවේත් ලංකාවේත් ගම් දනව්වල ඈත එපිට ගම්වල රෙදි නිෂ්පාදනය පිළිබඳ උනන්දුවක් ඇති වුණා. මම දන්නා විධියට අම්බලන්ගොඩ ආසනයේ පේෂකර්ම අත් යන්ත්‍ර 6,400 ක් පමණ ක්‍රියාත්මක වෙමින් තිබුණා. දකුණු පලාතේත් රටේ වෙනත් දිස්ත්‍රික්කවලත් සැහෙන පිරිසක් මේ අන්දමට ගම්වල ගෙවල්වල ඉඳගෙන මුදලක් උපයා ගැනීමේ ක්‍රමයක් ඇති කර ගෙන තිබුණා. විමධ්‍යගතව තිබුණු මේ වැඩ පිළිවෙළ කම්හල් කීපයක් යටතේ අද මධ්‍යගත වීමේ නැත්නම් එකතු වීමේ හේතුවෙන් ඒ ගම්වල සිටිමින් මුදල් ඉපැයූ සැහෙන පිරිසක් අද රැකියා විරහිතව සිටිනවා.

ඇත්තවශයෙන්ම මේ තත්ත්වය ගැන අපි සැලකිලිමත් වන්නට ඕනෑ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මත මේ පසුගිය කාලසීමාව තුළ රටේ මූලික නිෂ්පාදන කීපයක් අධිකාරයන් බිහිවීමේ පසුබිමක පසුවෙනවා. සමහර විට සීනි නිෂ්පාදනය එවැනි එකක් වන්නට පුළුවන්. පිටි නිෂ්පාදනයේ අධිකාරියක් අද ගොඩ නැගෙමින් පවතිනවා. මූලික අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අධිකාරයන් යටතට පත්වීම ඒ තරම් හොඳ දෙයක් නොවෙයි. සමහර විට යාන්ත්‍රිකකරණයෙන් ලාභදායක තත්ත්වයක් ඇති වෙනවා යයි කියන්නට පුළුවන් වුවත් අප වැනි කුඩා ජාතියක අධිකාරී තත්ත්වයන්—කොම්පැනි වන්නට පුළුවන් විදේශීය ආයතන බලවේග වන්නට පුළුවන්—ගොඩ නැගෙන ආයතන හේතුකොට ගෙන ගම්බද කර්මාන්ත ඇදවැටී යෑම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙකුම සඳහන් කළ අන්දමට ගම්වල තිබුණු ජීවන මාර්ග රැසක් නැති වී යෑමක්.

එක ආසනයක පේෂ කර්මාන්ත ආයතන 3 ක් නැවත විවෘත කිරීමේ ප්‍රතිපත්ති අපි අගයනවා. පසුගිය කාල සීමාව තුළ සැහෙන අත් - යන්ත්‍ර සංඛ්‍යාවක් වැඩට නොගෙන වසා දමා තිබීම නිසා ඒ කර්මාන්තය අඩපණ වුණා ; දුබල වුණා. මේ තත්ත්වය යටතේ පේෂකර්ම උපදේශක මට්ටමේ සැහෙන පිරිසකට නිකම් පඩි ගෙවමින් තබා ගෙන ඉන්න සිදු වී තිබෙනවා. මගේ ආසනයේ මේ වගේ පේෂකර්ම මධ්‍යස්ථාන වසා දැමීම නිසා උපදේශක මට්ටමේ තුන්දෙනෙකුට නිකම් පඩි ගෙවන්නත් වසා දැමූ තැන් ආරක්ෂා කිරීමට මුරකරුවන් තබා ගන්නත් සිදු වී තිබෙනවා. මේ තත්ත්වය තවදුරටත් පැවතෙන්න ඉඩ හැරීම තුළින් මේ ව්‍යාපාරයත්, ඒ අත් - යන්ත්‍රත් තව - තවත් දුර්වල වෙනවා. ඒ අතර රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් අපේ ගම්වල තිබුණු හැකියාව, ගොඩ නැගෙමින් තිබුණු දක්ෂතාවය පවා යටපත් වෙනවා. ඒ නිසා එක ආසනයකට පේෂ කර්ම මධ්‍යස්ථාන තුනක් කෙසේ වෙතත් එක මධ්‍යස්ථානය බැගින්වත් ඇති කොට සැහෙන අන්දමින් ඒවා නඩත්තු කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන හැටියට ඉල්ලා සිටින්න කැමතියි. නිෂ්පාදනය කෙරෙන ඒ රෙදි අලෙවි කිරීම සඳහා වෙළෙඳපොළකුත් ලබා දෙන්න ඕනෑ. විවිධ සේවා සමුපකාර සමිති මාර්ගයෙන්, එහෙම නැත්නම් රජයේ අවශ්‍යතාවන් සඳහා ඒ රෙදි ලබා ගැනීම තුළින් ඊට ප්‍රතිකර්ම යොදන්න පුළුවනි. ඒ විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම තුළින් ග්‍රාමීය පේෂකර්ම ව්‍යාපාරය තවදුරටත් රැකගත යුතුව තිබෙනවා. අපේ ගම්බද කාන්තාවන් පසුගිය කාලයේදී රෙදි වියීම පිළිබඳ සිය දක්ෂතාවන් ප්‍රගුණ කරගෙන තිබුණා. ඒ ප්‍රගුණතාවන් තවදුරටත් රැක ගන්න නම් අත් - යන්ත්‍ර පේෂකර්මාන්තය දිගටම තිබිය යුතු වෙනවා.

බලවේග පේශකර්මය පිළිබඳව මම මීට කලිනුත් එක්තරා කාරණයක් පෙන්වා දී තිබෙනවා. මේ අවස්ථාවේදී එය නැවත වරක් මතක් කරන්න කැමතියි. පසුගිය සුළු කාලය ඇතුළත එක්තරා දවසක ප්‍රධාන පුවත් පතක දැන්වීමක් පළ කර තිබුණා, බලවේග පේෂකර්ම යන්ත්‍ර හතරක් විකිණීම සම්බන්ධයෙන් ටෙන්ඩර් කැඳවමින්. ඒ ටෙන්ඩර් දැන්වීම අනුව ටෙන්ඩරය ඉදිරිපත් කරන තැනැත්තා, තමා මිල දී ගැනීමට කැමැති ඒ බලවේග පේෂකර්ම යන්ත්‍රයේ වටිනාකමින් සියයට 50 ක් තැන්පත් කළ යුතුව තිබුණා. ඒ විධියේ කොන්දේසියක් ටෙන්ඩර් දැන්වීමට ඇතුළත් කිරීම මඟින් බලාපොරොත්තු වන්නේ සමහර විට, අපේ කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කී විධියට මහා පරිමාණයේ පෞද්ගලික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ව්‍යවසායකයන්ට ඒ යන්ත්‍ර ලබා ගැනීමට කටයුතු සැලැස්විම වෙන්න ඇති. ඒ විධියට කටයුතු සැලැස්විම නිසා දැනට ඒ බලවේග පේෂකර්ම යන්ත්‍රවල කටයුතු කරන අයගේ සේවා අයිතිවාසිකම් හා වරප්‍රසාද ඒ අයට අහිමි නොවන තැනට අවශ්‍ය පියවර ගැනීම කෙරෙහිත් ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු විය යුතු බව මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න කැමතියි.

ඒ අතර සමහර දිස්ත්‍රික්කවල බලවේග පේෂකර්ම ව්‍යාපාරය සමුපකාර සමිති මඟින් ඉතාමත් සාර්ථක අන්දමට කරගෙන ගියා. ඒ නිසා ඒ වැඩ පිළිවෙලට මේ අවස්ථාවේදී ධෛර්ය දීමක් කළ යුතුව තිබෙනවා. උදහරණයක් වශයෙන් කියනවා නම් මාතර දිස්ත්‍රික් පේෂකර්ම සමිතියත්, ගාල්ල දිස්ත්‍රික් පේෂකර්ම සමිතියත් සැහෙන දියුණු මට්ටමකින් පවත්වාගෙන ගිය සමුපකාර සමිතියි. නමුත් අද තිබෙන තරඟකාරී තත්ත්වයට මුහුණ දීමේ අපහසුව නිසා ඒ සමිතිවල නිෂ්පාදන අලෙවි කර ගැනීමේ දුෂ්කරතා ඇති වී තිබෙනවා. ඒ නිසා අද ඒ සමිතිවල පැවැත්මට බාධා ඇති වී තිබෙනවා.

භාණ්ඩ සුලභ කිරීම සඳහාය කියමින් රජය අනුගමනය කරන විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ පිටරටවලින් ආනයනය කෙරෙන භාණ්ඩ නිසා විශේෂයෙන් ළදරු අවස්ථාවේ පසු වන ඇතැම් දේශීය නිෂ්පාදනවල අලෙවි කිරීමේ ප්‍රශ්නය හේතුකොටගෙන ලොකු අපහසුවක් ඇති වී තිබෙනවා. ඒ ව්‍යාපාරය පවත්වාගෙන යන්න. ඒ තත්ත්වය හේතුකොට ගෙන අපේ රටේ නිෂ්පාදන ශක්තිය දියුණු කිරීමේ පමණක් නොව තවදුරටත් පවත්වාගෙන යෑමේ පවා විශාල අමාරුවක් ඇති වී තිබෙනවා. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ තමා යටතේ තිබෙන සංස්ථාවලට මුහුණ පාන්න සිදු වී තිබෙන තරඟකාරී තත්ත්වය නිසා ඇති වී තිබෙන අපහසුකම් මොනවාදැයි ගරු කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමා පෙන්නා දී තිබෙනවා.

අපේ රෙදි-පිළි නිෂ්පාදනය ජාතික විය යුතුයි. කොටින්ම කියනවා නම් රෙදි-පිළි නිෂ්පාදනය, වෙළෙඳපොළ, අමුද්‍රව්‍ය ආදී සියලුම දේ ජාතික මට්ටමකට සකස් කර ගත යුතුයි. රෙදි-පිළි නිෂ්පාදනය පිළිබඳ අවබෝධය, තාක්ෂණික දැනීම ඇති, මෙතෙක් ඒ කර්මාන්තයේ නියැළී සිටි ගැමි පිරිස් රැක ගත යුතු වෙනවා. මේ කර්මාන්තය දේශීය වශයෙන් දියුණු කරන්න නම්, මෙතෙක් ඒ කර්මාන්තයට අදාළ සංස්ථාවල, කම්හල්වල සේවය කළ පිරිස් රැක ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරවන අතර අපේ රෙදි-පිළි නිෂ්පාදනය දියුණු කිරීමට කටයුතු කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා.

අ. භා. 4.00

**ඇලික් අළුවිහාරේ මහතා (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය ඇමතිතුමා)**
**(திரு. அலிக் அலுவிஹார — பெருந்தோட்டத் தொழில் பிரதி அமைச்சர்)**
(Mr. Alick Aluvihare–Deputy Minister of Plantation Industries)

සභාපතිතුමනි, මාතලේ දිස්ත්‍රික්කයේ පේෂකර්ම මධ්‍යස්ථාන හතරක් පිහිටුවා තිබුණා. ඒවායින් පාඩුයි කියමින් පෞද්ගලික ආයතනවලට ඒවා විකුණුවා. නමුත් 1983 ජූලි කලබල සමයේ මාතලේ බලවේග පේෂකර්ම මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලකට සුළු අලාභ-හානි සිද්ධ වුණාය කියා දැන් එය වසා දමා තිබෙනවා. එම බලවේග පේෂකර්ම මධ්‍යස්ථානවල බඩු ගලවාගෙන යන බව එතැන සේවකයන් පේෂකර්ම අමාත්‍යාංශයටත්, මාතලේ දිසාපතිවරයාටත් දන්වා තිබුණා ; නමුත් ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් ගෙන නැහැ. ඊට පසුව මමත් ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළා ; නමුත් ඒ ගැනත් කිසිම දෙයක් කර නැහැ. අපට දැනගන්නට ලැබී ඇති හැටියට මේ බලවේග පේෂකර්ම මධ්‍යස්ථානය පවත්වාගෙන ආ පුද්ගලයා, එහි කොටස් ගලවාගෙන ගිහින් විකුණා තිබෙනවා. දැන් ඒ පුද්ගලයා ලංකාවෙත් නැහැ. මේ අන්දමේ බලවේග පේෂකර්ම මධ්‍යස්ථාන පහක් තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කයේ ආසන හතරෙහි හතරකුත්, පාතදුම්බර ආසනයේ — අපේ නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමා නියෝජනය කරණ මැතිවරණ කොට්ඨාශයෙහි එක් මධ්‍යස්ථානයකුත් තිබුණා. මාතලේ පේෂකර්ම බලවේග මධ්‍යස්ථානයේ 189 දෙනෙක් සේවය කළා. පාතදුම්බර මධ්‍යස්ථානයේ 151 දෙනෙක්ද, රත්තොට 104 දෙනෙක්ද, උග්ගල 151 දෙනෙක්ද දඹුල්ලේ 104 දෙනෙක්ද සේවය කළා. මේ අනුව සේවය කර ඇති මුළු සංඛ්‍යාව 715 වෙනවා. රක්ෂාවක් කරන එක් පුද්ගලයකු ගෙන් හතර - පස් දෙනෙක් යැපෙන හැටියට සැලකිය හැකියි. ඔහුගේ රක්ෂාව නැති වුණාම මොකද වෙන්නෙ ? රක්ෂාවක යෙදීම හේතු කොටගෙන ආහාර මුද්දරත් අහෝසි වී ගිහින් තිබෙන්නෙ. රක්ෂා විරහිතභාවයට පත වී දැන් අවුරුදු එක හමාරක් පමණ කාලයක් ගත වී තිබුණත් ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් අරගෙන නැහැ. සෑම ඉරිද දිනයකම මේ සේවකයන් තම තමන්ගේ කොට්ඨාශවල මන්ත්‍රීවරුන් මුණ ගැහෙන්නට ගිහින් ඒ අයට කරදර කරනවා. දැනට අවුරුදු එක හමාරක් පමණ කාලයක් ගත වී ඇති නිසා, ඒ පුද්ගලයා නැවත ඇවිත් මේ මධ්‍යස්ථාන පවත්වාගෙන යනවා ඇත කියා අපට හිතන්නට බැහැ. එම නිසා, මෙම පේෂකර්ම මධ්‍යස්ථාන පහ අමාත්‍යාංශය යටතට පවරාගෙන, එම සේවකයන් යළිත් ඒ මධ්‍යස්ථානවලම සේවයෙහි යොදවා එම ස්ථානවල වැඩ කටයුතු කරගෙන යන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මා සඳහන් කළ ඒ පුද්ගලයා ලංකාවේ අද නැහැ. මහජන බැංකුවෙන් ඔහු ගැන සෝදිසි කළ අවස්ථාවේදී ඔහු රුපියල් ලක්ෂ දහයක පමණ මුදලක් බැංකුවෙන් ණය ලබාගෙන ඇති බව දැනගන්නට ලැබුණා. ජයරාම් කන්දයාර් කිරුබාකරන් නමින් හැඳින්වෙන මේ පුද්ගලයා, පොලිකොට් ඉන්ටර්නැෂනල් ආයතනයේ අයිතිකරු හා පාලක අධ්‍යක්ෂයි.

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
**(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)**
**(Mr. Richard Pathirana–Akmeemana)**

එහෙනම් ඊලාම් පිහිටුවන්න ආධාර කරන්නට යන්න ඇති ඔවා ඇති කළේ තමුන්නාන්සේලාමයි.

ඇලික් අළුවිහාරේ මහතා
(திரு. அலிக் அலுவிஹார)
(Mr. Alick Aluvihare)

ඒ පුද්ගලයා දැන් අපේ රටේ නැහැ, පැන ගිහින්.

ගරු සභාපතිතුමනි, මහජන බැංකුවෙන් මට එවා ඇති, ඔහු සම්බන්ධයෙන් වන ලිපිය සභාවේ දැනගැනීම සඳහා කියවන්නට කැමතියි. මෙය එවා මට එවා තිබෙන්නේ මාතලේ මහජන බැංකු ශාඛාවේ කළමනාකාර තැනයි.

" 84.11.05 දින අපගේ එච්එස්පී/කේබිඑස්/අය/යය. යොමුව රැගත් උක්ත හිසින් යුතු ලිපියට ඔබතුමා විසින් දක්වන ලද අනුග්‍රහය ගැන මහජන බැංකුව වෙනුවෙන් අපගේ අතිශය කෘතඥතාවය පළකරමු.

මෙම ආයතනය සතු රක්ෂණ ඔප්පු සතරකි. ජූලි කලබල අවස්ථාවේ මෙකී රක්ෂණ ඔප්පු ලංකා බැංකුව වෙත නියද කර නොතිබුණ අතර, ලංකා බැංකුවේ මාතලේ ශාඛාවේ ඔහුගේ ඥතියෙකුගේ මැදිහත්වීම මත වන්දි මුදල් ලංකා බැංකුව වෙත යොමු කර ඇති බව ඉතා විශ්වාසවන්ත මාර්ගයකින් අප වෙත දැනගැනීමට ලැබී ඇත. මෙහි අදහස වන්නේ ලංකා බැංකුවේ වගකීම පියවීමෙන් පසු අතිරික්තය ඔහු විසින් ලබාගැනීම විය හැකියි.

මෙකී ආයතනය පවත්වාගෙන යාමට ඔහු තුළ කිසිදු අදහසක් නොමැති බව මාතලේ. පලාපත්වල සිටින ඔහුගේ සොහොයුරා වෙත දන්වා ඇති බව ද, දැනට යාපන ජපානයේ සිටින බව ද දැනගන්නට ලැබී ඇත. එබැවින් ජාතික රක්ෂණ සංස්ථාවෙන් ඔහු වෙත ගෙවන වන්දි මුදල් ඔහු වෙත ලබා නොදී ලංකා බැංකුවේ වගකීම පියවීමෙන් පසු ඉතිරිය අප වෙත එවීමට ජාතික රක්ෂණ සංස්ථාව වෙත සුදුසු උපදෙස් ලබාදීම සඳහා ඔබතුමාගෙන් ලැබෙන්නාවූ සහයෝගය අප ඉතා අගේ කොට සලකමු. "

ගරු සභාපතිතුමනි, මම නම් හිතන්නේ නැහැ, මේ පුද්ගලයා ලංකාවට නැවතත් ඇවිත් මේ මධ්‍යස්ථාන පවත්වාගෙන යාවිය කියා. එම නිසා, මෙම ආයතන අමාත්‍යාංශයට පවරාගෙන නැවත ක්‍රියාත්මක කරවන ලෙස ඉල්ලා සිටිනවා.

අ. භා. 4.06

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

ගරු සභාපතිතුමනි, පේෂ කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡාවට භාජනය වන මේ අවස්ථාවේදී අපේ පේෂකර්ම ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස කාරණා කීපයක් ඉදිරිපත් කිරීමට මම අදහස් කරනවා. පළමුවෙන්ම මේ ඇමතිතුමාට මම ස්තුතිවන්ත වන්නට කැමතියි, එක් මැතිවරණ කොට්ඨාශයකට පේෂකර්මාන්ත මධ්‍යස්ථාන තුන බැගින් ලැබෙන සේ මධ්‍යස්ථාන ආරම්භ කරන්නට දැනටමත් අවශ්‍ය පියවර ගෙන තිබීම ගැන. ඒ අනුව අක්මීමන ආසනයේත් පේෂකර්ම මධ්‍යස්ථාන තුනක් නැවතත් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු යොද තිබෙනවා. මේ වර්ෂය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිචඩ් පතිරණ මහතා]

ඇතුලත ඒවායේ වැඩ කටයුතු නැවත ආරම්භ වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වන්නට පුළුවන්කමක් අපට නැහැ. නියෝජ්‍ය වැවිලි කර්මාන්ත ඇමති ධූරය දරන මාතලේ ගරු මන්ත්‍රීතුමා කී විධියට පේෂකර්ම අමාත්‍යාංශයේ යම් යම් ප්‍රතිපත්ති නිසා මේ රටේ රැකීරක්ෂා නැති අයගේ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. මන්ද 1977 මහා මැතිවරණයෙන් පසු එක්සත් ජාතික පක්ෂය රාජ්‍ය බලයට පත්වන අවස්ථාවේ අත්යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් පවත්වාගෙන යමින් මේ රටේ ජනතාව ජීවත් වුණා. නමුත් බලයට පත් වුණාට පස්සේ මේ රජය ගත් යම් යම් ක්‍රියාමාර්ග නිසා ඒ අත්යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන වසා දමන්නට සිද්ධ වුණා. සෑම මැතිවරණ කොට්ඨාශයකම මේ තත්ත්වය ඇති වුණා ; විශාල සංඛ්‍යාවකට රැකියා නැති වුණා. තවමත් ඒ අය රැකියා විරහිත තත්ත්වයෙන් ඉන්නේ. ආසන මට්ටමෙන් දැන් මේ මධ්‍යස්ථාන පටන්ගන්න යන නිසා ඉතා සුළු ප්‍රමාණයකට සහනයක් සැලසෙන නමුත් එයින් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ.

සමහර පේෂකර්ම මධ්‍යස්ථාන පුද්ගලික අංශයට පැවරීම නිසා ඇති වූ තත්ත්වය ගැන නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කලා. හත්සිය ගණනක් සේවකයන් රැකියා විරහිත භාවයට පත් වෙලා ඉන්නවා. ලංකාවේ බැංකුවලින් මේ මධ්‍යස්ථාන පවත්වාගෙන ගිය අය සල්ලි ණයට අරගෙන පැන ගොස් තිබෙනවා. මේ තත්ත්වය මුළු රටේම දකින්නට ලැබෙනවා. මේක පේෂකර්මාන්ත අංශයට පමණක් නොවෙයි ; සෑම කාර්මික නිෂ්පාදන අංශයකටම බලපානවා මේ ප්‍රතිපත්තිය ගැන ගරු කර්මාන්ත ඇමතිතුමා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. මේ රටේ නිෂ්පාදනවලට දැඩි තරගයකට මුහුණපාන්නට වීම නිසා විදේශවලින් භාණ්ඩ සීමා රහිත ලෙස මේ රටට ආනයනය කළ නිසා මේ තත්ත්වය ඇති වුණාය කිව්වා. එතකොට සෑම කාර්මික නිෂ්පාදනයකම මේ තරගය නිසා අඩාල වීමක් ඇති වුණා. ඒක මෙ ආණ්ඩුවේ ගරු කර්මාන්ත ඇමතිතුමා පිළිගන්නවා. අද එතුමා මේ රට රෙදිපිළි අතින් ස්වයංපෝෂිතයි කියනවා නම් අපි ඒ ගැන සතුටු වෙනවා. නමුත් කරන්නේ මෙහි රෙදි නිෂ්පාදනය කිරීම පමණයි. ඊට වුවමනා මූලික ද්‍රව්‍ය මෙහි නැහැ. ඒ නිසා ඒ මූලික ද්‍රව්‍ය පිටරටින් ගෙන්වන්නට ඕනෑ. එහෙමවත් තත්ත්වයක් ඇති වීම ගැන අපි සතුටු වෙනවා. නමුත් 1977 මැතිවරණය පැවති දිනවල මේ රටේ දහස් ගණනක් ජනතාව අත්යන්ත්‍ර රෙදි කර්මාන්තයෙන් ජීවත් වුණා නම් ඒ අය වෙනුවෙන් සලසන්ට පුළුවන් පහසුකම මොකක්ද, සහනය මොකක්ද කියලා අපි දැන ගන්නට කැමතියි. එම නිසා නැවත වතාවක් මේ අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ගැන හිතන්නට වෙලා තිබෙනවා. බලවේග පේෂකර්ම මධ්‍යස්ථානවලට මොකද වුණේ ? බොහෝ ඒවා වැහුවා. මම හිතන විධියට බලවේග පේෂකර්ම මධ්‍යස්ථාන දැනට තිබෙන්නේ තුනයි. ගාල්ලේ බටගන්විල බලවේග පේෂකර්ම මධ්‍යස්ථානයක් තිබෙනවා. ඒකත් විකුණන්නට ප්‍රවෘත්ති පත්‍රයේ දැම්මා. හරියට ඉල්ලුම්කාරයෝ හිටියේ නැහැ. ඉල්ලූ අයත් බොහොම අඩු ගණනකටයි ඉල්ලුවේ. ඒක නතර වුණේ ඒ නිසයි. ඒකත් එහෙම විකුණුවා නම් විශාල සංඛ්‍යාවකට—දහසකට ආසන්න සංඛ්‍යාවකට—රැකීරක්ෂා හිඟයකට මුහුණපාන්නට සිද්ධ විය හැකිව තිබුණා. එම නිසා මේ ප්‍රතිපත්ති ගැන නැවත වතාවක් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ. දියුණු වන රටක් හැටියට, තුන්වන ලෝකයේ රටක් හැටියට අපේ ආර්ථිකය හැඩගස්වා ගැනීමේදී අප ක්‍රියා කළ යුතු ආකාරය කෙරෙහි අපගේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම, දියුණු වෙමින් පවතින රටවල් මේ කර්මාන්ත සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග ගැන කල්පනා කර බලා, ඒඅනුව අපේ ආර්ථිකයට මේ අංශයෙන් දිය යුතු තැන දිය යුතුව තිබෙනවා.

ඊළඟට වැල්ලවත්තේ පෙහෙකම්හලේ සේවකයන්ගේ තත්ත්වය කුමක්දැයි ගරු ඇමතිතුමාගෙන් මම දැනගන්නට කැමතියි. වැල්ලවත්තේ පෙහෙකම්හලේ සේවකයින් දහස් ගණනකගේ අනාගතය කුමක්ද ? ගරු පේෂකර්ම ඇමතිතුමාගෙන් එය දැනගන්නට කැමතියි. ඒ අයගේ රැකියාවත් සම්පූර්ණයෙන් නැති වෙයිද ? එහෙම නැත්නම් ඒ අයගේ අනාගතය මොකක්ද කියන එක අපි මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමතියි. දැනට පූගොඩ, වේයන්ගොඩ, තුල්හිරිය ආදී විශාල කර්මාන්තශාලා ඉන්දියානු සමාගම්වලට පවරා දී තිබෙනවා, බදු දී තිබෙනවා. කොහොම හරි දැන් ඒවායේ පරිපාලනය කෙරෙන්නේ ඉන්දියානු සමාගම යටතේයි. මේ තත්ත්වය යටතේ ඒ අය භුක්ති විඳින වරප්‍රසාද මොනවාද ?

ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේදී පරිපාලනමය කළමනාකාරිත්වය පිළිබඳ දක්ෂතාවය ඇති පුද්ගලයන් අපේ රටේ පුහුණු කරන්නට බැරිද කියන ප්‍රශ්නය මතු වෙනවා. දැන් පූගොඩ රෙදි කම්හලෙනුත් ලාභයි කියා ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කර තිබුණා. අද එහෙම ලාභ ලබා ගන්නට පුළුවන් නම්, කලින් පාඩු සිදු වුණේ කළමනාකාරිත්වයේ වරද නිසා නම්, අපේ රටේ සිංහලයන්ට මේ කාර්යය කරන්න බැරිද කියන ප්‍රශ්නය අසන්නට අපට සිදු වෙනවා. මේ තත්ත්වය යටතේ ඉන්දියානු කොම්පැණිකාරයින්ගේ කළමනාකාරිත්වය ලංකාවේ කර්මාන්තශාලාවලට හැමදම ඕනෑද ? කියන ප්‍රශ්නයක් අපට ගරු ඇමතිතුමාගෙන් අහන්නට සිදු වෙනවා. මෙහෙම ටික දවසක් යන විට අතන කොටි ඉන්නවාය, මෙතැන කොටි ඉන්නවාය කියා ඊළඟට කෑගහනවා. ගරු ග්‍රාම සංවර්ධන ඇමතිතුමිය එහෙම අන්න අතන කොටි ඉන්නවාය, මෙන්න මෙතැන කොටි ඉන්නවාය කියනවා. ආණ්ඩුවම කොටි ඇති කරලා ඊළඟට ආණ්ඩුවම හැම තැනම කොටි ඉන්නවාය කියා ඒ ගැන කථා කරනවා.

**විමලා කන්නන්ගර මහත්මිය (ග්‍රාම සංවර්ධනය පිළිබඳ ඇමතිතුමිය)**
**(திருமதி விமலா கன்னங்கர — கிராம அபிவிருத்தி அமைச்சர்)**
(Mrs. Wimala Kannangara–Minister of Rural Development)

ගරු මන්ත්‍රීතුමනි ! කොටි ඉන්න තැන මම දන්නවා නම් මම තමුන්නාන්සේට කියන්නේ නැහැ, මිලිටරියට කියනවා. කෙළින්ම ඒක කරනවා මිසක් මම කරන ටික හැංගි හොරා කරන්නේ නැහැ. මම පොඩ්ඩක්වත් භයත් නැහැ. කොටින්ට භයත් නැහැ, වලසුන්ට ගයත් නැහැ, අලින්ට භයත් නැහැ.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

බොහොම ස්තුතිය ! ගරු ඇමතිතුමියනි. ගරු ග්‍රාම සංවර්ධන ඇමතිතුමිය ඒවාට භය නැති විත්තිය අපි දන්නවා. 1983 කලබල අවස්ථාවේදීත් එතුමිය මේ වාගේ ප්‍රශ්නයකට මුහුණ දුන්නා.

කොහොමවුණත් ඉන්දියානු සමාගම්වලට පවරා තිබෙන මේ කළමනාකාරිත්වය පිළිබඳ වගකීම ගරු ඇමතිතුමා ක්‍රමයෙන් ස්වදේශිකයන්ට පැවරීමට කටයුතු කරනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම ගරු පේෂකර්ම ඇමතිතුමාත් එම නියෝජ්‍ය ඇමතිතුමාත් ඉතාම හොඳ, මේ රටේ දියුණුවට කැමති ඇමතිවරුන් බව අපි පිළිගන්නවා. නමුත් තමුන්නාන්සේලාට මුහුණ පාන්නට සිදු වුණේ මේ රජයේ ප්‍රතිපත්තියටයි. මේ රටේ නිෂ්පාදනය කරන භාණ්ඩ වර්ගත් පිටරටවලින් ගෙන්නුවා. මේ රටේ නිෂ්පාදනය දියුණු වේගන ගිය කාර්මික භාණ්ඩත් පිටරටවලින් ගෙන්නුවා. ඒ ගෙන්වීම නිසයි මේ ප්‍රශ්නය ඇතිවුණේ. සෑම අංශයකටම මේ ප්‍රශ්නය ඇති වුණා. අල්පෙනෙත්තේ සිට සෑම භාණ්ඩයකටම මේ තරගයට මුහුණ පාන්නට සිදු වුණා. ඒ නිසා මිස මෙය තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයේ වරදක් නිසා සිද්ධ වුණු දෙයක් නොවෙයි. මෙය සිදු වුණේ ඔය තමුන්නාන්සේලා කියන නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය—විවෘත ආර්ථික ප්‍රතිපත්තිය—නිසයි. ලෝකයේ ඉතාමත්ම උග්‍ර ධනවාදී රටක් වන අමරිකාවේවත් සම්පූර්ණ නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් නැහැ. මීට අවුරුද්දකට පමණ කලින් අමෙරිකාව ලංකාවත් සමඟ ගිවිසුම් ගසා ඇණවුම් කළ ඇඟලුම් තොගය ගෙන්වීමත් අමෙරිකාව නතර කලා. ගරු වෙළඳ ඇමතිතුමාට ඒ ගැන සාකච්ඡා කරන්නටත් යන්න සිදු වුණා. ගරු වෙළඳ ඇමතිතුමා ඒ ගැන නැවත වරක් සාකච්ඡා කිරීමෙන් පසුව තමයි, ඒ ගිවිසුම අලුත් කරන්නට පුළුවන් වුණේ. ගරු ඇමතිතුමා මේ ගැන හොයා බලන්න. ලංකාවෙන් ගෙන්වන්නට තිබුණු ඇඟලුම් ගෙන්වන්නේ නැතිව අමෙරිකන් ආණ්ඩුව ඒ ගිවිසුම නතර කලා.

**විජයපාල මෙන්ඩිස් මහතා**
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

නැහැ ! නැහැ !

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේලා ගිහින් සාකච්ඡා කර නැවත ඒ ගිවිසුම දීර්ඝ කර ගන්නට ඇති. නමුත් ඇමතිතුමනි, පිටරටවලින් භාණ්ඩ ගෙන්වීම නිසා අමෙරිකාවේත් රැකියා විරහිත භාවය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලා මේ රටේ ඇති කළ නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය නිසා, කාර්මික භාණ්ඩවලට ඇති කළ තර්ජනය නිසා මේ රටේ රෙදිපිළි ජේෂකර්ම ව්‍යාපාරයත් යම්කිසි ප්‍රමාණයකින් අඩපණ වුණා. එය පිළිගත යුතුව තිබෙනවා. රක්ෂා කළ අයට එම රක්ෂා නැති වුණා. එම නිසා මේ තත්ත්වය ගැන නැවත සලකා බැලිය යුතුයි කියන අදහස ප්‍රකාශ කරමින් මගේ වචන කීපය මම අවසන් කරනවා.

**අබ්දුල් රසාක් මන්සූර් මහතා (මුලතිව් දිසා ඇමතිතුමා)**
**(ஜனாப் அப்துல் றஸ்ஸாக் மன்ஸூர் — முல்லைத்தீவு மாவட்ட அமைச்சர்)**
(Mr. Abdul Razaak Munsoor–District Minister, Mullaitivu)

Mr. Chairman I am happy that you have given me five minutes to speak on this very important Ministry.

Sir, the textile industry is undergoing a number of changes after the new Minister had taken it over. I only want to mention one aspect of the textile industry, that is the handloom sector. I think the hon. Member for Akmeemana said that the handloom sector was a very thriving and prosperous industry prior to 1977. That was due to a number of factors and the policy the then government adopted with regard to the handloom industry. But after 1977 because of the liberalization policy, naturally, the import and export sector of the textile industry also had to fall in line with the overall policy of the Government. As a result of that the handloom industry has suffered most during the last four or five years. Mr. Chairman, this industry was thriving in certain parts of Sri Lanka, particularly in the Balapitiya area and in the Eastern Province villages like Kattankudy and Maruthamunai in my electorate you get traditional handloom weavers who had inherited this craft, I should say, and carried on this trade for a number of years. They were playing a very important role in the promotion of handloom textiles. But in 1978, because of the cyclone, handloom weavers were very badly affected and more than 10,000 looms were damaged. The Hon. Minister was kind enough to pay more than one visit with his officials I believe to the Eastern region and he had been very sympathetic towards the cause of the handloom weavers and he promised to take some meaningful steps to revive this sector. I do not know whether during his administration the handloom industry has improved in quality and quantity. Therefore, we would like to hear from the Hon. Minister.

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

**අබ්දුල් රසාක් මන්සූර් මහතා**
**(ஜனாப் அப்துல் றஸ்ஸாக் மன்ஸூர்)**
(Mr. Abdul Razaak Munsoor)

Mr. Deputy Chairman, I was making certain submissions to the Hon. Minister with regard to the handloom sector of the textile industry. As the hon. Member for Kotmale mentioned, the handloom industry is perhaps the oldest domestic industry we have in this country. Every government had been doing its best to promote this sector because it is a illage based and labour intensive industry in our country. Sir, it is said that about one lakh of people who are engaged in the handloom sector for a number of reasons, have lost all enthusiasm in this industry.

Time and again we hear and read in the newspapers that our government is not doing enough to promote and revitalize this sector of the textile industry. However it is true that the Textile Ministry has done magnificent work during the last seven years. They have put to right many a public sector corporation and textile mills which had not been showing profits and had been mismanaged, etc. We are very happy to read and hear that they have done very well particularly in exports during the last four or five years. But we are very much concerned that the Ministry should do little more to revive this handloom sector because by promoting the handloom sector our local population will be directly benefited. In the past Government was in the habit of subsidizing the import of yarn and providing ready markets for their produce. That is how this industry was kept popular among the villagers during the time of the past Government. We understand and know the difficulty of revising the policy to help this industry, but we can take meaningful steps to maintain the standard and quality of the handloom product while at the same time seeing that the production level is also maintained in our villages. One factor which would go a long way in helping the handloom sector, Sir, is curbing the smuggling of foreign textiles into our country. I think it is a very very difficult task and I do not know how the Ministry of Textiles can effectively prevent smuggling. Now, Sir, all of us know that the import of foreign textiles is banned in our country. But as we all know because of foreign textiles being smuggled or coming in large quantities into our country it directly affects the locally produced handloom textiles as their produce is not marketable as they are unable to compete with foreign textiles. This is one aspect of the matter which the Ministry of Textiles must look into, because the general complaint is that the local producer, the handloom weaver, is unable to produce the qualitative textiles which can compete with foreign textiles.

Mr. Deputy Chairman, we have been told that our handloom woven textiles, have a very big market in the foreign countries and a ready market. We are told by establishments like Salu Sala that they are willing to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් රසාක් මන්සූර් මහතා]

purchase certain quality textiles from handloom weavers with a view to exporting them to countries like Norway and other places. But, Sir, if I may say so the Textile Ministry must play a dynamic role in getting this message across to some of our weavers at the village level. I am of the view that there should be co-ordination between the textile promotion and production sectors in our country. Now, our villagers, as we all know, are very very conservative. They do not desire to change over the type of their looms and the manner of their production and so on, overnight. It is through persuasion, particularly from the textile sector, that we can make our weavers to contribute to our export earnings. We have the best of weavers and they are capable of turning out the quality textile for export markets, but it is a question of educating them to change their looms and the manner of their production. I am certain, Mr. Deputy Chairman, that the Textile Ministry can play a very very important role towards this goal. I am happy the Hon. Minister had made a statement in this House a few weeks ago regarding his programme to revive and, particularly, help the handloom sector. I am very, very hopeful that he would pursue that policy and see that we do not allow the handloom sector to die a natural death in our country.

I thank the officials of the Ministry of Textile Industries because I understand that they are now even taking steps to site the export oriented industries in rural areas. I understand that recently they have approved a garment manufacturing unit to be established in a far away place like the Pottuvil electorate. It is a very, very encouraging sign. Those garments could be manufactured and brought to Colombo. I think they should stand a competitive price. That would provide employment to many unemployed girls in our area. The most acute problem that we are going to face and we are facing now is the rural unemployment particularly of educated girls who cannot move from far away places like – (*Interruption*). What is that ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

That is given to the GCEC.

**අබ්දුල් රසාක් මන්සූර් මහතා**
**(ஜனாப் அப்துல் றஸ்ஸாக் மன்ஸூர்)**
(Mr. Abdul Razaak Munsoor)

No, not only GCEC people, your people are also there. Do you know hon. Member for Kotmale that the concept of GCEC was first introduced into this country by the SLFP Government. I do not know whether you are aware of it.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

Discussions were going on but there was no final decision.

**අබ්දුල් රසාක් මන්සූර් මහතා**
**(ஜனாப் அப்துல் றஸ்ஸாக் மன்ஸூர்)**
(Mr. Abdul Razaak Munsoor)

And you were very unsuccessful.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

That is true.

**අබ්දුල් රසාක් මන්සූර් මහතා**
**(ஜனாப் அப்துல் றஸ்ஸாக் மன்ஸூர்)**
(Mr. Abdul Razaak Munsoor)

You wanted to introduce it. You brought forward the proposals. You were canvassing round the world, but you could not find investors. Where you have failed, we have succeeded and it is doing very well.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

I never mentioned whether I am for or against it. The question is the textile industry is given to some particular section like the GCEC. That is my opinion.

**අබ්දුල් රසාක් මන්සූර් මහතා**
**(ஜனாப் அப்துல் றஸ்ஸாக் மன்ஸூர்)**
(Mr. Abdul Razaak Munsoor)

That is the only sector that has come in very readily to enjoy the facilities that we offered. So you cannot blame the foreigners who have come here to start industries under those programmes.

Mr. Deputy Chairman, before I conclude, I want to say that the Ministry of Textile Industries has done very well in that it has put the public corporations into order and laid the foundation to revive the handloom industry. I only hope that as much as the Hon. Minister the officials will co-operate with him and see that the handloom industry is revived and once again given a place under the sun. Thank you.

අ. භා. 430

**එස්. බී. විජේකෝන් මහතා (මින්නේරිය)**
**(திரு. எஸ். பி. விஜேகோன் — மின்னேரியா)**
(Mr. S. B. Wijekoon – Minneriya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සන්තෝෂ වෙනවා, පේෂකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ සුළු වේලාවක් හෝ කථා කිරීමට මට අවස්ථාවක් ලබාදීම ගැන. ඇත්තවශයෙන්ම මම අහගෙන සිටියා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ කථා. එතුමන්ලා හුඟක් දුරට ප්‍රකාශ කළේ 1977 න් පසුව මේ අමාත්‍යාංශයෙන් මේ රටට සේවයක් සිද්ධවෙලා නැත කියායි. නමුත් මම ප්‍රථමයෙන් කියන්නට ඕනෑ 1977 ට පෙර යුගයත්, 1977 ට පසු යුගයත් ගැන කල්පනා කරන විට පේෂකර්ම අමාත්‍යාංශය මගින් විශාල සේවයක් මේ රටට සිදුවී තිබෙන්නේ 1977 න් පසු යුගයේ බව. මම ඒක විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මතක් කර දෙන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා 1977 ට පෙර තිබුණු යුගයේ තත්ත්වය. 1977 ත් පසු තත්ත්වයත් දැන් හොඳට පෙනෙනවා. මේ අය ඒ කාලයේ තිබුණු රෙදි ගැන කථා කළත්, ඇත්තෙන්ම ඒ කාලයේ තිබුණේ මොන තත්ත්වයේ රෙද්ද කියන එක කවුරුත් දන්නවා. අද පේෂකර්ම අමාත්‍යාංශය යටතේ, පූගොඩ, වැල්ලවත්ත, වේයන්ගොඩ ආදී කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කෙරෙන රෙදිපිළිවල තත්ත්වය ඉතාමත්ම හොඳ බව අපි අමතක කරන්න හොඳ නැහැ. ඒ නිසා අපි පේෂකර්ම ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ මේ යුගයේදී ඉතාම හොඳ තත්ත්වයකට පේෂ කර්ම අමාත්‍යාංශය යටතේ මේවා දියුණු කිරීම ගැන.

ගරු සභාපතිතුමනි, මගේ ආසනය සම්බන්ධයෙන් මම විශේෂයෙන් මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. රෙදිපිළි සම්බන්ධයෙන් මේ දියුණු තත්ත්වය ඇති වෙනවාත් සමගම මිත්තේරිය ආසනයේ කර්මාන්ත ශාලාවක් තිබුණා පේෂකර්ම අමාත්‍යාංශය යටතේ. එය නූල් කැටීමේ කර්මාන්තශාලාවක්. මිත්තේරිය ආසනයේ තිබුණු එකම විශාල කර්මාන්ත ආයතනය ඒකයි. නමුත් අවුරුදු ගණනාවක් තිස්සේ පැවතගෙන ආ මෙම ආයතනය පසුගිය අවුරුද්දේ තාවකාලිකව වසා දැමුවා. දැනට අවුරුද්දකුත් මාස දෙකක් පමණ වෙනවා. නමුත් අද එය සම්පූර්ණයෙන්ම වැසී යන තත්ත්වයකට වැටී තිබෙනවාය කියන ආරංචිය මිත්තේරිය ආසනයේ පැතිර ගොස් තිබෙනවා. මේ කාරණය මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නට ඕනෑ. පසුගිය අවුරුද්දේ මෙම ආයතනය වහන කොට සේවකයින් 843 දෙනෙක් එහි සේවය කළා. ඒ අයට අද දක්වා, අවුරුද්දකුත් මාස දෙකක් පමණ කාලයක් තිස්සේ, ගෙව්වේ අඩ වැටුප්. නමුත් පසුගිය මාසය වනවිට ඒකත් අඩුවෙලා. ගෙවා තිබෙන්නේ තුනෙන් එකක් පමණයි. ඒ වාගේ තත්ත්වයක් අද උදා වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සමගම මට දැනගන්න ලැබුණා දැන් මෙම ආයතනය සම්පූර්ණයෙන්ම වසා දමා යුද්ධ හමුදාවට භාර දෙන්න යනවා කියා. ඇත්තවශයෙන්ම මේ තත්ත්වය ඉතාමත්ම කණගාටුදායකයි. මන්ද, පසුගිය අතුරු මැතිවරණ කාලයේදීත් අපි ප්‍රකාශ කළා—ගරු ඇමතිතුමාත් දන්නවා—අතුරු මැතිවරණයෙන් පසුව කොහොම හරි මේ කර්මාන්ත ශාලාව වෙනත් නිෂ්පාදනයක් සඳහා හෝ විවෘත කරනවාය කියා. එම නිසා මිත්තේරියේ අතුරු මැතිවරණයෙන් ජයග්‍රහණය කළ මන්ත්‍රීවරයා හැටියට මම ඒ ප්‍රශ්නයට හුඟක් මැදිවෙලා ඉන්නවා. නමුත් මම නමුන්නාන්සේට බල කරන්නෙ නැහැ යුද්ධ හමුදාවට දෙන්නට යෝජනාවක් තිබෙනවා නම්, ඒක නවත්වන්නට කියා. රටේ අද තිබෙන තත්ත්වය අනුව, අපි හැම දෙයක් ගැනම කල්පනා කරන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, එය එහෙම වහන්නට තීරණය කරනවා නම්, අඩු තරමින් ඒ කර්මාන්ත ශාලාවේ සිටි සේවකයින්ගේ අනාගතය ගැනවත් අපි බලන්නට ඕනෑ. ඔවුන්ට පේෂකර්ම අමාත්‍යාංශය යටතේ තිබෙන වෙනත් ආයතනවලවත් රැකියා ලබා දෙන්නට නමුන්නාන්සේ වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් ඒ ගැන මම ඉතාමත්ම ආඩම්බර වෙනවා. ඒ වාගේම එසේ කරන්නටය කියා මම ඉල්ලා සිටිනවා. සේවකයින් විශාල සංඛ්‍යාවක් සිටින නිසා එය එක වරටම කරන්නට පුළුවන්කමක් නැති බව මම දන්නවා. එහෙත් ඔවුන් අද සිටින්නේ විශාල මානසික අසහනයකින් බව කියන්න ඕනෑ.

ඒ වාගේම එම කර්මාන්ත ආයතනයේ නිල නිවාසවල නිලධාරීන් පදිංචිව සිටිනවා. යුද්ධ හමුදාවට මේ ආයතනය භාර දුන්නොත් ඒ නිලධාරීන්ට එම නිවාසවල පදිංචිව ඉන්නට පුළුවන් වෙන්නෙ නැහැ. එම නිසා ඒ ගැනත් අපි සැලකිලිමත් වෙන්නට ඕනෑ. මම නමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, එවැනි අවස්ථාවක් ඇතිවෙනවා නම්, ඒ අයට මොන ස්ථානයක හෝ පේෂ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක රැකියාවත් ලබා දෙන්න. එනෙක් අඩු තරමින් කලින් ගෙවාගෙන ආ පරිදි අඩ වැටුපවත් ඒ අයට ගෙවන ලෙස මම ඉල්ලා සිටිනවා.

නොදියුණු ප්‍රදේශයක් වූ මිත්තේරිය ආසනයේ රැකී රක්ෂා නොමැති තරුණයන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. තිබෙන කර්මාන්තත් වැහෙනවා නම් ඒ අයට තැවතත් ප්‍රශ්න ඇති වෙනවා. එම නිසා බලවේග පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන කීපයක් මගේ ආසනයට අලුතෙන් ඇති කර දෙනවා නම් ඉතාමත් වටිනවා. එය ඉටු කර දෙන ලෙස ඇමතිතුමගෙන් ඉල්ලා සිටිමින් නමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ ඉදිරි අවුරුදු 5 ඇතුළත මිත්තේරිය වැනි නොදියුණු ප්‍රදේශයකට සේවයක් වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ සුළු කථාව අවසන් කරනවා. ස්තුතියි.

අ. භා. 4.37

**අනිල් මුණසිංහ මහතා (මතුගම)**
**(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)**
(Mr. Anil Moonesinghe–Matugama)

Mr. Deputy Chairman, Sir, the textile industry is a very important industry in the developmental process of a country. All countries which are called developing countries have at one time or another started with developing textiles. India is a very good example, and even countries like Mexico and Brazil started with textile manufacture. That was the beginning of the industrial process in those countries. In our country, too, from the very early beginning of the nationalist movement here, just as in India, there was attention paid to the making of cloth, the weaving of cloth. In fact I remember rightly that Anagarika Dharmapala sent persons to Japan to learn the textile industry and to come here and produce textiles. So we can see historically how important it is for us to develop this industry. Now, I am quite prepared to accept that today there is a great difference because the textile industry is a very sophisticated industry, and I am quite prepared to admit that we did not have the sophistication that this industry requires. Therefore on principle I am not against any technical advice and any technical knowledge being obtained from abroad for the development of the textile industry.

This Government has taken the course of handing over the complete management of the textile mills to foreign firms, who were of course well known in their fields, like Bombay Dyeing, Tootals, etc. I wonder whether the Hon. Minister can table some of those agreements which he has entered into with these companies, particularly in view of the fact that despite the companies coming in they have all shown a loss during the past period. I quoted in my Budget speech from the Report of the Central Bank that all the mills have been making a loss. What is the reason for this ? Certainly I am prepared to admit that we are producing excellent cloth. There is no doubt about it. One of the reasons, I think, is your open economy.

The "Aththa" paper has attacked me the other day for saying that I advocated an open economy, which I never did. All I said was that we cannot go back to a closed economy. But the openness of the economy depends on so many other factors.

I think the Hon. Minister of Textile Industry will support me when I say that certain industries must be protected. Even in the United States of America, despite all the talk of technological development and so on, they are going to protect their clothing or garment industry, particularly in New York and the surrounding States and on the west coast. If the Americans can protect their textile industry and their garment industry, why can we not do that ? Obviously, the kind



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මහතා]

of policy followed by this Government of an open economy has to be now modified, and I think you are taking the first steps in that process.

Secondly, with your Free Trade Zone you are getting textiles into this country in containers. Nobody knows how much is coming in and how much is going out. In fact, the biggest amount of textiles on the pavement today are textiles coming in through this illicit means and thereby depriving you of a proper market.

The Hon. Minister therefore must prepare a policy-statement on this matter and tell this country how he is going to protect these industries. These are most sophisticated industries.

You take the other industries, for instance the handloom industry. I am very sorry to say that the handloom industry in this country was decimated by this Government, and it is in a very sorry situation.

In my constituency there are about thirty odd handloom centres. How many are working ? Two. I want the Hon. Minister to go into this matter fully. I find that the ownership of many of these handloom textile centres is not in the Government's hands. You must remedy that situation. You must take them over or do something because I find that a number of these centres are still under private ownership.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

For how long ?

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

Some of them have been there for nearly 25 to 30 years. I know the case of a textile weaving centre in the village of Ovitigala in my constituency where the owners are very rich people. They want the land back now because it is valuable property. So one night some people came and broke the building down and said, "There is no textile centre now. We want the land back." So that is a matter the Hon. Minister will have to attend to.

I am really interested in developing the handloom centres in my area. With that idea in mind I allocated some funds for the repair of the buildings and the machinery. I have to go to the Ministry of Plan Implementation and get their permission for these monies to be allocated because some of these buildings do not belong to the Government. I have done that. Next year I want to start these centres.

Then there is another problem, the old recurrent problem of handloom centres. That is, they are unable to produce goods for a market which is secure. I quite agree that the old system of producing an innumerable amount of sarongs and various things is not sufficient. Certainly you can provide the hospitals with some bed sheets and linen ; you can produce a certain amount of bed spreads. But if you are really going to make the handloom industry a profitable one and a secure one you must try to get into the foreign market, because there is a definite demand for handloom textiles particularly in the Scandinavian countries and America. You must set up some machinery for this purpose. Otherwise you will not be able to procure the market and give a secure market to the handloom textile industry.

Then, Sir, a gentleman called Kumar has come from India to develop our handloom industry. I went with him to some of my handloom centres and he showed that our people are still not able to produce a good sarong. The hon. Deputy Minister, I think, went to South India. In Karnataka you can see handloom manufactured sarongs as good as the machine product. We are not doing that here because there are cetain processes which we still do not understand. We must learn those ings. Then we will be able to produce very good sarongs for sale in this country.

Then the Director of Textile in his report says :

"For example, we found that while raw material costs and wage rates were virtually the same in both countries, the Indian manufacturers were receiving considerable taxation and financial reliefs from their Government. For two weeks of each year, the All India Co-opertive Textile Society were permitted to sell handloom products 20% below purchase price, and the Indian Government meet the Society's loss in the form of a subsidy. Interest rates from banks, to Indian handloom manufacturers are around 8% as compared to 24% in Sri Lanka.

So you see, once again, the general economic situation has an effect because our interest rates are high and therefore we are in serious trouble. So we have to overcome this. You must have a policy whereby you are able to start these handloom centres and to produce a certain amount of goods for the local market and the balance for the foreign market.

In fact, as the hon. Deputy Minister would have known after his visit to India, India has a considerable market in the United States for handloom goods.

Now, the other area in which we can advance is the making of handloom goods out of raw silk. Already the Silk and Allied Products Authority is producing the raw materials. An Indian expert told me that it is far better to produce the silk woven material, because the costs are much better. But wages are not better, and as such I find that a lot of young girls are not prepared to go and work on these handlooms for the wages that they get.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Some of them get about Rs. 250 or Rs. 200. What is that today ? I am trying to set up eight silk units after discussing the matter with the Director of Textiles in my area. At Pelawatte, which is close by, we are producing raw materials for silk. We will be able to produce the cloth which we can sell and also, at the same time, give the girls who are working in these places an income of Rs. 500 to Rs. 600 a month which is very good, because they are working from their homes. I wish the Hon. Minister will really spend some time on this matter and put to right the handloom industry as far as the sale of handloom fabrics is concerned.

I would also like to know from the Hon. Minister what the position is about the service centres and Janasalu centres which they have started and how much of goods they have been able to produce per month and how much has been sold abroad. Now there are 62 textile service centres and 72 Janasalu centres. The total number of weavers who have been provided with employment at the end of 1982 was supposed to be 10,016. I would like to know from the Hon. Minister what the position is today.

Then, Sir, the other thing is the type of looms. I think the loom which is 96 inches wide is much better, because it can produce cloth, bed-spreads and even heavy curtaining for which there is a market in Europe. I would like the Hon. Minister to let us know what the position is (*Interruption*). You are doing that, but that is not enough.

**විජයපාල මෙන්ඩිස් මහතා**
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

We are broadening it. But you have 36 inches.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

The process is a little too slow. That is what I would like to say. But you must move a little faster. We can open up these textile centres that have been closed up for a long time in our areas, and we are prepared as Members of Parliament to give a lot of money from the decentralized budget to work these things.

අ. භා 4.50

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා (නියෝජ්‍ය රෙදිපිළි ඇමතිතුමා)**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா — புடவைக் கைத்தொழில் பிரதி அமைச்சர்)**
(Mr. R. M. Dharmadasa Banda–Deputy Minister of Textile Industries)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෙදිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට සහභාගිවුණු ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම ඉතාම වැදගත් අදහස් කීපයක් අපට දුන්නා. මෙහිදී කතා කළ මන්ත්‍රීවරුන්ගෙන් වැඩි දෙනෙකුම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් වුවත් එතුමන්ලා මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සෑහෙන දුරට සන්තෝෂයට පත් වී සිටින බව පෙනෙනව. ඇතැම් කනගාටුදායක කරුණු කීපයක් එතුමන්ලා කිව්වා. ඒවා වැළැක්වීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සැලසුම් කිරීම ගැන අපි සලකා බලනවා.

1977 දී අපේ රජය බලයට පත්වුණු විගසම අපට තිබුණු ලොකුම අභියෝගය මේ රටේ ජනතාවට අවශ්‍යව තිබුණු රෙදි ප්‍රමාණයත් එක්තරා තත්ත්වයක රෙදිත් ලබා දීමයි. දැන් මෙහිදී කතා කළ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම, විශේෂයෙන් විරුද්ධ පක්ෂයෙන් කතා කළ මන්ත්‍රීවරුන් සියලු දෙනාම පිළිගත්තා දැන් රෙදිවල හොඳ තත්ත්වයක් තිබෙන බව. ඒ නිසා මම ඒ ගැන කතා කරන්නේ නැහැ.

1977 දී අපි ඇතිකර ගත් යම්කිසි සම්මුතියක් මත නිසි ක්‍රියාදාමයක් ඇති කර එහි ප්‍රතිඵල ලබා දැන් අපි රෙදිවල යම්කිසි තත්ත්වයක් ඇතිකර තිබෙනවා. මා හිතන හැටියට ජාත්‍යන්තර මට්ටමට එය ගෙනැවිත් තිබෙනවා. එහෙම නම් අපේ එක් ව්‍යායාමයක් ගැන විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම සන්තෝෂ වෙනවා.

අපේ ඊළඟ ව්‍යායාමය වුණේ ජනතාවට වුවමනා කරන රෙදිපිළි මෙහි නිෂ්පාදනය කරදීමයි. 1977 දී අපි ගණන් බැලූ විට මේ රටේ ජනතාවට වුවමනා කර තිබුණු රෙදි ප්‍රමාණය යාර දස ලක්ෂ එකසිය හැත්තෑ පහක් පමණ බව අපට පෙනී ගියා. ඒ වන විට මේ රටේ තිබුණු ධාරිතාව, අත්යන්ත්‍රවලිනුත් බලවේග මධ්‍යස්ථාන වලිනුත් අනෙකුත් මිල්ස්වලිනුත් වියන්නට පුළුවන්කම තිබුණු රෙදි ප්‍රමාණය යාර දස ලක්ෂ දෙසිය පනස් හතයි. ඒ එදා තිබුණු ධාරිතාව. ලක්ෂ එකසිය හැත්තෑවක් පමණ රටේ ජනතාවට වුවමනා කළ රෙදි ප්‍රමාණය යාර දසලක්ෂ එකසිය හැත්තෑ පහක් යයි අපි ගණන් බැලුවේ එක් පුද්ගලයකුට යාර එකොළහක් හෝ දොළහක් පමණ වන පදනම අනුවයි. දැන් එය පොඩ්ඩක් වෙනස් වී තිබෙනවා.

1980-1981 දී පමණ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සමාජ විද්‍යා හා ආර්ථික සමීක්ෂණයක් පවත්වා තිබෙවන. ඒ මගින් ඉතා වැදගත් අදහසක් ඉදිරිපත් කර තිබෙනවා. ලංකාවේ පවුලක් මසකට දරන වියදමෙන් රෙදි පිළි සඳහා වැය කරන්නේ සියයට 4.3 ක් පමණක් බව එම වාර්තාවෙන් කියා තිබෙනව. නමුත් ආහාර සඳහා එක් පවුලක් සියයට 65 ක් වියදම් කරනවා. රෙදිපිළි සඳහා එක් පවුලක් මසකට වියදම් කරන මේ සියයට 4.3 ප්‍රමාණය ලංකාවේ සිටින පවුල් ගණන සමග සසඳ බැලුවොත් ඒ පවුල් ගණනට වුවමනා කරන රෙදිපිළි ප්‍රමාණය දැනටම අපි මේ රටේ නිපදවන බව පැහැදිලි වෙනවා. මේ සංඛ්‍යා ලේඛන අනුව එක් පවුලක් රෙදිපිළි සඳහා මාසයකට වැය කරන්නේ රුපියල් පනස් දෙකක පමණ මුදලක්. පවුල් ලක්ෂ තිහක් මේ රටේ සිටිනවාය යන පදනම ගෙන බැලුවොත් ලැබෙන ගණන එකයි. අපට වුවමනා කරන රෙදිපිළි ටික ඔක්කෝම අපි දැන් මෙහි නිෂ්පාදනය කරනවා. නමුත් තවත් මේ නිෂ්පාදනය දියුණු කළ යුතුය. විශේෂයෙන්ම බලවේග රෙදිකර්ම මධ්‍යස්ථාන ආයෙත් සැරයක් ක්‍රියාකාරීත්වයට පත් කළ යුතුය. අත්යන්ත්‍ර රෙදිකර්මාන්තය නැවත නගා සිටුවිය යුතුය යනාදී වශයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා මෙහිදී කිව්වා.

විශේෂයෙන්ම සියලු දෙනාම අත් යන්ත්‍ර රෙදිකර්මාන්තය ගැන මතක් කළ නිසා ඒ ගැන පළමුවෙන්ම අදහස් දක්වන්න කැමතියි. අත් යන්ත්‍ර රෙදි නිෂ්පාදනයට රෙදිකර්ම ක්ෂේත්‍රයේ විශේෂ තැනක් ලංකාවේ ලැබෙනවා. ඒක අපි පිළිගන්නවා. නමුත් මේ චෝදනාව මීට කලිනුත් ආවා. අපි මීට කලිනුත් මේ චෝදනාවට ප්‍රතිඋත්තර දී තිබෙනවා. රෙදිකර්මාන්තය අපි නිසා විනාශ වී ගියාය කියලයි චෝදනාව තිබෙන්නෙ. ඒක අදත් කිව්වා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) කිව්වා අම්බලන්ගොඩ ප්‍රදේශයේ යන්ත්‍ර පන් දහස් ගණනක් තිබුණාය කියා. මම දන්නේ නැහැ, ඒ තරම් තිබුණාද කියා. අපේ කල්මුණේ මන්ත්‍රී මුලතිව් දිසා ඇමතිතුමාත් සඳහන් කළා මඩකලපුව දිස්ත්‍රික්කයේ විසාල වශයෙන් තිබූ අත් යන්ත්‍ර රෙදිකර්ම මධ්‍යස්ථාන වැහිල ගොස් තිබෙනවාය කියා. මීට කලින් කාරක සභා අවස්ථාවලදීත් මේ චෝදනාව නගා තිබෙනවා.

මම මෙතැනදී නැවතත් වරක් කියන්න ඕනැ මෙසේ වැසුණු අත් යන්ත්‍ර ඒ රෙදිකර්ම මධ්‍යස්ථාන කිසිවක් අපේ අමාත්‍යාංශය යටතේ පරිපාලනය වූ ඒවා නොවන බව. අපි ඒවාට උදව් දී තිබෙනවා ; ගුරුවරුන් දී තිබෙනවා ; යන්ත්‍රසූත්‍ර දී තිබෙනවා ; අපට තිබුණ ගොඩනැගිලි ටික දී තිබෙනවා. නමුත් ඒවා පාලනය වුණේ රෙදිකර්මාන්ත සමුපකාර සංගමය විසිනුයි. රෙදිකර්මාන්ත සමුපකාර සංගමයේ යම් යම් වැරදි නිසා, දුර්වලතා නිසා සමහර මධ්‍යස්ථාන වැසී ගියා.

මේ ගැන අපට දිගටම චෝදනා කළ නිසා, මෙය අපේ අවධානයට යොමු කළ නිසා දැන් අමාත්‍යාංශයෙන් එක්තරා තීරණයක් අරගෙන තිබෙනවා.— ගරු මන්ත්‍රීතුමන්ලා ඒ ගැනත් සඳහන් කළා. — සෑම මන්ත්‍රී කොට්ඨාශයකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා]

වැසී තිබෙන අත් යන්ත්‍ර මධ්‍යස්ථාන තුන බැගින් පළමුවැනි පියවර වශයෙන් නැවත විවෘත කරන්න. අපි ඒ ගැන ගරු මන්ත්‍රිවරුන්ට දන්වා යැව්වා. අපි ඉල්ලුවා පළමුවෙනි පියවර වශයෙන් විවෘත කළ යුතු මධ්‍යස්ථාන තුනක් නම් කර එවන්නය කියා. සමහර මන්ත්‍රිවරුන් කැමැත්ත ප්‍රකාශ කර අපට විස්තර දන්වා එවා තිබෙනවා. සමහර මන්ත්‍රිවරුන් විමධ්‍යගත අය වැයෙන් මුදලුත් ලබා දී තිබෙනවා, ගොඩනැගිලි දියුණු කරන්නත්, යන්ත්‍රසූත්‍ර ගන්නත්. දැනටමත් සමහර ආසන සම්බන්ධයෙන් ක්‍රියා කරගෙන යනවා ; විවෘත කරගෙන යනවා. ඒ අනුව මේ අවුරුද්ද තුළදී ලංකාවේ අත් යන්ත්‍ර රෙදිකර්ම මධ්‍යස්ථාන 450 ක් විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ, වැහුණ ඒවා.

ඊට අමතරව ඒ රෙදිකර්මාන්ත මධ්‍යස්ථාන සමුපකාර සංගමයෙන් කියා තිබෙනවා දැන් ඒ අය විසින් පවත්වාගෙන යන මධ්‍යස්ථාන 650 ක් පමණ හොඳ ඒකක වශයෙන් තවදුරටත් පවත්වාගෙන යන්න බලාපොරොත්තු වෙනවාය කියා. අපි ඒකටත් ඉඩ දීලා වැසී තිබෙන ඒවායින් 450 ක් මේ අවුරුද්ද තුළදී සම්පූර්ණ කරනවා. කොත්මලේ ගරු මන්ත්‍රිතුමා (ආනන්ද දසනායක මහතා) කිව්වා එතුමාගේ ඒවා විවෘත වුණේ නැහැ කියා. මම පිළිගන්නවා. නව රාශියක් විවෘත කරන්න තිබෙනවා. 1985 වර්ෂය තුළ අපි ඒ ටික විවෘත කරනවා.

මෙතැනදී මතක තබාගත යුතු කාරණයක් තිබෙනවා. ඉල්ලීම් තිබෙනවා නම්, ඉක්මණින් කරන්න ඕනැය කියනවා නම්, අපට මාසයෙන් දෙකෙන් වුණත් මේවා විවෘත කරන්න පුළුවන්. නමුත් මතුගම ගරු මන්ත්‍රීතුමා (අනිල් මූණසිංහ මහතා) සඳහන් කළ ආකාරයට මේ නිෂ්පාදනය කරන දේවල් හොඳ තත්ත්වයෙන් තබා ගන්නටත් උත්සාහ කළ යුතුයි. එහෙම නොකළොත් අත්යන්ත්‍ර රෙදිකර්මාන්තය නැවත වරක් වැටෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා අපි අර ගතානුගතික දේවල් පැත්තකට දමා හොඳ තත්ත්වයේ දේවල් වියන්නට දැනට කටයුතු සූදානම් කර තිබෙනවා. දැන් රෙදිකර්ම දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ වැඩපිළිවෙළ සකස් කර තිබෙනවා. ඒ වාගේම දැන් සෑම දිස්ත්‍රික්කයකටම සහකාර අධ්‍යක්ෂවරයෙකු පත් කරනවා. සුපවයිසර කියන අය මෙතෙක් ලංකාවේ සිටියේ ඉතාම සුළු පිරිසක් පමණයි. දිස්ත්‍රික්කයකට එක්කෙනෙකුවත් දමා ගන්න බැරි තත්තවයකුයි තිබුණේ. අපි දැන් ඒ පිරිසත් වැඩි කර තිබෙනවා. මධ්‍යස්ථාන තුනකට හතරකට එක් සුපවයිසර් කෙනෙකු බැගින් දමන්නට දැන් අපි වැඩපිළිවෙළ සකස් කර තිබෙනවා.

ජාතික සළු මධ්‍යස්ථානය ගැනත් ගරු මන්ත්‍රිවරු මතක් කළා. ඒ සෑම ඒකකටම කළමනාකරුවෙකු බැගින් පත් කරන්නට දැනට අපි අනුමැතිය ලබා ගෙන තිබෙනවා. අලුතෙන් ආරම්භ කරන්නට බලාපොරොත්තු වන මධ්‍යස්ථාන 450 ටම කළමනාකරුවෙකු බැගින් පත් කරන්න යනවා. අපේ ක්ෂේත්‍රයේ ඉන්න ගුරුවරුන් අතරෙන් වියන්නට දක්ෂ අය තෝරා ඒ විධියට කළමනාකරුවන් හැටියට පත් කරන්න අදහස් කරනවා.

ඒ වගේම අහල් 90 යන්ත්‍ර ගැන සඳහන් කළා. එම ප්‍රශ්නය මතු කිරීම ගැන මා සන්තෝෂ වෙනවා. 1977 දී අපට වැඩියෙන්ම ලැබුණ දායාදය තමයි අහල් 36 පරිමාණයේ යන්ත්‍ර. එම යන්ත්‍රවලින් වැඩක් නැති බව අපට පැහැදිලි වුණා. ඒ නිසා අහල් 36 යන්ත්‍ර අපි දැන් හදන්නෙම නැහැ. අපි හරිගස්සන අඩුම යන්ත්‍රය තමයි අහල් 48 යන්ත්‍රය. ඒවාත් ඉතා සුළු ප්‍රමාණයක් පමණයි, හදන්නෙ. අපි දැන් අහල් 60 යන්ත්‍ර හදනවා. අහල් 90 යන්ත්‍ර හදන්නවා. අලුතෙන්ම අපි හදන්න යන්නේ අහල් 98 මැෂින් එකයි. ඔය ආකාරයට අපි අත් යන්ත්‍ර හදාගෙන එක් මධ්‍යස්ථානයකට අත්යන්ත්‍ර 12 බැගින්වත් දී, වසා තිබෙන මධ්‍යස්ථාන නැවත ආරම්භ කරන්නටයි, දැන් කටයුතු කරගෙන යන්නෙ.

ඒ වගේම සඳහන් කරන්න කැමතියි, අගලවත්ත. මතුගම ප්‍රදේශයේ පට නූල් හදන බව අපට පෙනී ගොස් තිබෙනවා. ඒ ප්‍රදේශවලට විශේෂත්වයක් දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. නමුන්නාන්සේලා දන්නවා ඇති අපි පසුගිය දවස්වල ප්‍රදර්ශනයක් පැවැත්තුවා. එය ඇත්තටම ප්‍රදර්ශනයක්ය කියා කියන්නත් බැහැ. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) නම් එයට විරුද්ධ වුණා, බාලක්ද මොකක්ද කියල නමකුත් කිව්වා. එහෙම එකක් නොවෙයි අපි පැවැත්වූවේ. අපි පැවැත්වූවේ මෝස්තර ප්‍රදර්ශනයක්. අපි දැන් " සිල්ක් එලයිට් " ආයතනයෙන් ඒ සිල්ක් නූල් මිලදී අරගෙන මේ අත් යන්ත්‍ර රෙදිකර්මාන්තය ප්‍රයෝජනයට ගනිමින් නොයෙක් මාදිලියේ රෙදි වර්ග හදනවා. දැනට විශේෂ සාරි වර්ග අපි හදනවා. අන්න ඒ රෙදිවල මෝස්තර ප්‍රදර්ශනයක් තමයි පසුගිය දවස්වල තිබුණේ. එයින් ඒ තරම් අපරාධයක් වුණාය කියන්න බැහැ. ඒ සිලික් රෙදිපිළි අපි දැන් නිෂ්පාදනය කරන්නට පටන් ගෙන තිබෙනවා. මතුගම ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සිල්ක්වලින් සාරි විවීමට ප්‍රසිද්ධ රටක් වන ඉන්දියාවේ රෙදිවල තත්ත්වයේම රෙදි දැන් මෙහි නිපදවනවා. මෝස්තරවලට උපදෙස් ලබා ගැනීමට දැනට බංගලි දේශයෙනුත් කෙනෙක් ඇවිත් ඉන්නවා. අවුරුදු දෙකක ගිවිසුමක් යටතේ ඔහු මෙහි ඇවිත් සිටිනවා. ඒ අයගේන් උපදෙස් අරගෙන අපි දැන් ඒ කටයුත්ත දියුණු කරගෙන යනවා. සිලික් සාරි සහ සිල්ක්වලින් සකස්කරන අනිත් රෙදිපිළි වර්ග වෙළඳ පොළට දමන්නට දැන් අපි කටයුතු කරගෙන යනවා. එම කර්මාන්තය දියුණු කරගන්නට පුළුවන් වේවිය කියා මා විශ්වාස කරනවා. ඒවා අපනයනය කිරීම සම්බන්ධයෙන් අපි දැනට සිතල නැහැ. නමුත් අපනයනය කරන්න වුණත් හොඳ තත්ත්වයක රෙදි දැනටමත් නිෂ්පාදනය වෙනවා.

ඒ වාගේම නමුන්නාන්සේලාට මතක් කළ යුතු තවත්, කාරණයක් තිබෙනවා. නමුන්නාන්සේලා කිව්වා යන්යන්ත්‍ර රෙදිකර්මාන්තය ඉන්දියාවේ දියුණු වී තිබෙනවාය කියා. එය ඇත්ත. ඉන්දියාවේ ඒ සඳහා යම්කිසි ආරක්ෂක සංවිධාන තිබෙනවා. එපමණක් නොවෙයි ඒ අය සෑම අවුරුද්දකටම දෙවරක් පමණ මිල අඩුකර එම රෙදි මහජනයාට විකුණනවා. නමුත් නිෂ්පාදකයාට නියම මිල රජයෙන් ගෙවන සිරිතක් තිබෙනවා. අපිත් දැන් ඒ කරුණු කල්පනාවට භාජනය කර තිබෙනවා. අපි හිතන්නෙ කොහොමද අපි මෙය කරන්නෙ කියලයි. අපි අර ගිය ගමනෙන් පසු කීප වරක්ම ගරු ඇමතිතුමා සමග මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. අපි බලනවා අපටත් එහෙම දෙයක් කරන්න පුළුවන්ද කියා. එහෙම කරන්න පුළුවන් වුණොත් බොහොම ඉක්මණට අත්යන්ත්‍ර රෙදිකර්මාන්තය දියුණු කරන්න පුළුවන් වෙයි. නමුත් අපි ටිකක් ප්‍රවේශම් වෙන්න ඕනැ. යන්ත්‍ර සවි කිරීම පමණක් නොවෙයි, වැඩි පිරිසකට රක්ෂාවල් දීම ගැන පමණක් නොවෙයි, අපි කල්පනා කළ යුත්තේ. නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ප්‍රශ්නය ගැන තමයි අපි වැඩියෙන් සැලකිලිමත් වෙන්න ඕනැ. ඒ නිසා ඉතාම ප්‍රවේශමෙන් මේ කටයුතු කරගෙන යන්න ඕනැ. ඊට අමතරව අපට මෙතෙක් බොහොම සුළුවෙන් තිබුණ ජැකාඩ් යන්ත්‍ර වැඩි ප්‍රමාණයක් මෙහි ගෙනැවිත් සවි කරන්නට කටයුතු සූදානම් කර තිබෙනවා. අපි විදේශ ආධාර ලබාගෙන අත්යන්ත්‍ර රෙදිකර්මාන්ත දියුණු නොකරන්නේ මන්දැයි එක් මන්ත්‍රිවරයෙක් ඇහුවා. මා සන්තෝෂයි ඒ ප්‍රශ්නය ඇසීම ගැන. නෝරාඩ් ආධාර යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ රෙදිකර්මාන්ත කටයුතු කරන්න අපි බලපොරොත්තු වෙනව. මන්ත්‍රිවරු ගණනාවක්ම අපට මේ පිළිබඳව දැන්නුවා. විශේෂයෙන් තංගල්ල මන්ත්‍රීතුමා (ජිනදස වීරසිංහ මහතා) පාර්ලිමේන්තු කාරක සභාවට මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. ඉන් පසුව නෝරාඩ් ආධාර යටතේ ඒ දිස්ත්‍රික්කයේ රෙදිකර්ම මධ්‍යස්ථාන 12 ක් ඇති කරන්න අපි කටයුතු කරනවා. ලබන අවුරුද්දේ පෙබරවාරි-මාර්තු වන විට ඒවායේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනවා. මේ විදේශ ආධාර ලබාගෙන අනික් ප්‍රදේශවලත් අත් යන්ත්‍ර රෙද කර්මාන්තය දියුණු කරන්නට අපි කල්පනා කර තිබෙනවා. එය කරන්න අපි පුළුවන් තරම් මහන්සි වෙනවා. මේ කර්මාන්තය දියුණු කරනවාත් සමගම එම නිෂ්පාදනත් හොඳ තත්ත්වයෙන් තබන්න අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම අත්යන්ත්‍ර රෙදිකර්මාන්තයේ නිෂ්පාදන තත්ත්වය ගැන අපට සන්තොෂ වෙන්න පුළුවන්. දැනටමත් පිටරට යවන්න පුළුවන් තත්ත්වයෙන් ඒවා තිබෙනවා. මෙතෙක් කල් අත්යන්ත්‍ර කර්මාන්තයේ නිෂ්පාදන පිටරට යවා තිබුණේ නැහැ. දැන් අපි ඒවා පිටරට යවනවා. අපි යම් යම් සම්මන්ත්‍රණවලට ඒ වාගේම ප්‍රදර්ශනවලට අපේ අයව යවනවා. ඒවායින් ලැබෙන ඇනවුම් අනුව අපි පිටරට යවනවා. පසුගිය අවුරුද්දේ පමණක් ලක්ෂ අනුවක අත්යන්ත්‍ර රෙදිපිළි පිටරට යවා තිබෙනවා. මා හිතන්නේ මේ අවුරුද්දේ ඒ ප්‍රමාණය තව ටිකක් වැඩි කරගන්න අපට පුළුවන් වෙයි. මේ අන්දමට දස ලක්ෂ නවයක රෙදිපිළි පිටරට යවන්න පුළුවන් වී තිබෙන්නේ අපේ රෙදිපිළි යම්කිසි හොඳ තත්ත්වයකින් තිබෙන නිසයි. මේ තත්ත්වය දිගටම පවත්වාගෙන යන්නට ඕනැ. ඒ නිසයි අපේ වැඩපිළිවෙළ ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරන්නේ. මෙය ඉක්මන් කරන්නැයි මන්ත්‍රීතුමන්ලා කිව්වා. අපට ඉක්මන් කරන්න පුළුවන්. නමුත්-

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

දෙපාර්තමේන්තුව සංස්ථාවකට හැරෙව්වොත් හොඳ නැද්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

සංස්ථාවකට හැරෙව්වොත් වැඩේ ඉක්මන් වෙන එක ඇත්ත. නමුත් සමහර සංස්ථා ආර්ථික වශයෙන් විඳින දුක ගැන බැලුවාම, සමහර සංස්ථාවලට සිදු වී තිබෙන කරදර ගැන බැලුවාම අපි ටිකක් ප්‍රවේශම් විය යුතුයි. දෙපර්තමේන්තුවල මුදල් හදල් පිළිබඳ ඝහංචි තිබෙන එක ඇත්ත. ඒ තහංචිවලට පිළියම් යොදන්න පුළුවන්.

**අනිල් මුණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

දිරිගැන්වීම් බෙහොම අමාරුයි කරන්න.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

අපි ඒ ගැනත් කල්පනා කර තිබෙනවා, යම්කිසි වැඩ පිළිවෙලක් යොදන්න. "වේටෙක්ස්" සමූපකාර සමිති හදල ඒ මාර්ගයෙන් මේ කටයුත්ත කරන්න අපි කල්පනා කර තිබෙනවා. ඒ විධියේ සමූපකාර සමිතියක් හදන්නය කියා අපි ඉල්ලා තිබෙනවා. එහෙම වුණොත් ඇත්ත වශයෙන්ම මේ වැඩ කටයුතු පමණක් නොව අත්යන්ත්‍ර පේෂකර්මාන්තයට අවශ්‍ය සම්පූර්ණ නූල් ප්‍රමාණය ඒ සමූපකාර සමිති මාර්ගයෙන් රටට බෙද හරින්න පුළුවන්. එවිට ඒ අයට ඕනෑ නම් එතනිනුත් ආදයමක් ලබාගන්න පුළුවන්. පොඩි කොමිස් එකකට දෙන්න අපි ඒ අයට දන්වලා තිබෙනවා. නමුත් ඒ අය තවම ක්‍රියාත්මක වුණේ නැහැ. ඇත්ත වශයෙන්ම අපට ඒ අය පිටුපස්සේ යන්නත් බැහැ. එය සමූපකාර ව්‍යාපාරයක්. අපේ රෙදිවල තත්ත්වයත් ආරක්ෂා කරගෙන අපේ රටට වුවමනා කරන — ජනතාවට වුවමනා කරන — රෙදි නිෂ්පදනය කර එය ඉක්මණින් විකුණා ගන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ.

**අනිල් මුණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

සමූපකාර දෙපාර්තමේන්තුව හා පේෂකර්ම දෙපාර්තමේන්තුව අතරේ සම්බන්ධය සමහර අවස්ථාවලදී මදිය කියා මා හිතනවා. එහි දියුණුවක් ඇති කරන්න ඕනෑය කියා මා විශ්වාස කරනවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ගරු මන්ත්‍රීතුමනි, අපි එයටත් පිළියම් යෙදුවා. අපේ අධ්‍යක්ෂවරයාට බලතල පවරා ඔහු නියෝජ්‍ය සමූපකාර කොමසාරිස්වරයකු හැටියට පත් කළා. ඉන් පසුව සමූපකාර දෙපාර්තමේන්තුවේ සිටි නිලධාරී මහත්මයෙකුත් අපේ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ගත්තා. පේෂකර්ම සමූපකාර සමිති දුවවන්න ඒ මාර්ගයෙනුත් අපි බැලුවා. නමුත් එහි යම් යම් අඩුලුහුඩුකම් තිබෙනවා. සමහර අවස්ථාලදී නීති හරස් වෙනවා. සමහර අවස්ථාවලදී සමූපකාර ආඥපණතේ යම් යම් දේවල් හරස් වෙනවා.

**අනිල් මුණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

මූලික ප්‍රශ්නය මුදල් මදි කමයි.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

මුදල් අමාරුකමත් තිබෙනවා. නමුත් අපි ඒ අයට උදව් කළා. පුළුවන් තරම් උදව් කර තිබෙනවා. මුදල් අමාරුකම් තිබෙනවා නම් ණයට මුදල් දෙනවා. ඒ අය ඒවා අරගෙන ගිහින් නිෂ්පාදනය කර, ඒවා විකුණා, අපට සල්ලි ගෙවන්න සැලැස්සුවා. සමහර සමිතිවලට අපි ලක්ෂ දෙක තුන ණයට දී තිබෙනවා. සමහර සමිති හොඳට ක්‍රියාත්මක වී අපේ ණය අපට ආපසු ගෙවා තිබෙනවා. සමහර සමිතිවලින් තව පොඩි පොඩි අය කිරීම් ලැබෙන්නට තිබෙනවා. නමුත් ඒ සෑම සමූපකාර සමිතියක්ම ණය ගෙවනවාය කියා අපට පොරොන්දු වී තිබීම ගැන මා සතුටු වෙනවා.

මේ වැඩ පිළිවෙල ගමට ගෙන යන්නට ඕනෑය කියා කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කිව්වා. මා සතුටු වෙනවා ඒ අදහස ගැන. කොට්ඨාශයකට තුන බැගින් මධ්‍යස්ථාන 450 ක් ඇති කරන බව මා කලින් කිව්වා. ඒ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන කොට ඒක නිරායාසයෙන්ම ගමට යනවා. ඒ හාරසිය පණහ පිහිටුවා අවසාන වුණාම යළිත් කල්පනා කර බලමු, තවත් හාරසිය පණහක් ඇති කරන්නට.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඉදිරි අවුරුදු පහම ගත වෙයි ඕවා පිහිටුවන විට.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඒ තරම් කල් යන්නේ නැහැ. 1985 වර්ෂය ඇතුළත ඒ හාරසිය පණහම විවෘත කරන්නට අපි පුළුවන් තරම් මහන්සි ගන්නවා. දැනටමත් කීපයක් විවෘත කර තිබෙනවා.

පිටරටින් ආනයනය කරන නූල් මේ රටේ තිබෙනවාය කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා. එහෙම තියෙද්දීත් ආනයනය කරනවා නම් අපි කණගාටු වෙනවා. නමුත් එහෙම තියෙන්න විධියක් නැහැ. මේ රටේ නිෂ්පාදනවලට වුවමනා කරන නූල් අපි සම්පූර්ණයෙන්ම මේ රටේම නිෂ්පාදනය කරනවා. කෘතිම නූල් වැනි අපට නිෂ්පාදනය කරන්නට බැරි නූල් තිබෙනවා නම් ඒවා පමණයි අමාත්‍යාංශයේ බලපත්‍ර උඩ මේ රටට ගෙන්වන්නට ඉඩ දී තිබෙන්නේ. මා සිතන හැටියට අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් ඒක දන්නවා ඇති. දැනට පෞද්ගලික අංශයේ අත් යන්ත්‍ර පේෂකාර්මික නිෂ්පාදනයත් පිටරට යවනවා. දෙපාර්තමේන්තුව මඟින් පමණක් ලක්ෂ 90 ක එවැනි නිෂ්පාදන පිටරට යැවූ බව මා සඳහන් කළා. පෞද්ගලික අංශයත් අත් යන්ත්‍ර නිෂ්පාදනයත් පිටරට යවනවා. අපේ කම්හල්වලින් ඒ අයට හොඳ නූල් ලැබෙන්නේ නැති නිසා පිටරටින් නූල් ආනයනය කරන්නට ඉඩ දෙන ලෙස ඒ අය අපෙන් ඉල්ලීමක් කර තිබෙනවා. ඉන්පසු අපි ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පවත්වා ඒ අයට ඕනෑ කරන තත්ත්වයේ නූල් දෙන්නැයි අපේ කම්හල්වලට කිව්වා. කම්හල් පොරොන්දු වී තිබෙනවා, ඒ ඉල්ලන තත්ත්වයේ නූල් ඒ මාසයේ නූල් සපයන්නට. එසේ සපයන්නට බැරි නූල් ප්‍රමාණය පමණක් පිටරටින් ගෙන්වන්නට අපි ඉඩ දී තිබෙනවා. අපට ඒවා මේ රටේ නිෂ්පාදනය කරන්නට බැරි නම් පිටරටට අපනයන කරන නිෂ්පාදනවලට ඒ නූල් අවශ්‍ය නම් අපි ඒ නූල් ආනයනය කරන්නට පෞද්ගලික අංශයට ඉඩ දී තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

නූල් සැපයීමේ අමු ද්‍රව්‍ය අපේ රටෙන්ම ගන්නට බැරිද ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

නූල් සපයන්නට වුවමනා කරන අමු ද්‍රව්‍ය කියන්නේ කපු නේද ? කපු බොහොම පොඩ්ඩයි මේ රටේ නිෂ්පාදනය කරන්නේ. ඒක අපේ අමාත්‍යාංශයට අයිති එකක් නොවෙයි. ඒක අයිති කෘෂිකර්ම අමාත්‍යාංශයට.

**අනිල් මුණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

කෘෂිකර්ම ඇමතිතුමා සමග ඔබතුමා දැනට සාකච්ඡා කරගෙන යනවා නේද ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඔව්. ඒක අපි අවුරුදු ගණනාවක් තිස්සේම කිව්වා. මේ රටේ නිෂ්පාදනය කරන සම්පූර්ණ කපු ප්‍රමාණයම මිලදී ගන්නට අපි සූදානම් බව කිව්වා. මක්නිසාද ? අපේ කර්මාන්තශාලාවලට කපු ඕනෑ. කපු වගාව භාරව



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා]

තිබෙන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයටයි. දැන් අමාත්‍යාංශ දෙකම එකඟත්වයක් පළ කර තිබෙනවා අළුත් වැඩපිළිවෙළකට. ඒ වැඩපිළිවෙළ සාර්ථක වුණොත් අපට වුවමනා කරන කපු ටික මේ රටේම වගා කරගන්නට පුළුවන් වෙයි. කපු වගාව සම්බන්ධයෙන් අද තිබෙන තත්ත්වය නම් කණගාටුදායකයි. අද අපට වුවමනා කරන කපු වලින් සියයට 5 ක ප්‍රමාණයක්වත් අපි නිෂ්පාදනය කරන්නේ නැහැ. එම නිසා අපට වුවමනා කරන ප්‍රමාණයෙන් සියයට 95 ක්ම කපු අවුරුද්දකට රුපියල් දස ලක්ෂ 1,500 ක් පමණ වැය කරමින් ආනයනය කරන්න සිද්ධ වී තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

බ්‍රිතාන්‍යයන් මේ රටේ සිටි කාලයේ කපු වගාව පටන් ගත්තේ.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

එහෙම නම් ඒ ගැන අපට දෙස් කියන්නට බැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

දෙස් කියන්නේ ඔක්කොටම.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය ගැන මා ඊට වඩා යමක් කියන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරු සියලු දෙනාම වාගේ අපේ පෙහෙකම්හල්වල පාලනය වෙනත් අයට දීම ගැන සඳහන් කළා. සමහර විට ඒවා ඉන්දියානු සමාගම්වලට දුන් නිසා ඒ මතය පළ කළාදැයි මා දන්නේ නැහැ. නමුත් ඒ ඔක්කොම ඉන්දියානු සමාගම් නොවෙයි. වැඩි හරියක් ඉන්දියානු සමාගම් වෙන්නට පුළුවනි. ඉන්දියානු කියන නිසා අපි වැරදි ආකල්පයක් හිතේ තබාගෙන කටයුතු කිරීම වැරදියි. [බාධා කිරීමක්] මේ එම ප්‍රවේශම් විය යුතු ප්‍රදේශයේ අය නොවෙයි. මෙයින් එක කණ්ඩායමක් කොයම්පුතුර්වලයි. අනික් කණ්ඩායම බොම්බායේ. ඒ නිසා මෙය අපි ඒ තරම්ම බිය වන්නට ඕනෑ කරුණක් නොවෙයි. කර්මාන්තශාලාවල හොඳ පාලනයක් ඇති කරන්නට මේ පියවර ගන්නට සිදු වුණා.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

අපිට ඒ ගිවිසුම බලන්න පුළුවන්ද ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඔව්. ඒ ගිවිසුම ගැනත් කියන්නම්. ගිවිසුම ගැන තමුන්නාන්සේලා මීට කලින් ප්‍රශ්න මතු කළ නිසා අපි ඒ ගැන බැලුවා. ඒ අනුව අපි දැනට සාකච්ඡා කරගෙන යනවා. ඒ ගිවිසුමේ මොනවා හෝ වැරදි තිබෙනවා නම් ඒවා හරිගස්සන්නට. තමුන්නාන්සේලා අපට කියා තිබෙන යම් යම් දේවල් ඇත්ත වශයෙන්ම හරිගස්සන්නට ඕනෑ.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

ඒ ගිවිසුම "ටේබල්" කරන්න බැරිද ? ටේබල් කරන්න පුළුවන් නම් බොහොම හොඳයි.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

තමුන්නාන්සේලා අපට දන්වා තිබෙන ඒවා ගැන බලා "ටේබල්" කරන්නම්. ගිවිසුමක් අනුව දැන් කර්මාන්තශාලා ටික කරගෙන යනවා. තමුන්නාන්සේලා අපට යම් යම් දේවල් දන්වා තිබෙනවා. අපි දැන් ඒ කරුණු ගැන සාකච්ඡා කරගෙන යනවා. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා හිතන තරම් භයානක තත්ත්වයක් ඒවායේ නැහැ. තමුන්නාන්සේලා මොනවා හිතනවාද මම දන්නේ නැහැ. ඒ තරම් භයානක තත්ත්වයක් නම් එහි නැහැ.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

ගිවිසුම දැක්කොත් නම් කියන්නට පුළුවන්.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඇත්ත වශයෙන්ම අපි කටයුතු කරගෙන යන්නේ මෙතෙක් කල් ලත් අත්දැකීම් තුළිනුයි. අවුරුදු තුන හතරක් දැන් අපි මෙය කර තිබෙන නිසා ඒ අත්දැකීම් තුළින් මොන මොන වෙනස්කම් කළ යුතුදැයි බලා අපි දැන් එය කරගෙන යනවා. ඊට පසුව ගරු ඇමතිතුමාගෙන් ඒවා බලාගන්නට තමුන්නාන්සේලාට පුළුවන්.

මෙහිදී මට පෙනෙන්නට තිබෙන තවත් දෙයක් තිබෙනවා. මේවා ඉන්දියානු සමාගම්ය කියන වැරදි ආකල්පය ඇති කරගන්නට හොඳ නැහැ. අපට මෙය එදා සිටම ලොකු හිසරදයක්ව තිබුණා. මේ සම්බන්ධයෙන් වැරදි ආකල්පයක් තබාගෙන ඉන්නවා. එක මන්ත්‍රීතුමෙක් කිව්වා පන් දහස් ගණනකට රක්ෂා නැති වුණාය කියා. තවත් මන්ත්‍රීතුමෙක් කිව්වා නඩු 15,000 ක් තිබුණාය කියා. එය පිළිගන්න මම කැමති නැහැ.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

නඩු තිබුණා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

15,000 ක් ?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

15,000 ක්ද කීයක්ද මම දන්නේ නැහැ. නමුත් සැහෙන නඩු ගණනක් තිබුණා. තමුන්නාන්සේලාගේ සංස්ථාවෙන් ඇපැලක් අරගෙන ඒවා දැන් කොහේදෝ හිර වී තිබෙනවා. ඒ අයට රක්ෂාත් නැහැ ; වෙන මොකවත් ඇත්තේත් නැහැ. එය සම්පූර්ණයෙන් දේශපාලන පළිගැනීමක්.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

එය දේශපාලන පළිගැනීමක් යයි අපේ කලවානේ ගරු මන්ත්‍රීතුමා කිවත් අපි එය පිළිගන්නේ නැහැ. දැන් මෙය පටලවා ගෙන දඟලනවා. මේ සිද්ධීන් ඔක්කොම ඇති වුණේ මේවායේ කළමණාකරණය මේ සමාගම්වලට දුන්නාට පසුව යයි අපට චෝදනා කරනවා.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

ඒක එකක්. තවත් තිබෙනවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

කොම්පැනිවලට කළමනාකරණය දුන්නාට පසුව මෙපමණ පිරිසක් මොනම ආකාරයකින් හෝ අස් කළේ නැහැ.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

අවස්ථා දෙකකදී අස් කළා. එකක් 1977 තමුන්නාන්සේලා බලයට පැමිණි අවස්ථාවේ දේශපාලන පළිගැනීම් වශයෙන් තුල්හිරියෙන් පිරිසක් අස් කිරීමයි. ඊට පසුව ඉන්දියානුන්ට මේවා දුන්නාට පසුව ඔවුන් තවත් කොටසක් අස් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

මෙහිදී අදහස් තුනක් ඉදිරිපත් වුණා. 1977 දී දේශපාලන පළිගැනීම් වශයෙන් අස්කළාය කියනවා. ඊට කලින් ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා කොහේදෝ " ෆෙවුන්ඩේෂන් " එකක තිබුණු රැස්වීමකින් පසුව පළිගැනීමට අස් කළාය කියා. ඒ නිසා නඩු 15,000 ක් තිබෙනවා යයි කිව්වා. දැන් කලවානේ ගරු මන්ත්‍රීතුමා කියනවා ඊට පසුව කොම්පැනි කාරයින් විසිනුත් අස් කළාය කියා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

ඔය කියන්නේ එක එක මන්ත්‍රීතුමන්ලාගේ අත්දැකීම් 1977 දී තමුන්නාන්සේලා විසින් පිරිසක් අස් කළ බව මම දන්නවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

1977 දී දේශපාලන පළිගැනීම්වලටය කියා අපි කිසිම කෙනෙක් අස් නොකළ බව කරුණාකර මතක තබා ගන්න.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

එහෙම කියලා අස් කළේ නැහැ.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

එහෙනම් මොනවාද කිව්වේ ?

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

අස් කළා. ඒකයි වුණේ.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

අපි කිසිම කෙනෙක් අස්කළේ නැහැයි මම කියනවා. නමුත් ඒ සේවකයින්ට කර්මාන්ත ශාලාවට එන්නට බැරි තත්ත්වයක් තිබිලා තිබෙනවා. කාරණය මොකක්ද කියා අපි දන්නේ නැහැ. මාස ගණනක් යම් සේවකයෙක් වැඩට ආවේ නැත්නම් ඒ අය සේවය අතහැර ගියාසේ සලකනවා මිස, ඒ හැර අපි වෙන මොනවා කරන්නද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

සේවයට යන විට යම්කිසි පිරිසක් ඔවුන්ට යන්නට ඉඩ දුන්නේ නැහැ.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

එකම එක තැනක එවැනි තත්ත්වයක් තිබුණා. ඒකත් ඔය කර්මාන්තශාලාවේ නොවෙයි. [බාධා කිරීමක්.]

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

වැල්ලවත්තේ තත්ත්වය මොකක්ද ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

වැල්ලවත්තේ එවැනි දෙයක් තිබුණේ නැහැ. වැල්ලවත්තේ අස් කරලත් නැහැ.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

අස් කරලා නොවෙයි. ඒ අයට රක්ෂාවල් නැති වෙන්න යනවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඒකට මම වෙනම උත්තරයක් දෙන්නම්. ගරු ඇමතිතුමාත් එයට උත්තරයක් දෙනවා ඇති.

මම මේ කියාගෙන ආවේ මෙයයි. සේවකයින් අස් කර තිබෙනවා යයි තමුන්නාන්සේලා චෝදනා කළා. කී දෙනෙකුගේදයි ගණන කියන්නේ නැහැ. එක් කෙනෙක් 15,000 යි කියනවා. තව කෙනෙක් 5,000 යි කියනවා. හරියට කවුරුවත් ගණන දන්නෙත් නැහැ. අපි දේශපාලන වශයෙන් තුල්හිරියේ කිසිම සේවකයෙක් අස් කර නැහැ. මෙය එදා සිටම තිබුණු දෙයක්. තමුන්නාන්සේලා පිළිගන්නවාද, මම දන්නේ නැහැ. සමහර අවස්ථාවල සමහර ෆැක්ටරිවල පළමුවැනි මාස හයේ දවස් 72 ක් හෝ 78 ක් සේවයට පැමිණිලා නැහැ. ඒ අතරතුර රජයේ නිවාඩු දවස් කීයක් තිබෙනවාද ? ඊට අමතරව සතියකට දවස් දෙකක් නිවාඩුයි. ඒ අනුව ඒ මාස හය තුළ වැඩ කරන්න තිබෙන්නේ දවස් කීයද ? නමුත් වැටුප් සහිත නිවාඩු ලබාගෙන ඒවා ඉවර වී වැටුප් රහිත නිවාඩුත් 78 ක් ලබා ගෙන තිබෙනවා. ඒ කාලය තුළ. එහෙම නම් මාස හයක් හෙවත් දවස් 180 ක් තුළ, කලින් සඳහන් කළ සාමාන්‍ය නිවාඩු, රජයේ නිවාඩු හා වැටුප් සහිත පෞද්ගලික නිවාඩුවලට අමතරව තවත් දවස් 78 ක් වැටුප් රහිත නිවාඩුත් ලබාගෙන තිබෙනවා නම් ඒ කර්මාන්තශාලාවේ ප්‍රගතිය මොකක්ද

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

නියෝජ්‍ය ඇමතිතුමා ඇත්ත තත්ත්වය පිළිගන්නවා නම් මේ දේත් පිළිගන්න ඕනැ. 1977 දී—මහා මැතිවරණයෙන් පස්සේ—ජේ. එස්. එස්. එකේ ප්‍රන්ටාකාරයන් කැති, පොලු අරගෙන ඒ කර්මාන්තශාලාවල ගේට්ටු ළඟ ඉඳලා කළේ මොකක්ද ? යූ. එන්. පී. එකට විරුද්ධව වැඩ කළාය කියා කල්පනා කළ මිනිසුන්ට පහර දුන්නා. ඇතුලට එන්න නොදී. එවැනි තත්ත්වයක් යටතේ කොහොමද, ඒ උදවිය වැඩට යන්නේ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

1977 අපි බලයට පත් වන විට ඔය 'ජේ.එස්.එස්.' එක එහෙම නැත්නම් "ප්‍රන්ටාකාරයෝ" කියන අයගේ සංවිධානයක් තිබුණේ නැහැ.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

බොහෝ ඉක්මනින් - දවසින් - දෙකෙන් - ඒ අය එකතු වුණා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඒ ගම්වල උදවිය මොනවා කර ගන්නද කියන්න මම දන්නේ නැහැ. නමුත් ඒ දවස්වලම ඒ චෝදනාවක් ඉදිරිපත් කළා නම් ඒ ගැනස සොයා බලන්න තිබුණා. අපි කියන්නේ මේකයි. යම් සේවකයෙක් මම කලින් විස්තර කළ පරිදි, වැඩට ඇවිත් නැත්නම් අපි මොකක්ද, කළ යුත්තේ ?

**අනිල් මූණසිංහ මහතා (මතුගම)**
**(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)**
(Mr. Anil Moonesinghe-Matugama)

"සී. ටී. බී." එකෙත් ගහලා එළෙව්වා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

අපි බලයේ ඉන්න කාලයේදීද, එහෙම නැත්නම් තමුන්නාන්සේලාගේ කාලයේදීද ? මතුගම ගරු මන්ත්‍රීතුමා (අනිල් මූණසිංහ මහතා) එහි සභාපති වශයෙන් සිටි කාලයේ වෙන්න ඇති ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

මහ මැතිවරණයකට පස්සේ නොයෙක් විධියේ දෙවල් සිදු වන බව මම පිළිගන්නවා. නමුත් මෙතැන පණහක් - හැටක් වගේ ටික දෙනකුට නොවෙයි, අති විශාල පිරිසකට ඒ තත්ත්වය උද වී තිබෙනවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඒ තරම් විශාල ප්‍රමාණයකට ඒක වුණේ නැහැ, එක දවසේ. ඒ තත්ත්වය ඇති වී තිබෙන්නේ මම කලින් විස්තර කළ තත්ත්වය යටතේයි. එය දැනටත් සිදු වෙනවා. යම් සේවක පිරිසක් අසාමාන්‍ය විධියට වැඩට නොඑනවා නම් ඒ අය එන තුරු යන්ත්‍රෝපකරණ ටික නතර කර තබා ගන්නයයි, නමුන්නාන්සේලා අපට කියනවාද ? සමහර දවස්වල කර්මාන්තශාලාවේ වැඩට එන්නේ නැහැ, 200ක් වත්. එවැනි තත්ත්වයක් යටතේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන ධාරිතාව පවත්වාගෙන යන්නේ කොහොමද ? ලාභ සහිතව ඒ කර්මාන්තශාලාව පවත්වාගෙන යන්න පුළුවන්ද, ඒ විධියට ? ඒ නිසා සේවයට පැමිණිය යුතු අනිවාර්ය දවස් ගණනක් නියම කර තිබෙනවා. ඒ සඳහා දිරිගැන්වීම් පවා කර තිබෙනවා. වැඩිපුර දවස් ගණනක් වැඩට ආ අයට වැඩිපුර පඩිත් දෙනවා. ඒ වැඩ පිළිවෙළ යටතේ යම් සේවකයෙක් දවස් තිහ - හතළිහක් පඩි රහිත නිවාඩු ගියොත් ඒ අය සේවයෙන් ඉවත් කරන්න සිදු වෙනවා. ඒ තත්ත්වය ඇති වී තිබෙන්නේ දේශපාලනයක් නිසාවත්, අර කොම්පැණි ඒ කර්මාන්තශාලා භාර ගැනීම නිසාවත් නොවෙයි. මේක හැම දාමත් කරගෙන යන වැඩක්. යම් සේවකයන් පිරිසක් ඕනෑවට වඩා පඩි රහිත නිවාඩු ගියොත්, නොදන්වා සේවයට නොපැමිණියොත් එවැනි සේවකයන් වෙනුවට වෙනත් අය බඳවා ගන්න අපට සිදු වෙනවා. එහෙම නැත්නම් කොහොමද, ඒ කර්මාන්තශාලාවල ඇති යන්ත්‍ර ක්‍රියා කරවන්නේ ? ඒ නිසා ඒ වැඩ පිළිවෙළ අලුත් එකක් නොවන බව නැවතත් අවධාරණයෙන් මතක් කරන්න කැමතියි.

මුල් හය මාසය තුළදී ගරු ඇමතිතුමායි, මමයි එක් කර්මාන්තශාලාවකට ගියා. මම මුලින් විස්තර කළ පරිදි සාමාන්‍ය නිවාඩුවලට අමතරව තමන්ගේ වැටුප් සහිත නිවාඩුත් අරගෙන ඉවර වී, ඒ මුල් හය මාසය තුළ වැටුප් රහිත නිවාඩුත් 78 ක් ලබාගෙන තිබෙන සේවකයන් ගැන අපට එහිදී දැන ගන්න ලැබුණා. ඉතින්ම කොහොමද, කර්මාන්තශාලාවේ දුවන්නේ ? ඒ විධියට කර්මාන්තශාලාවක් දුවවන්න පුළුවන්යයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා කල්පනා කරනවාද ?

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

තුල්හිරිය කර්මාන්තශාලාව සම්බන්ධයෙන් නමුන්නාන්සේලා කළේ මොකක් ? ඒ සම්බන්ධ නීති වෙනස් කරලා ඒක කාටද පැවරුවා. ඉන්පසු ඒ ගැන කම්කරු උසාවියේ නඩුවක් පැවරූ අවස්ථාවේදී නමුන්නාසේලා නීති ප්‍රශ්නයක් මතු කරමින් කීවා, " වග-උත්තරකාරයා වෙන කෙනෙක්ය " කියා. ඒ නිසා තවත් එහි තීන්දුව ලැබී නැහැ. දැන් ඒ පිළිබඳව අභියාචනයක් ඉදිරිපත් කර තිබෙනවා. කම්කරු උසාවියේ නඩුවලට අභියාචනා ඉදිරිපත් කළාම අවුරුදු පහක්-හයක් විතර ඒවා හිර වී තිබෙනවා. දැන් වෙලා තිබෙන්නේ ඒකයි. මේක ලොකු අසාධාරණයක්.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඉතින් ඒ ගැන අපි මොනවා කරන්නද ? අපේ අමාත්‍යාංශයෙන් නීතියක් වෙනස් කර තිබෙනවාද ?

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

හිඟ පඩි සල්ලි පැත්තක තියන්න. දැනට සේවය අහිමි කොට තිබෙන, තුල්හිරියේ අවුරුදු ගණනාවක් සේවය කළ ඒ සේවකයන්, නමුන්නාන්සේලාට ලැබෙන පළමු අවස්ථාවේදීම පුරප්පාඩු පිරවීම සඳහා යොද ගන්නා බවට පොරොන්දුවක් දෙන්න පුළුවන්ද ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

පුරප්පාඩු පුරවන්න කියන්නේ අස් වී ගිය සේවකයන්ගෙන්ද ?

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

ඔව්.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඒ අය වැඩට ගත්තොත් නැවතත් පරණ විධියටම ගෙදර ඉඳියි.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

නමුන්නාන්සේ හිතනවාද, ඒ අය නිකම්ම-හේතුවක් නැතිව ගෙදර නවතියි කියා ? ඒ අයට පිස්සුය කියා හිතනවාද ? එහෙම නම් ඒ අය මානසික රෝහලකට යවන්න ඕනෑ.?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

මින්නේරියේ කර්මන්තශාලාව වහන්න ප්‍රධාන හේතුව වුණෙත් සේවකයන් වැඩට නොපැමිණීමයි. සියයට 40 ක් වැඩට එන්නේ නැහැ. එහෙම නම් අපට කියන්නේ මොකක් කරන්න කියාද ? එසේ වැඩට නොඑන සේවකයන් නැවත බඳවා ගන්න කියාද අපට කියන්නේ ? මින්නේරිය, තුල්හිරිය ආදි වශයෙන් ඒ සැම තැනකම තිබෙන්නේ ඒ වැඩට නොඑන ලෙඩේ තමයි. [බාධාකිරීම්]

අපේ කර්මාන්තශාලාවල සේවයන්ගේ පඩි වැඩි කර නැහැ කියාත් සමහර ගරු මන්ත්‍රීවරුන් කීවා. තුල්හිරියේ කම්හලෙහි සේවකයින්ගේ මාසික දළ ඉපයීම 1980 දී රු. 660 යි. 1981 දී රු. 684 යි. 1982 දී රු. 797 යි. 1983 දී රු. 1,001 යි. 1984 දී රු. 1,145 යි. මෙයින් පැහැදිලියි ඒ අයගේ පඩි වැඩි කර ඇති බව. නමුත් විරුද්ධ පාර්ශ්වයේ නමුන්නාන්සේලා කියනවා, පඩි වැඩි කර නැතැයි කියා. ඒ වාගේම පූගොඩ කම්හලේ සේවකයින්ගේ පඩි වැඩි කර ඇති ආකාරය මෙහෙමයි. 1980 දී රු. 698 යි. 1981 දී 1,003 යි. 1982 දී රු. 1,236 යි. 1983 දී රු. 1,969 යි. 1984 දී රු. 1,300 යි. මේ එක් සේවකයකුගේ දළ ඉපයීමයි.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

ඔය හැම දෙනාගේම දළ ඉපයීමද ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

නැහැ. සාමාන්‍යයෙන් සේවකයන්ගේ දළ ඉපයීමයි. මාසයකට දවස් 10 ක් වැඩට ඇවිත් මේ මුදල ලබා ගන්නට බැහැ.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

average of all ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

No. මේක එක සේවකයකුගේ දළ ඉපයීමයි. මෙම ඉපයීම සාමාන්‍යයෙන් දැනට එහි සේවය කරන අයට ගෙවනවා. වැඩට පැමිණෙන්නේ නැති අයට ඒ මුදල ලැබෙන්නේ නැහැ.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

සමහර අවස්ථාවලදී ඕවාගෙ, එන්නෙ නැති උදවියටත්, ඔයිට වැඩිය හම්බු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඒක මම දන්නෙ නැහැ. මේ කර්මාන්ත ශාලාවල ඇතුළෙ නම් එහෙම දෙයක් වෙන්නෙ නැහැ. ඒ විධියට කාටවත් ලැබෙන්නෙ නැහැ. එහෙමනම් පිටස්තර තැන්වල වෙන්න ඇති.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

එහෙම දේවල් ලංකාවෙ ඇතුළෙ වෙනවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

වෙන්න ඇති. නමුත් මම දන්නේ නැහැ. මේ කර්මාන්තශාලාවල නම් නැහැ. එතුමා තර්කයක් මතු කළ නිසයි මම මේවා ගැන කියන්නේ.

ඊළඟට වේයන්ගොඩ කම්හලේ සේවකයින්ගේ මාසික දළ ඉපයීම මෙහෙමයි. 1980 දී රු. 569 යි. විශේෂයෙන්ම වේයන්ගොඩ කම්හල ගැන අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) සඳහන් කරමින්, එහි සේවයන්ට පඩි වැඩි කර නැතැයි කිව්වා. නමුත් මේ සංඛ්‍යාලේඛන එතුමාට පෙනෙනවා ඇති සේවකයන්ගේ පඩි වැඩි කර ඇති ආකාරය. 1981. දී රු. 927 යි. 1982 දී රු. 1,131 යි. 1983 දී රු.1,465 යි. 1984 දී රු. 1,485 යි. එහෙමනම් අපේ ආණ්ඩුව මෙම සේවකයන්ට පඩි වැඩි කර නැත, පාර්ලිමේන්තුවෙන් අනුමත කරන වැඩි කිරීම් ලබා දෙන්නෙත් නැත කියා අපට චෝදනා කිරීම සාධාරණද ?

ඊළඟට මත්තේගම කම්හළ [බාධා කිරීමක්] මින්නේරිය කම්හල දුන් වහලා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

මෙම මධ්‍යස්ථානවල කටයුතු සම්බන්ධයෙන් මේ දක්වා වාර්තා පිටකර නැහැ.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

සේවකයන්ගේ පැමිණීම දුර්වලවීම, කම්හල ඉතා ඈත ප්‍රදේශයක පිහිටුවා ඇති නිසා අමු ද්‍රව්‍ය ගෙනයාමට යන වියදම, වෙනත් කම්හලකට අමු ද්‍රව්‍ය ගෙන යනවාට වඩා තුන් ගුණයක් වැඩියෙන් ප්‍රවාහන ගාස්තු සඳහා වියදම් කරන්නට සිදු වීම, මෙන්න මේවගේ හේතුන් නිසා මෙම කම්හලේ වියදම ඉහළ නැග තිබෙනවා.

**අනිල් මුණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

ඡන්දයට පස්සෙ දුන් තෑග්ගක්ද දන්නේ නැහැ.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඡන්දෙට ඉස්සෙල්ලයි ඒක ලැබුණේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයේ ඉන්න කාලයේදී තමයි, ඔය ස්ථානය තීරණය කර තිබුණේ. අපි කළේ ඒක හොඳට ගොඩනංවා විවෘත කිරීම පමණයි.

**අනිල් මුණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

එහෙමනම් දුන් ඒක වනන්ට තීරණය කර තිබෙන්නේ ඇයි ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

කරුණු දෙකක් උඩ එය තාවකාලිකව වසා දමා තිබෙනවා. කෙසේ වුණත් තවදුරටත් අපි සාකච්ඡා කර ගෙන යනවා, නැවත වරක් විවෘත කරන්නට. ගරු සභාපතිතුමනි, එක් මන්ත්‍රීවරයකු කිව්වා, ඒක අපි යුද හමුදාවට දෙන්නට යනවාය කියා. එවැනි ප්‍රකාශ පාර්ලිමේන්තුව තුළදී කිරීම එතරම් හොඳ නැහැ. මෙවැනි ජාතික ප්‍රශ්නවලදී ආපදාවකට රට මුහුණ දී සිටිද්දී, යුද හමුදාවට අපේ ස්ථාන ඕනෑ කරනවා නම් ඒවා අපි ලබා දිය යුතුයි. නමුත් තවම නම් එබඳු ඉල්ලීමක් කර නැහැ. යම් විධියකින් එවැනි ඉල්ලීමක් කළොත්, අපේ ඇමතිතුමා එය ලබා දෙන්නට ක්‍රියා කරනවාට කිසිම සැකයක් නැහැ. සමහර විට මෙබඳු ජාතික ආපද අවස්ථාවකදී යුද හමුදාවේ අවශ්‍යතාවකට ඉල්ලා සිටින්නේ එතැන හමුදාවලට ගිහින් තිකම් ඉන්නට නොවෙයි. ඒක තාවකාලික පියවරක් වන්නට පුළුවනි. මේ ගැන සඳහන් කළේ අපේ මින්නේරියේ මන්ත්‍රීතුමා (එච්. බී. විජේකෝන් මහතා) යි. කොහොම වුණත්, ඇමතිතුමා තවමත් උත්සාහ ගන්නවා, කිසියම් පිරිසක් යොදවා, මෙම ස්ථානය විවෘත කර නැවත පවත්වා ගෙන යන්නට.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඒක ඡන්ද පොරොන්දුවක් නේද ?

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

කවුද ඡන්ද පොරොන්දු දුන්නේ ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඇමතිතුමා නේ !

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

නැහැ. ඒ විධියේ පොරොන්දුවක් නොදුන්නත් අපේ පක්ෂය ඡන්ද නව දහස් ගණනකින් දිනුවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඡන්ද පොරොන්දුවක් දී තිබුණා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

ඔය ඡන්ද පොරොන්දු ගැන කථා නොකර රෙදිපිළි නිෂ්පාදනය ගැන කථා කරන්න.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ඊළඟට අපි පිළිගන්නට ඕනෑ. මෙම කර්මාන්තශාලාවල පරිපාලනය කවුරුන් ගෙනගියත්, ඒවා වැඩි දියුණු කරමින් ලාභ සහිතව පවත්වා ගෙන යන බව. තුල්හිරියේ කම්හලින් දැනටමත් ලාභ ලබනවා. පූගොඩ කම්හලින් ලබන වර්ෂය වන විට - සමහර විට මේ වර්ෂයේ අවසානය වන විට - ලාභ ලබන්නට පුළුවන් වෙයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

දුන් අවුරුදු තුනක පමණ කාලයක් තිස්සෙ කොම්පැනි මගින් මේවා පවත්වා ගෙන යනවා. පසුගිය කාලයෙ සංස්ථා හැටියට තියෙන කොට ඒවායේ පරිපාලන වාර්තා පිට කළා. එම කම්හල්වල වැඩ කටයුතු ගැන,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

සේවකයන්ගේ පඩිනඩි ගැන, ලබන ලාභ ගැන විස්තර වාර්තා ඉදිරිපත් කළා. නමුත් දන් වාර්තා පිට කරන්නේ නැහැ. එම නිසා ඒවායේ කටයුතු සම්බන්ධයෙන් වාර්තා නිකුත් කිරීමට ඇමතිතුමා පියවර ගන්නවා නම් හොඳයි.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

ලබා දෙන්නට පුළුවනි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

එහෙම දෙනවා නම් ඔය ප්‍රශ්න කිසිවක් මතු වෙන්නේ නැහැ.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

ශ්‍රී ලංකා මහ බැංකුවේ 1983 වාර්තාවේ 61 වන පිටුවේ සඳහන් වෙනවා, පූගොඩ, තුල්හිරිය, වේයන්ගොඩ, මත්තේගම සහ මින්නේරිය යන ප්‍රදේශවල ඇති කම්හල් පහෙන් රුපියල් දස ලක්ෂ හයක පාඩුවක් සිදු වී තිබෙන බව.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

1982-83 වර්ෂයේදී පූගොඩ අළුතෙන්ම තිමැහුම් අංශයක් ඇරියා. ඒ අංශයට කෝටි ගණනක් වියදම් වෙලා තිබෙනවා. ඒ කෝටි ගණනත් මෙයට ඇතුළත් වෙලා තිබෙනවා. ඒ අවුරුද්දේ "ඩිප්‍රිසියේෂන්" එහෙම යවන කොට ඒ ගණන වෙනවා. නමුත් මේ අවුරුද්දේ අවසානයේදී නැත්නම් 1985 වර්ෂයේ සිට පූගොඩ කර්මාන්ත ශාලාව ලාභ සහිතව ගෙනයන්නට පුළුවන් වෙනවා. ඒ විධියට ලාභ සහිතව ගෙන යනවා නම්, රෙදි නිෂ්පාදන තත්ත්වය වැඩ දියුණු කර තිබෙනවා නම්, පාරිභෝගිකයන්ට වුවමනා කරන මාදිලියේ රෙදිපිළි නිෂ්පාදනය කරනවා නම් විරුද්ධ පාර්ශ්වයේ දෝෂාරෝපණයෙන් වැඩක් වන්නේ නැහැ. අපේ බලාපොරොත්තුව තිබුණේ, හොඳ රෙදි දීමටත්, වුවමනා කරන රෙදි ප්‍රමාණය දීමටත්. ඒ දෙකම කරගෙන යනවා නම් නමුන්නාන්සේලා අපිට උදව් කරන්න ඕනෑ ඒවා අපනයනය කරන්න. අපි දනට නූල් අපනයනය කරනවා. කර්මාන්තශාලා වලින් නිෂ්පාදනය කරන රෙදි අපනයනය කරන්නට හදනවා. නමුන්නාන්සේලා අපිට ඒ සඳහා උදව් දෙන්නට ඕනෑ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

වැඩ කටයුතු සම්බන්ධ වාර්තාවක් තිබෙනවා නම් මේ ප්‍රශ්න නැහැ.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

වාර්තාව දෙනවාය කියලා කිව්වා නේ. වාර්තාව දුන්නත් ඔහොම තමයි.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

නමුන්නාන්සේලාට එක උදව්වක් දෙන්න පුළුවන්. විවෘත ආර්ථික ක්‍රමය නැති කරලා දනවා නම් මේක දියුණු කරන්නට පුළුවන්.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

විවෘත ආර්ථිකයෙන් අපිට කරදර වෙලා තිබෙන්නේ මෙන්න මෙපමණයි. වැරදි මාර්ග වලින් රෙදි එනවාය කියලා නමුන්නාන්සේලා කිව්වා. ඒක අපි කවුරුත් දන්නවා. නමුත් කොහෙන් එනවාද කියලා අපි දන්නේ නැහැ. අපේ අමාත්‍යාංශයට සම්බන්ධ නැතකින් නම් ඒ විධියට කෙරෙන්නේ නැහැ. ඒ ගැන වැඩිදුරටත් ආරක්ෂාව සඳහා තමයි, ගරු ඇමතිතුමා "බොන්ඩඩ් වේයාර් හවුස් සිස්ටම්" එක ඇති කරලා තිබෙන්නේ. ඒක ජනවාරි මාසයේ පළමුවනදට අරම්භ වෙනවා. එවිට තවත් යම්කිසි "ලූප් හෝල්ස්" තිබෙනවා නම් ඒවාත් වැහිලා යාවි. [බාධා කිරීම්] ඉතින් අපේ අමාත්‍යාංශයෙන් කොහොමද ඒක නතර කරන්නේ? [බාධා කිරීම්] නූල් අරන් යනවා නම් ඉඩ දෙනවා. ඒක "එක්ස්පෝට්"—

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

නූල් නොවෙයි නමුන්නාන්සේලාට දෙන්න වෙයි ලණු.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

කලවානේ ගරු මන්ත්‍රීතුමා එච්චර බයක් වන්නට ඕනෑ නැ. නූල් කන්ටේනර්වලින් ආවත් ඒ නූල් ගන්නේ කර්මාන්තකරුවෝ. ඒ අය ගැන විශ්වාසයකුත් තිබෙනවා. සම්පූර්ණ විස්තර අපේ අමාත්‍යාංශයේ තිබෙනවා. එහෙම කන්ටේනර්වලින් ගෙනාවත් අපිට අහු වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman of Committees)**

ගරු ඇමතිතුමාත් කථා කරන්න ඉන්නවා.

**ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා**
**(திரு. ஆர். எம். தர்மதாச பண்டா)**
(Mr. R. M. Dharmadasa Banda)

අවසාන වශයෙන් ගරු ඇමතිතුමාට අවස්ථාව දෙන්නට ඕනෑ නිසා වැඩි විස්තර කරන්නට යන්නේ නැහැ. ඒ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අදහස් ගැන විස්තර කරන්නට වෙලාවක් නැහැ. එකක් කියන්නට ඕනෑ. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) තිමැහුම් කර්මාන්තශාලාව විකිණීම ගැන යම්කිසි දෝෂාරෝපණයක් කළා. ඒ තිමැහුම් කර්මාන්තශාලා අපි ඇති කළේ ලක්ෂ 600 ක් පමණ වියදම් කරලයි. හොඳ රෙදි නිෂ්පාදනය කරන්නට ඕනෑ විධියට වච්ච් කැටිම් තිබුණත් ඊළඟට මෝස්තර දීමට හා ඒවා තිමැහුම් කරන්නට අපහසුකම් තිබුණා. ඒ නිසා තමයි මුද්‍රණ යන්ත්‍රෝපකරණ සවිකරලා, තිමැහුම් කර්මාන්තශාලා ඇති කළේ. ඒ කර්මාන්තශාලා ඇති කළාට අමතරව තවත් තවත් කර්මාන්තශාලා 6 ක් මුළු ලංකාවේම ඇති කළා. අත්යන්ත්‍ර බලවේග වලටයි, බලවේග වලටයි ඕනෑ කරන විධියට, රෙදි නිෂ්පාදනය දියුණු කරන්නටයි ඒක කළේ. බලවේග ජේෂකර්මාන්තශාලා පෞද්ගලික අංශයට පැවරුවාට පස්සේ මේ හයෙනුත් හතරක් අපිට දෙන්නට සිද්ධ වුණා. මන්ද අපි ළඟ නිෂ්පාදන ශක්තියක් නැති නිසා. තව බලවේග ඒකක දෙකයි අපි ළඟ තිබෙන්නේ. මේ හතර පෞද්ගලික අංශයට පැවරුවේ ඒ අයට ඒකෙන් ප්‍රයෝජන ගන්නටයි. ඒකයි අර ටෙන්ඩර් කැඳවා තිබෙනවාය කියලා කිව්වේ. ඒ ගැන මොකක්ද සියයට 50 ක ගෙවීමක් ගැන කිව්වා. එහෙම දෙයක් නම් නැහැ.

බලවේග ජේෂකර්ම මධ්‍යස්ථාන ගැනත් කියන්නට ඕනෑ. ඒවායේ හුඟක් දුර්වලකම් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා මාතලේ ව්‍යාපාරය වහලාය කියලා. ඒක අපි දන්නවා. ඒක ආපහු ගන්නට පුළුවන්ද, නැත්නම් මොනවාද කරන්න පුළුවන් කියන එක ගැන නිරීක්ෂණය කරන්න නීතිපතිතුමාට භාරදී තිබෙනවා. නුවරඑළියේ ඒකක නම් දන් ආපසු විවෘත කරගෙන යනවා. නුවර දනටම මධ්‍යස්ථාන දෙකක් විවෘත කර තිබෙනවා. සල්ලි අරගෙන පැනලා ගියාය කිව්වා. [බාධා කිරීම්] ඒක අපේ වැඩක් නොවෙයි. ඒ කොම්පැණියේ එක් කෙනෙක්, ජර්මන් කාරයෙක්ද කොහේද මට මතක හැටියට. එයා ගියාට අනෙක් අය මෙහි ඉන්නවා. ගුණතිලක මහත්මයා මෙහෙ ඉන්නවා නෙ. ඒ අය දන් ඒක කරගෙන යනවා. ඒක සීමාසහිත සමාගමක්. දනට දෙකක් හෝ තුනක් විවෘත කර තිබෙනවා. තව ඉදිරියට විවෘත කරන්නට තිබෙන ඒවා මේ මාසයේ විවෘත කරනවා. ඒ ගැන ප්‍රතිඥ දී තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ අය කැඳෙව්වා. මේ විධියේ දුර්වලකම් තිබෙනවා. ඒ දුර්වලකම් ගැන අපි සොයා බලනවා.

එකක් තිබෙන්නේ පෞද්ගලික අංශයට දුන්නාම සේවක පඩි නඩි ආදිය ගැන ප්‍රශ්න තිබෙනවා. ඒවා අපිට අයිති නැහැ. ඒවා අයිති කම්කරු දෙපාර්තමේන්තුවට. ඒ දෝෂාරෝපණය අපිට ගෙනෙන්නට එපා. මම මීට වඩා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුන්නාන්සේලාගේ අදහස් දක්වීම ගැන සන්තෝෂ වෙනවා. ඒ අදහස් ගැන සලකා බලා මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කටයුතු තවදුරටත් දියුණු කරන්නට ඒ අදහස් උපයෝගී කර ගන්නවා. විශේෂයෙන් වැරදි හැඟීමකින් යුක්තව මේ දිහා බලන්නේ නැතිව මෙය කර්මාන්තයක් හැටියට ලංකාවේ දියුණු කරන්නට තමුන්නාන්සේලාගේ ආධාර අපේක්ෂා කරමින් මේ සඳහා උපකාර කළ ලේකම්තුමා ඇතුළු සියලුම සේවක මහත්වරුන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් මම නවතිනවා.

අ. භා. 5.32

**විජයපාල මෙන්ඩිස් මහතා (පේෂකර්ම ඇමතිතුමා)**
**(திரு. விஜயபால மெண்டிஸ் — புடைவைத் தொழில் அமைச்சர்)**
(Mr. Wijayapala Mendis–Minister of Textile Industry)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හැන්දෑ වෙලාවේ දීර්ඝ ලෙස කෙරුණු කථා කීපයක් අපට අහන්නට ලැබුණා. ඒ වාගේම විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කළ ප්‍රශ්නවලට අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා විසින් පිළිතුරු සපයන්නට යෙදුණා. විශේෂයෙන් මෑතක සිට වර්ෂයක් පාසා අපි නිෂ්පාදනය කරන රෙදිපිළි වර්ගවලින් මන්ත්‍රීවරුන්ට පරිත්‍යාගයක් කරන බවත් මම මේ අවස්ථාවේදීත් මතක් කරන්නට ඕනෑ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

මේ සැරේ ඒක වැඩි කරන්නට ඕනෑ.

**විජයපාල මෙන්ඩිස් මහතා**
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

මේ සැරේ වැඩි කරම්දෝ නොකරම්දෝ කියලයි, මම මේ කල්පනා කරන්නේ. ඒ මොකද කියනවා නම් ඒ නිෂ්පාදනය කරන රෙදිවලින් පරිත්‍යාග කළ ඒවා පාවිච්චි කර අවුරුද්දක් ගියාට පසුව කථා කරන්නට ලැබෙන අවස්ථාවේදිවත් ඒ රෙදි 1977 න් එහා පැත්තේ තිබුණු රෙදිවලට වඩා හොඳද නරකද කියන එකවත් කියන්නේ නැහැ.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
**(Mr. Anil Moonesinghe)**

නැහැ ! නැහැ ! මම කිව්වා.

**විජයපාල මෙන්ඩිස් මහතා**
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

ඒ ගරු මන්ත්‍රීතුමා නොවෙයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

රෙදිවල නිෂ්පාදන තත්ත්වය හොඳයි කියා අපි කියනවා.

**විජයපාල මෙන්ඩිස් මහතා**
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

දැන්වත් කියනවා නම් බොහොම හොඳයි.

මම හිතන විධියට අපේ රටේ අද නිෂ්පාදනය කරන රෙදි සම්බන්ධව කිසිම දෝෂයක් කියන්නට බැහැ. නිෂ්පාදනය කරන රෙදිවල තත්ත්වය පිළිබඳව කිසිම දෝෂයක් කියන්නට බැහැ. අද මේ රටේ ජනතාවගෙන් වැඩි කොටසක් අඳින්නේ අපි නිෂ්පාදනය කරන රෙදිපිළියි. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන කම්හල්වල පමණක් නොව පෞද්ගලික අංශයේ කම්හල්වලත් අද නිෂ්පාදනය කරන රෙදිපිළි තත්ත්වයෙන් ඉතා උසස් බව කියන්නට පුළුවනි. එම තත්ත්වයේ උසස්කම නිසාම ඒවා මේ රටේ ජනතාවගේ පාවිච්චියට පමණක් නොව විදේශීය රටවලට අපනයනය කිරීමටත් පුළුවන් වී තිබෙනවා. විදේශයනට අපේ රෙදිපිළි කොපමණ යවා තිබෙනවාද කියන එක මම සංඛ්‍යා ලේඛනවලින් පෙන්වන්නම්. ඒවාගේම කොපමණ විදේශ විනිමයක් ලබාගෙන තිබෙනවාද කියන එකත් මම පෙන්වන්නම්. විශේෂයෙන් 1983 වර්ෂයේ දී නම් අපට කරදරකාරී තත්ත්වයක් ඇති වුණා. 1983 ජූලි මාසයේ දී වැඩියෙන්ම කරදර සිදු වුණේ මේ රටේ රෙදිපිළි නිපදවන කර්මාන්තශාලාවලටයි. රෙදි නිපදවන කර්මාන්තශාලා විස්සකට පමණ මේ කරදරකාරී තත්ත්වයට මුහුණ පාන්නට සිදු වුණා. ඒ කෙසේ වෙතත් ඒ කඩාවාටීම් සිදුවුනත් කරදර සිදුවනත් ඒ කාලසීමාව තුළදී රෙදි නිෂ්පාදනයේ තත්ත්වය සෑහෙන දුරට උසස් කර ගන්නට අපට පුළුවන් වුනා. මට එය සංඛ්‍යා ලේඛන අනුව කියන්නට පුළුවන්. මෙයට ඇහුම්කන් දෙනවා නම් විතරක් මම මෙය කියවන්නම්. එහෙම නැත්නම් මට මෙය සභාගත කරන්නටයි සිදු වන්නේ.

1981 සිට 1984 දක්වා කාලය තුළදී නූල් කැටීම් පහත දැක්වෙන ආකාරයෙන් කර තිබෙනවා. 1981 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 8.25 යි. 1982 දී දශ ලක්ෂ 9.86 යි. 1983 දී දශ ලක්ෂ 8.51 යි. ඒ 1983 දී කරදරකාරී තත්ත්වයක් තිබුණ නිසයි. 1984 තුන්වන කාර්තුව දක්වා පමණක් කිලෝග්‍රෑම් දශ ලක්ෂ 6.60 යි. කපුවලින් පමණක් විවිත් මීටර් දශ ලක්ෂ ප්‍රමාණයන් මෙසේයි : 1981 දී දශ ලක්ෂ 66.72 යි ; 1982 දී දශ ලක්ෂ 80.35 යි ; 1983 දී දශ ලක්ෂ 81.10 යි ; 1984 තුන්වන කාර්තුව දක්වා 63.62 යි. කෘත්‍රිම අංශයෙනුත් එහෙම තිබෙනවා. කෘත්‍රිම ඒවාත් සමග එකතුව බැලුවාම 1981 දී දශ ලක්ෂ 97.91 යි. 1982 දී දශ ලක්ෂ 114.46 යි. 1983 දී දශ ලක්ෂ 112.97 යි. 1983 දී මේ තත්ත්වය ලැබුවේ කරදරකාරී තත්ත්වයක් තිබියදියි. 1984 තුන්වන කාර්තුව දක්වා පමණක් දශ ලක්ෂ 89.52 යි. මෙවැනි තත්ත්වයකට ගෙනෙන්නට පුළුවන් වී තිබෙන්නේ නිදහසේ යන්ත්‍රෝපකරණ ගෙන්වීමට ඉඩ දුන් නිසයි. අපි ආණ්ඩුව භාරගන්නා විට මේ රටට වුවමනා කරන යන්ත්‍රෝපකරණ ගෙන්වීමට ඉඩකඩ තිබුණේ නැහැ. විදේශ විනිමය නැහැ කියන කතාව තමයි, එද හැම තිස්සෙම කිව්වේ. රුපියල් ලක්ෂ 7 ක් දක්වා වටිනා යන්ත්‍රෝපකරණ නිදහසේ ගෙන්වීමට අපි ඉඩ දුන් නිසා, ඕනෑම කෙනෙකුට ඕනෑම යන්ත්‍රයක් ගෙන්වීමට—රෙදිපිළි සඳහා වුවමනා කරන යන්ත්‍රෝපකරණ පමණක් නොවෙයි—අවසර දුන් නිසා පෞද්ගලික අංශය හුඟක් දුරට රෙදි කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී මේ කර්මාන්තයට හුඟක් ආධාර කළා.

සංඛ්‍යා ලේඛන අනුව බලනවිට 1983 දී රෙදි මීටර් දශ ලක්ෂ 113 ක් පමණ නිෂ්පාදනය කර ඇත. මේ වර්ෂයේ දැනට ලැබී ඇති සංඛ්‍යා ලේඛන අනුව මුළු වර්ෂයේ නිෂ්පාදනය ඒ ප්‍රමාණය ඉක්මවා යන බවට සාධක තිබේ. මෙම ගණන් බැලීමේදී අත් යන්ත්‍ර රෙදිවලට අප විසින් වෙන්කොට ඇත්තේ මීටර් දශ ලක්ෂ 20 ක් පමණී. මම අත් යන්ත්‍ර ගැන වෙනම කියන්නම්. අත් යන්ත්‍රවල නිෂ්පාදනය සමහරවිට මීට වඩා වැඩිවෙන්නට පුළුවන්. ඇත්තවශයෙන්ම පසුගිය වර්ෂයේ වුවද ජූලි මාසයේ කලබල ඇති නොවුණා නම් අඩුම ගණනේ රෙදි මීටර් දශ ලක්ෂ 130 බලාපොරොත්තු වන්නට ඉඩ තිබුණි. අපි රෙදි මීටර් දශ ලක්ෂ 113 1983 දී නිෂ්පාදනය කර තිබෙනවා. කලබල තිබුණේ නැත්නම් රෙදි මීටර් දශ ලක්ෂ 130 ක් නිෂ්පාදනය කරන්ට තිබුණා.

ගරු සභාපතිතුමනි, අපේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ දැනටමත් අපේ ධාරිතාව තිබෙනව, මීටර් දශ ලක්ෂ 257 නිෂ්පාදනය කිරීමට. නමුත් අපේ රටට අවශ්‍යවන්නේ මීටර් දශ ලක්ෂ 166 යි. පසුගිය ද පත් කරනු ලැබූ කොමිටියකින් එක් කෙනෙකුට අවුරුද්දකට රෙදි මීටර් ප්‍රමාණය 11 ක් හැටියට ගණන් බලා තිබෙනවා. නමුත් ඒ ප්‍රමාණයවත් දැනට වර්ෂයකට පාවිච්චි කරනවාදැයි මම දන්නේ නැහැ. මේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම නම් පෙනෙන්නේ ඊට වඩා අඩු බවයි. අතික් එක දැන් කලබලේ රෙදි ගන්නට යන්නේත් නැහැ, අවශ්‍ය වෙලාවට ගන්න රෙදි තිබෙන නිසා.

දැන් අපි නිෂ්පාදනය කරන රෙදි ගැන සාකච්ඡා කරද්දී විශේෂයෙන් මතුගම ගරු මන්ත්‍රීතුමා (අනිල් මූණසිංහ මහතා) හැරුණුවිට, විරුද්ධ පක්ෂයේ අනෙක් සියලුම ගරු මන්ත්‍රීවරුන් දැනට නිෂ්පාදනය වන රෙදි ගැන කථා කළේ නැහැ. එතුමන්ලා කථා කළේ මේ පාලන ක්‍රමය වෙනස් කිරීම ගැනයි. ගරු සභාපතිතුමනි, අපට මේ පාලන ක්‍රමය වෙනස් කරන්නට වුණේ ඇයි ? 1977 දී අපි පාලනය භාරගත් වෙලාවේ අපි උත්සාහ දැරුවා, තිබුණු ආකාරයටම අළුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර ආණ්ඩුවට අයිති පේෂකර්ම සංස්ථාවේ ඒ කර්මාන්තශාලා දක්ෂ අන්දමට ගෙන යාමට. ඒ අනුව අපි ඉතා අමාරුවෙන් නිෂ්පාදනය කළ රෙදි විකුණා ගන්නටවත් බැරි වුණා. නිතර නිතර මුදල් ඇමතිතුමා හමුවී මුදල් ඉල්ලා සිටින්නට අපට සිදු වුණා. අන්තිමේදී රෙදි විකුණා ගන්නට නොහැකි වූ නිසා පඩි ගෙවා ගන්නට පවා මුදල් නැතුව ගියා. ඔහොම ගිහින් දස ලක්ෂ 430 ක් එක්කාසු වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයපාල මෙන්ඩිස් මහතා]

බැංකු ණය පමණක්. අපට ගෙවා ගන්න බැරි තත්ත්වයක් ආවා. ඒ නිසා අපි කල්පනා කළා, පාලන ක්‍රමයේ වෙනසක් කරන්න. මම කියන්න කැමතියි, සහජ දක්ෂතා තිබෙන ඉංජිනේරු මහත්වරුන් හුඟ දෙනෙක් මේ රටේ සිටින බව. හොඳ කාර්මිකයෝ ඉන්නවා. දීර්ඝ කාලයක් තිස්සේ වැඩ කරගෙන ආ අය, හොඳ පළපුරුදු ඇති අය ඉන්නවා. නමුත් මොන හේතුවකින් හෝ මණ්ඩල යටතේ ක්‍රියා කරගෙන එන විට අපට හොඳක් කොහෙත්ම පෙනුණේ නැහැ. එන්න එන්නම කරදරකාරී තත්ත්වයට වැටෙනවා මිසක් මුදල් අංශයෙත් දියුණුවක් තිබුණෙත් නැහැ, නිෂ්පාදනය කරන ද්‍රව්‍යවල දියුණුවක් තිබුණෙත් නැහැ. අන්න ඒ නිසා තමයි, අපි කල්පනා කර ඒ දැනුම තිබෙන විදේශීය උදව්ය ගෙන්වා පාලනය ගෙන යන්න භාර දුන්නෙ. එසේ පාලනය කරන්න භාර දීමේදී අපි කොන්දේසි කීපයක් දැම්මා. ඒ කොන්දේසිවලින් සේවයේ යෙදී සිටින අයට මොන මොන වාසි තිබෙනවාද අපි එයින් බලාපොරොත්තු වුණේ මොන විධියේ ප්‍රතිඵලයක්ද කියා බලමු.

අපි බලාපොරොත්තු වූ ප්‍රතිඵල මේවායි :

(i) එතරම් සතුටුදායක තත්ත්වයක නොතිබුණු නිෂ්පාදන ශක්තිය දියුණු කොට වැඩි වැඩියෙන් නූල් සහ රෙදි නිෂ්පාදනය දියුණු කිරීම.

(ii) කාර්මික අඩුපාඩු නිවැරදි කිරීම.

(iii) ජාත්‍යන්තර මට්ටමේ නූල් සහ රෙදිපිළි නිෂ්පාදනය කිරීම.

(iv) පාඩු අඩු කොට ලාභදායී තත්ත්වයකට කම්හල් පත් කිරීම.

(v) සේවකයන්ට අවශ්‍ය පුහුණුව මෙරට දී සහ පිටරට දී ලබාදීම. දැනටමත් ඒසේ එංගලන්තය, ඉන්දියාව ආදී ප්‍රදේශවලට යවා පුහුණු කරවීම පටන්ගෙන තිබෙනවා.

(vi) සේවකයින්ට වැඩ වැඩියෙන් උපයා ගැනීමට දිරි ගැන්වීමේ මාර්ග ඇති කොට වඩා හොඳ ජීවන තත්ත්වයක් ඇති කිරීම.

(vii) නූල් සහ රෙදි ආනයනය කර විදේශීය විනිමය උපයා ගැනීම.

මෙසේ මෙම කම්හල්වල පාලනය 1980 ජූලි මස සිට අන්තර් ජාතික සමාගම්වලට පැවරීමෙන් පසු නූල් කැටීම, රෙදි විවීම, රෙදි නිම්හම් කිරීම යන අංශ තුනේම ක්‍රමානුකූලව දියුණුවක් ලැබූ බව ඒ හා සම්බන්ධව සංඛ්‍යා ලේඛන සංසන්දනය කර බලන කල අපට මැනවින් පෙනී යනවා.

ඒ කම්හල් මොන තත්ත්වයකට අද දියුණුවට පත් වී තිබෙනවාද කියා විස්තර වශයෙන්ම කියන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. විශේෂයෙන් කොත්මලේ ගරු මන්ත්‍රීතුමාගේත් (ආනන්ද දසනායක මහතා) අනික් මන්ත්‍රීතුමන්ලාගේත් දැනගැනීම සඳහා ඒ ඒ කම්හල්වල 1979 සිට 1984 දක්වා නූල් නිෂ්පාදනය, රෙදි නිෂ්පාදනය, නිම්හම් කිරීම, අලෙවිය, ලාභය හා සේවක ඉපයීම ආදී විස්තර ඇතුළත් සංඛ්‍යා ලේඛන ලැයිස්තුවක් * මම සභාගත කරනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

අපේ අමු ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරනවාද කියලයි, අපට දැනගන්න ඕනෑ.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

එම ලැයිස්තුවෙන් මේ ව්‍යාපාරය වර්ධන තත්ත්වය බලාගන්න පුළුවන්.

විශේෂයෙන්ම තුල්හිරිය ගැන කථා කළා. තුල්හිරිය 1982 වනතුරු පාඩුවටයි අපි පවත්වාගෙන ගියේ. 1981 දී තුල්හිරියෙන් අපනයනය කළ නූල් ප්‍රමාණය කිලෝග්‍රෑම් දස ලක්ෂ 1,15,875 යි. 1982 දී 70,730 යි. 1983 දී 68,181 යි. 1984 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කිලෝග්‍රෑම් 1,00,000 යි. මේවා සඳහා වටිනාකම වශයෙන් ලැබී තිබෙන මුදල් ප්‍රමාණ මෙසේයි : 1981දී ඇමෙරිකන් ඩොලර් 5,83,284 යි. 1982 දී 3,67,564 යි. 1983 දී 3,64,838 යි. 1984 දී 4,61,538 යි.

* කථාව අවසානයේ පළ කර ඇත.

**Produced at end of speech.*

රෙදි පිටරට යැවීමේ තත්ත්වය මේකයි. තුල්හිරියෙන් පමණක් 1983 දී යවා තිබෙන ප්‍රමාණය මීටර් පත්ලක්ෂ පනස් දහයි. 1984 දී මීටර් හය ලක්ෂ විසි දහයි. ඒවා සඳහා ලැබී තිබෙන විදේශ විනිමය ප්‍රමාණය 1983 දී රුපියල් නව ලක්ෂයයි. 1984 දී රුපියල් දහතර ලක්ෂයයි.

පූගොඩ පෙහෙකම්හලෙන් ඇඟලුම් නිෂ්පාදකයන්ට සැපයීමේ ප්‍රමාණය 1983 දී — මෙන් පිටරට යැවූ ප්‍රමාණය — මීටර් හාර ලක්ෂ හැට හය දහස් හාරසිය හැට තුනයි. 1984 ජනවාරි සිට නොවැම්බර් දක්වා මීටර් විසි තුන් ලක්ෂ පහළොස් දහස් තුන්සිය අනූනවයයි. ඒවායේ වටිනාකම, 1983 දී ඒවායින් ලැබුණු ආදායම රුපියල් හැට අට ලක්ෂ දෙදහස් නවසිය අනූහතයි. 1984 දී ආදායම රුපියල් හාර කෝටි පනස් නව ලක්ෂ හැත්තෑ තුන් දහස් හත්සිය විසි හයයි. මේ විධියට රෙදිපිටරට යවා තිබෙන්නේ වෙන කවදද ?
**45 million**

කෙළින්ම අපනයනය කිරීම් 1983—1984 දී තිදහස් වෙළඳ කලාපයට 6,400 යි. වටිනාකම අමෙරිකන් ඩොලර් 3.520 යි. දැනටමත් නැව්ගත කර ඇති ප්‍රමාණය 63,093 යි. වටිනාකම ඇමෙරිකන් ඩොලර් 37,949.73 යි. වේයන්ගොඩ නිෂ්පාදනය කළ ඒවාත් ඒ හා සමානවම ප්‍රමාණයක් පිටරට යවා තිබෙනවා.

මම කියාගෙන ආවා, තුල්හිරියේ ලාභ සම්බන්ධව. 1980 දෙවැනි භාගයේ තුල්හිරියේ භාගයේ තුල්හිරියේ පෙහෙකම්හලේ කැටීම් අංශයේ කි. ග්‍රෑ. දශ ලක්ෂ 0.408 යි. 1981 දී කි. ග්‍රෑ. දශ ලක්ෂ 1,841 යි. 1982 දී දශ ලක්ෂ 2,874 යි. 1983 දී දශ ලක්ෂ 3.133 යි. 1984 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දස ලක්ෂ 2.600 යි.

විවීම් — 1980 දෙවැනි භාගය. මීටර් දශ ලක්ෂ 1.448 යි. 1981 දී මීටර් දශ ලක්ෂ 5.017 යි. 1982 දී මීටර් දශ ලක්ෂ 5.290 යි. 1983 දී 6.585 යි. 1984 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දශ ලක්ෂ 6.362 යි. නිමහම් කිරීමත් මේ විධියට දියුණු වී තිබෙනවා.

ශුද්ධ ලාභ ගැන මම කතා කළා. මේ ඉලක්කම් ඔක්කෝම කියවන්න ගියොත් කාලය ගත වන නිසා මම මේවා සභාගත කරනවා. 1980 දෙවැනි භාගයේදී තුල්හිරියේ දශ ලක්ෂ 26.249 ක පාඩුවක් වී තිබෙනවා. 1981 දී දශ ලක්ෂ 16.018 ක් පාඩු වී තිබෙනවා. 1982 දී එය දෙකෙන් පංගුවකට පමණ අඩු වී දස ලක්ෂ 7.482 ක් වී තිබෙනවා. 1983 දී දශ ලක්ෂ 1.7 ක් ලාභ වී තිබෙනවා. 1984 ජනවාරි සි සැප්තැම්බර් දක්වා දශ ලක්ෂ 11.648 ක ශුද්ධ ලාභයක් බලාපොරොත්තු වී තිබෙනවා. මෙය විශාල ජයග්‍රහණයක්. තුල්හිරියෙන් තමයි විශාල වශයෙන් පාඩු ලැබුණේ. ධාරිතාව කොයි තරම් තිබුණත් සියයට 20 කට, 25 කට වඩා කවදාවත් එතැන නිෂ්පාදනය කළේ නැහැ. තමුන්නාන්සේලා දන්නවා මොනවාද එතැන නිෂ්පාදනය කළේ කියල. රෙදි නොවෙයි, වෙන වෙන ජාති. නමුත් දැන් එහි විශාල ප්‍රගතියක් ලබා තිබෙන බව කියන්න පුළුවන්.

ඊළඟට මේ අනික් අංශ ගැන, සේවකයන්ගේ පඩිනඩි ආදිය ගැන නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. අද තුල්හිරියේ සේවකයන් මාසයකට රු. 1145 දක්වා වැටුප් ලබනවා. 1984 දී ඔවුන් ඒ විධියට වැටුප් ලැබුවත් 1980 දී ඔවුන් ලබා ගත්තේ රු.660 ක් වැනි වැටුපකුයි. එහෙම බලන විට දෙගුණයකින් පමණ ඔවුන්ගේ පඩි වැඩි වී තිබෙනවා. මේ විධියට හැම මෝලකම සේවකයන්ගේ පඩි වැඩ කර තිබෙනවා. වේයන්ගොඩ කම්හලේ, පූගොඩ කම්හලේ මේ ආකාරයෙන්ම නිෂ්පාදන ශක්තිය වැඩි කර තිබෙනවා. මත්තේගමත් ඒ ආකාරයේ විශාල දියුණුවක් ඇති වී තිබෙනවා. නිෂ්පාදනය අතිනුත් දියුණුවක් ලබා තිබෙනවා. ඒ වාගේම පාඩු අඩු කරගෙන ලාභයක් ලබන්නට පුළුවන් තත්ත්වයකට පත් කර ගන්නට බලාපොරොත්තු වෙනවා. එතකොට මින්නේරිය සම්බන්ධයෙන් තමයි, ප්‍රශ්නය තිබෙන්නේ. මින්නේරියේ ගරු මන්ත්‍රීතුමාත් ඉන්නවා. මගේ නියෝජ්‍ය ඇමතිතුමා මේ කාරණය සම්බන්ධයෙන් උත්තරයක් දුන්නා. මින්නේරියේ මෝල වසා තැබීමට හේතු එතුමා පැහැදිලි කළා. ඒ ප්‍රශ්නය විසඳන්න අපි පුළුවන් තරම් උත්සාහ කරනවා. මින්නේරියේ මෝල සවි කරන්න කලින් කල්පනා කර තිබුණේ ඒ පළාතේ කපු වවන්නයි. නමුත් කපු වැවීමක් කෙරුණේ නැහැ මේ මෝල සවි කළත් එහි කටයුතු සර්ථක කර ගන්න බැරිවීමට හේතුවක් තිබුණා. ඒ ප්‍රදේශය විශේෂයෙන් ගොවිතැන් කටයුතු තිබෙන ප්‍රදේශයක්. මින්නේරියේ ගරු මන්ත්‍රීතුමාත් ඒ බව දන්නවා. සේවකයන්ගේ පැමිණීම බොහොම දුර්වලයි. ගොයම් කපන කාලයට සේවකයන් වැඩට එන්නේ නැහැ. කුඹුරු හාන කාලයට එන්නේ නැහැ. ගොයම් පාගන කාලයට එන්නෙ නැහැ. ඔය විධියට සියයට 40 ක් 50 ක් පමණ රක්ෂාවට එන්නේ නැහැ. ඉතින් මෝලෙන් පාඩුයි. 800 ක් පමණ එතැන වැඩ කරනවා. දැනටත් ඒ අයට පඩියෙන් භාගයක් ගෙවනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි මේ මෝල සම්බන්ධයෙන් දැන් නොයෙක් විධියේ යෝජනා සකස් කරනවා. කොයි ආකාරයෙන්ද මෙය නැවත වරක් ආරම්භ කරන්න පුළුවන් වන්නෙ කියල අපි සොයා බලනවා. දැනට අපේ රටේ නිපදවන කපු නූල් ප්‍රමාණය වැඩියි. අපට වුවමනා ප්‍රමාණයට වඩා නිෂ්පාදනය කරනවා. මින්නේරියෙන් කරන්නේ කපු නූල් නිෂ්පාදනය කිරීමයි. ඒ නිසා මින්නේරියේ කපු නූල් නිෂ්පාදනය නවත්වා කෘතිම නූල් නිෂ්පාදනය කරන්නත් අපි කල්පනා කර තිබෙනවා. එවැනි වෙනස් කමක් කරන්නට පුළුවන් නම්, ඒ සඳහා විශාල වියදමක් දරන්නට සිදු වන්නේ නැත්නම්, ලාභයක් ලබන්න තත්ත්වයක එය පත් කරන්න පුලුවන්. පුළුවන් නම් ඒ විධියේ පරිවර්තනයක් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. අපි දැන් ඒ විධියට කල්පනා කරගෙන යනවා. භාණ්ඩාගාරය සමගත් සාකච්ඡා කරගෙන යනවා. මොකක් හරි තීරණයක් ගන්න පුළුවන් වෙයි කියා මම හිතනවා. ඒ නිසා මින්නේරියේ ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉවසිලිමත්ව ඉන්න ඕනැ. අපි මේ යෝජනාව ගැන පාවම පරීක්ෂණ කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලෝකයේ හැම තැනම රෙදිවලින් කරදර ඇති වෙන බව අපි දන්නවා. එක්තරා කාලයකදී රෙදි නිසා පාලකයන් පවා වෙනස් කරන්න යෙදුණා. ඉන්දියාව ආදී රටවල එවැනි දේ සිදු වුණා. ඒ වගේම ලෝකයේ උසස්ම වර්ගයේ රෙදි හරිගස්සන රටක් තමයි, ජපන් රට. ජපන් රටත් අද රෙදි නිෂ්පාදනය සඳහා ඒ තරම් කාලයක් යොදවන්නෙ නැහැ. ඉලෙක්ට්‍රොනික් ආදී අලුත් නිපදවීම් සඳහා තමන්ගේ කාලය සහ ධනය වැඩියෙන් යොදවනවා. ඒ නිසා අපටත් අවස්ථාව ලැබුණා, ජපන් රටට රෙදි යවන්න. අත්යන්ත්‍ර රෙදි ඒ රටට අපි යැව්වා. ඒ වගේම අනික් රටවල වගේ අපේ රටෙත් මේ කර්මාන්තයේ යම් යම් වෙනස්කම් කරන්නට සිදු වෙනවා. මේ කර්මාන්තය සම්බන්ධයෙන් අපට අද මුහුණ පාන්නට සිදු වෙන ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඉන් එකක් තමයි විදුලිය පාවිච්චිය සඳහා විශාල මුදලක් ගෙවන්නට සිදු වී තිබීම. මම පසුව විස්තර ඉදිරිපත් කරන්නම්. ඒ වාගේම බැංකුවලින් ගන්නා ණය සඳහා විශාල පොලියක් ගෙවන්න සිදු වී තිබෙනවා. සැහෙන ලාභයක් තබාගෙන මේ කර්මාන්ත ගෙන යන්න අමාරු වී තිබෙනවා. මේවායේ ලාභය බොහොම අඩුයි. මේ කර්මාන්ත ගෙන යන්න මෙපමණ කරදර තිබියදී තමයි අපට පුළුවන් වී තිබෙන්නේ—

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**

(The Deputy Chairman of Committees)

Order, please ? Will the House agree to give the Hon. Minister a few more minutes ?

**මන්ත්‍රීවරු**

**(அங்கத்தினர்)**

(Members)

Aye.

විජයපාල මෙන්ඩිස් මහතා

**(திரு. விஜயபால மெண்டிஸ்)**

(Mr. Wijayapala Mendis)

මේ කරදර මධ්‍යයෙහි තමයි අපට යම්කිසි දියුණුවක් ඇති කරන්නට පුළුවන් වී තිබෙන්නේ. "ඇග්‍රිමන්ට්" සම්බන්ධයෙන් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කථා කළා. විදේශ පාලකයින් සමග ඇති කරගෙන තිබෙන කොන්දේසි ගැන ඒ අය කථා කළා. සමහර කොන්දේසි අද කාලයේ හැටියට වෙනස් කළ යුතුය කියා අපට පෙනී ගොස් තිබෙනවා. අපේ නිලධාරී මහත්වරු, අපේ ලේකම්තුමා, භාණ්ඩාගාරයේ නිලධාරී මහත්වරුත් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ මහත්වරුන් සමග සාකච්ඡා කර අලුත් කොන්දේසි මාලාවක් ඇති කර තිබෙනවා. ඒ අයගේ කැමැත්ත අනුව ඒ කොන්දේසිවලට අත්සන් කරගෙන ඒ අලුත් කොන්දේසි යටතේ ලබන අවුරුද්දේ පාලනය ගෙන යන්නට අපි කටයුතු කරනවා.

මා කලින් කිව්වා වාගේ එක් එක් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. යම්කිසි සහනාධාර, ඉගෙනීමට වුවමනා කරන පුරුදු පුහුණුවීම් ආදිය එහි සේවය කරන උදවියටත් ලබා දිය යුතුයි. මේ නිෂ්පාදනය කරන රෙදි ඉස්සර නම් විකුණා ගන්න බැරිව මාස ගණනාවක් තියා ගන්න සිදු වුණා. නමුත් අද අපි නිෂ්පාදනය කරන රෙදි ඉස්තරම් තත්ත්වයක තිබෙන නිසා ඒවා මෝල්වල රඳා පවතින වැඩිම කාලය සුමාන තුනක් හෝ මාසයක් හෝ පමණයි. ඒ සියල්ලම විකිණෙනවා. ඒ නිසා අපට කරදරයක් නැහැ. සාමාන්‍යයෙන් මේ රෙදි විකිණෙන කාල සීමාවල් තමුන්නාන්සේ දන්නවා. රටේ සිංහල අවුරුදු කාලයේදී ඒ වාගේම අවුරුද්දේ අන්තිම කාලයේදී මේ රෙදි වැඩිපුර විකිණෙනවා. කෙසේ වෙතත් දැන් අපි නිෂ්පාදනය කරන රෙදි ඉස්සර වාගේ ගොඩ ගසා තියා ගන්න හේතුවක් නැහැ. ඒවා අලෙවි කර මුදල් ලබා ගන්න පුළුවන් තත්ත්වයට එය අපි දියුණු කර තිබෙනවා.

අපේ ඇඟලුම් කර්මාන්තය සම්බන්ධයෙනුත් කිව යුතුව තිබෙනවා. ජේෂකර්ම අංශයේ අපනයනයන් නිසා දැනට උපයා ගන්නා විදේශ විනිමය ප්‍රමාණය වාර්තාගත එකක් බව අපි මතක් කරන්න ඕනැ. කෘෂිකාර්මික වශයෙන් ලංකාවේ ප්‍රධාන අපනයනය වන්නේ තේ, රබර් සහ පොල්. කාර්මික අතින් බැලුවොත් පිරිපහදු කරන ලද ඉන්ධන වර්ග, හා ඇඟලුම් රෙදිපිලි පසුගිය වර්ෂ කිහිපය තුළ පෙරමුණට ඇදී ආ අපනයන වර්ගයි. දැනටමත් ඇඟලුම් හා රෙදිපිලි අපනයනයන් කාර්මික අපනයනයන් අතරින් මුල් තැනට පැමිණ ඇති අතර, එය තේ අපනයනයට පමණක් දෙවැනිව තිබෙනවා. 1977 දී අපනයනය කරන ලද ඇඟලුම් හා රෙදිපිලි නිෂ්පාදනයේ වටිනාකම රුපියල් දස ලක්ෂ 131 යි. පසුගිය වර්ෂයේ ඒවායේ අපනයන වටිනාකම රුපියල් 2641 යි. නිදහස් වෙළඳ කලාපය මගින් කෙරෙන අපනයනය මේකට ඇතුළත් කර නැහැ. මේ වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා වන 9 මාසය තුළ කරන ලද අපනයනයන්ගේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,706 කි. මේ අනුව මෙම වර්ෂයේ අවසානය වන විට අපනයනයන්ගේ මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 3,000 ඉක්මවා යනු නොඅනුමානය.

ඒ වාගේම දැනට 75,000 කටත් 1,00,000 කටත් අතර පිරිසක් මේ, කර්මාන්තය තුළින් රක්ෂාවල යෙදී සිටිනවා.

අපනයනයන් ශීඝ්‍ර වශයෙන් වැඩිවීම නිසාත්, පුහුණු කාර්මිකයන් රටින්පිටව් යාම නිසාත්, නිදහස් වෙළඳ කලාපයට යාම නිසාත් තවත් ව්‍යාප්ත වන මෙම කර්මාන්තයට පුහුණු කාර්මිකයන් සපයා ගැනීම දුෂ්කර වන බවට කරුණු පැහැදිලි විය. එම නිසා අපි යම්කිසි වැඩ පිළිවෙලක් ලැස්ති කර තිබෙනවා. ඇඟළුම් කර්මාන්තයට අවශ්‍ය පුහුණු නොයෙකුත් මාදිලියේ කාර්මිකයින් පුහුණු කිරීම සඳහා ඇඟළුම් කර්මාන්තය පුහුණු කිරීමේ ආයතනයක් ලෝක බැංකුවේද ආධාර ඇතිව පිහිටුවන ලදී. එහි මුළු වියදම රුපියල් දශ ලක්ෂ 23 කි. එම ආයතනයේ ගොඩනැගිලි ඉදි කිරීම හා යන්ත්‍රෝපකරණ සවි කිරීම දැන් අවසන් වෙමින් යන අතර, පසුගිය වර්ෂය අවසානයේ මේ සඳහා විශේෂ පනතක්ද පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය සේවකයින් බඳවා ගැනීමේ කටයුතුවල දැනට නිරතව සිටියි. මේ සඳහා විශේෂයෙන් පළපුරුද්දක් ඇති ආයතනයක සහාය අවශ්‍ය බැව් පෙනී ගිය හෙයින්, එංගලන්තයේ ෆීල්ඩන් හවුස්—Fieldon House—නමැති ආයතනයෙන් සහාය මේ සඳහා ලබා ගන්නා ලදී. දැනටමත් විදේශීය විශේෂඥයින් 4 දෙනෙකු පමණ පැමිණ පුහුණුවීම් කටයුතු සම්පාදනය කරන අතර, පුහුණුවීමේ පාඨමාලාවක්ද මෙම ඔක්තෝබර් මාසයේදී ආරම්භ කරන ලදී. මැහුම් උපදේශකවරුන්, මෝස්තර කපන්නන්, නිෂ්පාදන පරීක්ෂකවරුන්, තත්ත්ව පාලකයින් ආදී නොයෙකුත් මාදිලියේ අය මෙම ආයතනය මගින් පුහුණු කරනු ලැබේ. මේ විධියට මේ කර්මාන්තය දියුණු වෙමින් යන නිසා මෙම කර්මාන්තය සම්බන්ධව නියම අවබෝධයක් අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දීමට අපි මේ ආයතනය ලැස්ති කර තිබෙනවා.

අපට තිබෙන කරදරයක් ගැනත් මතක් කරන්නට ඕනැ. 1980 පමණ කාලයේදී විශේෂයෙන් අපි මේ ඇඟළුම් නිෂ්පාදන ඇමෙරිකාවට යවන විට අපේ රට ඒ අතින් 26 වන ස්ථානයේ තිබුණා. අද ඒ අංශයෙන් අපේ රට 5 වන ස්ථානයට ඇවිත් තිබෙනවා. ඇඟළුම් අපනයන කර්මාන්තය දියුණු වන අතර, එම දියුණුවට බාධා වන බාහිර කරුණුද ඉස්මතු වී තිබේ.

අපගේ අපනයනවලට දැනටමත් සීමා පනවා ඇති රටවල් රාශියකි. එනම් යුරෝපීය ආර්ථික හවුලේ රටවල් 10 ක්, ඇමෙරිකා එක්සත් ජනපදයත්, කැනඩාව, ස්වීඩනය, නෝර්වේ, ෆින්ලන්තය ආදී රටවල්ය. මෙයට අමතරව ඇමෙරිකාව විසින් තවත් දරදඬු පියවර කිහිපයක් ගෙන ඇත. ඉන් ප්‍රධාන වශයෙන් අපගේ අපනයනයන්ට බලපාන පියවර නම්, ඇමෙරිකාවේ ප්‍රබල වෘත්තීය සංගම් 3 ක් විසින් අපගේ අපනයනයන්ට විරුද්ධව ඇමෙරිකාවේ වෙළඳ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද දිරි ගැන්වීමේ සහන නිශ්ප්‍රභ කරන තීරු බදු පැනවීමේ පෙත්සමකි. Countervailing Duty Petition. ඒ රටේ තිබෙන නීතියේ හැටියට ඒ රටේ ඉන්න කාර්මිකයන් ආරක්ෂා කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයපාල මෙන්ඩිස් මහතා]

ඔවුන් ඒ පෙත්සම යවා තිබෙනවා. මෙම පෙත්සම ඔවුන් විසින් මේ වර්ෂයේ ජූලි මස ඉදිරිපත් කරන ලද අතර, එහි සඳහන් කරුණු අනුව පරීක්ෂණ පැවැත්වීමට ඇමෙරිකාවේ වෙළඳ අමාත්‍යාංශය පියවර ගෙන ඇත. මෙම පෙත්සමින් කියැවෙන්නේ නිදහස් වෙළඳ කලාපයෙන් දෙනු ලබන සහනත්, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දෙනු ලබන සහනත්, රජයට අයත් පෙහෙකම්හල්වල රෙදිපිළි අපනයන ඇඟළුම් සඳහා උපයෝගී කර ගැනීම නිසාත්, අප විසින් රෙදිපිළි අතින් ස්වයංපෝෂිත වීමට ගන්නා උත්සාහය අනුවත්, නොයෙකුත් සහන ඇඟළුම් අපනයනකරුවන්ට ලැබෙන බවත්, ඒ නිසා එම සහන කැපී යන පරිදි අපේ අපනයනයන්ට තීරු බදු පැනවිය යුතු බවත්ය. They want to have countervailing duties imposed.

මේ සම්බන්ධයෙන් රජයට එවන ලද ප්‍රශ්න මාලා කිහිපයකට දැනටමත් පිළිතුරු සපයා ඇති අතර, පෞද්ගලික අංශයේ අපනයනකරුවන් සියලු දෙනා විසිනුත් විස්තර සපයා ඇත. එසේ විස්තර සපයන ලද සියලුම ඇඟළුම් ආයතන අතුරින් ආයතන 20 ක් විශේෂ පරීක්ෂණ සඳහා ඇමෙරිකාවේ වෙළඳ අමාත්‍යාංශය විසින් තෝරා ගෙන ඇති අතර, ඒ සම්බන්ධයෙන් දීර්ඝ හා විස්තරාත්මක ප්‍රශ්න මාලාවක් එම ආයතන විස්සට එවන ලදී. එයටද පිළිතුරු දැන් සපයා ඇත. ඒ සම්බන්ධයෙන් රජය වෙනුවෙන් කටයුතු කිරීමට මෙම කරුණු පිළිබඳ විශේෂ දැනුමක් ඇති අමෙරිකාවේ නීතිඥ සමාගමක්ද අප විසින් යොදා ගන්නා ලදී. අපේ අය ඒ සම්බන්ධයෙන් නීතිය දන්නේ නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇති නීතිඥ සමාගමක් යොදාගෙන තිබෙනවා.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

ඒ අය ඒ අයගේ කර්මාන්ත ආරක්ෂා කරනවා.

විජයපාල මෙන්ඩිස් මහතා
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

ඒ අයත් ආරක්ෂා කරනවා ; අපිත් ආරක්ෂා කරගන්න ඕනෑ.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

ඒක තමයි කියන්නේ. අපිත් ආරක්ෂා කරගන්න ඕනෑ.

විජයපාල මෙන්ඩිස් මහතා
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

ලෝකයේ විශාල පොහොසත් රටවලුත් ආරක්ෂණවාදය තිබෙන්නට ඕනෑය කියනවා. එමෙන්ම සුළු රටක් වූ අපිත් අපේ තිබෙන ජාතික කර්මාන්ත ආරක්ෂා කර ගන්නට ඕනෑ. ඒකයි මගේ හැඟීම.

ඒ පරීක්ෂණයේ මූලික තීරණයක් මෙම දෙසැම්බර් මස මැද භාගය වන විට ගනු ලබන අතර, අවසන් තීරණය පෙබරවාරි මාසයේදී ගනු ලබනු ඇත. මෙවැනිම පෙත්සම් තවත් සංවර්ධනය වන රටවල් 12 කට විරුද්ධත්වය ඉදිරිපත් කොට ඇත.

මෙය අමෙරිකාවේ ඡන්ද කාලයේ ඉදිරිපත් කළ පෙත්සමක්. සමහර විට දේශපාලන වාසි ලබා ගැනීමේ හේතු උඩ මේ ක්‍රියාමාර්ගය ගන්නට ඇති. දැන් නම් ඡන්දය අවසාන වී තිබෙනවා. කොයි පක්ෂයෙන් මේ ක්‍රියාමාර්ගය ගන්නාදැයි අපි දන්නේ නැහැ. එය අපිට අයිති දෙයක් නොවෙයි. සමහර විට දැන් තත්ත්වය වෙනස් වෙන්නට පුළුවන්. මේ ගෙන යන සටනින් අපට හිරිහැරයක් නැතිව ජයග්‍රහණයක් ලබා ගන්නට පුළුවන්වේ යයි මම කල්පනා කරනවා.

ඊළඟට අපේ අලුත් යෝජනා. 1977 සිට මේ දක්වා අලුත් යෝජනා රාශියක් මෙම අමාත්‍යාංශය විසින් අනුමත කරන ලදී. වාර්තාගතවීම සඳහා ඒ පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නට කැමතියි.

**අලුත් ආයෝජන 1977–1984 සැප්තැම්බර් දක්වා**

| ආයෝජන ක්ෂේත්‍රය | අනුමත කර ඇති ඒකක | ආයෝජනය රු.දශලක්ෂ | අලුතින් ඇති කරන ලද රැකියා අවස්ථා ගණන |
|---|---|---|---|
| 1. කපු නොවන රෙදි වියීම | 104 | 615.79 | 10,097 |
| 2. කැපීම | 3 | 135.05 | 800 |
| 3. ඇඟළුම් (අපනයන) | 191 | 281.17 | 26,894 |
| 4. ඇඟළුම් (දේශීය වෙළඳපොළ) | 2,337 | 58.34 | 28,879 |
| 5. කුඩා, මහන නූල්, මේස් ආදී අනෙකුත් භාණ්ඩ | 333 | 241.44 | 12,623 |
| එකතුව | 2,968 | 1,331.79 | 79,293 |

කුඩා කර්මාන්තය දැන් තිබෙන්නේ අපේ අමාත්‍යාංශය යටතේයි. කුඩා නම් දැන් ඕනෑ තරම් තිබෙනවා. ඉස්සර වගේ කරදරයක් නැහැ. වර්ෂාවක් තිබෙන විට ඕනෑ මාදිලියේ කුඩා දකින්නට තිබෙනවා. මේ විධියට මේ අමාත්‍යාංශය යටතේ රක්ෂා හා රෙදි නිෂ්පාදනය දියුණු කිරීමටත් වැඩ කටයුතු රාශියක් අපි යොදා තිබෙනවා.

වැල්ලවත්ත රෙදි මෝල සම්බන්ධයෙන් කීප දෙනෙක්ම කථා කළා. විශේෂයෙන් මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) නිතරම කියන දෙයක් තමයි, ' වැල්ලවත්ත රෙදි මෝල වසා දමා තිබෙනවා, එහි සේවකයන්ට පඩි ගෙවා නැහැ, ඒ අයට වන්දි ගෙවා නැහැ, එය වහන්න හේතුව මොකක්ද, ඒ ආයතනය ලබාගෙන තිබෙන ණය මුදල්වලට මොනවාද කරන්නේ ? කියන එක.

වර්තමානයේ පැවතිය යුතු දියුණු තත්ත්වයට මේ මෝල ගෙන එන්නට අපි පුළුවන් තරම් උත්සාහ කළා. නමුත් මෙය අවුරුදු 100 කට ආසන්න කාලයක් පැරණි කර්මාන්තශාලාවක්. නියෝජ්‍ය සභාපතිතුමාත් දන්නවා ඇති, එතැන තිබුණු තත්ත්වය මොකක්ද කියා. එතැන තිබෙන ' මැෂින්ස් ' ප්‍රමාණයේ හැටියට නිෂ්පාදනය අඩුයි. තරඟකාරී තත්ත්වයකින් ඒ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු කරගෙන යන්න බැරි නිසා පාඩු විඳින්න සිදු වී තිබුණා. විදුලිය ගාස්තු ගෙවා, බැංකු පොලී ආදිය ගෙවා, සේවක පඩි–නඩිත් ගෙවා ඒ කර්මාන්ත ශාලාව පවත්වාගෙන යන්න බොහොම අමාරුයි. අද තත්ත්වයට ගැළපෙන විධියට උසස් තත්ත්වයේ රෙදි–පිළි නිෂ්පාදනය කිරීමට පුළුවන් වන ආකාරයට ඒ කර්මාන්තශාලාව වැඩි–දියුණු කරන්න පුළුවන්දැයි අපි නොයෙකුත් විධියේ පරීක්ෂණ, පර්යේෂණ මඟින් උත්සාහ කර බැලුවා. නමුත් කොයි තරම් මුදල් යට කළත් ඒ කර්මාන්තශාලාවෙන් ප්‍රයෝජන ගන්න බැරි බව ඉංජිනේරු කණ්ඩායමක් අපට අවවාදාත්මකව ප්‍රකාශ කර සිටියා. එතැන අක්කර 17 ක භූමි භාගයක් තිබෙනවා. ඒ කර්මාන්තශාලාව නිසා පරිසරය දූෂණය වෙනවාය කියා පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයෙන් අපිට නිතරම පැමිණිලි එනවා. ඒ රෙදි–පිළි නිමහම් කරන අපවිත්‍ර වතුර වැල්ලවත්ත ඇළ දිගේ යැම නිසා කෝට්ටේ දිහාවට පවා ඒ අපවිත්‍ර වතුර එනවාය, ඒ නිසා මාළු මැරෙනවාය ආදී වශයෙන් අපට පැමිණිලි එනවා. නමුත් ඒ ඉඩම බොහොම වටිනා ඉඩමක්. එය එහෙමම තබාගෙන සිට පසුව ප්‍රයෝජනයට ගන්න අපි අදහස් කරනවා.

ඒ තත්ත්වය යටතේ වැල්ලවත්ත රෙදි මෝල වෙනුවට වෙන මෝලක් පිහිටුවන්න අපි තීරණය කළා, ඒ සඳහා හෝමාගම ප්‍රදේශයෙන් දැන් අක්කර 30 ක පමණ ඉඩමකුත් ලබාගෙන තිබෙනවා.

අපි දන්නවා, අපේ රටට වුවමනා කරන්නේ මොනවාද කියා. අපේ රටේ බහුතර ජනතාවට වුවමනා කරන රෙදි–පිළි දැනටමත් අපේ රටේ නිෂ්පාදනය වෙනවා. තුල්හිරිය, පූගොඩ, වේයන්ගොඩ ආදී රාජ්‍ය අංශයේ මෝල්වලින් හා පෞද්ගලික අංශයේ මෝල්වලිනුත් ඒවා නිෂ්පාදනය වෙනවා. හොඳ කෘත්‍රිම රෙදි ආදියත් අද නිෂ්පාදනය වෙනවා.

එක්තරා කාරණයක් නිසා අද අපේ රෙදි – පිළි කර්මාන්තයට කරදරයක් ඇති වී තිබෙනවා. මේ රට තුළ ඇඟලුම් නිෂ්පාදනය කොට ඒවා පිටරට යවා විදේශ විනිමය උපයා ගැනීම සඳහා, ඒවාට අවශ්‍ය රෙදි පිටරටින් ගෙන්වනවා. නමුත් ඒවා ගෙන්වන සමහරු හොර–රහසේ ඒ රෙදි මේ රටේ අලෙවි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමටත් කටයුතු කරනවා. එයින් අපේ රෙදි නිෂ්පාදනයට පහර වැදී තිබෙනවා. ඒ නිසා අපි කල්පනා කළා, ඒ ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය රෙදිත් මේ රටේම නිෂ්පාදනය කිරීමට කටයුතු කළ යුතුය කියා. ඒ පරමාර්ථයෙන් තමයි, අද ලෝකයේ තිබෙන අලුත්ම මාදිලියේ, උසස්ම වර්ගයේ රෙදි කර්මාන්තශාලාවක් ඇති කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබෙන්නේ. ඒ ටෙන්ඩර් සලකා බලා තීරණයක් ගෙන, ඒ කර්මාන්තශාලාව ආරම්භ කොට රෙදි–පිළි නිෂ්පාදනය ඇරඹෙන්න තව අවුරුදු දෙක–තුනක් ගත වෙන්න පුළුවනි. ඒ ටෙන්ඩර් අපට ලාභදායී බව පෙනී ගියොත් අපි ඒ විධියට කර්මාන්තශාලාව පටන් ගන්නවා.

අර අස් වුණු උදවිය සම්බන්ධයෙන් අපි කර තිබෙන්නේ මොකක්ද කියාත් අපෙන් ඇහුවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Order, please! The Hon. Minister of Finance has to move certain items and we have to adjourn at 6.30 p.m. So can the Hon. Minister finish his reply in a few minutes ?

**ආර්. ජේ. ජී. ද මැල් මහතා (මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා)**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல் — நிதி, அமைப்புத்திட்ட அமைச்சர்)**
(Mr. R. J. G. de Mel–Minister of Finanace and Planning)

Can I move the items at this stage and thereafter the Hon. Minister of Textile Industry can continue his reply because these items will have to be passed today ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

The Hon. Minister of Textile Industry can take another five minutes and thereafter we will take up the items of the Hon. Minister of Finance.

**විජයපාල මෙන්ඩිස් මහතා**
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේ ආකාරයටයි වැල්ලවත්තේ රෙදි මෝලේ සේවකයන්ට වන්දි ගෙවා තිබෙන්නේ:

I. පසුගිය සේවා කාලය සඳහා එක් එක් වසරකට මාස 1/2 ක වැටුප බැගින්ද, ඊට අමතරව සේවකයින්ගේ වයස හා විශ්‍රාම ගැනීමට නියමිත දිනය අතර කාලය වෙනුවෙන් එක් එක් වසරකට මාස 1 1/2 වැටුප බැගින් ද, (එනම්, අවුරුදු 55 හෝ 58 හෝ අදාළ පරිදි) මුළු ගෙවීම මාස 24 ක වැටුප හෝ රු. 20,000 නො ඉක්මවිය යුතු මේ දෙකින් අඩු මුදල

සහ

II. 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන අනුව පාරිතෝෂික මුදල.

ආ. තවද නව ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන තෙක් පොරොත්තුව එහෙත් අතුරු කාලයේ දී පවත්නා පෙහෙකම්හලේ සේවයෙන් බැහැරව සිටින අයවළුන්ට මාස 1/2 ක වැටුප බැගින් මාස 30 ක් සඳහා වන්දි මුදල් ගෙවීමටත්.

ඇ. නව ව්‍යාපෘතිය මූල්‍යමය වශයෙන් ඵලදායී නොවන හා ආර්ථිකමය ශක්‍යතාවක් දක්නට නොලැබෙන්නේ නම්, ඉහත (ආ) හි සඳහන් සේවකයින්ට ද ඔවුනට ගෙවන ලද වන්දි මුදල අඩු කොට සම්පූර්ණ වන්දි මුදල් ගෙවීමටත්.

ඉ. නව ව්‍යාපෘතියට අදාළ කටයුතුවලට හා පවත්නා පෙහෙකම්හලේ ඉතිරි කටයුතුවල නිරතවීම් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලයක් රඳවා ගැනීමටත් තීරණය කොට ඇත.

මේ අනුව බලන විට, කම්කරුවන් සඳහා රුපියල් දස ලක්ෂ 48.656 ක ප්‍රමාණයකුත්, කම්කරුවන් නොවන ශ්‍රේණිවල අය සඳහා රුපියල් දස ලක්ෂ 10.266 ක ප්‍රමාණයකුත් වන්දි වශයෙන් ගෙවා තිබෙනවා. මේ හැර කැමති අයට වන්දි මුදලෙන් භාගයක් ලබා ගෙන, අලුත් මෝල ආරම්භ කළාම ඒ අයට නැවත වැඩට එන්නට අවකාශ ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සඳහන් කළ යුතු කාරණා රාශියක්ම තිබුණත් ඒ සඳහා මට ලැබී ඇති කාලය ප්‍රමාණවත් නැහැ. කෙසේ වුණත් බොහොම කෙටියෙන් මේ කාරණා ගැනත් හෙළිදරව් කරන්න කැමතියි. දැනට සේවා හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයකුත් රත්මලානේ ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා යන මුළු වියදම රුපියල් දස ලක්ෂ හැත්තෑපහයි. ගොඩනැගිලි ඉදි කිරීම සහ යන්ත්‍රෝපකරණ සවි කිරීම දැනටමත් අවසන් කර තිබෙනවා. මේ හැර රෙදි පිළි නිෂ්පාදන ආයතනවලට උපදෙස් දීම සඳහා ගමන් වාර 400 ක් පමණ ගොස් ඇති අතර කාර්මික උපදෙස් රාශියක්ම එම ආයතනවලට ලබා දී ඇති බවත් මතක් කරනවා.

පුහුණු කිරීමේ පාඨමාලා 31 ක් දැනට ක්‍රියාත්මක කර තිබෙනවා. සම්මේලන කීපයක්ම පවත්වා තිබෙනවා. ත්‍රෛ මාසික සඟරාවක් මුද්‍රණය කරගෙන යනවා. කාර්මික ඥානය පිළිබඳ පොත්පත් හා සඟරා ඇති පුස්තකාලයක් දැන් ගොඩනගා ගෙන යනවා. පේෂකර්මාන්තය ගැන දැනගැනීමට මේ පොත්පත් ප්‍රයෝජනවත් වෙනවා. එපමණක් නොවෙයි, මෙම ආයතනයෙන් ස්වකීය සේවකයන්ට පුහුණුව ලබා ගත හැකිද කියා විදේශීය රටවල් කීපයකින්ම විමසා තිබෙනවා. මෙම සේවා හා පුහුණු මධ්‍යස්ථානයෙන් එම පුහුණුව ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා.

කපු වැවීම ගැනත් කථා කළා. හොරෙන් අපේ රටට රෙදි ගෙන්වීම නතර කිරීමට "බොන්ඩඩ් වෙයාර්හවුසිං ස්කීම් එකක්" දැන් අපි ලැහැස්ති කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාගේ අමාත්‍යාංශයත්, රේගුවත් සමග සාකච්ඡා කර, මෙරටට හොරෙන් රෙදි ගෙන්වීම මෙම අලුත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමග නතර කරන්නට පුළුවන් වෙනවායයි අප විශ්වාස කරනවා.

අත් යන්ත්‍ර රෙදි වියීම ගැනත් ඇතැම් මන්ත්‍රීවරුන් ප්‍රශ්න කළා. ඇත්තවශයෙන්ම අත් යන්ත්‍ර ප්‍රශ්නය අපේ අමාත්‍යාංශයෙන් ඇති කළ දෙයක් හැටියට පෙන්වා දීම වැරදියි. අපේ ආණ්ඩුව රටේ පාලනය භාර ගන්නා විට, 1977 දී මුළු රටේම අත්යන්ත්‍ර ප්‍රමාණය විසි දහසකට පහත බැස තිබුණා. එපමණක් නොවෙයි, සමුපකාරය මාර්ගයෙන් පවත්වා ගෙන ගිය මෙම යන්ත්‍රවලින් නිෂ්පාදනය කළ රෙදි විකුණා ගන්නට බැරුව තිබුණා. ණයට මුදල් ලබා ගන්නට නොහැකිව තිබුණා පමණක් නොවෙයි, ලබාගත් මුදල්වලින් නිෂ්පාදනය කළ රෙදිපිළි විකුණා ගන්නත් නොහැකි වී තිබුණා. මෑතක් වනතුරුත් ඒවා විකුණා ගන්නට අප ආධාර කළා. නමුත් ඒක අපට අසීනි දෙයක් නොවෙයි. දැන් අපි විවෘත කර ගෙන යන සේවා මධ්‍යස්ථානවලින් නිපදවන රෙදි අලෙවි කර දීමේ වගකීම අපි භාර ගන්නවා. ඒ අනුව සැම මන්ත්‍රී කොට්ඨාශයකටම ආරම්භයක් වශයෙන් මධ්‍යස්ථාන තුන බැගින් ලබා දෙනවා. එම මධ්‍යස්ථානවල නිෂ්පාදනය කරන්නේ විදේශ රටවලට යවන්නට පුළුවන්, අලෙවි කරන්නට පුළුවන් රෙදිපිළියි. ඉස්සර නිෂ්පාදනය කළේ නිකම් ආවාට ගියාටයි. එම නිසා ඒ ගැන අපට දෝෂාරෝපනය කිරීමේ කිසි තේරුමක් නැහැ. මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කළ ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සැම මන්ත්‍රීවරයෙකුටම මම ස්තුතිවන්ත වෙනවා. සැම ප්‍රශ්නයකටම උත්තර දෙන්න මේ අවස්ථාවේ ඉඩ ලැබුණේ නැහැ. මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා ගරු නියෝජ්‍ය ඇමතිතුමාට. එතුමා අමාත්‍යාංශයේ විශාල වැඩ කොටසක් කරනවා. ඒවගේම ලේකම් තුමාටත්, අධ්‍යක්ෂවරුන්ටත්, සේවක සේවිකාවන් සැම දෙනාටත් මගේ අවංක ස්තුතිය පිරිනමමින් මගේ කථාව සමාප්ත කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

***සභාමේසය මත තබන ලද පිළිතුර :**
***சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:***
***List tabled :***

(i) කපු නූල් නිෂ්පාදනය (කි.ග්‍රෑ. දශ ලක්ෂ) :

| | 1979 | 1980 ජූලි - දෙසැ. | 1981 | 1982 | 1983 | 1984 ජන.- සැප්. |
|---|---|---|---|---|---|---|
| වේයන්ගොඩ | 1.40 | .94 | 1.20 | 1.40 | 1.20 | .81 |
| තුල්හිරිය | 1.77 | .41 | 1.84 | 2.67 | 3.13 | 2.6 |
| පූගොඩ | 1.15 | .75 | 1.08 | 1.30 | 1.31 | 1.08 |
| මත්තේගම | 1.00 | .27 | 1.43 | 1.10 | .81 | .72 |
| මින්නේරිය | .75 | .44 | .98 | 1.01 | .52 | – |

(ii) රෙදි නිෂ්පාදනය (මීටර් දශ ලක්ෂ) :

| | 1979 | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|---|
| වේයන්ගොඩ | 6.40 | 4.00 | 6.60 | 7.10 | 6.3 | 5.98 |
| තුල්හිරිය | 4.18 | 1.45 | 5.02 | 5.29 | 6.58 | 6.36 |
| පූගොඩ | 8.20 | 5.20 | 7.49 | 7.37 | 8.06 | 6.72 |

(iii) නිමහම් කිරීම (මීටර් දශ ලක්ෂ) :

| | 1979 | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|---|
| වේයන්ගොඩ | 9.70 | 1.37 | 9.70 | 8.90 | 9.4 | 7.69 |
| තුල්හිරිය | 8.60 | 1.96 | 11.18 | 12.81 | 9.84 | 7.72 |
| පූගොඩ | – | – | – | – | 7.68 | 8.30 |

අලෙවිය (රු. දශ ලක්ෂ) :

| | 1979 | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|---|
| වේයන්ගොඩ | 80.7 | 45.9 | 123.7 | 122.3 | 161.5 | 135.6 |
| තුල්හිරිය | 102.6 | 69.7 | 185.5 | 256.9 | 312.4 | 307.0 |
| පූගොඩ | 42.8 | 52.4 | 89.4 | 97.3 | 154.9 | 159.9 |
| මත්තේගම | 36.6 | 16.7 | 58.7 | 72.4 | 55.3 | 49.0 |
| මින්නේරිය | 33.5 | 25.8 | 60.4 | 57.7 | 33.9 | – |

(8) සමස්තයක් වශයෙන් ගත් කල ජාතික පේෂකර්ම සංස්ථාවට අයත් වන පෙහෙකම්හල් පහේ නූල් කැටීම, රෙදි වියීම හා නිමහම් කිරීමේ විස්තරත්, ඔවුන්ගේ රෙදිපිළි අලෙවිය වර්ෂයෙන් වර්ෂය වර්ධනය වූ අන්දමත්, ලාභාලාභ තත්ත්වයත්, නිෂ්පාදන ශක්‍යතාවයත්, සේවකයින්ගේ පඩිනඩි වර්ෂයෙන් වර්ෂය වැඩි වූ අන්දමත් දක්වෙන වැදගත් සංඛ්‍යා ලේඛන විකක් පහතින් දක්වේ.

තුල්හිරිය පෙහෙකම්හල

| | 1980 2 වන බාගය | 1981 | 1982 | 1983 | 1984 ජන.-සැප්. |
|---|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | | | | | |
| (අ) කැටීම (කි. දශලක්ෂ) | .408 | 1.841 | 2.874 | 3.133 | 2.600 |
| (ආ) වියීම (මී. දශලක්ෂ) | 1.448 | 5.017 | 5.290 | 6.585 | 6.362 |
| (ඉ) නිමහම් කිරීම (එම) | 1960 | 11.179 | 12.810 | 9.840 | 7.540 |
| 2. අලෙවිය (රු. දශලක්ෂ) | 69723 | 185.834 | 255.491 | 312.194 | 326.936 |
| 3. දළ ලාභය/(අලාභය) | (18.566) | 1.046 | 9.324 | 26.901 | 41.445 |
| 4. ශුද්ධ ලාභය/(අලාභය) | (26.249) | (16.018) | (7.482) | 1.7 | 11.648 |
| 5. නිෂ්පාදන කාර්යක්ෂමතාවය | | | | | |
| (අ) කැටීම | 84.8 | 87.2 | 89.4 | 90.4 | 81.5 |
| (ආ) වියීම | 44.2 | 48.7 | 52.5 | 58.7 | 70.0 |
| 6. සේවකයින්ගේ දළ ඉපයීම මසකට | රු. 660 | 684 | 797 | 1,001 | 1,145 |

පූගොඩ පෙහෙකම්හල

| | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | | | | | |
| (අ) කැටීම (කි.ද.ල.) | .654 | 1.070 | 1.302 | 1.315 | 1.080 |
| (ආ) වියීම (මී.ද.ල.) | 5.205 | 7.480 | 7.374 | 8.057 | 6.727 |
| (ඉ) නිමහම් කිරීම (එම) | – | – | – | 7.676 | 8.304 |
| 2. අලෙවිය (රු.ද.ල.) | 52.427 | 89.422 | 96.987 | 161.024 | 170.574 |
| 3. දළ ලාභය/(අලාභය) | 6.430 | (1.020) | 7.132 | 21.781 | 14.9 |
| 4. ශුද්ධ ලාභය (අලාභය) | (.910) | (16.091)* | (16.970) | (11.419) | (6.39) |

* නිමහම් යන්ත්‍රාගාරය ආරම්භ කිරීම නිසා ක්ෂය කිරීම වැඩිවේ.

| | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|
| 5. නිෂ්පාදන කාර්යක්ෂමතාවය | | | | | |
| (අ) කැටීම | 95.76 | 94.04 | 94.61 | 90.82 | 88.00 |
| (ආ) වියීම | 58.85 | 55.00 | 57.52 | 61.54 | 68.00 |
| 6. සේවකයින්ගේ දළ ඉපයීම මසකට | රු. 698 | 1,003 | 1,236 | 1,369 | 1,300 |

* ලබන වර්ෂයේ පූගොඩ කම්හල ද ශුද්ධ ලාභයක් ලබනු ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| වේයන්ගොඩ පෙහෙකම්හල | 1980 2 වන භාගය | 1981 | 1982 | 1983 | 1984 ජන.-සැප් |
|---|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | | | | | |
| (අ) කැටීම (කි.ග්‍රෑ.) | 486 | 1,184 | 1,390 | 1,184 | 813 |
| (ආ) විවීම (කි.ග්‍රෑ.) | 2,016 | 6594 | 7,103 | 6,257 | 5,970 |
| (ඉ) නිමහම් (කි.ග්‍රෑ.) | 2,746 | 9739 | 9,954 | 9,299 | 7,693 |
| 2. අලෙවිය (රු.ද.ල.) | 45.9 | 123.7 | 122.3 | 160.0 | 135.5 |
| 3. දළ ලාභය/(අලාභය) | (6.374) | (24.502) | (37.582) | (45.601) | (16.940) |
| 4. ශුද්ධ ලාභය/(අලාභය) | (5.945) | (26.330) | (41.632) | (58.389) | (45.215) |
| 5. නිෂ්පාදන කාර්යක්ෂමතාවය | | | | | |
| (අ) කැටීම | 79.0% | 81.75% | 90.0% | 92.0% | 87.2% |
| (ආ) විවීම | 56.0% | 57.0% | 58.5% | 57.0% | 70.2% |
| 6. සේවකයින්ගේ දළ ඉපයීම මසකට | රු. 569 | 927 | 1.131 | 1.465 | 1.485 |
| මත්තේගම පෙහෙකම්හල | | | | | |
| නිෂ්පාදනය | | | | | |
| 1. (අ) කැටීම (කි.ග්‍රෑ.) | .214 | 1.041 | 1.107 | .815 | .722 |
| 2. අලෙවිය (රු.ද.ල.) | 16.531 | 59.214 | 72.936 | 55.280 | 49.075 |
| 3. දළ ලාභය/(අලාභය) | .048 | 3.061 | 6.149 | 1.319 | 2.558 |
| 4. ශුද්ධ ලාභය/(අලාභය) | (2.218) | (4.388) | (8.292) | (13.779) | (9.013) |
| 5. නිෂ්පාදන කාර්යක්ෂමතාවය | | | | | |
| (අ) කැටීම | 57 | 79 | 84 | 75 | 74 |
| 6. සේවකයින්ගේ දළ ඉපයීම වර්ෂයකට | රු. 3,467 | 11.778 | 14.711 | 13.170 | 9.888 |

| මින්නේරිය පෙහෙකම්හල | 1981 | 1982 | 1983 | 1984 ජන.-සැප්. |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | | | | |
| (අ) කැටීම (කි.ග්‍රෑ.) | .460 | 1.006 | 1.024 | .520 |
| 2. අලෙවිය | 25.789 | 60.200 | 60.153 | 33.899 |
| 3. දළ ලාභය/(අලාභය) | .401 | (4.381) | (3.460) | (6.176) |
| 4. ශුද්ධ ලාභය/(අලාභය) | (3.459) | (13.843) | (15.917) | (22.134) |
| 5. නිෂ්පාදන කාර්යක්ෂමතාවය | | | | |
| (අ) කැටීම | 62 | 61 | 58 | 63 |
| 6. සේවකයින්ගේ දළ ඉපයීම වාර්ෂික | රු. 4.217 | 8,910 | 9.967 | 10,614 |

**"175 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 49,18,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**175 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**"தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 49,18,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

**தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.**

Question, "That the sum of Rs. 4,918,000, for Head 175, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 175, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

**1 වන වැඩ සටහන – රෙදි කර්මාන්ත නගා සිටුවීම හා සංවර්ධනය කිරීම – මූලධන වියදම, රු. 5,81,70,000**

**நிகழ்ச்சித் திட்டம் 1.—புடவைக் கைத்தொழில்களின் அபிவிருத்தியும் மேம்பாடும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 5,81,70,000**

Programme 1.– Promotion and Development of Textile Industries – Capital Expenditure, Rs. 58,170,000

**"175 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 5,81,70,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.**

**175 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**"தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 5,81,70,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

**தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.**

Question, "That the sum of Rs. 58,170,000 for Head 175, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 175, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

**2 වන වැඩ සටහන – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා – පුනරාවර්තන වියදම, රු. 17,13,000**

**நிகழ்ச்சித் திட்டம் 2.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—மீண்டுவரும் செலவு, ரூபா 17,13,000**

Programme 2.– General Administration and Staff Services – Recurrent Expenditure, Rs. 1,713,000

**"175 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 17,13,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**175 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**"தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவரும் செலவுக்கான ரூபா 17,13,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

**தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.**

Question, "That the sum of Rs. 1,713,000, for Head 175, Programme 2, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 175, Programme 2, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

2 වන වැඩ සටහන. – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා – මූලධන වියදම, රු. 1,10,000

நிகழ்ச்சித் திட்டம் 2.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 1,10,000

Programme 2.– General Administration and Staff Services – Capital Expenditure, Rs. 110,000

"175 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 1,10,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

175 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 1,10,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 110,000, for Head 175, Programme 2, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 175, Programme 2, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 176 වන ශීර්ෂය – රෙදි කර්මාන්ත දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන – රෙදි කර්මාන්ත අභිවර්ධනය හා උත්පාදනය – පුනරාවර්තන වියදම, රු. 3,11,10,000

### தலைப்பு 176.—புடவைக் கைத்தொழில் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—புடவைக் கைத்தொழில் அபிவிருத்தியும் மேம்பாடும்—மீண்டுவருஞ் செலவு, ரூபா 3,11,10,000

### HEAD 76.– DEPARTMENT OF TEXTILE INDUSTRIES

Programme 1.– Promotion and Development of Textile Production–Recurrent Expenditure, Rs. 31,110,000

"176 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,11,10,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

176 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 176, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 3,11,10,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 31,110,000, for Head 176, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන – රෙදි කර්මාන්ත අභිවර්ධනය හා උත්පාදනය – මූලධන වියදම, රු. 7,30,000

நிகழ்ச்சித் திட்டம் 1.—புடவைக் கைத்தொழில் அபிவிருத்தியும் மேம்பாடும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 7,30,000

Programme 1.– Promotion and Development of Textile Production– Capital Expenditure, Rs. 730,000

"176 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 7,30,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

176 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 176, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 7,30,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 730,000, for Head 176, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

*ප. ව. 6.25 ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.*

*කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි ; නැවත රැස්වීම 1984 දෙසැම්බර් 12 වන බදාදා.*

*பி. ப. 6.25 மணிக்கு குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைவர் அக்கிராசனத்திலிருந்து நீங்கினார்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது ; மீண்டும் கூடுவது புதன்கிழமை '12 டிசம்பர் 1984*

*At 6.25 p.m., the Chairman left the Chair to report Progress.*

*Committe report Progress ; to sit again on Wednesday, 12th December, 1984.*

## පරිපූරක මුදල : පූගොඩ පෙහෙකම්හලට නිමහම් යන්ත්‍රාගාරයක්

## குறை நிரப்புத் தொகை : பூகொட நெசவாலைக்குப் பதனிடும் இயந்திரம்

## SUPPLEMENTARY SUPPLY : FINISHING PLANT FOR PUGODA TEXTILE MILLS

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

I move,

"That a supplementary sum not exceeding Rupees Eighty million (Rs. 80,000,000) be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka or any other fund or monies of, or at the disposal of, the Government of the Democratic Socialist Republic of Sri Lanka or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka, for the service of the financial year beginning on 1st January, 1984, and ending on 31st December, 1984 and that the said sum may be expended as specified in the Schedule hereto :–

Schedule

| | Rs. |
|---|---|
| Head : 175–Minister of Textile Industries | |
| Programme : 1–Promotion and Development of Textile Industries | 80,000,000" |

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

## අරක්කු බද්ද

## மதுவரி

## DUTY ON ARRACK

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
(Mr. R. J. G. de Mel)

I move,

"That the Order made by the Minister of Finance and Planning under section 22 of the Excise Ordinance (Chapter 52) relating to Coconut and Processed Arrack, and published in Gazette No. 323/19 of 14.11.1984, which was presented on 10.12.1984, be approved."

This is an Order under the Excise Ordinance to give effect to one of my Budget Proposals.

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මෙරට නිෂ්පාදිත විදේශීය ස්ප්‍රීතු බද්ද
## வெளிநாட்டு மதுவரி
## DUTY ON COUNTRY - MADE FOREIGN SPIRITS

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
(Mr. R. J. G. de Mel)

I move,

"That the Order made by the Minister of Finance and Planning under sub-section (1) of section 22 of the Excise Ordinance (Chapter 52) relating to Countlry-made "Foreign" Spirits, and published in Gazette No. 323/19 of 14.11.1984, which was presented on 10.12.1984, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put and agreed to.*

## ධාන්‍ය මත්පැන් බද්ද
## மோல்ட் மதுவரி
## DUTY ON MALT LIQUOR

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
(Mr. R. J. G. de Mel)

I move,

"That the Order made by the Minister of Finance and Planning under sub-section (1) of section 22 of the Excise Ordinance (Chapter 52) relating to Malt Liquor, and published in Gazette No. 323/19 of 14.11.1984, which was presented on 10.12.1984, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## ඉක්ෂුපාක හා තල් අරක්කු බද්ද
## பனைப்பாகு மதுவரி
## DUTY ON MOLASSES AND PALMYRAH ARRACK

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
(Mr. R. J. G. de Mel)

I move,

"That the Order made by the Minister of Finance and Planning under section 22 of the Excise Ordinance (Chapter 52) relating to Molasses and Palmyrah Arrack, and published in Gazette No. 323/19 of 14.11.1984, which was presented on 10.12.1984, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put and agreed to.*

## දුම්කොළ බද්ද
## புகையிலை வரி
## TOBACCO TAX

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
(Mr. R. J. G. de Mel)

I move,

"That the Order made by the Minister of Finance and Planning under sub-section (2) of section 2 of the Tobacco Tax Act, (Chapter 245) as amended by Act, No. 10 of 1959, Act, No. 9 of 1965 and Act, No. 40 of 1973, published in Gazette Extraordinary No. 323/18 of 14.11.1984, which was presented on 03.12.1984 be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put and agreed to.*

## පිරිවැටුම් බදු පනත : නියෝගය
## மொத்த விற்பனை வரிச் சட்டம் : கட்டளை
## TURNOVER TAX ACT : ORDER

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
(Mr. R. J. G. de Mel)

I move,

"That the Order made by the Acting Minister of Finance and Planning under section 4 of the Turnover Tax Act, No. 69 of 1981, published in the Gazette Extraordinary No. 316/13 of September 27, 1984 and set out in the Schedule hereto be approved.

Schedule

TURNOVER TAX ACT, No. 69 OF 1981

Order under Section 4

BY virtue of the powers vested in me under Section 4 of the Turnover Tax Act, No. 69 of 1981 I, Mohamadu Haniffa Mahamadu Naina Marikar, Acting Minister of Finance and Planning, do by this Order, with effect from October 01, 1984, exempt the following from Turnover Tax :-

(1) National Development Lottery ;

(2) Gam Udawa Sevana Lottery Fund ;

(3) Mahapola Lottery and Higher Education Trust Fund ;

(4) Wasana Lottery of the National Youth Service Council ;

(5) Lotteries conducted by the National Lotteries Board.

M. H. M. NAINA MARIKAR,
Acting Minister of Finance and Planning.

Colombo 1, September 25, 1984."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**විජයපාල මෙන්ඩිස් මහතා**
**(திரு. விஜயபால மெண்டிஸ்)**
(Mr. Wijayapala Mendis)

I move,

"That the Parliament do now adjourn".

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put and agreed to.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.28 ට, 1984 නොවැම්බර් 21 වන දින පාර්ලිමේන්තු සම්මුතිය අනුව 1984 දෙසැම්බර් 12 වන බදාදා පූ. භා. 9 වන තෙක් කල් ගියේ ය.*

*அதன்படி, பி. ப. 6.28 மணிக்கு பாராளுமன்றம், அதனது 1984 நொவம்பர் 21 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1984 டிசம்பர் 12, புதன்கிழமை மு. ப. 9 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.28 p.m. until 9.00 a.m. on Wednesday, 12th December 1984, pursuant to the Resolution of the parliament of 21st November, 1984.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සවකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1984 දෙසැම්බර් 26 වන බදාදා**

**නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි**

***குறிப்பு***

***அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு***

1984 டிசம்பர் 26, புதன்கிழமைக்குப் பிந்தாமற்

***கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.***

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

**not later than**

**Wednesday, 26th December 1984**

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 9.00 a.m. to 6.28 p.m. on 11.12.1984** |
| **Final set of manuscripts received from Parliament** | : | **7.15 p.m. on 12.12.1984** |
| **Printed copies despatched** | : | **13.12.1984 afternoon** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org